පාලි භාෂාව

05

පස්වෙනි ශ්‍රේණිය

මූලික පිරිවෙණ

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ප්‍රථම මුද්‍රණය - 2017
දෙවන මුද්‍රණය - 2018

සියලු හිමිකම් ඇවිරිණි.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නුගේගොඩ, ගංගොඩවිල, උඩහමුල්ල දුම්රියපළ පාර, නො. 44 දරන
ස්ථානයෙහි පිහිටි නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

තිළිණය ලෙසින් රජයෙන් මේ පොත ලදිමි
කියවා එයින් නැණ ගුණ එළි කර ගනිමි
මගෙ රට වෙනුවෙන් ම දෑ සම්පත් රකිමි
මේ පොත එන වසරෙ වෙන කෙනකුට පුදමි

அரசின் வெகுமதியாய் நூலிதனைப் பெற்றேன்
அறிவு பெருகிடவே நூலிதனைக் கற்பேன்
தாய் நாட்டின் வளமெனவும் நூலிதனைக் காப்பேன்
பல மாணவரும் பயின்றிடவே நூலிதையே அளிப்பேன்

From the government, I received this as a gift
I'll read it, light up my knowledge and practise thrift
On my country's own behalf, I'll protect the national resources
And offer this book to another one as a fresh garland of roses

ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

පිරිවෙන් මගින් ගිහි පැවිදි දෙපක්ෂයට ම භාෂා, ආගමික හා සාරධර්ම අධ්‍යාපනය ලබා දීම චිරාත් කාලයක සිට පැවත ආ බැවින්, පිරිවෙණ යනු ශ්‍රී ලාංකික අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත් විය. එය දේශීය ගිහි පැවිදි ශිෂ්‍ය පරම්පරාව පමණක් නොව විදේශීය විද්‍යාර්ථීන් ද ඥානනය කළ විශ්වවිද්‍යාලයක් බඳු ස්ථානයක් විය. එක් එක් යුගයේ අවශ්‍යතා අනුව සකස් වූ විෂයමාලාවක් පිරිවෙන් අධ්‍යාපනය මඟින් සිසුන් වෙත ප්‍රදානය කරනු ලැබිණි. එබැවින් ම එවැනි අධ්‍යාපන මධ්‍යස්ථාන විශ්ව සම්භාවනාවට පත් විය.

විදේශීය ආක්‍රමණ හමුවේ - විශේෂයෙන් ම පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණ හමුවේ - පිරිවෙන් අධ්‍යාපනය ගුණාත්මක වශයෙන් හීන වී ගිය බව සැබෑ ය.

එහෙත් 1753 දී ශ්‍රී ලංකාවේ මහණ උපසම්පදාව යළි පිහිටුවීමට ක්‍රියාකළ අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ කැපවීම මත පිරිවෙණ නැමැති අධ්‍යාපන ආයතනය ශීඝ්‍ර දියුණුවකට පත් ව දෙස් විදෙස් කීර්තියට පත්වීම අප ලැබූ ජයග්‍රහණයකි.

අනෙකුත් අධ්‍යාපන ක්ෂේත්‍රවලට මෙන් ම පිරිවෙන් අධ්‍යාපනයට ද නිදහස් අධ්‍යාපන සංකල්පය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අර්ථවත් කිරීම අපගේ පරම අපේක්ෂාවයි. පිරිවෙන් පෙළපොත් නොමිලයේ සැපයීමෙන් රජය ඉහළ වැයක් දරුව ද එමගින් සමස්ත ජනතාවගේ විනය, සදාචාරය හා යහපැවැත්ම පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව වෙතින් ඉටු වනු ඇතැයි උදක් ම අපේක්ෂා ඇති ව මෙම පොත ඔබ අතට පත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකන අතර මෙම පොත පරිහරණය කිරීමෙන් ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නැණ ගුණ දියුණු වේවායි ද පතමි.

අකිල විරාජ් කාරියවසම්
අධ්‍යාපන අමාත්‍ය

පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය මහනුවර නියමකන්ද පරිවේණස්ථානයෙන් ආරම්භ වී වර්තමාන අවධියේ දී සාධනීය ලක්ෂ්‍යයකට පැමිණ ඇත. වසර ගණනක් නොවෙනස් ව පැවති මූලික පිරිවෙන් විෂය නිර්දේශය නූතන අධ්‍යාපන ක්‍රමෝපායයන්ට උචිත ආකාරයෙයන් වෙනසකට භාජනය කර ඇත. ඒ අනුව විශාල පිරිවැයක් දරමින් නව පෙළපොත් මුද්‍රණය කරවා පිරිවෙන් අධ්‍යාපනයට නව ජවයක් ගෙන දීමට රජය උත්සුක වී තිබීම ප්‍රශංසනීය ය.

සම්භාව්‍ය අධ්‍යාපනය සැකසී ඇත්තේ ප්‍රාචීන හා ප්‍රතිචීන භාෂාවල උපකාරයෙනි. එය තවදුරටත් ආරක්ෂා කර ගනිමින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය හා සම ව ගමන් කොට විශ්වයට ඔබින ප්‍රතිබලසම්පන්න භික්ෂූන් වහන්සේ නමක් නිර්මාණය කරගැනීම අවශ්‍ය වේ. එකී අරමුණු සාධනයෙහි ලා උපස්ථම්භක වන්නා වූ නව විෂය නිර්දේශයක් හඳුන්වා දී තිබේ. ඊට අනුගත ව පැවිදි ගිහි සිසුන් වෙත නව පෙළපොත් තිළිණ කරනු ලැබ ඇත. මෙය පිරිවෙන් ක්ෂේත්‍රයට සුවිශේෂ අවස්ථාවකි.

රජය මගින් පිරිනමනු ලබන මෙම පෙළපොත ගෞරවයෙන් සහ පිරිසිදු ව භාවිත කිරීමට උත්සාහ කළ යුතු ය. එළඹෙන වසරේ සහෝදර සිසුනට ද නැවත තිළිණ කරදීමට හැකි වන පරිදි පොත පරිශීලනය කිරීම අවශ්‍ය ය. එලෙස කටයුතු කිරීම රටේ ආර්ථික සංවර්ධනයට උරදීමක් ද වනු ඇත.

විජිත වෙලගෙදර
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

පෙරවදන

ශ්‍රී ලංකාව තුළ බුද්ධ ධර්මය ස්ථාපිත වීමත් සමග ම වාගේ විහාරාරාම ගොඩනැංවීම ආරම්භ විය. දිවයිනේ ප්‍රධාන විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් "පිරිවෙන" නැමැති විද්‍යායතනය බිහි වී ඇත. ගිහි පැවිදි දෙපක්ෂයට ම අවශ්‍ය වූ කලා ශිල්ප, භාෂා හා සමය සමයාන්තර ඥනයත්, යහපත්, ගුණගරුක සමාජයක් බිහි කිරීමට අවශ්‍ය සාරධර්ම අධ්‍යාපනයත් බෙදා දුන්නේ පිරිවෙන මගිනි. එම සාම්ප්‍රදායික අනන්‍යතාව රැක ගනිමින් ම, කාලීන අවශ්‍යතා ද සපුරාලමින් යහපත් සමාජයක් ගොඩනැගීමේ කාර්යය ඉදිරියට ගෙන යාමට පිරිවෙන ඉටු කරන කාර්යභාරය සුළු කොට තැකිය නොහැකි ය.

සම්භාවනීය අධ්‍යාපන සම්ප්‍රදායයන් රැක ගනිමින් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ මෙන් ම ගිහි සිසුන්ගේත් අවශ්‍යතා සැලකිල්ලට ගෙන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පිරිවෙන් සඳහා මෙම පාඨග්‍රන්ථය සම්පාදනය කර ඇත. එම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, ලේඛක හා සංස්කාරක මණ්ඩල සාමාජිකයන් සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මාගේ ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි.

ඩබ්ලිව්. ඩී. පද්මිණී නාලිකා
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2018.05.07

නියාමනය හා අධීක්ෂණය :-

ඩබ්ලිව්. ඩී. පද්මිණී නාලිකා මිය - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

මෙහෙයවීම :-

විජිත වෙලගෙදර මහතා - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

ඩබ්ලිව්.ඒ. නිර්මලා පියසීලි මිය - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

උපදේශකත්වය :-

මහාචාර්‍ය පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි - පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

සම්බන්ධීකරණය :-

පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි - පාලි විෂය උපදේශක (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

ඩී.එම්.ජේ. පුෂ්පකුමාර මයා - නියෝජ්‍ය කොමසාරිස් (පාලන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

කේ.ඒ. සුමිත් ධර්ම ශ්‍රී මයා - පාලි විෂය උපදේශක (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

සංස්කරණය :-

මහාචාර්‍ය පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි - පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ලේඛක මණ්ඩලය :-

කේ.ඒ. සුමිත් ධර්ම ශ්‍රී මයා (සභාපති) - පාලි විෂය උපදේශක (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි - පාලි විෂය උපදේශක (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

පූජ්‍ය වල්පොල පියරතන හිමි - පරිවේණාචාර්ය
විද්‍යොදය පිරිවෙණ, මාලිගාකන්ද පාර,
කොළඹ 10

පූජ්‍ය කොස්ගොඩ විමලවංසතිස්ස හිමි - පරිවේණාචාර්ය
සුගතසාසනෝදය පිරිවෙණ
වැලිතර
බලපිටිය

සෝදුපත් කියවීම :-

පූජ්‍ය මුවපැටිගේවෙල පඤ්ඤාලෝක හිමි - ආරාධිත කථිකාචාර්ය
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

පිටු නිර්මාණය සහ පිට කවරය :-

ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ මෙය - පරිගණක අංශය
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පරිගණකගත කිරීම :-

ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ මෙය - පරිගණක අංශය
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඉසුරංගි කනකරත්න මෙය - පරිගණක අංශය
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පටුන

01	නමො මහාකාරුණිකස්ස තස්ස !!!	01
02	එතු ඛො භන්තෙ භගවා සඞ්ගතං භන්තෙ	08
03	අක්කාසමෙව අලත්ථ.	21
04	උපාසකං මං භවං ගොතමො ධාරෙතු	35
05	උට්ඨෙහි සම්ම සුදිනන	44
06	තථාගතස්ස ආළාහනං	52
07	පස්සථ අය්‍යා උපසන්තාය කම්මං	59
08	බ්‍රහ්මාති මාතාපිතරො	65
09	කස්මා ලිච්ඡවීති වදන්ති?	76
10	සබ්බං කිර පහාය ගන්තබ්බං	86
11	ආහඤ්ඤං අමතදුන්දුභිං	98
12	තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා	107
13	තෙ නමස්සාමි මාතලී	115
14	අග්‍රගණ්‍ය පාලි පඬිවරු සිවුදෙනෙක්	128
15	උදානපාළි	147
16	සඞ්ගාමජීසුත්තං	153
17	අපදානපාළි	167
18	මහාපජාපතිගොතමී අපදානං	170
19	ආටානාටිය සුත්තං	204

ලඝු සඤ්ඤා

නා	-	නාම පදයකි
සං	-	සන්ධි පදයකි
කි	-	කිතක පදයකි
ස	-	සමාස පදයකි
ත	-	තද්ධිත පදයකි
නි	-	නිපාත පදයකි
ක්‍රි	-	ක්‍රියා පදයකි
තු	-	තුමන්ත ක්‍රියාවකි
පූ.ක්‍රි	-	පූර්වක්‍රියා පදයකි
ස.නා	-	සර්වනාම පදයකි

පඨමො පාඨො

නමො මහාකාරුණිකස්ස තස්ස !!!

යො කප්පකොටීහිපි අප්පමෙය්‍යං
කාලං කරොනෙතා අතිදුක්කරානි,
බෙදං ගතො ලොකහිතාය නාථො
නමො මහාකාරුණිකස්ස තස්ස.

අසම්බුධං බුද්ධනිසෙවිතං යං
භවාභවං ගච්ඡති ජීවලොකො
නමො අවිජ්ජාදිකිලෙසජාල
විද්ධංසිනො ධම්මවරස්ස තස්ස.

ගුණෙහි යො සීලසමාධිපඤ්ඤා
විමුත්තිඤාණප්පභුතීහි යුත්තො
බෙත්තං ජනානං කුසලත්ථිකානං
තමරියසඞ්ඝං සිරසා නමාමි.

(සමන්තපාසාදිකා)

පදමාලාව

කප්පකොටීහි'පි	(ස)	-	කල්ප කෝටියකිනුත්
අප්පමෙය්‍යං	(ස)	-	ප්‍රමාණ කළ නොහැකි
කරොනෙතා	(කි)	-	කරන්නේ
අතිදුක්කරානි	(ස)	-	ඉතා දුෂ්කර වූ
බෙදං	(නා)	-	සංවේගයට
ගතො	(කි)	-	ගිය
ලොකහිතාය	(ස)	-	ලෝකයාට හිත පිණිස
නාථො	(නා)	-	පිහිට වූ
මහාකාරුණිකස්ස	(ස)	-	මහාකාරුණිකයන් වහන්සේට
අසම්බුධං	(කි)	-	මැනවින් අවබෝධ නොකළ
බුද්ධනිසෙවිතං	(ස)	-	බුදුරදුන් විසින් ඇසුරු කරන ලද
භවාභවං	(නා)	-	භවයෙන් භවයට
විද්ධංසිනො	(කි)	-	විද්ධංසනය (නැසීම) කරන්නා වූ
කුසලත්ථිකානං	(ස)	-	කුසල් කැමැත්තවුන්ට
තමරියසඞ්ඝං	(සං)	-	(තං + අරියසඞ්ඝං) ඒ ආර්ය සංඝයා
ජීවලොකො	(ස)	-	ජීවලෝකයා
අවිජ්ජාදි	(සං)	-	අවිද්‍යාව ආදි
කිලෙසජාල	(ස)	-	කෙලෙස් දැල

අභ්‍යාස

01. ''නමො මහාකාරුණිකස්ස තස්ස'' යටතේ ඇති ගාථා සිංහලට නගන්න.

02. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. මහාකාරුණිකො කිත්තකං කාලං අතිදුක්කරානි අකාසි?
ii. නාථො කස්මා බෙදං ගතො?
iii. කස්මා ජීවලොකො භවාභවං ගච්ඡති?
iv. අරියසඞ්ඝා පන කස්ස පුත්තා හොන්ති?
v. අරියසාවකා කීදිසෙහි ගුණෙහි සමන්නාගතා භවන්ති?

03. ගාථා ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i. 'කප්ප' යන පදය විවරණය කරන්න.
ii. ඇදිලි බැඳ නමස්කාර කිරීම යනු කුමක් ද?
iii. අවිද්‍යාව අන්ධකාරයකට සමාන කොට ඇත්තේ කුමක් හෙයින් ද?
iv. ත්‍රිශික්ෂා නම් කරන්න.
v. සංඝරත්නය කෙතකට සමාන වන්නේ කෙසේ ද?

අක්ෂර

'අක්ෂර' එනමින් හැඳින්වෙන්නේ අවසන් වීමක් හෝ ක්ෂය වීමක් නොවන හෙයින් බව සාම්ප්‍රදායික පිළිගැනීම යි. **(නක්ඛරනතී'ති අක්ඛරා)** පාලි භාෂාවේ අකුරු **අක්ඛර, වණ්ණ, ව්‍යඤ්ජන** යන පදවලින් ද හඳුන්වනු ලබන අතර කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායට අනුව පාලි භාෂාවේ අකුරු 41 කි. **(අක්ඛරාපාදයො එකචත්තාළීසං)** ඒවා ස්වර 08 කින් හා ව්‍යඤ්ජන 33 කින් සමන්විත වේ.

මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායට අනුව වර්ණ (අකුරු) 43 කි. **(අආදයො තිතාළීස වණ්ණා)** **'එ'**, **'ඔ'** ස්වර දෙක හ්‍රස්ව හා දීර්ඝ යන දෙවිධියෙන් ම පිළිගැනීම නිසා ස්වර 10 ක් වීම මීට හේතුව වේ. එහෙත් දීර්ඝ ලෙස උච්චාරණය කළ ද ලිවීමේ දී **'ඒ'**, **'ඕ'** වශයෙන් දීර්ඝව ලිවීමක් සිදු නො වේ.

ඕනෑම භාෂාවක් නිවැරැදිව ලිවීමට හා උච්චාරණය කිරීමට හුරු පුරුදු වීම ඉතා වැදගත් ය. පාලි භාෂාව හැදෑරීමේ දී මෙය නිතර සිහි තබාගත යුතු වැදගත් කරුණකි. භාෂාවක මූලික ඒකකය අක්ෂර යි. අක්ෂර කීපයකින් පදයක් සෑදෙන අතර, පද කීපයකින් අර්ථවත් වාක්‍යයක් සෑදේ. පදයක අර්ථය නිවැරැදි ව හඳුනාගත හැකි වනුයේ අක්ෂර මගිනි. **(අත්ථො අක්ඛරසඤ්ඤාතො)** අක්ෂර නිවැරැදි ව නො යෙදුවහොත් අර්ථය වරදී. 'ශාස්තෘ' යන අර්ථය දැනවීමට **'සත්තා'** ලෙස ලියුවහොත් ඉන් අදහස් වනුයේ 'ශාස්තෘ' නොව 'සතුරා' හෝ 'සත්ත්වයෝ' යන්න යි.

සන්ධි, නාම, සමාස, තද්ධිත, කිතක, ආඛ්‍යාත ආදි ව්‍යාකරණාංග හැදෑරීමේ දී ද අක්ෂරාවබෝධය අත්‍යවශ්‍ය වේ. ඇතැම් විට පාලියේ තනි අක්ෂරය අර්ථවත් පදයක් වන අවස්ථා ද ඇත.

උදා:- සා (ඇය, සුනඛයා), ක (ජලය), ජෙ (බොල), හො (පින්වත), මා (එපා)

පාලි භාෂාවෙන් යමක් ලිවීමට භාවිත කරන සුවිශේෂ වූ සංකේත විශේෂයක් නොමැති බව ද සිහි තබා ගත යුතු ය. අප සිංහල අකුරෙන් පාලි හෝඩිය ලියා දක්වන අතර සියම්, බුරුම, ඉංග්‍රීසි, ජපන් ආදි රටවල වැසියෝ තම තමන්ගේ භාෂාවල අක්ෂරවලින් පාලි හෝඩිය ලියනු ලැබේ.

පාලි අක්ෂර මාලාව

ස්වර - 08

අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඔ

ව්‍යඤ්ජන - 33

ක, ඛ, ග, ඝ, ඞ,
ච, ඡ, ජ, ඣ, ඤ,
ට, ඨ, ඩ, ඪ, ණ,
ත, ථ, ද, ධ, න
ප, ඵ, බ, භ, ම,
ය, ර, ල, ව,
ස, හ, ළ,
(අ)ං

ස්වර

තමා ම බැබළේ යන අදහසින් ස්වර නම් වේ. (**සයං රාජෙනතී'ති සරා**) එසේ ම ව්‍යඤ්ජනාක්ෂරයන් උසුරුවීමට ආධාර වන හෙයින් ද ස්වර නම් වේ. (**ව්‍යඤ්ජනෙ සාරාපෙනතී'ති සරා**)

ස්වර අට අතුරින් තුනක් (අ, ඉ, උ) හ්‍රස්ව වන අතර, ඉතිරි ඒවා දීර්ඝ ස්වර වේ. (ආ, ඊ, ඌ, එ, ඔ)

■ සංයෝගයකට මුලින් ඇති 'එ', 'ඔ' දෙක හ්‍රස්වව උච්චාරණය වේ.

උදා:- එත්ථ, සෙය්‍යථීදං, ඔට්ඨා, සොත්ථි

■ සංයෝගයක් නැති විට දීර්ඝව උච්චාරණය වේ.

උදා:- **එවං, එකං, සොතං, ඔදනං, දෙවො**

■ 'එ', 'ඔ' අකුරු දෙක අසවර්ණ නම් වේ.

ව්‍යඤ්ජන

ව්‍යක්ත අර්ථ දැනවීමෙහි සමත් අකුරු **'ව්‍යඤ්ජන'** නම් වේ. **(ව්‍යඤ්ජයති අත්ථො එතෙහී'ති ව්‍යඤ්ජනා)**

වර්ගාක්ෂර

පහත දැක්වෙන පරිදි 'ක' සිට 'ම' දක්වා පහ පහ බැගින් ඇති අකුරු 25 වර්ගාක්ෂර නම් වේ. **(බ්‍යඤ්ජනානං කාදයො මකාරන්තා පඤ්ච පඤ්චසො අකඛරවන්තෙනා වගගා)**

'ක' වගග	-	**ක, ඛ, ග, ඝ, ඞ**
'ච' වගග	-	**ච, ඡ, ජ, ඣ, ඤ**
'ට' වගග	-	**ට. ඨ, ඩ, ඪ, ණ**
'ත' වගග	-	**ත, ථ, ද, ධ, න**
'ප' වගග	-	**ප, ඵ, බ, භ, ම**

මේවා අක්ෂර උපදින ස්ථානවල හා දිව මැද මැනවින් ස්පර්ශ වන හෙයින් **'ස්පර්ශාක්ෂර'** ලෙස ද නම් කෙරේ.

අනෙක් අක්ෂර **'ක'** වර්ග, **'ච'** වර්ග ආදි ලෙස කිසියම් වර්ගයකට නොවැටෙන හෙයින් **'අවර්ගාක්ෂර'** නම් වේ.

අඝෝෂාක්ෂර

වර්ගයන්ගේ පළමු දෙවන අකුරු 10 ද **'ස'** කාරය ද අඝෝෂ නම් වේ. **(වගගානං පඨමදුතියා සො චාඝොසා)**

ක, ඛ, ච, ඡ, ට, ඨ, ත, ථ, ප, ඵ, ස

ඝෝෂාක්ෂර

අඝෝෂ අකුරු 11 හා නිග්ගහීතය හැර 'ළ'කාරය අන්ත කොට ඇති ඉතිරි අකුරු 21 ඝෝෂාක්ෂර වේ. **(ළනතාඤෙඤඤ ඝොඝා)**

ග, ඝ, ඹ, ජ, ඣ, ඤ, ඩ, ඪ, ණ, ද, ධ, න, බ, භ, ම, ය, ර, ල, ව, හ, ළ

නිග්ගහීත

'(අ)ං' බින්දුව නිග්ගහීතය ලෙස හැඳින්වේ. මුල්කාලයේ අකුරු උඩින් බිංදුව ලියන ලද බැවින් සිළුමිණක ආකාරය උසුලන අතර තනිව උසුරුවිය නොහැකි බැවින් ඊට මුලින් 'අ' කාරයක් යොදා කියනු ලැබේ.

බින්දු චූළාමණාකාරෝ - නිගහීතන්ති වුච්චතෙ
කෙවලඝඝාපපයොගත්තා - අකාරෝ සන්නිධීයතෙ

අන්ත්‍යස්ථාක්ෂර

ය, ර, ල, ව යන අකුරු 04 ස්වර ස්වභාවයත්, ව්‍යඤ්ජන ස්වභාවයත් අතර පවතින හෙයින් මෙනමින් හැඳින් වේ. මේවා **ද්වීයාක්ෂර** ලෙස ද, අක්ෂර උත්පත්ති ස්ථානවල සම්පූර්ණයෙන් ස්පර්ශ නොවන හෙයින් **ඊසම්ඵුට්ඨ** ලෙස ද හැඳින් වේ.

අක්ෂර උත්පත්ති ස්ථාන



අක්ෂරයන්ගේ ප්‍රභේද

<table>
<tr><td rowspan="2">ස්වර</td><td>හ්‍රස්ව ස්වර</td><td>අ, ඉ, උ
(ලහුමත්තා තයෝ රස්සා)</td><td rowspan="2">අඝෝෂ</td><td rowspan="2">ක, ඛ, ච, ඡ, ට, ඨ, ත, ථ,ප, ඵ, ස
(වගඟානං පඨමදුතියා සෝ චාඝොසා)</td></tr>
<tr><td>දීර්ඝ ස්වර</td><td>ආ, ඊ, ඌ, එ, ඔ
(අඤ්ඤේ දීඝා)</td></tr>
<tr><td colspan="2">වගීඃක්ෂර</td><td>ක, ඛ, ග, ඝ, ඞ
ච, ඡ, ජ, ඣ, ඤ
ට. ඨ, ඩ, ඪ, ණ
ත, ථ, ද, ධ, න
ප, ඵ, බ, භ, ම
(වගඟා පඤ්ච පඤ්චසෝ මන්තා)</td><td>ඝෝෂ</td><td>ග, ඝ, ඞ, ජ, ඣ, ඤ,
ඩ, ඪ, ණ, ද, ධ, න,
බ, භ, ම, ය, ර, ල,
ව, හ, ළ,

(ළන්තාඤේඤේ ඝෝඝා)</td></tr>
<tr><td colspan="2">අවගීඃක්ෂර</td><td>ය, ර, ල, ව, ඝ, හ,
ළ, (අ)ං</td><td>නිග්ගහීත</td><td>(අ)ං
(අං ඉති නිග්ගහීතං)</td></tr>
<tr><td colspan="2">අන්ත්‍යඃස්ථාක්ෂර</td><td>ය, ර, ල, ව</td><td>අල්පප්‍රාණ</td><td>ක, ග, ච, ජ, ට, ඩ,
ත, ද, ප, බ,</td></tr>
<tr><td colspan="2">ඌෂ්මාක්ෂර</td><td>ඝ, හ</td><td>මහාප්‍රාණ</td><td>ඛ, ඝ, ඣ, ඣ, ඨ, ඪ,
ථ, ධ, ඵ, භ,</td></tr>
</table>

අභ්‍යාස

01. සිංහලට නඟන්න.

i. අකාරාදයෝ නිගහීතන්තා එකචත්තාළීසක්ඛරා භවන්ති.

ii. එකෝ මනුඝෙඝා අක්ඛරානි දිඝවා 'කිං භෝ ඉද'න්ති අක්ඛරඤ්ඤුං මනුඝ්ඝං පකේකාඝාපෙත්වා දඝෙඝසි.

iii. යෝ නිරුත්තිං න ජානාති - ජානාති පිටකත්තයං
පදෙ පදෙ විකඛේඛය්‍ය - වනෙ අන්ධගජෝ විය.

iv. අක්ඛරචින්තකා (ව්‍යාකරණඥයෝ) සුගහීතසුත්තා නං අට්ඨඤ්ඤව පාළිඤ්ඤව පටිබුජ්ඣන්ති.

v. ඉදානි පන මුද්දිතපොත්ථකානං සුලභතාය තාලපණ්ණේසු ලිඛන්තා දුල්ලභා හොන්ති.

02. පාලියට නඟන්න.

i. සාමණේර තෙමේ පැන (අකඛරවඤ්ඣු) ගෙන පොතෙහි අකුරු ලියා ගුරුවරයාට පෙන්වීය.
ii. පාලි භාෂාවේ ව්‍යඤ්ජනාක්ෂරයෝ තිස්තුනක් වෙති.
iii. ඇතමෙක් බිංදුවට නිග්ගහීත යැයි කියත්.
iv. පුස්කොළ පොත්වල අකුරු රටා 03ක් දක්නට ලැබේ.
v. මුගලන් ඇදුරෝ අකුරුවලට වර්ණ යැයි ව්‍යවහාර කරත්.

03. අර්ථවත් ඒකාක්ෂර පද 20ක් ලියන්න.

04. හිස්තැන් පුරවන්න.

අක්ෂර	උපදින ස්ථානය	බාලාවතාර සූත්‍ර පාඨය
ව	දත් සහ තොල්	වෝ දන්තොට්ඨ්යෝ
ඉ, ඡ		
ග, හ,		
උ, ඵ		
ල, ස		
ට, ළ		

05. පහත දැක්වෙන පදවල අක්ෂර වින්‍යාසය නිවැරැදි කොට ලියන්න.

i. අණනෝ
ii. අට්ඨාරස
iii. විශෙෂං
iv. මා නිවත්ථ
v. අජ්ජබාසි
vi. නිබහත්තති
vii. පුරිසධම්මසාරථී
viii. චත්තාලීසති
ix. උච්ඡාරණ
x. සම්බතං

දුතියො පාඨො

එතු ඛො භන්තෙ භගවා සුඛාගතං භන්තෙ

එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන වච්ඡගොත්තො පරිබ්බාජකො එකපුණ්ඩරීකෙ පරිබ්බාජකාරාමෙ පටිවසති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලියං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි. අතිප්පගො ඛො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුං. යන්නූනාහං යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො, යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො භගවා යෙන එකපුණ්ඩරීකො පරිබ්බාජකාරාමො යෙන වච්ඡගොත්තො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අද්දසා ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච. එතු ඛො භන්තෙ, භගවා. සුඛාගතං භන්තෙ, භගවතො, චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු, භන්තෙ, භගවා ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. වච්ඡගොත්තොපි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි.

(තෙවිජ්ජවච්ඡගොත්ත සුත්ත - මජ්ඣිමනිකාය)

පදමාලාව

භගවා	(ත)	-	භාග්‍යවතුන් වහන්සේ
වෙසාලියං	(නා)	-	විශාලාවෙහි
විහරති	(ක්‍රි)	-	වාසය කරයි
මහාවනෙ	(ස)	-	මහ වනයෙහි
කූටාගාරසාලායං	(ස)	-	කූටාගාර ශාලාවේ
වච්ඡගොත්තො	(ස)	-	වච්ඡගොත්ත තෙමේ
එකපුණ්ඩරීකෙ	(ස)	-	ඒක පුණ්ඩරික නම් වූ
පටිවසති	(ක්‍රි)	-	වාසය කරයි
පුබ්බණ්හසමයං	(ස)	-	උදය කාලයේ / පෙරවරුවෙහි
නිවාසෙත්වා	(පූ.ක්‍රි)	-	හැඳ පොරවා
ආදාය	(පූ.ක්‍රි)	-	ගෙන
පාවිසි	(ක්‍රි)	-	පිවිසියේ ය
අතිප්පගො	(නි)	-	කල්වැඩිය / ඉතා වේලාසනය
තාව	(නි)	-	තවම, ඒතාක්
චරිතුං	(තුං)	-	හැසිරෙන්නට
යන්නූන	(සං)	-	මැනවි / ඉතා යෙහෙකි
අද්දසා	(ක්‍රි)	-	දුටුවේය
දූරතොව	(සං)	-	දුරින් ම

එතු	**(ක්‍රි)**	-	පැමිණේවා, වඩිනු මැනවි
සඞාගතං	**(නි)**	-	යහපත් පැමිණීමක් වේවා
පරියායමකාසි	**(සං)**	-	පියවර කළේය
යදිදං	**(සං)**	-	යම් මේ
ඉධාගමනාය	**(සං)**	-	මෙහි පැමිණීම පිණිස
නිසීදතු	**(ක්‍රි)**	-	හිඳගනීවා
ඉදමාසනං	**(සං)**	-	මේ අසුන
පඤ්ඤත්තං	**(කි)**	-	පනවන ලද
නීචං	**(නා)**	-	මිටි / පහත්

අභ්‍යාස

01. 'එතු බො භන්තෙ භගවා සඞාගතං භන්තෙ' යන ඡේදය සිංහලට නගන්න.

02. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. තදා භගවා කුහිං විහරි?
ii. වච්ඡගොත්තො පරිබ්බාජකො කත්ථ පටිවසති?
iii. අතිප්පගො බො තාව වෙසාලියං පිණ්ඩාය චරිතුන්ති කො චින්තෙසි?
iv. කො දූරතොව ආගච්ඡන්තං භගවන්තං අද්දස?
v. වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං දිස්වා කිං කථෙසි?

03. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. වච්ඡගොත්ත පරිබ්‍රාජක තෙමේ කුමන නගරයක වාසය කළේ ද?
ii. බුදුරදුන් වඩින බව දුටු වච්ඡගොත්ත පරිබ්‍රාජක තෙමේ උන්වහන්සේ පිළිගත්තේ කෙසේ ද?
iii. "නීචං ආසනං" යනුවෙන් හැඳින්වූයේ කුමක් ද?
iv. බුදුහිමියන්ගේ දිනචරියාවේ කවර අංගයක් මෙම ඡේදයෙන් විස්තර වේ ද?
v. මෙම ඡේදයෙන් බුදුහිමියන්ගේ කිනම් ගුණයක් ප්‍රකාශ වේ ද?

නාම වරනැඟීම

හැඳින්වීම

පාලි භාෂාවේ **නාම** හා **ආඛ්‍යාත** යයි පද වර්ග දෙකකි. **සබ්‍යඤ්ජන** යනු නාම පද යි. **තබ්‍යඤ්ජන** යනු ආඛ්‍යාත පදයි. නාම පද හා ආඛ්‍යාත පද ප්‍රකෘති - ප්‍රත්‍යය යෝග යෙන් තැනේ. නාමවලට **"සි"** ආදි (සබ්‍යාදි) ප්‍රත්‍යය එක් වී නාමපද ද ධාතුවලට **"ති"** ආදි (තබ්‍යාදි) ප්‍රත්‍යය එක් වී ක්‍රියාපද ද සෑදේ.

නාම පද යනු ලිඞ්ගයට හෙවත් නාමයට පසුව සි ආදි විභක්ති ප්‍රත්‍යයන් යෙදී සෑදෙන පද විශේෂයකි.

ඒක වචන	-	බුද්ධ + සි	බහුවචන	-	බුද්ධ + යො
		බුද්ධ + (සි >) ඔ			බුද්ධ + (යො >) ආ
		බුද්ධ් + ඔ			බුද්ධ් + ආ
		බුදෙධා			බුද්ධා

යනා දි වශයෙන් පද සිද්ධ වේ.

නාම විභක්ති

පාලි භාෂාවේ නාම විභක්ති නවය (09) කි. ලිංගය හෙවත් ශබ්දප්‍රකෘතිය කර්ම, කර්තෘ ආදි වශයෙන් හා ඒකවචන, බහුවචන වශයෙන් ඒ ඒ අර්ථයන්ට බෙදන නිසා **'විභක්ති'** නම් වේ. පහත දැක්වෙන ඒකී විභක්ති අතර ආලපන විභක්තිය පඨමා විභක්තියේ ම කොටසක් ලෙස ද කරණ විභක්තිය තතියා විභක්තියේ ම කොටසක් ලෙස ද සැලකේ. විභක්ති නමය (09) පහත දැක්වේ.

i. **පඨමා විභත්ති**
ii. **ආලපන විභත්ති**
iii. **දුතියා විභත්ති**
iv. **තතියා විභත්ති**
v. **කරණ විභත්ති**
vi. **චතුත්ථී විභත්ති**
vii. **පඤ්චමී විභත්ති**
viii. **ඡට්ඨී විභත්ති**
ix. **සත්තමී විභත්ති**

නාම විභක්ති ප්‍රත්‍යය

ශබ්ද ප්‍රකෘතියකට පසුව නාම විභක්ති ප්‍රත්‍යය යෙදී ඒකවචන, බහුවචන භේදයත් පඨමා, දුතියා ආදි විභක්ති භේදයත් ප්‍රකාශ කරන්නේ නාම විභක්ති ප්‍රත්‍යය යි. පාලියේ එබඳු ප්‍රත්‍යය තුදුසක් (14) පෙන්වා දී ඇත. ඒ ඒ විභක්තිවලට ඒවා අයත් වන ආකාරය හා එහි භාවිතය පහත වගුවෙන් තේරුම් ගන්න.

විභක්තිය	සූත්‍රපාඨය	ඒකවචන	බහුවචන
පඨමා	සි යො ඉති පඨමා	සි	යො
දුතියා	අං යො ඉති දුතියා	අං	යො
තතියා	නා හි ඉති තතියා	නා	හි
චතුත්‍ථී	ස නං ඉති චතුත්‍ථී	ස	නං
පඤ්චමී	සමා හි ඉති පඤ්චමී	සමා	හි
ඡට්ඨී	ස නං ඉති ඡට්ඨී	ස	නං
සත්තමී	සමිං සු ඉති සත්තමී	සමිං	සු

(තතොව විභත්තියො සි යො අං යො නා හි ස නං සමා හි ස නං සමිං සූති විභත්තියො)

පඨමා විභක්තිය . ලිඞ්ගත්‍ථෙ පඨමා

නාම විභක්ති නවයෙහි පළමු විභක්තිය පඨමා විභක්තිය යි. පඨමා විභක්තිය උක්තාර්ථයේ යෙදේ. අවසාන ආඛ්‍යාතයෙන් කියවෙන අර්ථය උක්තාර්ථය යි. කර්තෘකාරක වාක්‍යවල උක්ත කර්තෘ හා කර්මකාරක වාක්‍යවල උක්ත කර්මය පඨමා විභක්තියෙන් සිටී.

පුරිසො ගාමං ගච්ඡති. (කර්තෘකාරක)
කඤ්ඤාය **ඔදනො** පචචතෙ. (කර්මකාරක)

ආලපන විභක්තිය - අභිමුඛීකරණමාලපනං

ආලපන යනු ඉදිරියේ සිටින කෙනෙකුට ඇමතීම යි. ආමන්ත්‍රණවාචී පද ආලපන විභක්තියෙන් යෙදේ.

හෙ පුත්ත, **ඉහාගච්ඡ.** (පින්වත් පුත්‍රය, මෙහි එන්න)
අනුජානාමි භික්ඛවෙ, වස්සං උපගන්තුං (මහණෙනි, වස් එළඹෙන්නට අනුදනිමි)

දුතියා විභක්තිය - කම්මත්‍ථෙ දුතියා

දුතියා විභක්තිය කර්මාර්ථයේ යෙදේ. කර්තෘගේ ක්‍රියාවට යටත් වන්නේ කර්මය යි. යමක් කරයි ද එය කර්මය යි.

කුමාරො භත්තං භුඤ්ජති. (කුමාරයා බත් අනුභව කරයි)
සාමණෙරො ලෙඛනං ලිඛති. (සාමණේරයන් වහන්සේ ලියුමක් ලියති)

තතියා විභක්තිය - කත්තරි ච

කර්තෘ අර්ථය සඳහා තතියා විභක්තිය යෙදේ. ක්‍රියාව කරන්නා කර්තෘ නම් වේ. එය උක්ත කර්තෘ, අනුක්ත කර්තෘ යයි දෙපරිදි වේ. ඉන් අනුක්ත කර්තෘ පදය තතියාවෙන් සිටී. කර්තෘ අනුක්ත වන්නේ කර්මකාරක හා භාවකාරක ආඛ්‍යාත යෝගයේ දී ය. විසින් යන අර්ථය ලැබෙනුයේ මෙම විභක්තිය යෙදීමෙනි.

සූදෙන ඔදනෝ පචචතෙ. (**අරක්කැමියා විසින්** බත් පිසනු ලැබේ) **(කර්මකාරක)**
තුමෙහහි කතතබබං කුසලං. (**නුඹලා විසින්** කුසල් කළ යුතු ය) **(භාවකාරක)**

කරණ විභක්තිය - කරණෙ තතියා - යෙන වා කයිරතෙ තං කරණං

කරණයේ දී තතියා විභක්තිය වෙයි. යමකින් කරණු ලැබේ ද එය කරණය යි. ක්‍රියාව සිදු කිරීම සඳහා කර්තෘහට අතිශයින් උපකාර වනුයේ කරණය යි. යමක් කිරීමට උපකාර වන්නේ කරණය යි. පොරෝ කරණකොට ගෙන ගස කපයි, නැතහොත් **පොරොවෙන්** ගස කපයි. (**එරසුනා** රුකඛං ජිඤති) යන නිදසුනෙන් කරණ විභක්තියේ භාවිතය තේරුම් ගන්න.

සො පාදෙන කඤුකං පහරති. (ඔහු **පයින්** බෝලයට ගසයි)
සුනඛො මුඛෙන ඩසති. (බල්ලා **කටින්** හපයි)

චතුත්‍ථී විභක්තිය - සම්පදානෙ චතුත්‍ථී

සම්ප්‍රදානාර්ථයේ චතුත්‍ථී විභක්තිය වේ. කර්තෘ පූජා බුද්ධියෙන් හෝ අනුග්‍රහ බුද්ධියෙන් යමෙකුට දීමට කැමති වේ ද, දීමට රුචි වේ ද යමක් දරා ද මෙම දීම්, දැරීම්, හෝ රුචි කිරීම් ලබන්නා සම්ප්‍රදාන හෙවත් චතුත්‍ථී විභක්තියෙන් යෙදේ. **ට, හට, පිණිස, සඳහා** යන අරුත් ලැබෙනුයේ මෙම විභක්තිය යෙදීමෙනි.

උපාසකො සංඝස්ස චීවරං දදාති. (උපාසක තෙමේ **සංඝයාට** සිවුර දෙයි)
සමණස්ස සචචං රොචතෙ. (**ශ්‍රමණයාට** සත්‍යය රුචි වේ)

පඤ්චමී විභක්තිය - අපාදානෙ පඤ්චමී

අපාදාන අර්ථයේ පඤ්චමී විභක්තිය යෙදේ. යමකු කෙරෙන් ඉවත් වේ ද, බිය වේ ද, ගන්නේ වේ ද, කර්තෘගේ පහවීම් ආදියට නිමිති වූ දේ පඤ්චමී විභක්තියෙන් යෙදේ. **කෙරෙන්, ගෙන්** යන අරුත් ලැබෙනුයේ මෙම විභක්තිය යෙදීමෙනි.

සුනඛා ගාමා අපෙනති. (බල්ලෝ **ගමින්** පිට වෙත්)
මනුස්සා චොරා භායනති. (මිනිස්සු **සොරා කෙරෙන්** බිය වෙත්)
සිස්සො උපජ්ඣායා සිකඛං ගණ්හාති. (ශිෂ්‍යයා **ගුරුවරයා කෙරෙන්** ශික්ෂාව ගනියි)

ඡටඨී විභක්තිය - සාමිඅත්ථං ඡටඨී

ස්වාමි අර්ථයේ ඡට්ඨී විභක්තිය යෙදේ. යමෙකුගේ අයිතියක් වේ ද, එය සාමි නම් වේ. යමෙකු හෝ යමකට අයත්ය, **ගේ** (මගේ, ඔහුගේ) යන අර්ථය ප්‍රකාශ කිරීම සඳහා මෙය භාවිත වේ.

භික්ඛුනො චීවරං	(භික්ෂුවගේ සිවුර)
නරානං ඉස්සරො	(මිනිසුන්ගේ අධිපතියා)
රුක්ඛස්ස සාඛා	(ගසේ අත්ත)

සත්තමී විභක්තිය - ඔකාසෙ සත්තමී

සත්තමී විභක්තිය අවකාශ හෝ ආධාරාර්ථයේ යෙදේ. යම් ක්‍රියා සිද්ධියක පැවැත්මට යමක්, යමෙක්, දෙයක් හෝ තැනක් හෝ ආධාර වේ ද එය සත්තමී විභක්තියෙන් තබනු ලැබේ.

රාජා ආසනෙ නිසීදති.	(රජ තෙමේ අසුනෙහි හිඳියි)
දාරකො මඤ්ඤව සෙති.	(දරුවා ඇඳෙහි නිදයි)
මාතා පුත්තෙසු පසීදති.	(මව දරුවන් කෙරෙහි පහදී)

සර්වනාම හා සංඛ්‍යානාම

පොදුවේ යෙදිය හැකි නාම සර්වනාම නම් වේ. මේවා ලිංගත්‍රයේ වරනැගිය හැකිය. සර්වනාම ශබ්ද සමූහයක් බාලාවතාරයේ දැක්වේ.

> **සබ්බ, කතර, කතම, උභය, ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, පුබ්බ, පර, දක්ඛිණ, උත්තර, එක, ය, ත, එත, ඉම, අමු, කිං, තුම්හ, අම්හ ඉති සබ්බනාමානි** යනුවෙනි.

සර්වනාම වෙනත් නාමයක් වෙනුවට භාවිත කරනු ලැබේ.
නිදසුන: සොමපාලො පරිවෙණං ගච්ඡති. **සො** තත්ථ ගන්ත්වා සිප්පං උග්ගණ්හාති
තවද සර්වනාම ශබ්ද විශේෂණ පද ලෙස ද භාවිත වේ.

- අථ ඛො **තෙසං භික්ඛූනං** එතදහොසි.
  (ඉක්බිති ඒ භික්ෂූන් වහන්සේලාට මෙබඳු අදහසක් විය)

- නමො **තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**
  (ඒ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරය වේවා)

- පරිනිබ්බුතො **සො භගවා** පරිනිබ්බාණාය ධම්මං දෙසෙති.
  (පිරිනිවියා වූ ඒ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීම උදෙසා ධර්මය දේශනා කරන සේක)

සංඛ්‍යා නාම

එක, දුවි, තී, චතු, පඤ්ච, ඡ, සත්ත, අට්ඨ, නව, දස, ආදි ශබ්ද සංඛ්‍යා වාචක නාම යි.

පහත වගුවෙන් දැක්වෙනුයේ ඒ ඒ සංඛ්‍යානාමය අයත් වන ලිංගය හා වරනැගෙන වචනයයි. එය ✓ ලකුණෙන් දක්වා ඇත.

සංඛ්‍යානාමය	පුල්ලිංග	ඉත්ථිලිංග	නපුංසකලිංග	බහුවචන	ඒකවචන	බහුවචන
එක	✓	✓	✓	-	✓	-
දුවි	-	-	-	✓	-	✓
තී	✓	✓	✓	-	-	✓
චතු	✓	✓	✓	-	-	✓
පඤ්ච	-	-	-	✓	-	✓
ඡ සිට අට්ඨාරස තෙක්	-	-	-	✓	-	✓
එකූනවීසති පටන් අට්ඨනවුති තෙක්	-	✓			✓	-
එකූනසත පටන් ලකඛ තෙක්	-	-	✓	-	✓	-
කොටි	-	✓	-	-	✓	-

සංඛ්‍යානාම වරනැගීමේ ප්‍රභේද කීපයකි.

'එක' ශබ්දය සංඛ්‍යා අර්ථයේ දී ලිංගත්‍රයේ ම ඒකවචනයහි පමණක් වරනැගේ.

විභක්ති	පුල්ලිංග	ඉත්ථිලිංග	නපුංසකලිංග
පඨමා	එකො	එකා	එකං
දුතිය	එකං	එකං	එකං
තතියා	එකෙන	එකාය	එකෙන
චතුත්ථී	එකස්ස	එකිස්සා/එකිස්සාය/එකාය	එකස්ස
පඤ්චමී	එකමහා/එකස්මා	එකාය	එකමහා/එකස්මා
ඡට්ඨී	එකස්ස	එකිස්සා/එකිස්සාය/එකාය	එකස්ස
සත්තමී	එකමහි/එකස්මිං	එකිස්සං/එකස්සං/එකායං	එකමහි/එකස්මිං

- සංඛ්‍යාවාචී 'දුවි' ශබ්දය ලිංගත්‍රයෙහි බහු වචනයෙහි පමණක් වරනැගේ.

විභක්ති	ලිංගත්‍රයෙහි සමානය
පඨමා	දෙව / දුවෙ
දුතියා	දෙව / දුවෙ
තතියා	දුවීහි/දුවීහි
චතුත්ථී	දුවිනනං/දුවිනනං
පඤ්චමී	දුවීහි/දුවීහි
ඡට්ඨී	දුවිනනං/දුවිනනං
සත්තමී	දුවීසු

- ති, චතු ශබ්දයන් ලිංගත්‍රයෙහි බහු වචනයෙහි පමණක් වරනැගේ.

විභක්ති	පුලලිංග	ඉත්ථිලිංග	නපුංසක ලිංග
පඨමා	තයො	තිසෙසා	තීණි
දුතියා	තයො	තිසෙසා	තීණි
තතියා	තීහි/තීහි	තීහි/තීහි	තීහි/තීහි
චතුත්ථී	තිණණං/තිණණනනං	තිසසනනං	තිණණං/තිණණනනං
පඤ්චමී	තීහි/තීහි	තීහි/තීහි	තීහි/තීහි
ඡට්ඨී	තිණණං/තිණණනනං	තිසසනනං	තිණණං/තිණණනනං
සත්තමී	තීසු	තීසු	තීසු

විභක්ති	පුල්ලිංග	ඉත්ථිලිංග	නපුංසක ලිංග
පඨමා	චත්තාරො/චතුරො	චතසෙසා	චත්තාරි
දුතියා	චත්තාරො/චතුරො	චතසෙසා	චත්තාරි
තතියා	චතූහි/චතූහි	චතූහි/චතූහි	චතූහි/චතූහි
චතුත්ථී	චතූනනං	චතසසනනං	චතූනනං
පඤ්චමී	චතූහි/චතූහි	චතූහි/චතූහි	චතූහි/චතූහි
ඡට්ඨී	චතූනනං	චතසසනනං	චතූනනං
සත්තමී	චතූසු	චතූසු	චතූසු

- **පඤ්ච** ශබ්දයේ සිට **අට්ඨාරස** ශබ්දය තෙක් ඇති ශබ්ද ලිංගත්‍රයෙහි බහු වචනයෙහි පමණක් වරනැගේ.

විභක්ති	ලිංගත්‍රයෙහි සමානය
පඨමා	පඤ්ච
දුතියා	පඤ්ච
තතියා	පඤ්චහි
චතුත්ථී	පඤ්චන්නං
පඤ්චමී	පඤ්චහි
ඡට්ඨී	පඤ්චන්නං
සත්තමී	පඤ්චසු

- **එකූනවීසති** ශබ්දයේ සිට **අට්ඨනවුති** ශබ්දය තෙක් ඇති ශබ්ද ඉත්ථිලිංගයේ ඒක වචනයෙහි පමණක් වරනැගේ.

විභක්ති	ඉත්ථිලිංග
පඨමා	එකූනවීසති
දුතියා	එකූනවීසතිං
තතියා	එකූනවීසතියා
චතුත්ථී	එකූනවීසතියා
පඤ්චමී	එකූනවීසතියා
ඡට්ඨී	එකූනවීසතියා
සත්තමී	එකූනවීසතියං

- **එකූනසත** ශබ්දයේ සිට **සතසහස්ස** ශබ්දය තෙක් ඇති ශබ්ද නපුංසකලිංග ඒක වචනයෙහි පමණක් වරනැගේ. එකූනසත ශබ්දය පහත වගුවෙන් දක්වා ඇත.

විභක්ති	ඉත්ථිලිංග
පඨමා	එකූනසතං
දුතියා	එකූනසතං
තතියා	එකූනසතෙන
චතුත්ථී	එකූනසතස්ස
පඤ්චමී	එකූනසතා/ එකූනසතමහා/ එකූනසතසමා
ඡට්ඨී	එකූනසතස්ස
සත්තමී	එකූනසතෙ/ එකූනසතමහි/ එකූනසතසමිං

සංඛ්‍යා ශබ්දයන්ගෙන් කොටසක් පහත දක්වා ඇත.

01	එක
02	දෙ
03	ති
04	චතු
05	පඤ්ච
06	ඡ
07	සත්ත
08	අට්ඨ
09	නව
10	දස
11	එකාදස
12	දොඩස - බාරස
13	තෙරස - තෙළස
14	චුද්දස - චතුද්දස -ඔද්දස
15	පඤ්චදස - පණ්ණරස
16	සොළස - සොරස
17	සත්තදස - සත්තරස
18	අට්ඨාදස - අට්ඨාරස
19	එකූනවීසති
20	වීසති - වීස
21	එකවීසති
22	දෙවීසති - දොවීසති -බාවීසති
23	තෙවීසති - තෙවීස
24	චතුවීසති
25	පඤ්චවීසති
26	ඡබ්බීසති
27	සත්තවීසති
28	අට්ඨවීසති
29	එකූනතිංසති
30	තිංසති

31	එකතිංසති
32	දවත්තිංසති
33	තෙත්තිංසති
34	චතුත්තිංසති
35	පඤ්චතිංසති
36	ඡත්තිංසති
37	සත්තතිංසති
38	අට්ඨතිංසති
39	එකූනචත්තාළීසති
40	චත්තාළීසති
41	එකචත්තාළීසති
42	දවිචත්තාළීසති
43	තිචත්තාළීසති
44	චතුචත්තාළීසති
45	පඤ්චචත්තාළීසති
46	ඡචත්තාළීසති
47	සත්තචත්තාළීසති
48	අට්ඨචත්තාළීසති
49	එකූනපඤ්ඤාසති
50	පඤ්ඤාසති
51	එකපඤ්ඤාසති
52	දවිපඤ්ඤාසති
53	තිපඤ්ඤාසති
54	චතුපඤ්ඤාසති
55	පඤ්චපඤ්ඤාසති
56	ඡපඤ්ඤාසති
57	සත්තපඤ්ඤාසති
58	අට්ඨපඤ්ඤාසති
59	එකූනසට්ඨි
60	සට්ඨි

61	එකසට්ඨි
62	දවිසට්ඨි
63	තිසට්ඨි
64	චතුසට්ඨි
65	පඤ්චසට්ඨි
66	ඡසට්ඨි
67	සත්තසට්ඨි
68	අට්ඨසට්ඨි
69	එකූනසත්තති
70	සත්තති
71	එකසත්තති
72	දවිසත්තති
73	තිසත්තති
74	චතුසත්තති
75	පඤ්චසත්තති
76	ඡසත්තති
77	සත්තසත්තති
78	අට්ඨසත්තති
79	එකූනාසීති
80	අසීති
81	එකාසීති
82	දවාසීති
83	තෘාසීති
84	චතුරාසීති

85	පඤ්චාසීති
86	ඡාසීති
87	සත්තාසීති
88	අට්ඨාසීති
89	එකූනනවුති
90	නවුති
91	එකනවුති
92	දෙනවුති
93	තිනවුති
94	චතුනවුති
95	පඤ්චනවුති
96	ඡනවුති / ඡන්නවුති
97	සත්තනවුති
98	අට්ඨනවුති
99	එකූනසතං
100	සතං
200	දවිසතං
300	තිසතං
400	චතුසතං
500	පඤ්චසතං
1000	සහස්සං
100,000	සතසහස්සං - ලක්ඛං
10,000,0000	දසකොටි

සංඛ්‍යා ශබ්දයන් වාක්‍යයන්හි යෙදෙන අයුරු පහත දැක්වේ.

i. දසසු පුරිසෙසු පඨමො ඒකො භවති.
(පුරුෂයන් දස දෙනාගෙන් පළමු වැන්නා දක්ෂයෙක් වෙයි)

ii. අක්ඛරාපාදයො එකචත්තාළිසං හොන්ති.
(අ ආදි අකුරු හතළිස් එකක් වේ)

iii. භගවා චත්තාරි අරියසච්චානි පකාසෙසි.
(භාග්‍යවතුන් වහන්සේ චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කළ සේක)

අභ්‍යාස

පහත වගුව සම්පූර්ණ කරන්න.

නාමය	චතුත්‍ථී විභක්ති ඒකවචන		පංචමී විභක්ති ඒකවචන		ඡට්ඨී විභක්ති ඒකවචන	
	පාලි පදය	සිංහල අර්ථය	පාලි පදය	සිංහල අර්ථය	පාලි පදය	සිංහල අර්ථය
වානර						
කවි						
වනිතා						
රුක්ඛ						
අග්ගි						
ජම්බු						
ගො						
ඵල						
ඉම						

2. පහත දැක්වෙන පාලි වාක්‍යයන්හි හිස්තැන්වලට සුදුසු සංඛ්‍යා ශබ්දයන් වරහන් තුළින් තෝරා යොදන්න.
(දසහි, අසීති, දවත්තිංස, සහස්සං, තිස්සො)

i. භගවතො ..... මහාපුරිසලක්ඛණා හොන්ති.
ii. තස්ස කායෙ ..... අනුබ්‍යඤ්ජනානි දිස්සන්ති.
iii. ..... ඉමා භික්ඛවෙ ධාතුයො.
iv. සො ..... මානුසෙ සංග්‍රාමෙ ජිනාති.
v. ..... අඞ්ගෙහි සමන්නාගතො අරහාති වුච්චති.

3. සිංහලට නගන්න.

i. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං.
ii. තීණිමානි භික්ඛවෙ අකුසලමූලානි.
iii. යත්‍ථ සීලවන්තා භික්ඛවො වසන්ති තත්‍ථ මනුස්සා සප්පුරිසා හොන්ති.
iv. භගවා පඨමං වස්සං බාරාණසියං ඉසිපතනාරාමෙ විහරි.
v. මාතා දස අම්බානි කිණිත්වා ධීතරානං දදිස්සති.

4. පාලියට නගන්න.

i. රජතුමා බුදුරජාණන් වහන්සේ දකියි.
ii. වෙළෙන්දෝ ගොවීන් සමග ගස් කපති.
iii. මසුන් මරන්නෝ කරත්තවලින් ගමට මාළු ගෙනෙත්.
iv. මාගේ සහෝදරයා මිත්‍රයන් දෙදෙනෙකු සමග අනුරාධපුරයට ගියේ ය.
v. මහණෙනි, පැවිද්දා විසින් සේවනය නොකළ යුතු අන්ත දෙකකි.

5. සුදුසු සර්වනාම පද යොදා වාක්‍ය සම්පූර්ණ කර තේරුම ද ලියන්න.

(කො, යො, සො, සා, අහං, සබ්බං, තෙ)

i. ..... ගාවං න විජානාති ..... ගොගණං න රක්ඛති.
ii. ..... කිර එකදිවසං චින්තෙසි ..... අපි පබ්බජිස්සාමි.
iii. ..... අන්ධවනං අජ්ඣාගහෙසුං.
iv. වාණිජෝ ..... ධනං යාචකානං දත්වා අඤ්ඤං රට්ඨං අගමි.
v. ..... නදියා වාපියා ච අන්තරා ධෙනුං හරන්ති?

තතියො පාඨො

අකෙඛාසමෙව අලත්ථ.

අථ ඛො ආයසමා රට්ඨපාලො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදකඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන ථුල්ලකොට්ඨිතං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන ථුල්ලකොට්ඨිතං තදවසරි. තත්‍ර සුදං ආයසමා රට්ඨපාලො ථුල්ලකොට්ඨිතෙ විහරති රඤ්ඤා කොරව්‍යස්ස මිගාචීරෙ. අථ ඛො ආයසමා රට්ඨපාලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ථුල්ලකොට්ඨිතං පිණ්ඩාය පාවිසි. ථුල්ලකොට්ඨිතෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන සකපිතුනිවෙසනං තෙනුපසංකමි. තෙන ඛො පන සමයෙන ආයසමතො රට්ඨපාලස්ස පිතා මජ්ඣිමාය දවාරසාලාය උල්ලිඛාපෙති. අද්දසා ඛො ආයසමතො රට්ඨපාලස්ස පිතා ආයසමන්තං රට්ඨපාලං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන එතදවොච. "ඉමෙහි මුණ්ඩකෙහි සමණකෙහි අමහාකං එකපුත්තකො පියො මනාපො පබ්බජිතො"ති. අථ ඛො ආයසමා රට්ඨපාලො සකපිතුනිවෙසනෙ නෙව දානං අලත්ථ, න පවචකඛානං, අඤ්ඤදත්ථු අකෙඛාසමෙව අලත්ථ. තෙන ඛො පන සමයෙන ආයසමතො රට්ඨපාලස්ස ඤාතිදාසී ආභිදොසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමා හොති. අථ ඛො ආයසමා රට්ඨපාලො තං ඤාතිදාසිං එතදවොච. "සචෙ තං භගිනි, ඡඩ්ඩනීයධම්මං ඉධ මෙ පත්තෙ ආකිර' ති.

(රට්ඨපාල සුත්ත - මජ්ඣිමනිකාය)

පදමාලාව

උට්ඨායාසනා	(සං)	-	අසුනෙන් නැගිට
පදකඛිණං	(නා)	-	පැදකුණු
සංසාමෙත්වා	(පූ.ක්‍රි)	-	තැන්පත් කොට තබා/ සකසා තබා
ථුල්ලකොට්ඨිතං	(ස)	-	ථුල්ලකොට්ඨිත නම් නගරය
පක්කාමි	(ක්‍රි)	-	ගියේ ය
අනුපුබ්බෙන	(ස)	-	පිළිවෙළින්
චරමානො	(කි)	-	හැසිරෙන්නේ
තදවසරි	(සං)	-	එතැනට පැමිණියේ ය
තත්‍ර සුදං	(නි)	-	එහි දී
කොරව්‍යස්ස	(ත)	-	කොරව්‍ය ගේ
මිගාචීරෙ	(ස)	-	මිගාචීරයෙහි
සපදානං	(ස)	-	ගෙපිළිවෙළින්
සකපිතුනිවෙසනං	(ස)	-	තම පියාගේ නිවසට
මජ්ඣිමාය	(නා)	-	මැද
දවාරසාලාය	(ස)	-	ගෙහි සාලයෙහි
උල්ලිඛාපෙති	(ක්‍රි)	-	කොණ්ඩය පීරවයි
අද්දසා	(ක්‍රි)	-	දුටුවේ ය

දූරතොව	(සං)	-	දුර දී ම
මුණ්ඩකෙහි සමණකෙහි	(ත)	-	හිස මුඩු කරන ලද ශ්‍රමණයන් විසින්
අලත්ථ	(ක්‍රි)	-	ලැබුවේ ය.
පචවකඛානං	(සං)	-	එපා යැයි කීම
ඒකන්තදත්ථු	(නි)	-	ඒකාන්තයෙන්
අකෙකාසමෙව	(සං)	-	බැනුම් ම
ආභිදොසිකං	(නා)	-	පිළිණු වූ
කුමමාසං	(නා)	-	පිට්ටු
ඡඩෙඩතුකාමා	(කි)	-	බැහැර කරනු කැමැත්තේ
ආකිර	(ක්‍රි)	-	දමන්න

අභ්‍යාස

1. 'අකෙකාසමෙව අලත්ථ' ඡේදය සිංහලට නගන්න.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. ආයසමා රට්ඨපාලො කුහිං චාරිකං පකකාමි?
ii. රඤඤා කොරව්‍යසස මිගාචීරෙ කො වසති?
iii. ආයසමා රට්ඨපාලො කතරසමිං කාලෙ පිණඩාය චරි?
iv. ථෙරසස පිතා කසමා අකෙකාසි?
v. සො ථෙරො තං ඤාතිදාසිං කිං කථෙසි?

3. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. රට්ඨපාල රහතන් වහන්සේගේ ගම කුමක් ද?
ii. කොරව්‍ය රජුගේ උයනේ නම කුමක් ද?
iii. රට්ඨපාල හිමියන් දුටු පියතුමා පැවසුවේ කුමක් ද?
iv. රට්ඨපාල රහතන් වහන්සේට තම ගෙදරින් නොලැබුණේ මොනවා ද?
v. "ආභිදොසිකං කුමමාසං" යන්න විස්තර කරන්න.

කාරක

හැඳින්වීම

කරොති කිරියං නිපඵාදෙතීති කාරකං, කිරියානිපඵත්තිනිමිත්තනන්‍යතෝ.

ක්‍රියා නිෂ්පත්තියට නිමිති වීමෙන් ක්‍රියාව නිපදවනුයේ **'කාරක'** නම් වේ. ක්‍රියා නිෂ්පත්තියේ දී ප්‍රධාන වශයෙන් කාරක වන්නේ කර්තෘ ය. අනෙකුත් කාරක අප්‍රධාන වශයෙන් කාරක වන අතර ඒවා ක්‍රියා නිෂ්පත්තියට නිමිත්ත වේ. පාලි භාෂාවේ කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අපාදාන, ආධාර යනුවෙන් කාරක හයක් දැක්වේ.

කත්තුකරණං ච කම්මං - සම්පදානමථාපරං,
අපාදානඤ්ච ඔකාසං - කාරකං ඡබ්බිධං මතං.

(බාලාවතාරය)

ෂට්ඨී විභක්තිය හා ආලපන විභක්තිය ක්‍රියාසිද්ධියට උපකාර නොවන නිසා කාරක නොවේ. ඒ ඒ විභක්ති මගින් කාරකාර්ථ හෙවත් ක්‍රියාව හා සම්බන්ධ වීම ප්‍රකාශ කෙරෙන අයුරු පහත දැක්වේ.

විභක්ති	කාරක අර්ථය	සූත්‍රය	උදාහරණ
දුතියා	කර්මාර්ථය	කම්මත්ථේ දුතියා	පුරිසෝ **රුක්ඛං** ඡින්දති.
තතියා	කර්තෘ අර්ථය	කත්තරි තතියා	බුද්ධෙන **ධම්මෝ** දෙසිතෝ.
කරණ	කරණාර්ථය	කරණෙ තතියා	සෝ **සකටෙන** ගච්ඡති.
චතුත්ථී	සම්ප්‍රදානාර්ථය	සම්පදානෙ චතුත්ථී	කඤ්ඤා **යාචකස්ස** හත්ථං දෙති.
පඤ්චමී	අපාදානාර්ථය	අපාදානෙ පඤ්චමී	**රුක්ඛමහා** ඵලං පතති.
සත්තමී	ආධාරාර්ථය	ඔකාසෙ සත්තමී	භූපාලෝ **පීඨෙ** නිසීදති.

උපපද විභක්ති

කිසියම් පදයක් කාරකාර්ථය හැර සමීපව සිටි නිපාත, උපසර්ග, ධාතු ආදි අන්‍ය පදයක් නිසා වෙනත් විභක්ති ස්වරූපයක් ගනී නම් ඒ **'උපපද විභක්ති'** නම් වේ. පාලියෙහි ඇති සාම්ප්‍රදායික වාක් ප්‍රයෝග තේරුම් ගැනීමටත් නිවැරදි හා අර්ථවත්ව වාක්‍ය නිර්මාණයටත් කාරක හා උපපද විභක්ති ඉගෙනීම ප්‍රයෝජනවත් වේ.

නිපාත යෝගය - **පිතා පුත්තේන සහ** ගච්ඡති. (පියා පුතා සමග යයි)
උපසර්ග යෝගය - **භික්ඛු** ගාමං **උපවසති.** (භික්ෂුව ගමේ වෙසේ)
ධාතු යෝගය - **පිතා පුත්තං** මුදධනි චුම්බිත්වා **පාඨාලයං පෙසෙසි.**
(පියා පුතාගේ මුදුන සිඹ පාසලට යැවීය)

දුතියා විභක්තිය

කම්මත්ථේ දුතියා - යං කරොති තං කම්මං

දුතියා විභක්තිය කර්මාර්ථයේ යෙදේ. කර්තෘගේ ක්‍රියාවට යටත් වන්නේ කර්මය යි. යමක් කරයි ද එය කර්මය යි. දුතියා විභක්තිය යෙදෙන කර්මාර්ථ ප්‍රභේද සතරක් බාලාවතාරයෙහි විස්තර කොට තිබේ.

ඉච්ඡිත කම්ම

කර්තෘගේ කැමැත්තෙන් සිදුකරන කර්ම ඉච්ඡිත කර්ම වේ.

කුමාරො බුද්ධං වන්දති (කුමාරයා බුදුන් වඳියි)
උපාසකො සීලං රක්ඛති (උපාසකයා සිල් රකියි)

අනිච්ඡිත කම්ම

කර්තෘගේ අකැමැත්තෙන් සිදුකරන කර්ම අනිච්ඡිත කර්ම වේ.

දහරො කණ්ඨකං මද්දති. (දරුවා කටුව පාගයි)
කඤ්ඤා විසං ගිලති. (කන්‍යාව විෂ ගිලියි)

ඉච්ඡිතානිච්ඡිත කම්ම

කර්තෘගේ කැමැත්තක් හෝ අකැමැත්තක් නැතිව ඉබේම සිදුවන කර්මය ඉච්ඡිතානිච්ඡිත කර්මය නම් වේ.

වාණිජො ගාමං ගච්ඡන්තො රුක්ඛමූලං උපසඞ්කමති.
(වෙළෙන්දා ගමට යන්නේ ගසක් මුලට පැමිණෙයි.)
බාලකො ගෙහං ධාවන්තො සුසානභූමිං දිස්සති.
(ළමයා ගෙදරට දුවන්නේ සුසාන භූමියක් දකියි.)

අකථිත කම්ම

ක්‍රියාවෙන් නොකියවෙන කර්ම පදය අකථිත කර්ම නම් වේ. මෙය ද්විකර්මක ධාතු යෝගයේ දී දැක ගත හැකිය. ද්විකර්මක ධාතු නම්, ✓දුහ, ✓යාච, ✓රුධි, ✓පුච්ඡ, ✓භික්ඛ, ✓සාසු, ✓වච, ආදිය වේ.

යාචකො **සෙට්ඨිං** ධනං යාචති.
පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම **ගොතමං**

දුතියා විභක්ති කාරක ප්‍රයෝග

අච්චන්ත සංයෝගය

කාල, මාර්ග ආදි ප්‍රමාණ වාචක පද ද්‍රව්‍ය, ගුණ, ක්‍රියාවාචි පද සමඟ ඇතිවන අත්‍යන්ත සම්බන්ධය අත්‍යන්ත සංයෝගයයි. අත්‍යන්ත සංයෝගයේ දී කාලවාචී පද හා මාර්ගවාචී පද දුතියා විභක්තියෙන් සිටී.

නිද : ථෙරො **තෙමාසං** පරිත්තං භණති.
යොජනං වනරාජි භවති.

කර්මප්‍රවචනීයාර්ථය

වෙනත් විභක්තියකින් තිබිය යුතු පදය කර්මයක් බවට පත් කොට කීම කර්මප්‍රවචනීයාර්ථයයි. එනම් **අනු, පති, අධි, උප, අන්තරා, සමන්තා** ආදි උපසර්ග, නිපාතයන් හා බැඳෙන පද කර්මප්‍රවචනීය වෙයි.

එකං සමයං භගවා අන්තරා ච **රාජගහං අන්තරා ච නාලන්දං** අද්ධානමග්ගං
පටිපන්නො හොති.
භගවා **නෙරංජරං පති** විහරති.
සො අහම්පි ගම්ස්සාමි **නගරං මිථිලං පති.**
තං ඛො පන **භගවන්තං ගොතමං** කල්‍යාණො කිත්තිසද්දො **අබ්භුග්ගතො.**
උපමා **මං** පටිභාති.

ක්‍රියා විශේෂණය දුතියා විභක්තියෙන් තබනු ලැබේ.

සුඛං සුපති **සුඛං** පටිබුජ්ඣති.
දුක්ඛං සෙති පරාජිතො.
උපසන්තො **සුඛං** සෙති.
අස්සො **සීඝං** ධාවති.

කාලවාචී පද දුතියා විභක්ති ගනී.

අථ ඛො ආයස්මා රට්ඨපාලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ථුල්ලකොට්ඨිතං පිණ්ඩාය පාවිසි.
(ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල භික්ෂුතෙම පෙරවරු කාලයේ හැඳ පාසිවුරු ගෙන පිඬු පිණිස ථුල්ලකොට්ඨිතයට පිවිසියේ ය)
සො එකදිවසං වනං පාවිසි. (හෙතෙම එක්දිනක් වනයට පිවිසියේ ය)

තතියා විභක්තිය (කත්තරී ච)

තතියා විභක්තියෙන් කර්තෘ අර්ථය පැවසේ. අනුක්ත කර්තෘ පදය තතියාවෙන් යෙදේ. කර්තෘ අනුක්ත වන්නේ කර්මකාරක හා භාවකාරක වාක්‍යය වලදී ය.

■ **අනුක්ත කර්තෘ**

අනුක්ත කර්තෘ පදය තතියාවෙන් සිටී.

සූදෙන ඔදනො පච්චතෙ. (අරක්කැමියා විසින් බත් පිසනු ලැබේ)
බුද්ධෙන ධම්මො දෙසිතො (බුදුරදුන් විසින් ධර්මය දෙසන ලදී)

■ **ප්‍රයෝජ්‍ය කර්තෘ (හෙත්වත්ථෙ ච)**

ප්‍රයෝජ්‍ය කර්තෘ පදය තතියා විභක්තියෙන් ද සිටියි. අනුන්ගේ මෙහෙයවීමෙන් ක්‍රියාව කරන්නා ප්‍රයෝජ්‍ය කර්තෘ නම් වේ.

සාමි දාසෙන කම්මං කාරෙති. (ස්වාමි තෙමේ දාසයා ලවා වැඩ කරවයි)
සාමණෙරො බාලකෙන ථෙරං පඤ්හං පුච්ඡාපෙති.
(සාමණේර තෙම ළමයා ලවා තෙරුන්ගෙන් ප්‍රශ්න අස්වයි)

■ **කිච්ච ප්‍රත්‍යයාන්ත හා යෙදුණු කර්තෘ**

කිච්ච ප්‍රත්‍යාන්ත හා යෙදුණු කර්තෘ පදය ද කර්මකාරක හා භාවකාරකයන්හි වන නිසා තතියාවෙන් යෙදේ.

පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.
(පැවිදි වූවහු විසින් නිතර ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු ය)
කරණීයං අත්ථකුසලෙන (දියුණුවේ දක්ෂයා විසින් කළ යුතු ය)

තතියා විභක්ති කාරක ප්‍රයෝග

■ **ක්‍රියාපවර්ගාර්ථය**

ක්‍රියාපවර්ගාර්ථය තතියා විභක්තියෙන් යෙදේ. ක්‍රියාවක් නිමවීමට ගතවන කාලය ක්‍රියාපවර්ගාර්ථය නම් වේ.

ථෙරා **නවහි මාසෙහි** සංගීතිං අකංසු.
(තෙරුන්වහන්සේලා **මාස නවයකින්** සංගායනාව කළහ)
නරිස්සරො **තීහි වස්සෙහි** විහාරං නිට්ඨාපෙසි.
(රජතෙමේ **වසර තුනකින්** විහාරය නිමකරවීය)

■ **අංගවිකාර අවයවාර්ථය**

යම් ශරීර අවයවයක රෝගී ස්වභාවයක් පෙනේ නම් ඒ විකල අවයවවාචී පදය තතියා විභක්තියෙන් සිටියි.

- සො **අක්ඛිණා** කාණො (ඔහු **ඇසකින්** කණෙකි)
- සො **පාදෙන** ඛඤ්ඤා (ඔහු **පයින්** කොර ය)
- සො **සොතෙන** බධිරො (ඔහු **කනෙන්** බිහිරි ය)

■ **කාලාර්ථය**

කාලාර්ථයෙහි තතියා විභක්තිය යෙදේ.

කාලෙන ධම්මසවණං - එතං මංගලමුත්තමං
(**සුදුසු කාලයේ** දහම් ඇසීම යන මෙය මංගල කරුණකි)
තෙන සමයෙන භගවා විහාරං පාවිසි.
(**එසමයෙහි** භාග්‍යවතුන් වහන්සේ විහාරයට වැඩි සේක)

■ **සහාදි යෝගය**

සහ, සද්ධිං, සමං, යන සහාර්ථවත් නිපාත යෝගයේ ද, **විනා, නානා, අඤ්ඤත්‍ර, අලං, කිං** ආදි නිපාත යෝගයේ ද තතියා විභක්තිය වේ.

සහ භණ්ඩකෙන චොරං චූළාය ගණ්හන්තී විය මං විප්පකාරං පාපෙය්‍ය.
(**බඩු සමග** සොරා කෙස්වැටියෙන් අල්වා ගන්නියක් මෙන් මා විකාරයට පමුණු වන්නීය)
පඤ්චසතා භික්ඛූ **තෙන සද්ධිං** මගගං පටිපජ්ජිංසු.
(පන්සියක් භික්ෂූහු **ඔහු සමග** මගට පිළිපන්හ)

යං කරොමසෙ බ්‍රහ්මුණො සමං දෙවෙහි මාරිස තදජ්ජ තුය්හං කරිස්සාම.
(පින්වත දෙවියන් සමග අපි බ්‍රහ්මයාට යම් වැඳීමක් කරමු ද එය අද පින්වතාට කරන්නෙමු)

කරණ විභක්තිය

කරණෙ තතියා - යෙන වා කයිරතෙ තං කරණං

ක්‍රියාව සිදු කිරීම සඳහා කර්තෘහට අතිශයින් උපකාර වනුයේ කරණය යි.

කරණාර්ථයේ ද තතියා විභක්තිය වෙයි. යමකින් ක්‍රියාව කරණු ලැබේ ද එය කරණය යි.

නෙත්තෙහි චන්දං ඉක්ඛතෙ.	(ඇස්වලින් සඳ බලනු ලබයි)
හත්ථෙන අඞ්ගුලිං මද්දතෙ	(අතින් ඇඟිලි මඩිනු ලබයි)
දාත්තෙන වීහිං ලුනාති.	(දැකැත්තෙන් ගොයම් කපයි)

චතුත්ථී විභක්තිය (සම්පදානෙ චතුත්ථී)

සම්ප්‍රදානාර්ථයේ චතුත්ථී විභක්තිය වේ. කර්තෘ පූජා බුද්ධියෙන් හෝ අනුග්‍රහ බුද්ධියෙන් යමෙකුට දීමට කැමති වේ ද, දීමට රුචි වේ ද යමක් දරා ද මෙම දීම්, දැරීම්, හෝ රුචි කිරීම් ලබන්නා දැක්වෙන පදය සම්ප්‍රදාන නම් වේ.

සංඝස්ස චීවරං දදාති.	(සංඝයාට චීවරය දෙයි)
සමණස්ස සච්චං රොචතෙ.	(ශ්‍රමණයාට සත්‍ය රුචි වේ)
යක්ඛස්සදත්තස්ස ඡත්තං ධාරයතෙ.	(යක්ඛදත්තට කුඩය දරනු ලැබේ)

අනිරාකත්තානුමන්තාරාධකං සම්පදානියං
තිධා යථා ජලං දෙති රුක්ඛස්ස භික්ඛුනො'ත්ථිනො

ආරාධක, අනිරාකත්තු, අනුමන්තු යනුවෙන් චතුත්ථී විභක්තිය තෙවදෑරුම් වේ.

■ ආරාධක

යමක් ඉල්ලාගෙන ලබාගන්නා තැනැත්තා ආරාධක නම් වේ.

අත්ථිනො ජලං දෙති. (ආගන්තුකයාට ජලය දෙයි)

■ අනුමනතු

නොඉල්ලා ලැබෙන දේ මැනවැයි පිළිගන්නේ අනුමන්තු නම් වේ.

භික්ඛුනො ජලං දෙති. (භික්ෂුවට ජලය දෙයි)

■ අනිරාකතතු

නොඉල්ලා දෙන ලද දේ යහපතයැයි අනුමත නො කරයි ද, එහෙත් ප්‍රතික්ෂේප ද නො කරයි නම්, එය අනිරාකත්තු නම් වේ.

රුක්ඛස්ස ජලං දෙති. (ගසට ජලය දෙයි)

■ තාදර්ථය

පිණිස, සඳහා යන අර්ථය ප්‍රකාශ කරනුයේ තාදර්ථය නමි. එහිදී චතුත්ථී විභක්තිය භාවිත වේ.

බුද්ධා ලොකානුකම්පාය ධම්මං දෙසෙති
(බුදුරජ ලොවට අනුකම්පා පිණිස ධර්මය දෙසයි)
අහං සීතස්ස පටිඝාතාය චීවරං පටිසෙවාමි
(මම සීතල නැති කිරීම සඳහා සිවුර සේවනය කරමි)

■ නමො, සොත්ථී නිපාත පද සමඟ චතුත්ථී විභක්තිය වේ.

නමො තස්ස භගවතො. (ඒ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා)
සොත්ථී තෙ හොතු සබ්බදා. (සැමදා ඔබට යහපතක් වේවා)

පඤ්චමී විභක්තිය (අපාදානෙ පඤ්චමී)

අපාදාන අර්ථයේ පඤ්චමී විභක්තිය යෙදේ.

යස්මාදපෙති භයමාදත්තෙ වා තදපාදානං.

යමකු කෙරෙන් පහ වේ ද, බිය වේ ද, ගන්නේ වේද, කර්තෘගේ පහවීම ආදියට නිමිති වූ පදය පඤ්චමී විභක්තියෙන් යෙදේ.

ගාමා අපෙනති. (ගමින් පිට වෙත්)
චොරමහා භායනති. (සොරා කෙරෙන් බිය වෙත්)
උපජ්ඣායා සික්ඛං ගණ්හාති. (ගුරුවරයා කෙරෙන් ශික්ෂාව ගනියි)

අපාදානාර්ථයේ ප්‍රභේද දෙකකි.

අචල අපාදානය
චල අපාදානය

■ **අචල අපාදානය**

නොසැලෙන වස්තුවකින් යමක් ඉවත් වේ ද, ඒ අචල අපාදානය යි.

රුක්ඛමහා ඵලං පතති. (**ගසෙන්** ගෙඩිය වැටෙයි)

■ **චල අපාදානය**

සැලෙන වස්තුවකින් යමක් ඉවත් වේ ද, ඒ චල අපාදානය යි.

ධාවතා අස්සා පුරිසෝ පතති. (දුවන්නා වූ **අශ්වයා කෙරෙන්** පුරුෂයා වැටෙයි)

පඤ්චමී විභක්ති ප්‍රයෝග

■ **උපසර්ග යෝගය**

අප, ආ, පරා යන උපසර්ගයන් හා යෝග වූ නාම පඤ්චමී විභක්තියෙන් යෙදේ.

අපසාලාය ආයන්ති වාණිජා (වෙළෙන්දෝ **ශාලාව** හැරයත්)
ආබ්‍රහ්මලෝකා සද්දෝ අබ්භුග්ගච්ඡති. (**බ්‍රහ්මලෝකය දක්වා** ශබ්දය උස්ව නැඟේ)

■ **නිපාත යෝගය**

අඤ්ඤත්‍ර, ආරකා, උද්ධං, අධෝ, රහිතා, රිතෙ, විනා ආදි නිපාත යෝගයේ ඒ හා සම්බන්ධ වන පදය පඤ්චමී විභක්තියෙන් යෙදේ.

උද්ධං පාදතලා අධෝ කෙසමත්ථකා තචපරියන්තං පූරං නානාප්පකාරස්ස අසුචිනෝ පච්චවෙක්ඛති.
අරුණුග්ගමණතෝ පට්ඨාය කම්මං කරොති.
යාව බ්‍රහ්මලෝකා සද්දෝ අබ්භුග්ගච්ඡි.
මාතුජා රහිතා (සහෝදරයා හැර)
රිතෙ සද්ධම්මා (සද්ධර්මය හැර)
විනා සද්ධම්මා (සද්ධර්මය හැර)

■ හේත්වර්ථය

හේත්වර්ථයෙහි පඤ්චමී විභක්තිය යෙදේ.

කාමතෝ ජායතී සොකෝ.
කසමා තුමෙහ ඉධ වසථ?

සත්තමී විභක්තිය (ඔකාසෙ සත්තමී)

සත්තමී විභක්තිය ආධාරාර්ථයේ යෙදේ. යමෙක් ක්‍රියා සිද්ධියට උපකාර වූ කර්තෘ, කර්මයන්ට පිහිට (ආධාර) වේ ද, ඒ ඔකාස නම් වේ.

ඔපසිලෙසික විසයාභ්‍යාස - බ්‍යාපිකභෙදා චතුධාධාරෝ
වාරිසටෙසු ච සලිලෙ මචඡා - සඝසං නදියං තිලෙසු තෙලං

ආධාරය සතර වැදෑරුම් වේ. ඔපසිලේසික, විසය, අභ්‍යාස, ව්‍යාපික ආධාරය වශයෙනි.

■ ඔපසිලේසික ආධාරය

යම් ආධාරක වස්තුවක් ආධෙය වස්තුවෙහි ගැටී පවතී ද, එය ඔපසිලේසික ආධාරය නම් වේ.

වාරි සටෙසු	(කළයෙහි දිය)
රාජා ආසනෙ නිසීදති.	(රජ තෙමේ අසුනෙහි හිඳියි)

■ විසයික ආධාරය

යම් ආධාරක වස්තුව ආධෙය වස්තුවට විෂය වේ ද, විෂයාධාර නම් වේ.

සලිලෙ මචඡා	(ජලයෙහි මත්ස්‍යයෝ)
ආකාසෙ සකුණා චරනති.	(අහසේ පක්ෂීහු හැසිරෙත්)

■ අභ්‍යාස ආධාරය

ආධාර වස්තුව ආධෙය වස්තුවට සමීපයෙහි පවතී නම් එය අභ්‍යාසාධාර නම් වේ.

නදියං සසසං (ගඟ සමීපයෙහි ගොයම)
ගංගායං සොසෝ (ගඟ සමීපයෙහි සෝෂාව)

■ ව්‍යාපික ආධාරය

යම් ආධාරයක් ආධෙය වස්තුවේ පැතිර පවත්නේ වේද එය ව්‍යාපිකාධාරය නම් වේ.

තිලෙසු තෙලං (තලවල තෙල්)
උචඡුසු රසෝ (උක්වල රස)

සත්තමී විභක්ති ප්‍රයෝග

■ ගහ ආදි ධාතු යෝගය

කර්මාර්ථයෙහි ✓ගහ -උපාදානෙ (ගැනීම් අර්ථයෙහි), ✓චුබි (සිඹීමෙහි), අභි+ ✓වදි - අභිවාදනෙ (වැඳීමෙහි) යන මේ ධාතූන්ගේ යෝගයක් ඇති කල්හි සත්තමී විභක්තිය වේ.

බාහාසු ගහෙත්වා (අත් ගෙන)
භික්ඛූසු අභිවාදෙනති (භික්ෂූන් වඳියි)
මුදධනි චුම්බිත්වා (හිස සිඹ)

■ සම්ප්‍රදානාර්ථය

සම්ප්‍රදානාර්ථයෙහි ද සත්තමී විභක්තිය වේ.

සංසෙ දිනනං (සංඝයාට දෙන ලද දේ)
සංසෙ ගොතමී දෙහි (ගෝතමියනි, සංඝයාට දෙන්න)

■ කාලාර්ථය

කාලවාචක ශබ්ද සත්තමී විභක්තියෙන් ද සිටියි. එය '**කාලසත්තමී**' යනුවෙන් හැඳින්වේ.

පුබබණ්හසමයෙ ගතෝ. (පෙරවරුයෙහි ගියේ ය)
තසමිං සමයෙ භගවා අවොච. (එකල භාග්‍යවතුන් වහන්සේ කී සේක)

■ භාවාර්ථය

භාව නම් වීමයි. සිංහල භාෂාවේ පැවසෙන 'කල්හි, විට (වසින කල්හි . පැමිණි විට) යනාදි අරුත් පැවසීම සඳහා සත්තමී විභක්තිය යෙදේ. මෙහිදී වාක්‍යයාංශයේ කර්තෘ පදය ඒ හා සම්බන්ධ කිතක පදය ද සත්තමී විභක්තියෙන් තැබීම පාලි රීතිය යි.

බ්‍රහමදත්තෙ රජජං කාරෙන්තෙ	(බ්‍රහමදත්ත රාජ්‍යය කරවන කල්හි)
චොරෙසු ආගතෙසු	(සොරු පැමිණි විට)

■ නිර්ධාරණාර්ථය

නිර්ධාරණාර්ථයේ හෙවත් ගොඩකින් යමක් වෙන්කර ගැනීමේදී සත්තමී විභක්තිය වේ.

බ්‍රාහමණෙසු දෙවදත්තො පණ්ඩිතො (බ්‍රාහ්මණයන් අතර දේවදත්ත පණ්ඩිතයෙක්)

අභ්‍යාස

1. සිංහලට නගන්න.

i. සෙනාපති යොධෙහි සද්ධිං නගරමහා නික්ඛමති.
ii. මුනි සද්ධෙහි ගහපතීහි සද්ධිං ගිරිමහිරුහති.
iii. තෙන ඛො පන සමයෙන ආයසම්තො රට්ඨපාලස්ස පිතා මජ්ඣිමාය දවාරසාලාය උල්ලිඛාපෙති.
iv. ආයසම්තො රට්ඨපාලස්ස ඤාතිදාසී ආභිදොසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමා හොති.
v. අථ ඛො ආයසමා රට්ඨපාලො තං ඤාතිදාසිං එතදවොච.

2. පාලිට නගන්න.

i. පින් කරන පුද්ගලයා නිතර නිතර පින් කරයි.
ii. මාලාකාරයා මල් රැස් කර මල් දම් ගොතා විකුණා ජීවත් වෙයි.
iii. මගේ මව උදෙන් ම දානය පිළියෙල කර විහාරයට ගොස් භික්ෂු සංඝයාට පූජා කළාය.
iv. ඔහු ධර්මයේ හැසිරෙන්නේ ය. දුශ්චරිතයෙහි නො හැසිරෙන්නේ ය.
v. බෝධිසත්ත්වයන් වහන්සේ ඇසතු රුකමුල වැඩහිඳ වෙසක් පුන් පොහෝ දින අභිසම්බෝධියට පත්වූහ.

3. කෙටි පිළිතුරු සපයන්න.

i. කාරක යනු මොනවාද?
ii. කාරක වර්ග 06 ලියන්න.
iii. උපපද විභක්ති යනු මොනවාද?
iv. "අවච්ඡ සංයෝගය" යන්න විස්තර කරන්න.
v. "සම්පදානෙ චතුත්ථී" ප්‍රයෝගය සඳහා උදාහරණ 2ක් දෙන්න.

4. පහත සඳහන් වාක්‍යයන්හි කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති ප්‍රයෝගය ලියා සිංහලට නගන්න.

i. **තෙන ඛො පන සමයෙන** ආයසමා සංගාමජි අඤ්ඤතරසමිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නො හොති.
ii. භගවා **තායං වෙලායං** ඉමං උදානං උදානෙසි.
iii. **පඤ්චහි භික්ඛූනීසතෙහි** සහ ගොතමී නිබ්බානං යාති.
iv. පුත්ත, **භාසකාලෙ උපට්ඨිතෙ** සොචිතුං න යුත්තං.
v. අහං **තාසං සබ්බසං** ජෙට්ඨා අහොසිං.
vi. අඤ්ඤතරො සො පනායසමා නත්‍ථෙ **අරහතං** අහොසි.

5. A හි දී ඇති විභක්ත්‍යර්ථයට උචිත යෙදුම් B කොටසින් තෝරාගෙන ලියා දක්වන්න.

	A කොටස	B කොටස
i	ක්‍රියා ප්‍රවර්ගාර්ථයේ තතියා	උපාසකා අල්ලවත්‍ථෙහි අල්ලකෙසෙහි භගවන්තං උපසංකමිංසු.
ii	නිර්ධාරණාර්ථයේ සත්තමී	ථෙරා නවහි මාසෙහි සංගීතිං අකංසු.
iii	අත්‍යන්ත සංයෝගාර්ථයේ දුතියා	උපසන්තො සුඛං සෙති.
iv	සහාදි යෝගයෙහි තතියා	ආචරියො සහ සිස්සෙහි ගච්ඡති.
v	ක්‍රියා විශේෂණාර්ථයේ දුතියා	භගවා සත්තාහං එකපල්ලංකෙන නිසීදි.
vi	නිර්ධාරණාර්ථයේ ඡට්ඨී	පඤ්චවග්ගියෙසු භික්ඛූසු කොණ්ඩඤ්ඤා පඨමො අරහා අහොසි.
vii	ඉත්ථම්භූතාර්ථයේ තතියා	උපාසකො තෙසං අඤ්ඤතරො අහොසි.
viii	ද්විකර්මක ධාතුයෝගයෙහි දුතියා	පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම ගොතමං.
ix	නමො යොගයෙහි චතුත්ථී	යාවකො කසිරෙන ඝාසච්ඡාදං ලභති.
x	ක්‍රියාවිශේෂණාර්ථයෙහි තතියා	නමො තෙ බුද්ධවීරත්ථු.

චතුත්ථො පාඨො

උපාසකං මං භවං ගොතමො ධාරෙතු

එවං වුත්තෙ කූටදන්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. අභික්කන්තං හො ගොතම, අභික්කන්තං හො ගොතම. සෙය්‍යථාපි හො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙව හොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. එසාහං හො ගොතම සත්ත ච උසභසතානි, සත්ත ච වච්ඡතරසතානි, සත්ත ච වච්ඡතරීසතානි, සත්ත ච අජසතානි සත්ත ච උරබ්හසතානි මුඤ්චාමි, ජීවිතං දෙමි. හරිතානි චෙව තිණානි ඛාදන්තු, සීතානි ච පානීයානි පිවන්තු, සීතො ච නෙසං වාතො උපවායතූති. අථ ඛො භගවා කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස ආනුපබ්බිකථං කථෙසි. සෙය්‍යථීදං? දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි කූටදන්තං බ්‍රාහ්මණං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං. අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි. දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි. යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති.

(කූටදන්තසුත්ත - දීඝනිකාය)

පදමාලාව

භගවන්තං	**(ත)**	-	භාග්‍යවතුන් වහන්සේට
එතදවොච	**(සං)**	-	මෙය කීයේ ය
අභික්කන්තං	**(කි)**	-	මැනවි / මනවඩයි
සෙය්‍යථාපි	**(නි)**	-	යම්සේ
නික්කුජ්ජිතං	**(කි)**	-	යටිකුරු කළ
උක්කුජ්ජෙය්‍ය	**(කි)**	-	උඩුකුරු කරන්නේ ය
පටිච්ඡන්නං	**(කි)**	-	වැසුණු
විවරෙය්‍ය	**(ක්‍රි)**	-	විවෘත කරන්නේ ය
මූළ්හස්ස	**(කි)**	-	මං මුළා වූවෙකුට
ආචික්ඛෙය්‍ය	**(ක්‍රි)**	-	කියන්නේ ය
තෙලපජ්ජොතං	**(ස)**	-	තෙල් පහනක්

ධාරෙය්‍ය	(ක්‍රි)	-	ධරන්නේ ය
අනෙකපරියායෙන	(ස)	-	නොයෙක් අයුරින්
පකාසිතො	(කි)	-	ප්‍රකාශ කරන ලද්දේ
අජ්ජතග්ගෙ	(නි)	-	අද පටන්
පාණුපෙතං	(ස)	-	දිවි ඇති තාක්
උසභසතානි	(ස)	-	ගොනුන් සියයක්
සත්ත	(නා)	-	හත (7)
වච්ඡතරසතානි	(ස)	-	වස්සන් සියයක්
වච්ඡතරීසතානි	(ස)	-	වැස්සියන් සියයක්
අජසතානි	(ස)	-	එළුවන් සියයක්
උරබ්භසතානි	(ස)	-	බැටළුවන් සියයක්
හරිතානි	(නා)	-	කොළ පැහැ
බාදනතු	(ක්‍රි)	-	කත්වා
පිවනතු	(ක්‍රි)	-	බොත්වා
උපවායතු	(ක්‍රි)	-	හමාවා
ආනුපුබ්බිකථං	(ස)	-	පිළිවෙළ කථාව
සෙය්‍යථීදං	(නි)	-	කෙසේ ද යත්
ආදීනවං	(නා)	-	දුර්විපාක/ ආදීනව
ඔකාරං	(කි)	-	ලාමක බව
සංකිලෙසං	(නා)	-	කෙලෙස් සහිත බව
නෙක්ඛම්මෙ	(කි)	-	ගිහිගෙන් නික්මීමෙහි
අඤ්ඤාසි	(ක්‍රි)	-	දැනගත්තේ ය
කල්ලචිත්තං	(ස)	-	යහපත් සිත
මුදුචිත්තං	(ස)	-	මෘදු වූ සිත
විනීවරණ චිත්තං	(ස)	-	නීවරණයන්ගෙන් තොර සිත/ පැහැදිලි සිත
උදග්ග චිත්තං	(ස)	-	ඔදවැඩී ගිය සිත
පසන්න චිත්තං	(ස)	-	පහන් සිත
සාමුක්කංසිකා	(නා)	-	සාමුක්කංසික දේශනාව
අපගතකාලකං	(ස)	-	පහ වූ කළු පැහැ ඇති
සම්මදෙව	(සං)	-	මනාව
රජනං	(නා)	-	වර්ණ
පටිගණ්හය්‍ය	(ක්‍රි)	-	පිළිගන්නේ/ වැදගන්නේ

අභ්‍යාස

01. 'උපාසකං මං භවං ගොතමො ධාරෙතු' ඡේදය සිංහලට නගන්න.

02. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො භගවන්තං පාණුපෙතං සරණං ගතො හොති?
ii. අන්ධකාරෙ කිමත්ථාය තෙලපජ්ජොතං ධාරෙති?
iii. පුරිසො කෙ සත්තෙ බන්ධනා මුඤ්චි?
iv. කො නාමෙසා සාමුක්කංසිකා ධම්මදෙසනා?
v. කස්ස බ්‍රාහ්මණස්ස තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි?

03. ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i. බුදුරදුන්ගේ ධර්මදේශනාවෙන් පැහැදුණු පුද්ගලයා බුදුන්ට ප්‍රශංසා කළ අයුරු ලියන්න.
ii. යාගය සඳහා යාගස්ථම්භය වෙත පැමිණ වූ සත්තු කවරහු ද?
iii. අනුපිළිවෙළ කථාව ලියන්න.
iv. චතුරාර්ය සත්‍යය නම් කරන්න.
v. මෙහි එන උපමා දෙකක් උපුටා ලියන්න.

04. ඡේදයේ වාක්‍ය රටාව අනුව පාලියට නඟන්න.

i. අපගේ ගුරුවරයා විසින් නොයෙක් ආකාරයෙන් කරුණු ප්‍රකාශ කරන ලදී.
ii. අද පටන් දිවි ඇති තාක් මම සතුන් නො මරමි.
iii. වසා තිබූවක් විවෘත කරන්නාක් මෙන් ගුරුවරයා අපගේ මනස ප්‍රබෝධ කරවීය.
iv. ඔහුට එවෙලේ ම සියලු සංස්කාර අනිත්‍යය යන දහම් ඇස පහළ විය.

ධාතු, ධාතුගණ හා ආඛ්‍යාත

ධාතුවක් යනු ක්‍රියාමූලයකි. කාල පුරුෂාදියකට අයත් නොවන ක්‍රියාවක මූලික ස්වරූපය ධාතුව නම් වේ. ක්‍රියාව දරණ බැවින් ධාතු නම් වෙයි. බාලාවතාරයේ "**භූවාදයො ධාතවො**" යනුවෙන් **භූ** ආදිය ධාතු නම් වන බව කියා ඇත. ධාතු ප්‍රධාන වශයෙන් කොටස් 2 කි.

i. අකර්මක ධාතු
ii. සකර්මක ධාතු

අකර්මක ධාතු :- එනම් ක්‍රියාවෙන් කර්මයක් අපේක්ෂා නොකරන ධාතූන් ය.

හස	>	**හසති**	- සිනාසෙයි
කන්ද	>	**කන්දති**	- හඬයි
ජර	>	**ජීරති**	- දිරයි
රුජ	>	**රුජති**	- රිදෙයි

මේවා කර්තෘ පදය පමණක් යෙදීමෙන් පූර්ණ අදහසක් ලැබේ.

සකර්මක ධාතු:- ක්‍රියාවෙන් කර්මයක් අපේක්ෂා කරන ධාතූන් ය. එම ධාතුවලින් සෑදෙන ක්‍රියාපද සහිත වාක්‍ය කර්ම පදයක් (**දුතියා**) යෙදීමෙන් ම අර්ථවත් වේ.

ලිඛ	>	**ලිඛති**	- ලියයි
පූජ	>	**පූජෙති**	- පුදයි
ඡින්ද	>	**ඡින්දති**	- සිඳිය

"**කුමාරො ලිඛති.**" යයි කී විට "**කුමාරො කිං ලිඛති?**" යන ප්‍රශ්නය පැන නඟී. "**කුමාරො අක්ඛරං ලිඛති.**" යැයි කර්ම පදයක් යෙදූ විට එය පූර්ණ අදහසක් බවට පත්වේ.

ධාතුගණ

ධාතුගණයක් යනු පද සිද්ධියෙන් සමාන වන ධාතු සමූහයකි. ඒවා වරනැගෙන ආකාරය ද සමාන ය. '**විකරණය**' නම් ධාතුවටත් ආඛ්‍යාත ප්‍රත්‍යයටත් අතර එකතුවන විශේෂ ප්‍රත්‍යයකි.

තවද ඒ ඒ ගණවලට අයත් ක්‍රියාපදවල පද සිද්ධියේ වෙනස සිදුවන්නේ විකරණ ප්‍රත්‍යවල බලපෑම නිසා ය.

ධාතුගණ 8ක් පාලියෙහි දැක්වේ. ඒ ඒ ධාතුගණ, ධාතුගණයට අයත් විකරණ හා ක්‍රියාපද පහත වගුවෙහි දැක්වේ.

	ධාතු ගණය	බාලාවතාර සූත්‍රය	විකරණ ප්‍රත්‍ය	පද සිද්ධිය	පදය
01.	භූවාදි	භූවාදිතෝ අ	අ	භූ+අ+ති	භවති
02.	රුධාදි	රුධාදිතෝ නිගහීතපුබ්බං ච	අං	රුධ+අං+ති	රුන්ධති
03.	දිවාදි	දිවාදිතෝ යෝ	ය	දිව්+ය+ති	දිබ්බති
04.	ස්වාදි	සවාදිතෝ ණා උණා ච	ණා	සු+ණා+ති	සුණාති
			උණා	සක්ක+උණා+ති	සක්කුණාති
05.	කියාදි	කියාදිතෝ ණා	ණා	කී+ණා+ති	කිණාති
06.	තනාදි	තනාදිතෝ ඔ යිරා	ඔ	තන+ඔ+ති	තනොති
			යිර	කර+යිර+ති	කයිරති
07.	චුරාදි	චුරාදිතෝ ණෙ ණයා	ණෙ	චුර+ණෙ+ති	චොරෙති
			ණය	චුර+ණය+ති	චොරයති
08.	ගහාදි	ගහාදිතෝ පපණ්හා	පප/ණ්හ	ගහ+පප+ති ගහ+ණ්හ+ති	ඝෙපපති ගණ්හාති

ආඛ්‍යාත

ආඛ්‍යාත නම් ධාතු කෙරෙන් පරව ප්‍රත්‍යය යොදා සාදාගනු ලබන පද විශේෂයකි. ආඛ්‍යාතයෙන් යම් ක්‍රියා සිද්ධියක් ප්‍රකාශ වෙයි. ආඛ්‍යාත පදයක් පහත ලක්ෂණවලින් යුක්ත ය.

"යං තිකාලං තිපුරිසං - ක්‍රියාවාචී තිකාරකං,
අත්තිලිඞ්ගං ද්විවචනං - තදාඛ්‍යාතන්ති වුච්චති."

යනුවෙන් බාලාවතාරයෙහි කාලත්‍රයක්, පුරුෂත්‍රයක්, කාරකත්‍රයක් වචන දෙකක් ඇති ලිංගභේදයක් නොමැති ක්‍රියා අර්ථයක් පවසන යමක් වේ ද, එය ආඛ්‍යාත යයි කියනු ලැබේ.

කාලත්‍රය:- වත්තමාන, අතීත, අනාගත
පුරුෂත්‍රය:- පඨමපුරිස, මජ්ඣිමපුරිස, උත්තමපුරිස
කාරකත්‍රය:- කර්තෘකාරක, කර්මකාරක, භාවකාරක
වචනද්වය:- ඒකවචන හා බහුවචන

මෙම ප්‍රභේදවලින් යුතු ආඛ්‍යාත පද වරනැගෙන ක්‍රියා විභක්ති 8කි. පහත වගුව බලන්න.

	ක්‍රියා විභක්තිය	බාලාවතාර සූත්‍රය	අර්ථය
01.	වත්තමානා	වත්තමානා පච්චුප්පන්නෙ	පවත්නා කාලය
02.	පඤ්චමී	ආණත්‍යාසිට්ඨානුත්තකාලෙ පඤ්චමී	අණ කිරීම හා ආශීර්වාද කිරීම
03.	සත්තමී	අනුමතිපරිකප්පත්ථෙසු සත්තමී	අනුමතිය හා පරිකල්පනය
04.	හීයත්තනී	හීයොප්පභුති පච්චක්ඛ හීයත්තනී	ඊයේ පටන් ප්‍රත්‍යක්ෂ අතීතය
05.	පරොක්ඛා	අපච්චක්ඛ පරොක්ඛාතීතෙ	අප්‍රත්‍යක්ෂ වූ අතීතය
06.	අජ්ජතනී	සමීපෙජ්ජතනී	සමීප අතීතය
07.	භවිස්සන්ති	අනාගතෙ භවිස්සන්ති	අනාගත කාලය
08.	කාලාතිපත්ති	ක්‍රියාතිපන්නෙනතීතෙ කාලාතිපත්ති	සිදු නොවූ අතීත සිද්ධි

ක්‍රියාපදය සැමවිට ම උක්ත පදයක් සමග යෙදේ. උක්තය සහ ආඛ්‍යාතය පුරුෂයෙන් වචනයෙන් සමාන විය යුතුය.

වත්තමාන විභක්ති

පරස්සපද හා අත්තනොපදවල යෙදෙන වර්තමාන ක්‍රියාරූප උක්තපද හා යෙදෙන අයුරු පහත දැක්වේ.

වත්තමානා - ති, අන්ති, සි, ථ, මි, ම, තෙ, අන්තෙ, සෙ, වෙ, එ, මෙ

	පරස්සපද		අත්තනොපද	
පුරිස	එකවචන	බහුවචන	එකවචන	බහුවචන
පඨමපුරිස	කුමාරො වදති	කුමාරා වදන්ති	කුමාරො වදතෙ	කුමාරා වදන්තෙ
මජ්ඣිමපුරිස	ත්වං වදසි	තුමෙහ වදථ	ත්වං වදසෙ	තුමෙහ වදවෙ
උත්තමපුරිස	අහං වදාමි	මයං වදාම	අහං වදෙ	මයං වදාමෙහ

පඤ්චමී විභක්ති

පංචමී - තු, අන්තු, හි, ථ, මි, ම, තං, අන්තං, සසු, වෙහා, එ, ආමසෙ.

පඤ්චමී ආඛ්‍යාතය අණ කිරීම, විධාන කිරීම හා ආශීර්වාද කිරීම සඳහා උපයෝගී කර ගැනේ. පඤ්චමී ආඛ්‍යාතයේ පරස්සපද මධ්‍යම පුරුෂ ඒකවචනයෙහි "හි" ප්‍රත්‍ය ලොප් වී විශේෂ රූපයක් ලැබේ. "වද" ධාතුව පඤ්චමීයේ වරනැඟෙන අයුරු පහත දැක්වේ.

	පරසඝපද		අත්තනෝපද	
පුරිස	එකවචන	බහුවචන	එකවචන	බහුවචන
පඨමපුරිස	වන්දතු	වන්දන්තු	වන්දතං	වන්දන්තං
මජ්ඣිමපුරිස	වන්ද / වන්දාහි	වන්දථ	වන්දසඝු	වන්දවෙහා
උත්තමපුරිස	වන්දාමි	වන්දාම	වන්දෙ	වන්දාමසෙ

පාලි භාෂාවේ බෙහෙවින් භාවිත ක්‍රියාරූපයක් වන මෙය විධානාර්ථ, ආශීර්වාදාර්ථ දෙක්හි යෙදී ඇති අයුරු පහත නිදසුන්වලින් ප්‍රකට වේ.

- දෙවො **වස්සතු** කාලෙන.
- සබ්බ'ව භූතා සුමනා **භවන්තු.**
- **නික්ඛම** සමණ, **පවිස** සමණ.
- යන්නෙ කරණීයං තං **කරොහි.**
- එථ ගණ්හථ බන්ධථ.
- සමන්තා **පරිවාරෙථ.**
- සො සුඛී **භවතං.**
- තෙ සුඛිතා **භවන්තං.**
- ත්වම්පි සමණ **කසඝසු** ච වපඝසු ච.
- තුම්හෙ සුඛිතා **භවවෙහා.**
- අහං අවෙරො **හොමි.**
- අහං සුඛී **භවෙ.**

සත්තමී විභක්ති

සත්තමී - **එය්‍ය, එය්‍යුං, එය්‍යාඝි, එය්‍යාථ, එය්‍යාමි, එය්‍යාම,**
එථ, එරං, එථෝ, එය්‍යවෙහා, එය්‍යං, එය්‍යාමෙහ.

යන ප්‍රත්‍යය සත්තමී විභක්තියෙහි යෙදේ. **"අනුමති පරිකප්පත්ථෙසු සත්තමී"** යනුවෙන් විස්තර වන පරිදි සත්තමී ක්‍රියා විභක්තිය අනුමති අර්ථයේ හා පරිකල්පාර්ථයේ යෙදේ. අනුමති අර්ථය නම් අනුමතියක් අපේක්ෂාවෙන් කරනු ලබන ප්‍රකාශය හෝ සත්පුරුෂයන් විසින් අනුමත කළ දෙය යි. පරිකල්පාර්ථය නම් උපකල්පනය කරන අදහස යි. පාලියෙහි පරිකල්පාර්ථය යෙදෙන විට බොහෝ තන්හි **සචෙ, චෙ, සෙය්‍යථාපි, යදි, යන්නූන** වැනි නිපාත පද යෙදී ඇත. සත්තමීයෙහි පරස්සපද පඨමපුරිස ඒකවචනයෙහි 'එ' යන ප්‍රත්‍යය ද යෙදේ. **"වන්ද"** ධාතුව සත්තමීයෙන් වරනැඟෙන අයුරු පහත දැක්වේ.

	පරස්සපද		අත්තනෝපද	
පුරිස	එකවචන	බහුවචන	එකවචන	බහුවචන
පඨමපුරිස	වන්දෙ / වන්දෙය්‍ය	වන්දෙය්‍යුං	වන්දෙථ	වන්දෙරං
මජ්ඣිමපුරිස	වන්දෙය්‍යාසි	වන්දෙය්‍යාථ	වන්දෙථො	වන්දෙය්‍යවෙහා
උත්තමපුරිස	වන්දෙය්‍යාමි	වන්දෙය්‍යාම	වන්දෙය්‍යං	වන්දෙය්‍යාමෙහ

සත්තමී ක්‍රියාරූප යෙදෙන අර්ථයන් පහත වාක්‍ය අධ්‍යයනයෙන් උගනිමු.

- න **භජෙ** පාපකෙ මිත්තෙ, න **භජෙ** පුරිසාධමෙ.
- සෙය්‍යථාපි මහාරාජ පුරිසො ඉණං ආදාය කම්මන්තෙ **පයොජෙය්‍ය** තස්ස තෙ කම්මන්තා **සම්පජ්ජෙය්‍යුං**.
- ඉදානි මයං ධම්මං ච විනයං ච **සංගායෙය්‍යාම**.
- අහං උපාලිං විනයං **පුච්ඡෙය්‍යං**.
- සචෙ සො පඨමවයෙ **පබ්බජෙය්‍ය** අරහා **භවෙය්‍ය**.
- කින්නු බො මයං දෙවලොකං **ගච්ඡෙය්‍යාම** උදාහු අපායං.

අභ්‍යාස

01. පහත වාක්‍ය සිංහලට නඟන්න.

i. සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය.
ii. සබ්බීතියො විවජ්ජන්තු සබ්බරොගො විනස්සතු.
iii. වන්දෙ තෙ පිතරං භද්දෙ, තිම්බරුං සුරියවච්චසෙ.
iv. ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං.
v. අහං අවෙරො හොමි, අබ්‍යාපජ්ජා හොමි.

02. පහත සඳහන් අංකිත ක්‍රියාපදයන්හි ක්‍රියා විභක්ති, වචන හා පුරුෂය ලියා දක්වන්න.

වන්දෙ තං බොධිපාදපං.
පටිජගෙය්‍ය පණ්ඩිතො.
භජෙථ මිත්තෙ කල්‍යාණෙ.
අථ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ.
සත්තධා මෙ ඵලෙ මුද්ධා ජීවන්තො න සුඛං ලභෙ.
රාහු චන්දං පමුච්චස්සු.
තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු.
න හි සො භික්ඛවෙ අහිනා දට්ඨො කාලං කරෙය්‍ය.
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා.
අමනුස්සා රිත්තම්පි පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං.

03. සත්තමී ක්‍රියා උපයෝගී කරගෙන පාලියට නඟන්න

i. ඉඳින් ඔහු පැවිදි වන්නේ නම් රහත් බව ලබන්නේ ය.
ii. මම ගමට යන්නෙම් නම් මව්පියන් දකින්නෙමි.
iii. කිමෙක් ද ඔබ ධර්මය උගත්තෙහි ද? නැතහොත් (උදාහු) විනය ඉගෙන ගත්තෙහි ද?
iv. ඉදින් ඔබ බුදුන් සිහි කරන්නේ නම් භයක් නොවන්නේ ය.
v. පවිටු මිතුරන් ඇසුරු නොකරන්නේ නම් මැනවි.

04. පහත වගුව සම්පූර්ණ කරන්න.

ක්‍රියාපදය	**පරස්සපද, පඤ්චමී, පඨමපුරිස, ඒකවචන**	**පරස්සපද, සත්තමී, පඨමපුරිස, ඒකවචන**	**අත්තනොපද, වත්තමානා, පඨමපුරිස, ඒකවචන**	**අත්තනොපද, සත්තමී, උත්තමපුරිස, ඒකවචන**
ලහති ජානාති සුණාති නිසීදති කිලමති පස්සති බන්ධති වින්දති විහරති පවිසති ආචික්ඛති	ලහතු	ලභෙය්‍ය	ලභතෙ	ලභෙය්‍යං

05. ''උපාසකං මං භවං ගොතමො ධාරෙතු'' ඡේදයේ එන ක්‍රියාපද උපුටා දක්වා පහත වගුවෙහි යොදන්න.

ක්‍රියාපදය	**ක්‍රියා විභක්තිය**	**පුරුෂය**	**පදය**	**වචනය**

පඤ්චමෝ පාඨෝ

උට්ඨෙහි සම්ම සුදින්න

අථ ඛෝ සුදින්නස්ස කලන්දකපුත්තස්ස සහායකා යෙන සුදින්නස්ස කලන්දපුත්තස්ස මාතාපිතරෝ තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නස්ස කලන්දකපුත්තස්ස මාතාපිතරෝ එතදවොචුං. "අම්ම, තාත, එසෝ සුදිනෙනා අන්තරහිතාය භූමියා නිපනෙනා 'ඉධෙව මෙ මරණං භවිස්සති පබ්බජ්ජා වා'ති. සචෙ තුමෙහ සුදින්නං නානුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, තත්ථෙව මරණං ආගමිස්සති. සචෙ පන තුමෙහ සුදින්නං අනුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, පබ්බජිතම්පි නං දක්ඛිස්සථ. සචෙ සුදිනෙනා නාභිරමිස්සති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, කා තස්ස අඤ්ඤා ගති භවිස්සති? ඉධෙව පච්චාගමිස්සති. අනුජානාථ සුදින්නං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. "අනුජානාම, තාත, සුදින්නං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. අථ ඛෝ සුදින්නස්ස කලන්දකපුත්තස්ස සහායකා යෙන සුදිනෙනා කලන්දකපුත්තෙනා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නං කලන්දකපුත්තං එතදවොචුං. "උට්ඨෙහි සම්ම සුදින්න, අනුඤ්ඤාතෝ'සි මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. අථ ඛෝ සුදිනෙනා කලන්දකපුත්තෙනා "අනුඤ්ඤාතෝ'මහි කිර මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති හට්ඨා උදග්ගා පාණිනා ගත්තානි පරිභුඤ්ජන්තෙනා උට්ඨාසි. අථ ඛෝ සුදිනෙනා කලන්දකපුත්තෙනා කතිපාහං බලං ගාහෙත්වා යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නෙනා ඛෝ සුදිනෙනා කලන්දකපුත්තෙනා භගවන්තං එතදවොච. "අනුඤ්ඤාතෝ'මහි අහං භන්තෙ මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. පබ්බාජෙතු මං භගවා"ති. අලත්ථ ඛෝ සුදිනෙනා කලන්දකපුත්තෙනා භගවතෝ සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නෙනා ච පනායස්මා සුදිනෙනා එවරූපෙ ධුතගුණෙ සමාදාය වත්තති. ආරඤ්ඤිකෝ හොති, පිණ්ඩපාතිකෝ, පංසුකූලිකෝ, සපදානචාරිකෝ. අඤ්ඤතරං වජ්ජිගාමං උපනිස්සාය විහරති.

(පඨමපාරාජිකං - පාරාජිකපාළි)

පදමාලාව

කලන්දකපුත්තස්ස	(ස)	-	කලන්ද පුත්‍ර වූ
මාතාපිතරෝ	(ස)	-	මව්පියෝ
එතදවොචුං	(සං)	-	මෙය කීවාහු ය
අනන්තරහිතාය	(ස)	-	කිසිවක් නො ඇතිරූ
භූමියා	(නා)	-	බිමෙහි
ඉධෙව	(සං)	-	මෙහි ම
නිපන්නෙනා	(කි)	-	හොත්තේ (වෙයි)
සචෙ	(නි)	-	ඉඳින්
අනුජානිස්සථ	(ක්‍රි)	-	අනුදනිවු
දක්ඛිස්සථ	(ක්‍රි)	-	දක්නාහු ය

අභිරමිස්සති	(ක්‍රි)	-	ඇලෙන්නේ ය
පච්චාගමිස්සති	(ක්‍රි)	-	ආපසු එන්නේ ය
උට්ඨහි	(ක්‍රි)	-	නැගිටින්න
අනුඤ්ඤාතෝ	(කි)	-	අනුදන්නා ලදී
හට්ඨා	(කි)	-	සතුටු වූයේ
උදග්ගෝ	(කි)	-	ඔදවැඩි සිත් ඇත්තේ
පාණිනා	(නා)	-	අතින්
ගත්තානි	(නා)	-	ගාත්‍රා, ශරීරාංග
පරිපුඤ්ඡන්තෝ	(කි)	-	පිරිමදින්නේ
උට්ඨාසි	(ක්‍රි)	-	නැඟී සිටියේ ය
කතිපාහං	(ස)	-	කීපදවසක්
(බලං) ගාහෙත්වා	(පූ.ක්‍රි)	-	බලගන්වා
අලත්ථ	(ක්‍රි)	-	ලැබී ය
අචිරූපසම්පන්නෝ	(කි)	-	උපසපන් වී නොබෝ දිනකින්

අභ්‍යාස

1. ''උට්ඨහි සම්ම සුදින්න'' යන ඡේදය සිංහලට නගන්න.

2. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කෙ කිං නිස්සාය සුදින්නස්ස පබ්බජ්ජාය අනුජානථාති මාතාපිතරං යාචිංසු?
ii. සචෙ සුදින්නස්ස මාතාපිතරෝ පබ්බජ්ජං නානුජානෙය්‍යුං තස්ස කිං භවෙය්‍යුං?
iii. පබ්බජ්ජාය අනුඤ්ඤාතභාවං ඤත්වා කෝ කං උපසඞ්කමි?
iv. චිත්තාපෙක්ඛා භින්නෝ සුදින්නෝ කස්මිං නිපන්නෝ අහොසි?
v. පබ්බජිතෝ සුදින්නෝ කීවරූපෙ ධුතගුණෙ සමාදාය වත්තති?

3. ඡේදයෙහි එන වාක්‍ය රටාව අනුගමනය කොට පාලියට නඟන්න.

i. දකුණු දිසාවෙහි මහඇමතිගේ යහළුවෝ ජනාධිපතිතුමා වෙත එළඹ මෙසේ කීවාහු ය.
ii. මේ දරුවා කිසිවක් නො ඇතිරූ බිම වැතිර සිටී.
iii. ඇමතිවරුනි, යැපීම සඳහා වැටුප(වෙතන) අනුමත කරන්න.
iv. යහළුවනි, නැඟිටිවු, ඇමතිවරුන් විසින් තොපගේ වැටුප(වෙතන) අනුමත කරන ලදී.
v. ගුරුවරයා යම් තැනක ද අපි සියල්ලෝ ම එතනට යමු.

4. ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i. බලාපොරොත්තු ඉටුකර ගැනීමට පුද්ගලයකුට තිබිය යුතු සම්පත් මොනවා ද?
ii. මව්පියන් දරුවන් කෙරෙහි දක්වන ආකල්පය කුමක් ද?
iii. පැවිදි වීමට අත්‍යවශ්‍ය වන සාධකය කුමක් ද?
iv. සුදින්නගේ පැවිද්දට අනුමැතිය ගැනීමට යහළුවන් ඉදිරිපත් කළ තර්කය කුමක් ද?
v. පැවිදි වූ තැනැත්තා තුළ තිබිය යුතු උතුම් ගුණාංග මොනවා ද?

ආඛ්‍යාත භාවිතය II

හැඳින්වීම

හතරවන පාඩමේ දී ආඛ්‍යාත පිළිබඳ මූලික ලක්ෂණ අපි උගත්තෙමු. තව ද වත්තමාන, පඤ්චමී, සත්තමී ආඛ්‍යාත භාවිතය හඳුනාගත්තෙමු. මෙහි දී **හීයත්තනී, අජ්ජතනී, පරොක්ඛා, කාලාතිපත්ති හා භවිස්සන්ති** ආඛ්‍යාත භාවිතය පිළිබඳ ව හදාරමු.

හීයත්තනී ආඛ්‍යාතය

මෙය අතීතකාල ආඛ්‍යාතයකි. බාලාවතාරයේ **"හීයත්තනී ආ, උ්, ඔ, ත්ථ, අ, මහා, ත්ථ, ත්ථුං, සෙ, වහං, ඉං, මහසෙ"** යන සූත්‍රයෙන් එහි ප්‍රත්‍යයමාලාව දැක්වේ. පව (පිසීමේ) ධාතුවට හීයත්තනී ප්‍රත්‍යය යෙදී පහත සඳහන් පරිදි පද සිද්ධිය වේ.

පුරිස	පරස්සපද				අත්තනොපද			
	එකවචන		බහුවචන		එකවචන		බහුවචන	
	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය
පඨමපුරිස	ආ	අපචා	උ්	අපචු	ත්ථ	අපචත්ථ	ත්ථුං	අපචිත්ථුං
මජ්ඣිමපුරිස	ඔ	අපචො	ත්ථ	අපචත්ථ	සෙ	අපචසෙ	වහං	අපචවහං
උත්තමපුරිස	අ	අපච	මහා	අපචමහා	ඉං	අපචිං	මහසෙ	අපචමහසෙ

හීයත්තනී ආඛ්‍යාතය අතීතකාලය සඳහා යෙදේ. ඊයේ පටන් අතීතය යෙදෙන බව **''හීයොපභුති පචවකෙඛ හීයත්තනී''** යනුවෙන් සාම්ප්‍රදායික ව්‍යාකරණයේ උගන්වයි. ජාතකපාළියේ හීයත්තනී ක්‍රියා බහුලව යෙදී ඇත. **අජ්ජතනී, හීයත්තනී හා කාලාතිපත්ති** යන විභක්තිවල පද සාධනයේ දී ක්‍රියාපදයේ මුලට 'අ' කාරයක් විකල්පයෙන් ආගම වේ.

උදාහරණ:-

අහං උදකං රාමපුත්තං **එතදවොචං.**
පඤ්චාලරට්ඨං අහං **පසාදයිං.**
අගා ජෙතවනං ජිනො.
සබ්බාරිවිජයං **අකා.**
භාරද්වාජො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං **අලත්ථ.**
තෙ සහායකා භගවතො සන්තිකෙ පබ්බජ්ජං **අලත්ථුං** උපසම්පදං'ති.

පරොක්ඛා ආඛ්‍යාතය

ඉන්ද්‍රිය විෂයගත නොවූ අතීත සිද්ධියක් වාර්තා කිරීමේ දී **'පරොක්ඛා'** ආඛ්‍යාතය භාවිත වේ. **"අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ"** යන බාලාවතාර සූත්‍රයෙන් ඒ බව දැක්වේ. එහි යෙදෙන ප්‍රත්‍යයමාලාව මෙසේ ය. **"පරොක්ඛා අා, උෑ, එ, ත්ථ, අ, මහ, ත්ථ, රෙ, ත්ථො, වෙහා, ඉ, මෙහ"** යනු යි. **'පච'** ධාතුව ප්‍රත්‍යය ගැන්වීම පහත සඳහන් පරිදි වේ.

පුරිස	පරස්සපද				අත්තනොපද			
	එකවචන		බහුවචන		එකවචන		බහුවචන	
	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය
පඨමපුරිස	අ	පපච	උ	පපචු	ත්ථ	පපචිත්ථ	රෙ	පපචිරෙ
මජ්ඣිමපුරිස	එ	පපචෙ	ත්ථ	පපචිත්ථ	ත්ථො	පපචිත්ථො	වෙහා	පපචිවෙහා
උත්තමපුරිස	අ	පපච	මහ	පපචිමහ	ඉ	පපචි	මෙහ	පපචිමෙහ

මෙය පාලි භාෂාවේ එතරම් ම භාවිත නොවූ ක්‍රියා රූපයකි. මෙය 'ලු', 'ල' යන ශ්‍රැති සූචනාර්ථය සඳහා භාවිත වේ. ධාතුවේ මුල අකුර ද්විත්ව වීම පද සාධනයේ දී සිදු වේ.

උදාහරණ:-

කුමාරො හීයො ගාමං **ජගාම.**
ගන්තුං සයං අපදත්‍තාය **සුසොච** නූනං.
තුමෙහ පඨමවයෙ සාමණෙරා **බහුවිත්ථ.**

අජ්ජතනී ආඛ්‍යාතය

පාලි භාෂාවේ භාවිත සාමාන්‍ය අතීත ක්‍රියා විභක්තිය යි. **"සමීපෙජ්ජතනී"** යන බාලාවතාර සූත්‍රයට අනුව සමීප අතීතය අජ්ජතනියෙන් කියවේ. අජ්ජතනියෙහි යෙදෙන ප්‍රත්‍යය වන්නේ **"අජ්ජතනී ඊ, උං, ඕ, ත්ථ, ඉං, මහා, ආ, උෑ, සෙ, වහං, අ, මෙහ"** යනුවෙනි. 'ගමු' ධාතුවට අජ්ජතනී ප්‍රත්‍යය යෙදෙන අයුරු පහත දැක්වේ.

පුරිස	පරස්සපද				අත්තනොපද			
	එකවචන		බහුවචන		එකවචන		බහුවචන	
	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය
පඨමපුරිස	ඊ	අගමි, ගමි අගමී, ගමී	උං	අගමිංසු, ගමිංසු	ආ	අගමා	උ	අගමූ
මජ්ඣිමපුරිස	ඔ	අගමො, ගමො	තථ	අගමිත්ථ, ගමිත්ථ	සෙ	අගමිසෙ	වහං	අගමිවහං
උත්තමපුරිස	ඉං	අගමිං, ගමිං	මහා	අගමිම්හා, ගමිම්හා	අ	අගම	මෙහ	අගමිමෙහ

අජ්ජතනී ආඛ්‍යාතය බහුල වශයෙන්ම අතීතකාලය සඳහා භාවිත වූ ක්‍රියාපදය යි.

උදාහරණ:-

අඤ්ඤතරා දෙවතා එකමන්තං **අට්ඨාසි**.
බ්‍රාහමණා යෙන භගවා **තෙනුපසඞ්කමිංසු**.
බ්‍රහමබන්ධු පුරෙ **ආසිං**.
මයං භගවතො සන්තිකෙ පබ්බජ්ජං **අලභිම්හ**.
ආවුසො මා සොචිත්ථ මා **පරිදෙවිත්ථ**.
ත්වං හීයො ගාමං **ගච්ඡා**.

කාලාතිපත්ති ආඛ්‍යාතය

"ක්‍රියාතිපන්නෙනතීතෙ කාලාතිපත්ති" යනුවෙන් බාලාවතාරයේ දක්වෙන පරිදි සිදු නොවූ අතීත ක්‍රියාව කාලාතිපත්ති නම් වේ. නැතහොත් වැරදී ගිය ක්‍රියාව යි. සිදුවිය හැකිව තිබූ, එහෙත් සිදු නොවූ ක්‍රියාව කාලාතිපත්ති නම් වේ. මෙහි දී 'සචෙ', 'යදි' ආදි නිපාත පද යෙදී තිබෙනු දැකිය හැකි ය. එහි ප්‍රත්‍යයෝ වනාහි **"කාලාතිපත්ති සස්සා, සස්සංසු, සෙස, සස්සථ, සස්සං, සස්සමෙහ, සස්සථ, සස්සිංසු, සස්සසෙ, සස්සවෙහ, සස්සං, සස්සාමහසෙ"** යනු යි.

"සචෙ සො පඨමවයෙ **පබ්බජිස්සා** අරහා **අභවිස්සා**."
(ඉදින් හෙතෙම පළමු වියෙහි පැවිදි වූවා නම් රහත් වන්නට තිබුණි)

මෙබඳු ක්‍රියා භාවිතයේ දී පුරුෂත්‍රයෙහි පහත ආඛ්‍යාත පද නිපද වේ.

පුරිස	පරස්සපද				අත්තනොපද			
	එකවචන		බහුවචන		එකවචන		බහුවචන	
	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය
පඨම පුරිස	සසා	අපච්ඡසා	සසංසු	අපච්ඡසංසු	සසථ	අපච්ඡසථ	සසිංසු	අපච්ඡසිංසු
මජ්ඣිම පුරිස	සෙස	අපච්ඡෙස	සසථ	අපච්ඡසථ	සසසෙ	අපච්ඡසසෙ	සසවෙහ	අපච්ඡසවෙහ
උත්තම පුරිස	සසං	අපච්ඡසං	සසමහා	අපච්ඡසමහා	සසං	අපච්ඡසං	සසාමහසෙ	අපච්ඡසාමහසෙ

කාලාතිපත්ති ආඛ්‍යාතය භාවිත වන්නේ ක්‍රියාසිද්ධියේ අභාවය දැක්වීමට යි.

උදාහරණ:-

සචෙ සො අගාරං **අජ්ඣාවසිස්සා** චක්කවත්ති රාජා **අභවිස්සා**.
සචාහං පඨමවයෙ අනලසො **අභවිස්සං** සබ්බසිප්පෙසු කොවිදො **අභවිස්සං**.
සචෙ භගවා අඞ්ගුලිමාලස්ස පුරතො න **අගමිස්සා** මහාජානිකරො **අභවිස්සා**.
සචාහං තණ්ඩුලං **අලභිස්සං** ඔදනං **අපචිස්සං**.
සචාහං යානං **අලභිස්සං** තයා සද්ධිං **අගමිස්සං**.

භවිස්සන්ති ආඛ්‍යාතය

"අනාගතෙ භවිස්සන්ති" යන බාලාවතාර සූත්‍රයට අනුව අනාගත කාලය භවිස්සන්ති ආඛ්‍යාතයෙන් යෙදේ. එහි යෙදෙන ප්‍රත්‍යයමාලාව මෙසේ ය. **"භවිස්සන්ති සසති, සසන්ති, සසසි, සසථ, සසාමි, සසාම, සසතෙ, සසන්තෙ, සසසෙ, සසවෙහ, සසං සසාමෙහ."**

'පච' ධාතුවට ප්‍රත්‍යයමාලාව ගැන්වූ විට පහත රූප සෑදේ.

	පරස්සපද				අත්තනොපද			
පුරිස	එකවචන		බහුවචන		එකවචන		බහුවචන	
	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය	ප්‍රත්‍යය	පදය
පඨම පුරිස	සසති	පච්ඡසති	සසන්ති	පච්ඡසන්ති	සසතෙ	පච්ඡසතෙ	සසන්තෙ	පච්ඡසන්තෙ
මජ්ඣිම පුරිස	සසසි	පච්ඡසසි	සසථ	පච්ඡසථ	සසසෙ	පච්ඡසසෙ	සසවෙහ	පච්ඡසවෙහ
උත්තම පුරිස	සසාමි	පච්ඡසාමි	සසාම	පච්ඡසාම	සසං	පච්ඡසං	සසාමෙහ	පච්ඡසාමෙහ

මෙම ක්‍රියාරූප අනාගතාර්ථය දීම සඳහා භාවිත වේ. වර්තමාන ප්‍රත්‍යයමාලාවට "ස්‍ස" කොටස මුලට එකතු කිරීමෙන් මේ ප්‍රත්‍යය ලැබෙන බව වරනැඟීමෙන් ප්‍රකට වේ. උත්තම පුරුෂ අත්තනොපද ඒකවචනය පමණක් වර්තමාන රූපයෙන් වෙනස් වේ.

උදාහරණ:-

කිලනෙතාසමි ආනන්ද නිපජ්ජිස්සාමි.
කිං කරිස්සාමි අරඤ්ඤවාසෙන.
ආයාම ආනන්ද යෙන කුසිනාරා තෙනුපසඞ්කමිස්සාම.
සුපටිවජනෙනා අනතරසරෙ ගමිස්සාමීති සිකඛා කරණීයා.

අභ්‍යාස

01. පහත ක්‍රියාපදයන්හි ආඛ්‍යාත විභක්තිය, පදය, පුරුෂය, වචනය ලියන්න.

i.	උපසඞ්කමිංසු	ii.	අවොචුං
iii.	භවිස්සති	iv.	අනුජානිස්සථ
v.	අනුජානාම	vi.	උටෙඨහි
vii.	උටඨාසි	viii.	නිසීදි
ix.	අවොච	x.	අලත්ථ

02. පහත සඳහන් ක්‍රියාපද ආඛ්‍යාත විභක්ති හතෙහි (7) පරස්ස පදයෙහි ප්‍රථම පුරුෂයේ වරනඟන්න.

	පඤ්චමී	සත්තමී	හීයත්තනී	අජ්ජතනී	පරොකඛා	කාලාතිපත්ති	භවිස්සන්ති
නිදැ:- වන්දති	වන්දතු / වන්දන්තු	වන්දෙය්‍ය / වන්දෙය්‍යුං	අවන්දා/ අවන්දු	අවන්දි, වන්දි / අවන්දිංසු /වන්දිංසු	වවන්ද වවන්දු	අවන්දිස්සා අවන්දිස්සංසු	වන්දිස්සති වන්දිස්සන්ති
චරති							
කසති							
නමති							
සුපති							
තිටඨති							
ලහති							
පස්සති							
හසති							
නන්දති							

03. දී ඇති ආඛ්‍යාතපද සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න.

(ආගඤ්ඡුං/පරියාපුණාථ/උපට්ඨහසසු/නික්කුජෙජය්‍යුං/යනතු/කරොහි/සමෙමාදිංසු/භාවෙය්‍ය)

i. ඉති ඉමා චතුරාරක්ඛා භික්ඛු ..... සීලවා.
ii. අසෙසා විලයං ..... අනන්තගුණතෙජසා.
iii. ..... භික්ඛවෙ ආටානාටියං රක්ඛං.
iv. අමනුසසා රිත්තමපි පත්තං සීසෙ .....
v. අපෙපකවෙව භගවතා සද්ධිං .....
vi. ..... තසසුපට්ඨානං බත්තියා බ්‍රාහමණා බහු.
vii. බීණාසවා අනෙහන පානෙන .....
viii. යං තෙ කරණීයං තං .....

04. හිස්තැන් පුරවන ලද 3 ප්‍රශ්නයෙහි එන වාක්‍ය සිංහලට නඟන්න.

05. පහත ආඛ්‍යාතයන්හි බහුවචන රූපය, ආඛ්‍යාත විභක්තිය, පදය හා පුරුෂය ලියන්න.

i. පක්කමිසසං
ii. වසී
iii. ගච්ඡය්‍යං
iv. අනුජානාහි
v. බමසසු
vi. වන්දෙ
vii. අඤ්ඤාසි
viii. ජගාම
ix. අලභිසසා
x. අට්ඨාසි
xi. අදදසා

06. ඒකවචන රූප ලියන්න.

i. පවත්තයුං
ii. අබ්‍රවුං
iii. ආහංසු
v. නිබ්බායිසසාම
v. පරිදෙවිංසු
vi. අලත්ථුං
vii. යාචාම
viii. පමජ්ජන්ති
ix. පරිභවිංසු
x. කුබ්බන්ති
xi. සමාගච්ඡන්තු
xii. සමගගහුං
xiii. අහු
xiv. අලභිමහ
xv. ලභෙය්‍යාම

ජටෙඨා පාඨෙ

තථාගතස්ස ආළාහනං

අථ ඛො ආයස්මා මහාකස්සපො යෙන කුසිනාරා මකුටබන්ධනං නාම මල්ලානං චෙතියං, යෙන භගවතො චිතකො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකංසං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා පාදතො විවරිත්වා භගවතො පාදෙ සිරසා වන්දි. තානිපි ඛො පඤ්චභික්ඛුසතානි එකංසං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා භගවතො පාදෙ සිරසා වන්දිංසු. වන්දිතෙසු ච පනායස්මතා මහාකස්සපෙන තෙහිපි පඤ්චහි භික්ඛුසතෙහි සයමෙව චිතකො පජ්ජලි. ඣායමානස්ස ඛො පන භගවතො සරීරස්ස, යං අහොසි ඡවීති වා චම්මන්ති වා මංසන්ති වා නහාරූති වා ලසිකාති වා තස්ස නෙව ඡාරිකා පඤ්ඤායිත්ථ, න මසි, සරීරානෙව අවස්සිංසු. සෙය්‍යථාපි නාම සප්පිස්ස වා තෙලස්ස වා ඣායමානස්ස න ඡාරිකා පඤ්ඤායිත්ථ, න මසි. සරීරානෙව අවසිස්සිංසු. තෙසඤ්ඤෙව පඤ්චන්නං දුස්සයුගසතානං දෙව ච දුස්සානි න ඩයහිංසු. යඤ්ඤෙව සබ්බබහන්තරිමං, යඤ්ඤෙව බාහිරං. දඩ්ඪෙ ච ඛො පන භගවතො සරීරෙ අන්තලික්ඛා උදකධාරා පාතුභවිත්වා භගවතො චිතකං නිබ්බාපෙසි. උදකං සාලතොපි අබ්භුන්නමිත්වා චිතකං නිබ්බාපෙසි. කොසිනාරකාපි මල්ලා සබ්බගන්ධොදකෙන භගවතො චිතකං නිබ්බාපෙසුං.

(මහාපරිනිබ්බාණසුත්ත - දීඝනිකාය)

පදමාලාව

ආයස්මා	(ත)	-	ආයුෂ්මත්
මකුටබන්ධනං	(ස)	-	එනම් නාමය (ඔටුනු බැඳීම)
මල්ලානං	(නා)	-	මල්ල රජදරුවන්ගේ
එකංසං	(ස)	-	ඒකාංශ
අඤ්ජලිං	(නා)	-	ඇඳිලි
පණාමෙත්වා	(පූ.ක්‍රි)	-	නමස්කාර කොට
තික්ඛත්තුං	(ත)	-	තුන්වරක්
චිතකං	(නා)	-	සෑය
පදක්ඛිණං	(නා)	-	පැදකුණු
පාදෙ	(නා)	-	පාද
පඤ්චහි භික්ඛුසතෙහි	(ස)	-	පන්සියයක් භික්ෂූන් විසින්
සයමෙව	(සං)	-	තෙමේ ම
පජ්ජලි	(ක්‍රි)	-	දැල්වුනි
ඣායමානස්ස	(කි)	-	දැල්වෙන්නා වූ
ඡවීති	(සං)	-	සිවිය යැයි
චම්මන්ති	(සං)	-	සම යැයි
නහාරූති	(සං)	-	නහර යැයි

ලසිකාති	(සං)	-	සඳමිඳුලු යැයි
ඡාරිකා	(නා)	-	අලු
මසි	(නා)	-	දැලි
සරීරානෙව	(සං)	-	ශාරීරික (ධාතුහු) ම
අවසිසසංසු	(ක්‍රි)	-	ඉතිරි වූහ
සෙය්‍යථාපි	(නි)	-	යම් සේ
සපපි	(නා)	-	ගිතෙල්
තෙල	(නා)	-	තල තෙල්
ඩයහිංසු	(ක්‍රි)	-	දැවී ගියහ
යඤ්ඤව	(සං)	-	යමක්
සබ්බභඤ්ඤතරිමං	(ස)	-	සැමට යටින්
අනතලිකඛා	(නා)	-	අහසින්
උදකධාරා	(ස)	-	දිය දහරා
පාතුභවිත්වා	(පු.ක්‍රි)	-	පහළ වී
නිබ්බාපෙසි	(ක්‍රි)	-	නිවීය
සාලතොපි	(සං)	-	සල් ගසේ (අතු පතරින්) ද
අභූතනමිත්වා	(පූ.ක්‍රි)	-	මතු වී
සබ්බගන්ධොදකෙන	(ස)	-	සියලු සුවඳින් යුතු සුවඳ දියෙන්

අභ්‍යාස

01. 'තථාගතසස ආළාහනං' ඡේදය සිංහලට නඟන්න.

02. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. තථාගතසස ආළාහනං කත්ථ අහොසි?
ii. ආයසමා මහාකසසපො කතිකඛත්තුං භගවතො චිතකං පදකඛිණං අකාසි?
iii. සො කිත්තකෙහි භික්ඛූහි සද්ධිං තත්ථ අගමාසි?
iv. ඣායමානසස භගවතො සරීරෙ කෙ පන අවසිසසිංසු?
v. කොසිනාරකා පන කෙන භගවතො චිතකං නිබ්බාපෙසුං?

03. පිළිතුරු සපයන්න.

i. තථාගත දේහය ආදාහනයේ දී අලු නොවී ඉතිරි වූ වස්තු දෙක කුමක් ද?
ii. මහකසුප් මාහිමි තථාගත ශ්‍රී දේහයට අවසන් බුහුමන් දැක්වීමට ප්‍රමාදවීමට හේතුව කුමක් ද?
iii. තථාගත දේහය දැවීමේ දී අලු හෝ දැලි ඉතිරි නොවී දැවුනේ කුමන කොටස් ද?
iv. මහකසුප් හිමි අවසන් බුහුමන් දක්වන තෙක් තථාගත දේහයට ගිනි නොඇවිලී තිබුණේ කුමක් නිසා ද?
v. චිතකයේ ගිනි නිවීමට ජලධාරාවන් පැමිණියේ කොතැනින් ද?

04. ඡේදයේ එන වාක්‍ය රටා අනුගමනය කරමින් පාලියට නගන්න.

i. සාමණේරවරු උදැසන ම සිවුර ඒකාංශ කොට ඇඳිළිබැඳ තුන්වරක් චෛත්‍යය පැදකුණු කොට හිසින් වඳිති.
ii. ජනාධිපති තෙම ඇමතිවරුන් පන්සියයක් සමඟ අනුරාධපුරයට ගියේ ය.
iii. ළමුන් පන්සියයක් අතුරෙන් දෙසියපනහක් (අඩ්ඩතෙය්‍යසතං) විභාගය සමත් වූහ.
iv. අප නගරයට ගිය කල්හි බොහෝ මිනිස්සු එහි රැස්වූහ.

වාක්‍ය රචනය I

සම්පූර්ණ අදහසක් ප්‍රකාශ කරන පද සමූහය වාක්‍ය නම් වේ. වාක්‍යයක් නිපදවීමට කරන්නෙක් ද (කර්තෘ) ක්‍රියාවක් ද (ආඛ්‍යාත) තිබිය යුතු ය. එසේ නොමැතිව අර්ථවත් වාක්‍යයක් තැනිය නොහැකි ය.

බාලකො ධාවති - (ළමයා දුවයි)

මෙහි **බාලකො** යන කර්තෘ පදය පඨමපුරිස ඒකවචන වේ. එනිසා ම ක්‍රියා පදය ද පඨමපුරිස ඒකවචනයෙන් ම තබා ඇත. මෙසේ උක්තපදයට (කර්තෘ) ගැළපෙන සේ ආඛ්‍යාතය තැබීම ව්‍යාකරණ රීතිය යි. මෙවැනි ආඛ්‍යාත පදවලින් තැනුණු වාක්‍යයන්හි කර්ම පදයක් නැතත් වාක්‍යයේ අදහස ප්‍රකාශ වීමට එය බාධාවක් නො වේ.

එහෙත් සකර්මක වාක්‍යවල ක්‍රියාව කර්මපදයක් අපේක්ෂා කරයි. මෙය **මනුස්සො භුඤ්ජති** - (මිනිසා අනුභව කරයි) යන්න ඇසූවෙකුට මිනිසා අනුභව කරන්නේ මොනවා ද? යන ප්‍රශ්නය පැන නගී. එබැවින් අනුභව කරන දෙය ප්‍රකාශ වන කර්ම පදය වාක්‍යවල යොදනුයේ කර්මය ප්‍රකාශවන දුතියා විභක්ති නාමපදය යෙදීමෙනි. එනිසා කර්ම පදයක් මීට ඇතුළත් කොට **මනුස්සො භත්තං භුඤ්ජති** (මිනිසා බත් අනුභව කරයි) යැයි කී විට වාක්‍යය සම්පූර්ණ වේ. පහත දැක්වෙන නිදසුන් බලන්න.

බුද්ධා ධම්මං දෙසෙති.
භික්ඛවො **තං** සුණන්ති.
උපාසිකා **කුසුමසන්තතිං** ආහරි.
උපාසකා **පදීපානි** උජ්ජාලෙන්ති.

කර්තෘ හා ක්‍රියාව ඒකවචන වූ පමණින් කර්ම පදය ද ඒකවචනයෙන් ම තැබිය යුතු නො වේ. එය ඒකවචනයෙන් හෝ බහුවචනයෙන් තැබිය හැකි ය.

පහත දැක්වෙන වාක්‍ය රටාවන් නිරීක්ෂණය කිරීමෙන් මෙය වටහා ගන්න.

රාජා රට්ඨං පාලෙති.	(රජු රට පාලනය කරයි)
මයං අනුරාධපුරං ගච්ඡාම.	(අපි අනුරාධපුරයට යමු)
ත්වං සීලං රක්ඛ.	(ඔබ ශීලය රකින්න)
තුමෙහ පුඤ්ඤානි කරොථ.	(තෙපි පින් කරවු)
අහං ලෙඛනං ලිඛාමි.	(මම ලිපියක් ලියමි)
සා පඤ්චසීලං සමාදියති.	(ඇය පංචශීලය සමාදන් වෙයි)

විශේෂණ පද භාවිත කොට වාක්‍යය දිගු කිරීම.

මුල දී ඉගෙන ගත් සරල වාක්‍යවලට විශේෂණ පද එක් කිරීම තුළින් වාක්‍යය දිගු කර ගත හැකි අතර ඉන් පරිපූර්ණ බවක් ද ව්‍යක්ත බවක් ද ඇති වේ. ඒ සඳහා 'නාම විශේෂණ, ක්‍රියා විශේෂණ, කර්ම විශේෂණ, සංඛ්‍යා විශේෂණ, නිපාත හා උපසර්ග' ආදිය උපයෝගී කර ගත හැකි ය.

නාම විශේෂණ

වාක්‍යයක නාම පදයක් කිසියම් පදයක් හෝ කීපයක් යොදා විශේෂණය කෙරේ නම්, එය නාම විශේෂණ නම් වේ. මෙහි දී විශේෂ්‍ය ලෙස යෙදෙන පදයට විශේෂණව යෙදෙන පද සමානව විභක්ති, ලිංග, වචනවලින් තැබිය යුතු ය.

භික්ඛු ධම්මං සුණාති.

ධිතිමා භික්ඛු ධම්මං සුණාති.
ධිතිමා භික්ඛු **බුද්ධස්ස** ධම්මං සුණාති.
ධිතිමා භික්ඛු **දසබලස්ස සම්මාසම්බුද්ධස්ස** තං ධම්මං සුණාති.
ධිතිමා භික්ඛු **දසබලස්ස සම්මාසම්බුද්ධස්ස මධුරං** ධම්මං සුණාති.

මේ අයුරින් වාක්‍යක නාමපදවලට විශේෂණ ලෙස පද එක් කර ගනිමින් අලංකාරවත් ලෙස දිගු වාක්‍ය ලියා දැක්විය හැකි ය.

ක්‍රියා විශේෂණ

පාලි භාෂාවේ ක්‍රියා විශේෂණ බොහෝ විට නපුංසක ලිංගිකව දුතියා විභක්ති ඒක වචනයෙන් සිටී. මෙහි දී **මුහුත්තං, අභිණ්හං, ඛිප්පං** ආදි නිපාත පද යෙදේ. ඇතැම් විටෙක තතියා විභක්ති ඒකවචන ද ක්‍රියා විශේෂණ ලෙස යෙදේ.

සක්කච්චං	-	සකසා, පිළිවෙළට
සුඛං, සුඛෙන	-	සැපසේ
සනිකං	-	හෙමින්
සීඝෙන	-	වේගයෙන්
නිබද්ධං	-	නිරන්තරයෙන්
සාධුකං	-	මනාකොට

පුරිසො පණ්ඩිතං පයිරුපාසති.
විඤ්ඤූපුරිසො පණ්ඩිතං පයිරුපාසති.
විඤ්ඤූපුරිසො සීලවන්තං පණ්ඩිතං පයිරුපාසති.
විඤ්ඤූපුරිසො සීලවන්තං පණ්ඩිතං මුහුත්තං පයිරුපාසති.

මෙසේ කර්තෘ කර්ම ක්‍රියා සහිත වාක්‍යයක නාම පද හා ක්‍රියා පදය නාම විශේෂණ හා ක්‍රියා විශේෂණයක් යොදා දිගු කොට ලිවිය හැකි ය. මේ ආකාරයට වාක්‍යවලට විශේෂණ පද යොදා දිගු වාක්‍ය ලිවීමට පුරුදු වන්න.

උපසර්ග හා නිපාත පද යෙදීම

උපසර්ග හා නිපාත පද යොදා ගනිමින් ද අලංකාරවත් දිගු වාක්‍ය නිර්මාණය කළ හැකි ය.

බුද්ධා ජෙතවනෙ වසති.
සම්බුද්ධා ජෙතවනෙ වසති.
සම්මා සම්බුද්ධා ජෙතවනෙ වසති.
ඉදානි සම්මාසම්බුද්ධා ජෙතවනෙ වසති.
ඉදානි පන සම්මාසම්බුද්ධා ජෙතවනං අජ්ඣාවසති.

ඉහත දැක්වෙන ආකාරයට උපසර්ග හා නිපාත පද යොදාගනිමින් දිගු වාක්‍ය නිර්මාණය කිරීමට පුරුදු වන්න.

සංඛ්‍යා නාම භාවිතය

වාක්‍ය රචනයේ දී එක්කෙනෙක්, දෙන්නෙක්, එක්වරක්, දෙවරක් ආදි ලෙස සංඛ්‍යාවාචී ශබ්ද ද එකතු කිරීමට සිදුවේ. සංඛ්‍යාවාචී ශබ්ද වාක්‍යයකට එකතු කිරීමේ දී අනුගමනය කළ යුතු සුවිශේෂී ක්‍රමවේදයන් ඇත.

- සංඛ්‍යා ශබ්ද අතුරෙන් '**එක**' (1) '**ති**' (3) '**චතු**' (4) යන ශබ්දත්‍රය ලිංගත්‍රයෙහි ම වරනැගෙන බැවින් සර්වනාමවලට ඇතුළත් කොට ඇත. 'එක' ශබ්දය සංඛ්‍යාවාචී වූ විට එක් සත්ත්වයකු ගැන යෙදෙන බැවින් සියලු විභක්තීන්හි ඒකවචනයේ පමණක් වරනැගේ. 'එක' ශබ්දය සර්වනාම පදයක් ලෙස **ඇතැම්, සමහර** යනාදි අරුත් දෙමින් ලිංගත්‍රයේ ම 'ය' ශබ්දය මෙන් වරනැගේ. 'ද්වි' ශබ්දය බහුවචනයේ පමණක් වරනැගෙන අතර, එය ලිංගත්‍රයේ ම සමාන වේ.

දෙවන පාඩමෙහි දැක්වූ පරිදි **ති, චතු** ශබ්ද ලිංගත්‍රයෙහි අසමාන රූප සහිතව බහුවචනයේ පමණක් වරනැගේ. වාක්‍යයක් රචනා කිරීමේදී මෙම වෙනස හදුනාගෙන භාවිත කළ යුතු ය. පහත නිදසුන් බලන්න.

උදා:-
- **එකො** පුරිසො **එකෙන** එරසුනා **එකං** රුක්ඛං ඡින්දති.
- **එකා** ඉත්ථී **එකමහා** ගාමමහා නික්ඛමිත්වා **එකං** නගරං පාවිසි.
- දෙව වනිතායො දෙව පුත්තෙ විජායිංසු.
- සො **දවීහි** හත්ථෙහි තං පහරති.

- **තිසසන්නං** වනිතානං **චත්තාරෝ** පුත්තා ච **තිස්සෝ** ධීතරෝ ච සන්ති.
- **චත්තාරෝ** මනුස්සා ච **චතස්සෝ** නාරියෝ ච **චතූහි** මගෙහි වනං පවිසිංසු.

- පාලියේ දෙ (2) ශබ්දයේ පටන් අට්ඨාරස (18) ශබ්දය අවසන් කොට ඇති ශබ්දයෝ (ති (3) චතු (4) හැර) බහුවචනයේ පමණක් යෙදෙන අතර ලිංගත්‍රයේ ම සමාන වෙති.

- එකූනවීසති (19) පටන් අට්ඨනවුති (98) දක්වා සංඛ්‍යාවෝ ද කොටි පටන් කොටිපපකොටි දක්වා සංඛ්‍යාවෝ ද ස්ත්‍රීලිංග ඒකවචනයෙන් යුක්ත වෙති.

- එකූනසත (99) පටන් සතසහස්ස (ලක්ෂය) දක්වා සංඛ්‍යා ශබ්දයෝ නපුංසක ලිංග ඒකවචනයෙන් යුක්ත වෙති.

උදා:-
- **පඤ්ච** වාණිජා **දසහි** සකටෙහි භණ්ඩානි ආහරිංසු.
- ඡ බාලකා ඡට්ඨමං පාඨං පඨන්ති.
- ඉමෙහි **සත්තහි** ධම්මෙහි සමන්නාගතා භික්ඛු පණ්ඩිතෝ හොති.
- අට්ඨසු ගෙහෙසු **පඤ්චතිංසති** ජනා වසන්ති.
- **එකිස්සං** සාලායං **සතං** පුරිසා **පඤ්ඤාසා** ඉත්ථියෝ ච නිසීදන්ති.

අභ්‍යාස

01. සිංහලට නඟන්න.

i. ඉදානි පන එකෙචෙ සමණපතිරූපකා පීතානි වත්ථානි පාරුපිත්වා සාසනවිලොමං කරොන්ති.
ii. ධිතිමන්තො සො පාතොව උට්ඨාය කුජන්තෙ සකුණෙ පස්සති.
iii. කතවෙදී සුනඛො අත්තනො සාමිකං ගොපනත්ථාය භුඞ්කාරං අකාසි.
iv. පණ්ඩිතා සප්පුරිසා මනුස්සා අත්තානං උපකාරකානං පච්චුපකාරං කරොන්ති.
v එකො මක්කටො දිවසෙ දිවසෙ තථාගතස්ස උපට්ඨානං කරොති.

02. පාලියට නඟන්න.

i. ධර්මය දන්නා වූ නුවණැත්තෝ නොයෙක් කුසල් දහම් පුරා තමන් ම දමනය කරති.
ii. ගුණවත් උපාසිකාවෝ විහාරයට ගොස් එකත්පසෙක හුන්නාහ.
iii. ගම්වැසි මනුෂ්‍යයෙක් එක් මුගටිපැටියෙක් (නකුලො) ගෙනවිත් මහත් සෙනෙහසින් පෝෂණය කරයි.
iv. දුම්රියෙන් (ධූමරථ) යන්නා වූ ඔවුහු කුඩා ගෙවල් බොහෝ සෙයින් (භියේ‍යාසොමත්තාය) දැක්කාහ.
v. එක් බළලෙක් ලොකු මීයකු අල්ලා ගනු පිණිස වේගයෙන් දිව්වේ ය.

03. පහත සඳහන් පද ලිංගත්‍රයට අනුව බෙදා දක්වන්න.

තිසෙසා, පඤ්චහි, වීසති, ඡබ්බීසති, එකූනවීසති, තයො, දුවෙ, දවත්තිංසති, එකපඤ්ඤාසා, එකිසසං, චතසෙසා, තෙරස, නවුති, ඡ, සත්තති, ඡත්තිංසති, තිසසනනං, සටඨී, පඤ්චවීසති, දස, තීණි, සතං, දවීසු, පඤ්චහි, තිණණං, අසීති, ඡාසීති, ඡනනවුති, නවුති,

04. වරහන් තුළ දක්වා ඇති ඉලක්කමට ගැළපෙන සංඛ්‍යාවාචී වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. ..... (03) ගාවියො ඛෙත්තෙ ආහිණ්ඩනති.
ii. මයං ගාමං ගචඡනෙත්තා ..... (29) මිගෙ පසසිමහ.
iii. දසපුරිසා ..... (05) අමෙබ බාදිංසු.
iv. ඉමසමිං ගාමෙ ..... (102) ගෙහා සන්ති.
v. මයං ඉතො ..... (08) දිවසෙහි නගරං ගමිසසාම.

05. පහත මාතෘකා සඳහා වචන පහකට නො අඩු පාලි වාක්‍යය 5 බැගින් ලියන්න.

i. වානරො
ii. නගරං
iii. මහාවාලුකානදී
iv. සොවණ්ණමාලිමහාචෙතියං

සත්තමෝ පාඨෝ

පඤ්ඤට්ඨ අය්‍යා උපසන්තාය කම්මං

භූතපුබ්බං භික්ඛවෙ, ඉමිස්සායෙව සාවත්ථියා වෙදෙහිකා නාම ගහපතානී අහොසි. වෙදෙහිකාය භික්ඛවෙ ගහපතානියා එවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ: සොරතා වෙදෙහිකා ගහපතානි, නිවාතා වෙදෙහිකා ගහපතානි, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. වෙදෙහිකාය ඛෝ පන භික්ඛවෙ ගහපතානියා කාළී නාම දාසී අහොසි, දක්ඛා අනලසා සුසංවිහිතකම්මන්තා. අථ ඛෝ භික්ඛවෙ කාළියා දාසියා එතදහොසි: මය්හං ඛෝ අය්‍යාය එවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ: සොරතා වෙදෙහිකාය ගහපතානී, නිවාතා වෙදෙහිකා ගහපතානී, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. කින්නු ඛෝ මෙ අය්‍යා සන්තංයෙව නු ඛෝ අජ්ඣත්තං කොපං න පාතුකරොති? උදාහු අසන්තං? උදාහු මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති? නො අසන්තං? යන්නූනාහං අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛෝ භික්ඛවෙ කාළී දාසී දිවා උට්ඨාසි. අථ ඛෝ භික්ඛවෙ වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. කිං අය්‍යෙති? කිං ජෙ දිවා උට්ඨාසීති? 'න ඛෝ අය්‍යෙ කිඤ්චීති.' නො වත රෙ කිඤ්චි පාපී දාසී දිවා උට්ඨාසී'ති කුපිතා අනත්තමනා භාකුටිං අකාසි.

අථ ඛෝ භික්ඛවෙ කාළියා දාසියා එතදහොසි: සන්තංයෙව ඛෝ මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං. යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං වීමංසෙය්‍යන්ති අථ ඛෝ භික්ඛවෙ කාළී දාසී දිවාතරං උට්ඨාසි. අථ ඛෝ භික්ඛවෙ වෙදෙහිකා ගහපතානි කාළිං දාසිං එතදවොච: හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙ'ති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? 'න ඛෝ අය්‍යෙ කිඤ්චී'ති. නො වත රෙ කිඤ්චි පාපී දාසී, දිවාතරං උට්ඨාසීති කුපිතා අනත්තමනා අනත්තමනවාචං නිච්ඡාරෙසි. අථ ඛෝ භික්ඛවෙ කාළියා දාසියා එතදහොසි: සන්තංයෙව ඛෝ මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං, මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති, නො අසන්තං. යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛෝ භික්ඛවෙ කාළී දාසී දිවාතරංයෙව උට්ඨාසි. අථ ඛෝ භික්ඛවෙ වෙදෙහිකා ගහපතානි කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? න ඛෝ අය්‍යෙ කිඤ්චීති. නො වත රෙ කිඤ්චි පාපී දාසී, දිවාතරං උට්ඨාසීති කුපිතා අනත්තමනා අගගළසූචිං ගහෙත්වා සීසෙ පහාරං අදාසි. සීසං වොභින්දි. අථ ඛෝ භික්ඛවෙ කාළී දාසී භින්නෙන සීසෙන ලොහිතෙන ගළන්තෙන පටිවිස්සකානං උජ්ඣාපෙසි: 'පඤ්ඤට්ඨය්‍යා සොරතාය කම්මං, පඤ්ඤට්ඨය්‍යා නිවාතාය කම්මං, පඤ්ඤට්ඨය්‍යා උපසන්තාය කම්මන්ති.

(කකචූපම සූත්‍ර - මජ්ඣිමනිකාය)

පදමාලාව

භූතපුබ්බං	(කි)	-	පෙර වූවකි
ඉමිස්සායෙව	(සං)	-	මෙහි ම
සාවත්ථියා	(නා)	-	සැවත්නුවර
කල්‍යාණෝ	(ත)	-	යහපත්
කිත්තිසද්දෝ	(ස)	-	කීර්ති ඝෝෂාවක්
අබ්භුග්ගතෝ	(කි)	-	පැන නැගුණි
සොරතා	(ත)	-	දැමුණු ඉඳුරන් ඇති තැනැත්තියක්
නිවාතා	(ත)	-	සන්සුන් තැනැත්තියක්
උපසන්තා	(ත)	-	උපශාන්ත තැනැත්තියක්
දක්ඛා	(ත)	-	දක්ෂ තැනැත්තියක්
අනලසා	(ස)	-	කම්මැලි නැති තැනැත්තියක්
සුසංවිහිතකම්මන්තා	(ස)	-	පිළිවෙළට කටයුතු කරන
අය්‍යාය	(නා)	-	ආර්යාවගේ
කින්නු	(සං)	-	කිමෙක් ද?
සන්තංයෙව	(සං)	-	ඇත්තා වූ ම
අජ්ඣත්තං	(නි)	-	ඇතුළාන්තයේ වූ
පාතුකරොති	(ක්‍රි)	-	එළිදක්වයි, ප්‍රකට කරයි
උදාහු	(නි)	-	නැතහොත්
අසන්තං	(ස)	-	නැත්තා වූ
මය්හමෙවෙතෙ	(සං)	-	මා විසින් ම මේ
සුසංවිහිතා	(ස)	-	මැනවින් කටයුතු සම්පාදනය කරන්නී
වීමංසෙය්‍යං	(ක්‍රි)	-	විමසන්නෙමි
උට්ඨාසි	(ක්‍රි)	-	නැගිට්ටාය, අවදි වූවා ය
හෙ ජෙ	(නි)	-	ඈ බොල
අනත්තමනා	(ස)	-	නොසතුටු සිත් ඇත්තී
භාකුටිං අකාසි	(ක්‍රි)	-	බැම හැකිලුවා ය
භියෝසොමත්තාය	(නි)	-	බෙහෝ සෙයින්
දිවාතරං	(ත)	-	වඩා දහවල් වී
වත	(නි)	-	ඒකාන්තයෙන්
රෙ	(නි)	-	කොල, බොල
නිච්ඡාරෙසි	(ක්‍රි)	-	පිටකළාය
අග්ගළසූචිං	(නා)	-	දොරපොල්ල
ඵොහින්දි	(ක්‍රි)	-	බින්දාය, පැළුවාය
හිනෙනන සීසෙන	(නා)	-	පැළුණු හිසින්
ලොහිතෙන ගළන්තෙන	(නා)	-	ලේ ගලමින්
පටිවිස්සකානං	(ස)	-	අසල්වැසියන්ට
උජ්ඣාපෙසි	(ක්‍රි)	-	කෑ ගැසීය, දොස් නැගීය
පස්සට	(ක්‍රි)	-	බලවූ

අභ්‍යාස

01. 'පසසථ අය්‍යා උපසන්තාය කම්මං' ඡේදය සිංහලට නගන්න.

02. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. වෙදෙහිකාය ගහපතානියා දාසී කා නාම අහොසි?
ii. සා කිර දාසී කීදිසා අහොසි?
iii. සා අත්තනො චෙතසා කිං චින්තෙසි?
iv. අත්තනො අය්‍යං වීමංසිතුං සා කිං අකාසි?
v. කුපිතා අනත්තමනා වෙදෙහිකා තං දාසිං කිං අකාසි?

03. පිළිතුරු සපයන්න.

i. බුද්ධකාලීන භාරතයේ දාසීන්ගේ ස්වරූපය පිළිබඳ කරුණු 02 ක් ලියන්න.
ii. වේදේහිකාවගේ ඉවසීම පරීක්ෂා කිරීමට දාසිය කළේ කුමක් ද?
iii. ඇතුළාන්ත කෝපය දුරුකිරීමට අනුගමනය කළ යුතු ප්‍රතිපදාව කුමක් ද?
iv. මෙම පාඩමෙන් උගත හැකි ආදර්ශ 03 ක් ලියන්න.
v. නිලීනව (සැඟව) පවත්නා කෙලෙස් හඳුනාගත හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

වාක්‍ය රචනය - II

ඉහත පාඩමේ දී කර්තෘ, කර්ම, ක්‍රියා යන මූලිකාංගවලින් සමන්විත වාක්‍යයකට නාම විශේෂණ, ක්‍රියා විශේෂණ, සංඛ්‍යා ශබ්ද ආදිය යොදා ක්‍රම ක්‍රමයෙන් එම වාක්‍ය දිගු කර ගන්නා ආකාරය ඉගෙන ගතිමු. මෙම පාඩමේ දී තුමන්ත ක්‍රියා, කිතක, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා ආදි පද එක්කොට අර්ථවත් හා පරිපූර්ණ වාක්‍යයක් සකසන ආකාරය තවදුරටත් ඉගෙන ගනිමු.

තුමන්ත ක්‍රියා

'යන්ට', '**කරන්ට**' යනාදි අර්ථ ලබාගැනීම සඳහා ධාතුව අගට '**තුං**' '**තවෙ**' යන ප්‍රත්‍යය එක් කොට සාදාගන්නා පද විශේෂය **තුමන්ත ක්‍රියා** පද ලෙස හැඳින්වේ. මේවා ඇතැම් තැනෙක නිපාත ලෙසින් ද හඳුන්වා ඇති කිතක පද විශේෂයකි.

- 'අ' කාරාන්ත හා 'උ' කාරාන්ත ධාතු සඳහා ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරෙහි 'ඉ' කාරයක් ආගම කොට තුමන්ත ක්‍රියා පද සාදා ගනී.

උදා:-

පච	+ ඉ + තුං	පචිතුං	(පිසන්නට)
ඛාද	+ ඉ + තුං	ඛාදිතුං	(කන්නට)
හර	+ ඉ + තුං	හරිතුං	(ගෙන යන්නට)
ධාව	+ ඉ + තුං	ධාවිතුං	(දුවන්නට)

- 'ආ' කාරාන්ත ධාතූන්ට සෘජුව ම තුමන්ත ප්‍රත්‍යය එක් කොට තුමන්ත ක්‍රියා පද සාදා ගනී.

උදා:-

දා	+ තුං	දාතුං	(දෙන්නට)
පා	+ තුං	පාතුං	(බොන්නට)
ඨා	+ තුං	ඨාතුං	(සිටින්නට)
ඤා	+ තුං	ඤාතුං	(දැන ගන්නට)

- ඇතැම් ධාතූන්ගේ අන්තයේ ඇති ව්‍යඤ්ජනාක්ෂරයට හා ප්‍රත්‍යයට අනුරූප ලෙසත් අකුරක් ආදේශ කොට තුමන්ත ක්‍රියා පද සාදා ගනී.

උදා:-

ගමු	+ තුං	ගන්තුං, ගන්තුං	(යන්නට)
කර	+ තුං	කත්තුං	(කරන්නට)
වද	+ තුං	වත්තුං	(කියන්නට)
භුජ	+ තුං	භොත්තුං	(අනුභව කරන්නට)

- ඇතැම් විට ධාතුවේ පූර්ව ස්වරය වෘද්ධි කොට තුමන්ත ක්‍රියා පද සාදා ගනී.

උදා:-

න	+ තුං	නෙතුං	(පමුණුවන්ට)
ජී	+ තුං	ජෙතුං	(දිනන්නට)
සු	+ තුං	සොතුං	(අසන්නට)
හු	+ තුං	හොතුං	(වන්නට)

මීට ඉහත පාඩමකදී විශේෂණ පද හා උපසර්ග, නිපාත පද යොදාගනිමින් අලංකාරවත් දිගු වාක්‍ය නිර්මාණය කරන්නට උගන්තෙමු. දැන් තුමන්ත ක්‍රියා පද යොදා වාක්‍ය දිගු කොට ලිවීමට පුරුදු වෙමු.

ජනා විහාරං ගච්ඡන්ති.
සජ්ජනා විහාරං ගච්ඡන්ති.
සජ්ජනා විහාරං නිබද්ධං ගච්ඡන්ති.
සජ්ජනා විහාරං ධම්මං සොතුං නිබද්ධං ගච්ඡන්ති.
තසමිං සමයෙ සජ්ජනා විහාරං ධම්මං **සොතුං** ගච්ඡන්ති.

ඉහත දැක්වෙන ආකාරයට විශේෂණ නිපාත, උපසර්ග පද හා තුමන්ත ක්‍රියා යොදා ගනිමින් වාක්‍ය දිගු කොට ලිවීමට හුරුවන්න.

පූර්ව ක්‍රියා

අවසාන ක්‍රියාවට පෙර සිදු කොට අවසන් වූ ක්‍රියා පූර්වක්‍රියා ලෙස හැඳින්වේ. පූර්වක්‍රියා සාදාගනුයේ ධාතුවේ අගට **ත්වා, ත්වාන, තූන** යන ප්‍රත්‍යය එක්කර ගැනීමෙනි. **(පුබ්බකාලෙකකත්තුකානං තූන ත්වාන, ත්වා වා)** යනුවෙන් බාලාවතාරයේ මේ බව දැක්වේ. ඇතැම් විට **'ය'** ප්‍රත්‍යය එක් කිරීමෙන් ද පූර්වක්‍රියා පද සෑදේ. තනි තනිව කිව යුතු වාක්‍ය කීපයක් පූර්වක්‍රියා පද යෙදීම තුළින් තනි වාක්‍යයකින් පැවසිය හැකි ය. පහත දැක්වෙන වාක්‍ය කිහිපය සහ ඉන් අනතුරුව ඒ ආශ්‍රයෙන් දක්වා ඇති තනි වාක්‍යය දෙස බැලීමෙන් උක්ත අදහස පහසුවෙන් අවබෝධ කොට ගත හැකි ය.

- ධාතුවට පරව ත්වා, ත්වාන, තූන යන ප්‍රත්‍යය එක් කොට පූර්වක්‍රියා පද තනා ගත හැකි ය.

උදා:- කර + ත්වා - කත්වා
කර + ත්වාන - කත්වාන
කර + තූන - කතූන

- ඇතැම් විට ධාතුවට පූර්වයෙන් උපසර්ගයක් යෙදුණු විට විකල්පයෙන් 'ය' ප්‍රත්‍යය ආදේශ වේ.

උදා:- අභි + √භූ + ය - අභිභූය
නි + √කමු + ය - නික්ඛම්ම
ආ + √ගමු + ය - ආගම්ම
උ + √ඨා + ය - උට්ඨාය

පූර්ව ක්‍රියා නිපාත ආදිය ද යොදාගනිමින් වාක්‍ය දිගුකොට ලියන ආකාරය බලන්න.

දාරකො පාඨසාලං ගච්ඡති.
ගුණවා දාරකො පාඨසාලං ගච්ඡති.
අථ ඛො ගුණවා දාරකො තං පාඨසාලං ගච්ඡති.
අථ ඛො ගුණවා දාරකො අක්ඛරානි උගණ්හිතුං පාඨසාලං ගච්ඡති.
අථ ඛො ගුණවා දාරකො පාතොව **උට්ඨාය** පාතරාසං **භුඤ්ජිත්වා** අක්ඛරානි උගණ්හිතුං සහසා පාඨසාලං ගච්ඡති.

අභ්‍යාස

01. සිංහලට නගන්න.

i. සො කාලසෙසව උට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා දන්තකට්ඨං දාතබ්බං, ආසනං පඤ්ඤාපෙතබ්බං හොති.

ii. උපජ්ඣායසස පච්ඡාසමණෙන හොතබ්බං. නාතිදූරෙ ගන්තබ්බං. පත්තපරියාපන්නං පටිගහෙතබ්බං හොති.

iii. සචෙ උපජ්ඣායො ජන්තාඝරං පවිසිතුකාමො හොති චුණ්ණං සන්නෙන තබ්බං හොති.

iv. පතිකුලෙ වසන්තියා නාම අන්නො අගහි බහි න නීහරිතබ්බො. බහි අගහි අන්නො න පවෙසෙතබ්බො

v. බජ්ජභොජ්ජලෙය්‍යපෙය්‍යවසෙන චතුබ්බිධා හොන්ති මනුස්සානං ආහාරා.

02. පහත දැක්වෙන වාක්‍ය නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ යොදා දිගු කොට ලියන්න.

i. බාළකො ගාමං ගච්ඡති.

ii. වාණිජා භණ්ඩානි විකකිණන්ති.

iii. පුරිසො විහාරං ගච්ඡති.

iv. කස්සකා ඛෙත්තං කසන්ති.

v. මයං ධම්මං සුණාම.

03. පහත දැක්වෙන වාක්‍ය නිපාත හා උපසර්ග පද ද යොදා ගනිමින් දිගු කොට ලියන්න.

i. භික්ඛු පිණ්ඩාය පාවිසි.

ii. චොරා අසෙස චොරෙන්ති.

iii. දාරිකා විහාරං ගචජති.

iv. භගවා ධම්මං දෙසෙසි.

v. පුරිසා අසෙස කිණන්ති.

04. පහත දැක්වෙන වාක්‍ය තුමන්ත ක්‍රියා හා පූර්ව ක්‍රියා ද යොදමින් දිගුකොට ලියන්න

i. මාතා භත්තං පචි.

ii. පිතා නගරං ගච්ඡති.

iii. දාසා ගොණෙ හරන්ති.

iv. බාලකො පොත්ථකං පඨති.

v. බාලිකා දාරුණි ආහරති.

අට්ඨමො පාඨො

බ්‍රහමාති මාතාපිතරො

සබ්‍රහමකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොනති. සපුබ්බදෙවතානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොනති. සපුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොනති. සාහුණෙය්‍යකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොනති. බ්‍රහමාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. පුබ්බදෙවතාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. ආහුණෙය්‍යාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං. තං කිස්ස හෙතු? බහූපකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං, ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති.

බ්‍රහමාති මාතාපිතරො - පුබ්බාචරියාති වුච්චරෙ
ආහුණෙය්‍යා ච පුත්තානං - පජාය අනුකම්පකා

තස්මා හි නෙ නමස්සෙය්‍ය - සක්කරෙය්‍යාථ පණ්ඩිතො
අන්නෙන අථ පානෙන - වත්ථෙන සයනෙන ච
උච්ඡාදනෙ නහාපනෙ - පාදානං ධොවනෙන ච

තාය නං පාරිචරියාය - මාතාපිතූසු පණ්ඩිතා
ඉධෙව නං පසංසන්ති - පෙච්ච සග්ගෙ ච මොදති.

(ඉතිවුත්තකපාළි)

පද මාලාව

සබ්‍රහමකානි	(නා)	-	බ්‍රහ්මයන් සහිත
තානි	(ස.නා)	-	ඒ
කුලානි	(නා)	-	කුල, පවුල්, ගෙවල්
යෙසං	(ස.නා)	-	යමෙකුගේ
අජ්ඣාගාරෙ	(සං)	-	තම ගෙයි
සපුබ්බදෙවතානි	(ස)	-	පූර්ව දේවතාවන් සහිත
ආහුණෙය්‍යකානි	(ත)	-	පිදියයුත්තන් සහිත
අධිවචනං	(ස)	-	අපර නාමයකි
කිස්ස	(ස.නා)	-	කුමක්ද
හෙතු	(නා)	-	හේතුව
ආපාදකා	(ත)	-	මඟ පෙන්වන්නෝ

පොසකා	**(ත)**	-	පෝෂණය කරන්නෝ
දක්ඛතාරෝ	**(කි)**	-	දක්වන්නෝ
එතමත්ථං	**(සං)**	-	මේ කරුණ
අවොච	**(ක්‍රි)**	-	වදාළ සේක
වුච්චරෙ	**(ක්‍රි)**	-	කියනු ලැබෙත්
බ්‍රහමාති	**(සං)**	-	බ්‍රහ්මයා යනු
පුබ්බාචරියාති	**(සං)**	-	පූර්වාචාර්ය යනු
පජාය	**(නා)**	-	ප්‍රජාවට
නමස්සෙය්‍ය	**(ක්‍රි)**	-	වඳින්නේ ය/ වැඳිය යුතු ය
සක්කරෙය්‍යා	**(ක්‍රි)**	-	සත්කාර කරන්නේ ය/ සත්කාර කළ යුතු ය
අන්නෙන	**(නා)**	-	කෑමෙන්
පානෙන	**(කි)**	-	බීමෙන්
වත්ථෙන	**(නා)**	-	වස්ත්‍රයෙන්
සයනෙන	**(කි)**	-	ඇඳ ඇතිරිලිවලින්
උච්ඡාදනෙ	**(කි)**	-	ඇඟ ඉලීමෙන්
නහාපනෙ	**(කි)**	-	නෑවීමෙන්
පාදානං	**(නා)**	-	පාදයන්
ධොවනෙන	**(කි)**	-	සේදීමෙන්
පාරිචරියාය	**(කි)**	-	මෙහෙවර කිරීමෙන්
ඉධෙව	**(සං)**	-	මෙලොව දී ම
පසංසන්ති	**(ක්‍රි)**	-	ප්‍රශංසා කරති
පෙච්ච	**(නි)**	-	පරලොව
මොදති	**(ක්‍රි)**	-	සතුටු වෙයි

අභ්‍යාස

01. ''බ්‍රහමාතිමාතාපිතරෝ'' පාලි ඡේදය සිංහලට නගන්න.

02. ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. ඉමස්මිං සුත්තෙ කෙසං ගුණං පාකටං කරොති?
ii. කතමානි තානි ගුණානි?
iii. පුත්තෙහි මාතාපිතූනං කිං කාතබ්බං?
iv. මාතාපෙත්තිභරං ජන්තු කානි ආනිසංසානි ලභති?
v. මාතාපිතූනං කානි අධිවචනානි භවන්ති?

3. ඡේදය කියවා පහත සඳහන් ප්‍රශ්නවලට සිංහලෙන් පිළිතුරු සපයන්න.

i දෙමව්පියෝ හැදින්වීමට යොදා ඇති පර්යාය පද 03ක් ලියන්න.
ii. ආහුණෙය්‍ය ගුණය පහදන්න.
iii. දෙමව්පියෝ දරුවන්ට දක්වන උපකාර මොනවා ද?
iv. නුවණැති පුද්ගලයෝ මව්පියන්ට සිදු කරන යුතුකම් මොනවා ද?
v. මව්පිය - දූදරු සම්බන්ධයේ වටිනාකම ඡේදය ඇසුරින් පහදන්න.

වාක්‍ය පරිවර්තනය

හැඳින්වීම

වාක්‍ය පරිවර්තනයේ දී හා නිර්මාණයේ දී ඉතා වැදගත් වන අංග කීපයක් වේ. එහි දී නිපාත, උපසර්ග, පූර්වක්‍රියා, තුමන්ත ආදි වියරණ විධි ප්‍රධාන වේ. භාෂාවේ ජීව ගුණය වර්ධනය කිරීමට හා භාෂා සුඛනම්‍යතාව දැක්වීමට මෙමගින් ලැබෙන ආලෝකය අතිමහත් ය. වාක්‍යය පරිවර්තනයේදී නිපාතාර්ථ පිළිබඳ අවබෝධය වැදගත් වන බැවින්, මෙහි ලා නිපාත සමූහයක අර්ථ දක්වමු.

විභක්ති අර්ථ සහිත නිපාත පද

පඨමා විභක්තිය

අත්ථි - ඇත සක්කා - හැකි ය ලබ්භා - ලැබිය හැකි ය

ආලපන විභක්තිය

ආවුසො - ඇවැත්නි
භමෙභා - එම්බා/ පින්වත්නි
භරෙ - බොල
ජෙ - බොල
අමෙභා - එම්බා/පින්වත
අරෙ - බොල, කොල
රෙ - බොල

තතියා විභක්ති අර්ථය

සයං - තමා සමං - සමාන සම්මා - මනා සේ

චතුත්ථී විභක්ති අර්ථය

කාතවෙ - කරන්නට
කාතුං - කරන්නට
දාපෙතුං - දෙන්නට
දාතවෙ - දෙන්නට
දාතුං - දෙන්නට

පඤ්චමී විභක්ති අර්ථය

රාජතො	- රජුගෙන්	චොරතො	- සොරුගෙන්
පිටඨිතො	- පසු පසින්	පාදතො	- පාදයෙන්
සීසතො	- හිසෙන්		

සත්තමී විභක්ති අර්ථය

සමන්තා	- හාත්පස	සාමන්තා	- සමීපයේ වූ
පරිතො	- හාත්පස	අභිතො	- හාත්පසින්
එකමන්තං	- එකත්පසෙක	හෙට්ඨා	- යට
උපරි	- මත්තෙහි	සම්මුඛා	- ඉදිරියෙහි
ඔරං	- යට, මෙහා	පෙච්ච	- පරලොව

කාල සත්තමී අර්ථය

සුවෙ	- හෙට	භූතපුබ්බං	- පෙර වූවක්
උත්තර සුවෙ	- අනිද්දා	පාතො	- උදෑසන
නිච්චං	- නිතර	සතතං	- නිතර
අභිණ්හං	- නිතර	අභික්ඛණං	- නිතර

පාලි භාෂාවේ යෙදෙන විවිධ අර්ථ ඇති නිපාත පද සමූහයක් පහත දැක්වේ.

කච්චි	- කිමෙක් ද?	න	- නොවේ
කථං	- කෙසේ ද?	කිං	- කිමෙක් ද?
ඉති	- යනුවෙනි	යාව	- යම්තාක්
තාව	- ඒ තාක්	යාවතා	- යම්තාක්
තාවතා	- ඒ තාක්	කිත්තාවතා	- කොපමණකින්
එත්තාවතා	- මෙපමණකින්	එවං	- මෙසේ
සාහු	- යෙහෙකි	ඔපායිකං	- සුදුසු
ආම	- එසේ ය	සාධු	- මැනවි
යථා	- යම් සේ	තථා	- එසේ
එවං	- මෙසේ	යථාපි	- යම්සේ ද
එවමපි	- මෙසේ ද	විය	- මෙන්
සෙය්‍යථාපි	- යම් සේ	යථරිව	- යම්සේ
ඉව	- වාගේ / මෙන්	ඉංඝ	- එහෙනම්
සාධු	- මැනවි	සචෙ	- ඉදින්

හන්ද	- ඒකාන්තයෙන්	නූන	- ඒකාන්තයෙන්
කසමා	- කවර හෙයකින්	සහ,සද්ධිං,සමං	- සමඟ
විනා	- හැර	රිතෙ	- හැර
නානා	- නොයෙක්	පුථු	- බොහෝ
පුථු	- වෙන්ව	විසුං	- වෙන්ව
දුට්ඨු	- නොමනා සේ	කු	- නින්දිත, අල්ප
සකිං	- එක් වරක්	ඊසකං	- ස්වල්පයක්
සනිකං	- හෙමින්	ඛිප්පං	- වහා/ඉක්මනින්
ආසු	- වහා	අචිරං	- නොබෝ කලකින්
චිරං	- බොහෝ කලක්	චිරස්සං	- දිගු කලකින්
චෙ	- ඉඳින්	යදි	- ඉඳින්
හා	- අහෝ	සචේ	- ප්‍රත්‍යක්ෂය
මුසා	- මුසාව	මිච්ඡා	- මිථ්‍යාව
අලිකං	- අසත්‍ය	සුවත්ථි	- සෙත්වේවා
අථ	- ඉක්බිති	බලු	- වනාහි
වත	- ඒකාන්තයෙන්	අථෝ	- ඉක්බිති
සෙය්‍යථීදං	- කෙසේ ද යත්	හි	- ඒකාන්තයෙන්
චරහි	- දැන්, එසේනම්	හවෙ	- ඒකාන්තයෙන්
ච	- ද	වෙ	- ඉඳින්

මෙබඳු නිපාත යෙදුණු වාක්‍ය කීපයක පරිවර්තනය මෙසේ ය.

අචිරං වතයං කායො පඨවිං අධිසෙස්සති - වැඩි කලක් යන්නට පෙර මේ සිරුර ඒකාන්තයෙන් පොළොවෙහි හොවින්නේ ය.
මා මං අපාදකො හිංසි. - පා නැත්තා මට හිසා නො කරන්න.
පුනප්පුනං දානපතී දදන්ති - දානපතීහු නැවත නැවත දෙති.
කහං පන භික්ඛු **එතරහි** සො භගවා විහරති - භික්ෂුව දැන් ඒ භාග්‍යවතුන් වහන්සේ කොහි වාසය කරන සේක් ද?

උපසර්ග පද

''**උපෙච්ච අත්ථං සජනතීති උපසගගා**'' ධාතු මූලික ශබ්දයන්ට මුලින් යෙදී අර්ථය සරසන 'ප' ආදි පද 'උපසර්ග' නම් වෙයි. තව ද උපසර්ග පද සියල්ල ම අන්‍ය ශබ්දයක් සමග මිස හුදෙකලාව නො යෙදේ. (''**උපසගගා සබ්බපි සද්දන්තරෙන සහ පයුජ්ජන්තෙ**) එබඳු උපසර්ග පද විස්සක් (20) පාලි භාෂාවේ දක්නට ලැබේ. මේවා ද වරනොනැඟෙන බැවින් **අව්‍යය පද** ගණයට වැටේ.

ප, පරා, නි, නී, උ, දු, සං, වි, අව, අනු, පරි, අධි, අභි, පති, සු, ආ, අති, අපි, අප, උප එතෙ වීසත්‍යුපසගගා පාලි භාෂා ව්‍යරණ ඇදුරෝ උපසර්ග පදවල ක්‍රියාකාරීත්වය පිළිබඳ අගනා විවරණයක් කර ඇත.

ධාත්වත්ථං බාධතෙ කොචි - කොචි තං අනුවත්තතෙ
තමෙවඤ්ඤා විසෙසෙති - උපසගගතී තිධා

උපසර්ග පදයන්ගේ ක්‍රියාකාරිත්වය තුන් ආකාරයකට සිදු වේ.

ධාතුවේ අර්ථයට බාධා කරයි.
ධාතුවේ අර්ථයට අනුකූල වෙයි.
ධාතුවේ අර්ථය විසිතුරු කරයි.

උපසර්ග නිසා ධාතුවකින් නිපදවෙන ක්‍රියා පද විවිධාර්ථවත් වන අයුරු පහත නිදසුනෙන් පැහැදිලි වේ.
කමු (ගතියං) ධාතුවට උපසර්ග පද එක්වීමෙන් පද සෑදෙන්නේ මෙසේ ය.

ප + කමු + ති	-	පක්කමති	- යයි
පරා + කමු + ති	-	පරක්කමති	- වීර්ය කරයි
නි + කමු + ති	-	නික්ඛමති	- නික්මෙයි
සං + කමු + ති	-	සංකමති	- සංක්‍රමණය වෙයි
අව + කමු + ති	-	ඔක්කමති	- බසියි
අනු + කමු + ති	-	අනුක්කමති	- අනුව යයි
පරි + කමු + ති	-	පරික්කමති	- වටේ යයි
අභි + කමු + ති	-	අභික්කමති	- ඉදිරියට යයි
පටි + කමු + ති	-	පටික්කමති	- ආපසු යයි
ආ + කමු + ති	-	අක්කමති	- පාගයි
අති + කමු + ති	-	අතික්කමති	- ඉවත් වෙයි

ඒ අනුව උපසර්ග නිසා ක්‍රියාපදයක් විවිධාර්ථවත් බවට පත්වන අයුරු ප්‍රකට වේ. පරිවර්තන කාර්යයේදී උපසර්ගයක් මගින් අර්ථ වෙනස් වන අයුරු අවබෝධ තරගත යුතු ය.

සන්ධි කාර්ය නිසා උපසර්ග පද අප්‍රකට වන අවස්ථා පාලි භාෂාවෙහි දැකිය හැකි ය. පහත නිදසුන් එබඳු අවස්ථා තේරුම් ගැනීමට ඉවහල් වේ.

අව > ඔ වීම	අව + නද්ධා	-	ඔනද්ධා
	අව + කාස	-	ඔකාස
පරි > පළි වීම	පරි + බොධො	-	පළිබොධො
	පරි + බුජ්ඣති	-	පළිබුජ්ඣති
අභි > අබහ වීම	අභි + ඔකාසං	-	අබ්භොකාසං
	අභි + උගගච්ඡති	-	අබ්භුගගච්ඡති
පති > පච්ච වීම	පති + එකං	-	පච්චෙකං

	පති + අකඛාති	-	පචචකඛාති
අති > අචච වීම	අති + අන්ත	-	අචචන්ත
	අති + අගා	-	අචචගා
අධි > අජ්ඣ වීම	අධි + අභාසි	-	අජ්ඣභාසි
	අධි + අවහරති	-	අජෙඣාහරති
පති > පටි වීම	පති + ලභති	-	පටිලභති
	පති + කමති	-	පටිකකමති
අපි > පි වීම	අපි + දහති	-	පිදහති

වාක්‍ය පරිවර්තනයේදී පූර්වක්‍රියා තුමන්ත ක්‍රියාවන්හි කාර්ය වැදගත් වන බැවින් මෙහි ලා ඒවා සංක්ෂිප්තව දක්වමු.

පූර්ව ක්‍රියා

පුබබකාලෙකකත්තුකානං තුන ත්වාන ත්වා වා පූර්ව ක්‍රියා පද සාධනයේ දී තුන ත්වාන, ත්වා යන ප්‍රත්‍යය යෙදේ. එකකර්තෘක වාක්‍ය කීපයක් පූර්වක්‍රියා යෙදීමෙන් එක් වාක්‍යයක් බවට පත් කෙරේ.

පුරිසො පාතොව පබුජ්ඣති.
සො මුඛං ධොවති.
සො ගෙහෙ කම්මං කරොති.
සො භත්තං භුඤ්ජති.

පුරිසො පාතොව **පබුජ්ඣිත්වා** මුඛං **ධොවිත්වාන** ගෙහෙ කම්මං **කාතුන** භත්තං භුඤ්ජති.

මේ වාක්‍යයේ එක ම කර්තෘවරයෙක් නිසා පූර්වක්‍රියා පදවලින් තනි වාක්‍යයක් බවට පත් කර ඇති අයුරු පෙනේ.

පූර්වක්‍රියා පද සාධනය

කර + **ත්වා** - කත්වා
කර + **ත්වාන** - කත්වාන
කර + **තුන** - කාතුන

කත්වා, කත්වාන, කාතුන (කොට)
පචිත්වා, පචිත්වාන (පිස)
වසිත්වා, වසිත්වාන (වාසය කොට)

පූර්වක්‍රියා පද සාධනයේ දී තුන ආදි ප්‍රත්‍යයවලට පාලියෙහි **ය, ඝඨා, මම, ඡඡ, චච, යහ** යනාදී ආදේශ වේ. බොහෝ විට මෙම ආදේශයන් සිද්ධ වනුයේ උපසර්ග පූර්ව ධාතු පූර්වක්‍රියා බවට පත්වීමේ දී ය.

අභි + භූ + ය	- අභිභූය	(මැඩ)
දිස + තඝා	- දිඝඨා	(දැක)
නි + කමු + මම	- නික්කමම	(නික්ම)
වී + භජ + ඡජ	- විභජජ	(බෙදා)
වි + විච + චච	- විවිචච	(වෙන්ව)
ආ + රුහ + යහ	- ආරුයහ	(නැග)

යනු නිදසුන් ය.

තුමන්ත ක්‍රියා

ඉච්ඡත්‍ථෙසු සමානකත්තුකෙසු තවෙ තුං වා තුමර්ථය නම්, කිරීමට ඇති කැමැත්තයි. කර්තෘ යම් ක්‍රියාවක් කිරීමට අපේක්ෂා කරන විට එම ක්‍රියාව තුමර්ථයෙන් යෙදේ. තුමර්ථයේ දී පාලියෙහි **තවෙ, තුං** යන ප්‍රත්‍යයයෝ යෙදෙත්. **තවෙ, තුං** යන ප්‍රත්‍යයන්ට අතිරේකව **'තායෙ'** යනුවෙන් ප්‍රත්‍යයක් ද වේ. උදාහරණ පහත දැක්වේ.

සො ධම්මං සොතුං ඉච්ඡති.
සො ධම්මං සොතවෙ ඉච්ඡති.
දකඛිතායෙ අපරාජිතසංඝං.

අභ්‍යාස

01. උදාහරණය සැලකිල්ලට ගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

නිපාත පදය	සිංහල අර්ථය	පාලි වාක්‍යය
ආවුසො	ඇවැත්නි	මා ආවුසො සොචිත්‍ථ
අමෙහා		
ජෙ		
සෙය්‍යථීදං		
හි		
වෙ		
යදි		

02. නිපාත පදවල අර්ථය ලියන්න.

අතිපපගොබ්බා	
කුහිං	
මිච්ඡා	
මුධා	
සුවෙ	
හුරං	
කීවචිරං	
කතිධා	
කතිකඛත්තුං	
තිරියං	

03. පුර්ව ක්‍රියා පද යොදා පහත වාක්‍ය තනි වාක්‍ය සේ ලියන්න

උදාහරණ :- අහං විහාරං ගච්ඡාමි / අහං බුද්ධං වන්දාමි
අහං විහාරං ගන්ත්වා බුද්ධං වන්දාමි.

i. කුමාරෝ නගරං ගච්ඡති / සෝ ආපණා භණ්ඩානි කිණාති.
ii. මාතා පුප්ඵං ඔචිනාති / සා බුද්ධං වන්දති.
iii. දෙවෝ ධම්මං සුණාති / සෝ ආකාසෙන ගච්ඡති.
iv. මිගෝ සීහං පස්සති / සෝ වෙගෙන ධාවති.
v. ථෙරා පිණ්ඩාය චරන්ති / තෙ විහාරං පවිසන්ති.

04. තුමන්ත ක්‍රියා පද යොදා පහත වාක්‍ය තනි වාක්‍ය සේ ලියන්න. අර්ථය ද ලියන්න.

උදාහරණ :- අහං විහාරං ගච්ඡාමි / අහං බුද්ධං වන්දාමි
අහං බුද්ධං වන්දිතුං විහාරං ගච්ඡාමි.

i. සාමණෙරෝ පරිවෙණං ගච්ඡති. / සෝ තත්ථ පාලිභාසං උගණ්හාති.
ii. පුරිසෝ පාතොව ධූමරථෙන නගරං ගච්ඡති / සෝ නගරෙ කම්මං කරොති
iii. භික්ඛවෝ පණ්ණරසියං උපොසථාගාරං ගච්ඡන්ති / තෙ තත්ථ විනයං වාචෙන්ති.
iv. කම්මකාරා වෙසාඛෙ පාටිපදියං සන්නිපතන්ති /තෙ තෙසං කම්මකාරදිවසං සමනුස්සරන්ති.

05. පහත වාක්‍යයන්හි කළු අකුරින් මුද්‍රිත පදවල උපසර්ග වෙන් කර ලියන්න. සිංහලට පරිවර්තනය කරන්න.

i. කෙවලකප්පං ගිජ්ඣකූටං **ඔහාසෙත්වා** යෙන භගවා තෙනුපසංකමිංසු.
ii. යෙහුය්‍යෙන බො පන භන්තෙ යක්ඛා **අප්පටිවිරතායෙව** පාණාතිපාතා.
iii. තෙ යානෙ **අභිරුහිත්වා** සබ්බා දිසා **අනුපරියන්ති.**
iv. **පච්චෙසන්තෙනා පකාසෙන්ති** තතොලා තත්තලා තතොතලා
v. **නිපජ්ජ** පාදමූලමහි තං ඨානං **අභිපත්ථයිං.**

06. වගුව සම්පූර්ණ කරන්න.

ක්‍රියාපදය	අර්ථය	පූර්ව ක්‍රියාව	තුමන්ත ක්‍රියාව
ඔතරති	බසියි	ඔතරිත්වා	ඔතරිතුං
නිරුජ්ඣති			
ආරුහති			
නීහරති			
අබ්භුගච්ඡති			
උපසංකමති			

07. පහත වාක්‍ය සිංහලට නගන්න.

i. අජ්ජ උපාසකා විහාරං ගන්ත්වා ධම්මං සුණන්තු.
ii. මයං සුවෙ ගගනයානෙන ජම්බුදීපං ගච්ඡිස්සාම.
iii. හෙ මිත්ත, අජ්ජව සීලානි සමාදියාහි, අකුසලං පජහිත්වා කුසලං භාවෙහි.
iv. අහං ආහාරං පටියාදෙතුං ගෙහං පවිසාමි.
v. යක්ඛිනී සහායිකාය වණ්ණනාගන්ත්වා ගෙහං පාවිසි.

08. පහත වාක්‍ය පාලියට නගන්න

i. අනේපිඬු සිටුතුමා දවසට දෙවරක් බුදුහිමියන් බලන්නට ජේතවනාරාමයට යයි.
ii. පින් කරන පුද්ගලයෝ නිතර නිතර පින් කරන්නට සිත යොමු කරති.
iii. මහා ප්‍රජාපතී ගෝතමිය පැවිදි වීමට බුදුහිමියන්ගෙන් අවසර ඉල්ලුවා ය.
iv. පිරිවෙන් ශිෂ්‍යයෝ සෑමදා පිරිවෙනට ගොස් පාලි භාෂාව ඉගෙනීමට සිතා ගත්හ.
v. නැණවත් බුද්ධිමත් දරුවෝ නිතර බුදුන් වඳින්නට වෙහෙරට යත්.

09. දී ඇති නිපාත පද සුදුසු තැන්හි යොදා පහත වාක්‍ය පාලියට නගන්න.
(ආවි වා රහො වා / අඳධා / අබහුමෙම / කිං / ඡෙ / දීඝරත්තං)

i. **එම්බල** කාළිය **කුමක්** **හෙයින්** දවල් වී නැගිට්ටා ද?
ii. **එළිපිට** හෝ **රහසින්** හෝ පව් නොකළ යුතු ය.
iii. මෙය මට **දීර්ඝ** **කාලයක්** අහිත පිණිස පවතියි.
iv. **ඒකාන්තයෙන්** මේ ප්‍රතිපත්තිය නිවන් පිණිස ම පවතී.
v. **හපොයි** **අම්මේ**, මේ කුමන විපතක් ද?

10. පහත ආඛ්‍යාත පදයන්ගෙන් නිපදවෙන පූර්ව ක්‍රියාපද හා තුමන්ත ක්‍රියාපද දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

කරොති	කත්වා	කත්වාන	කාතූන	කාතුං	කාතවෙ
භුඤ්ජති					
සයති					
වන්දති					
චරති					
ධාවති					

නවමො පාඨො

කසමා ලිචඡවීති වදන්ති?

තෙන ච සමයෙන අඤ්ඤතරො තාපසො ගොපාලකුලං නිස්සාය ගඞ්ගාතීරෙ විහරති. සො පාතොව ගඞ්ගං ඔතරන්තො භාජනං ආගච්ඡන්තං දිස්වා පංසුකූලසඤ්ඤාය අගගහෙසි. තතො තත්ථ තං අකඛරපට්ටකං රාජමුද්දිකාලඤ්ඡනඤ්ච දිස්වා මුඤ්චිත්වා තං මංසපෙසිං අදාස. දිස්වානස්ස එතදහොසි. 'ඉයා ගබ්භො. තථා හිස්ස දුගන්ධපූතිභාවො නත්ථී'ති. තං අස්සමං නෙත්වා සුදෙධ ඔකාසෙ ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන දෙව මංසපෙසියො අහෙසුං. තාපසො දිස්වා සාධුතරං ඨපෙසි. තතො පුන අඩ්ඪමාසච්චයෙන එකමෙකිස්සා පෙසියා හත්ථපාදසීසානමත්ථාය පඤ්ච පඤ්ච පීළකා උට්ඨහිංසු. තාපසො දිස්වා පුන සාධුතරං ඨපෙසි. අථ අඩ්ඪමාසච්චයෙන එකා මංසපෙසි සුවණ්ණබිම්බසදිසො දාරකො. එකා දාරිකා අහොසි. තෙසු තාපසස්ස පුත්තසිනෙහො උප්පජ්ජි. අඞ්ගුට්ඨකතො චස්ස බීරං නිබ්බත්ති. තතොප්පභුති ච බීරහත්ථං ලභති. සො හත්ථං භුඤ්ජිත්වා බීරං දාරකානං මුඛෙ ආසිඤ්චති. තෙසං යං යං උදරං පවිට්ඨං, තං සබ්බං මණිභාජනගතං විය දිස්සති. එවං ලිච්ඡවී අහෙසුං. එවං තෙ නිච්ඡවිතාය ලිච්ඡවීති පඤ්ඤායිංසු.

(බුද්දකපාඨට්ඨකථා)

පදමාලාව

අඤ්ඤතරො	(ස,නා)	-	එක්තරා
ගොපාලකුලං	(ස)	-	ගොපලු කුලය
ඔතරන්තො	(කි)	-	බසින්නේ
පාතොව	(සං)	-	උදෑසන ම
නිස්සාය	(නි)	-	නිසා
අගගහෙසි	(ක්‍රි)	-	අල්ලා ගත්තේ ය
අකඛරපට්ටකං	(ස)	-	අකුරු ලියූ රෙදි කැබැල්ල
රාජමුද්දිකාලඤ්ඡනං	(ස)	-	රාජ්‍ය මුද්‍රා තැබූ ලාංඡනය
මුඤ්චිත්වා	(පූ.ක්‍රි.)	-	මුදා
දිස්වානස්ස	(සං)	-	(දිස්වාන + අස්ස) දැක ඔහුට
සියා	(ක්‍රි)	-	වන්නේ ය
ගබ්භො	(නා)	-	දරු ගැබ
දුගන්ධපූතිභාවො	(ස)	-	දුර්ගන්ධ හා නරක් වූ
සුදෙධ	(කි)	-	පිරිසිදු
ඔකාසෙ	(නා)	-	එළිමහනෙහි
අහෙසුං	(ක්‍රි)	-	වූහ
අඩ්ඪමාසච්චයෙන	(ස)	-	අඩමසක් ඇවෑමෙන්
සුවණ්ණබිම්බසදිසො	(ස)	-	රන් ප්‍රතිමාවක් සමාන

දාරකො	**(ත)**	-	පිරිමි දරුවා
පීළකා	**(නා)**	-	බිබිලි
උට්ඨහති	**(ක්‍රි)**	-	පැන නඟී
පුත්තසිනෙහො	**(ස)**	-	පුත්‍ර ස්නේහය
අඩ්ඪුට්ඨකතො	**(නා)**	-	මාපට ඇගිල්ලෙන්
තතොපපභුති	**(සං)**	-	එතැන් පටන්
බීරභත්තං	**(ස)**	-	කිරිබත්
මණිභාජනගතං	**(ස)**	-	මැණික් බඳුනකට ගිය
විය	**(නි)**	-	මෙන්
දිසසති	**(ක්‍රි)**	-	පෙනෙයි
ආසිඤ්චති	**(ක්‍රි)**	-	ඉසියි
නිච්ඡවිතාය	**(න)**	-	සිවිය නැති හෙයින්

අභ්‍යාස

01. 'කසමා ලිච්ඡවී'ති වදන්ති' ඡේදය සිංහලට නඟන්න.

02. පහත දැක්වෙන ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. තාපසො කුහිං වසති?
ii. තාපසො අක්ඛරපට්ටකං රාජමුද්දිකලඤ්ඡනං ච දිසවා කිං චින්තෙසි?
iii. කසමා මංසපෙසියා පඤ්ච පඤ්ච පීළකා උට්ඨහිංසු?
iv. දාරිකං ච දාරකං ච දිසවා තාපසො කිං අකාසි?
v. කසමා ලිච්ඡවීනං ඉත්ථං නාමං අහෙසුං?

03. පිළිතුරු සපයන්න.

i. තාපස දිනචර්යාවේ ඇති මූලික ලක්ෂණයක් ලියන්න.
ii. රාජ්‍යමුද්‍රා තැබීමෙහි ගූඪාර්ථය (සැඟවුණු අර්ථය) කුමක් ද?
iii. තවුස් දිවියේ අල්පේච්ඡත්වය ප්‍රකට වන කරුණු දෙකක් දක්වන්න.
iv. දරු සෙනෙහස පිළිබඳ බුදුරදුන්ගේ ඉගැන්වීම කෙබඳු ද?
v. ලිච්ඡවීන්ගේ රාජ්‍ය පාලන ක්‍රමයේ පැවති සුවිශේෂත්වය කුමක් ද?

සන්ධි

වෙන් වෙන්ව ඇති ලී කැබලි දෙකක් ගෙන එකට ගළපා එක ලීයක් කරන්නාක් මෙන් වෙන් වෙන්ව ළංව සිටි අකුරු දෙකක් **ලෝප, ආදේශ, ආගම, හ්‍රස්ව, දීර්ඝ, ද්විත්ව** ආදි සන්ධි කාර්යයන්ගේ ආධාරයෙන් එකට ගැළපීම සන්ධි නම් වේ.

උදා:- පාතො + එව - පාතොව
දිසවාන + අසස - දිසවානසස
එතං + අහොසි - එතදහොසි
තතො + පභුති - තතොපපභුති

පාලි භාෂාවේ ප්‍රධාන සන්ධි ප්‍රභේද 04ක් ඉගැන්වේ.

1. **ස්වර සන්ධි**
2. **ව්‍යඤ්ජන සන්ධි**
3. **නිග්ගහීත සන්ධි**
4. **වොමිස්සක සන්ධි**

පද සන්ධි කිරීමෙන් පසු සුඛොච්චාරණය, පද කෙටි වීම, භාෂාවේ ව්‍යක්ත බව ඇතිවීම හා ඡන්දස් ශාස්ත්‍රයේ දී විරිත ආරක්ෂා වීම ආදි ප්‍රයෝජන රැසක් ලැබේ.

ස්වර සන්ධි

පෙර පදයේ අග හා පර පදයේ මුල ස්වරයක් ඇති විට ලොප් කිරීමකින් හෝ අන්‍ය ක්‍රමයකින් එම අකුරු ගැළපීමෙන් සිදු වෙන සන්ධි විධිය **ස්වර සන්ධි** නම් වේ.

මාතු උපට්ඨානං විසන්ධි පදය
මාත් + උ + උපට්ඨානං ස්වර ව්‍යඤ්ජන වෙන් කිරීම **(පුබ්බමඩොඨිතමසසරං සරෙන වියොජයෙ)**
මාත් + උපට්ඨානං පූර්ව ස්වර ලෝපය **(සරා සරෙ ලොපං)**
මාතුපට්ඨානං අකුරු ගැළපීම **(නයෙ පරං යුත්තෙ)**

ස්වර සන්ධි			
	විස්තර	**උදාහරණ**	**බාලාවතාර සූත්‍ර**
ලෝපය	පූර්ව ස්වර ලෝපය	ලොක + අගෙහා - ලොකගෙහා	**සරා සරෙ ලොපං**
	පර ස්වර ලෝපය	ඡායා + ඉව - ඡායාව	**වා පරෝ අසරූපා**
දීර්ඝ	පූර්ව ස්වර දීර්ඝය	කිංසු + ඉධ - කිංසූධ	**පුබ්බො ච**
	පර ස්වර දීර්ඝය	යානි + ඉධ - යානීධ	**දීඝං**

ආදේශ	**අසවර්ණාදේශය** ඉ, ඊ > එ උ, ඌ > ඔ	බන්ධුසස + ඉව > බන්ධුසෙසව ගංගා + උදය > ගංගොදය	කචාසවණණං ලුත්තෙ
	යකාරාදේශය එ > ය	තෙ + අජ්ජ > ත්‍යජ්ජ	යමෙදන්තසසාදෙසො
	ඉ, ඊ > ය	වුත්ති + අසස > වුත්‍යාසස	ඉවණෙණා යං නවා
	වකාරාදේශය ඔ, උ > ව	සො + අසස > සවසස අනු + එති > අන්වෙති	වමොදුදන්තානං
	දකාරාදේශය ධ > ද ඇතැම් විට ව්‍යඤ්ජන අකුරක් පර කල්හි ද මෙය වේ.	ඉධ + අහං > ඉදාහං ඉධ භික්ඛවෙ > ඉදභික්ඛවෙ	දොධසස ච
	රිකාරාදේශය ස්වරයා කෙරෙන් පර වූ එව ශබ්දයේ එ > රි වේ. ගැළපෙන සේ පූර්වස්වර ලෝපය ද වේ.	යථා + එව > යථරිව	එවාදිසසරි පුබ්බා ච රසෙසා
	අබ්භාදේශය අභි > අබ්භ	අභි + උග්ගතො > අබ්භුග්ගතො	අබ්භා අභි
ආගම	අතරට 'ය' ආදි අකුරක් පැමිණීම යි. 'ය' ආගම 'ව' ආගම 'ම' ආගම 'ද' ආගම 'න' ආගම 'ත' ආගම 'ර' ආගම 'ළ' ආගම 'ග' ආගම	පරි + එසති - පරියෙසති භූ + ආදයො - භූවාදයො කසා + ඉව - කසාමිව බහු + එව - බහුදෙව ඉතො + ආයති - ඉතොනායති තසමා + ඉහ - තසමාතිහ චතු + ආරක්ඛා - චතුරාරක්ඛා ඡ + අභිඤ්ඤා - ඡළභිඤ්ඤා පුථ් + එව - පුථග්ගෙව	යවමදනතරලා චාගමා

ද්විත්ව	ස්වරයා පර කල්හි පූර්වයේ ඇති අක්ෂරය ද්විත්ව වේ.	පති+අන්තං = විසන්ධිය පත්+ය්+අන්තං = ඉවණ්ණා යං නවා පච්+අන්තං = සබ්බබ්‍යඤ්ඤනන්ති පච්ච්+අන්තං - පරදෙවභාවොඨානෙ පචචන්තං - නයෙපරං යුත්තෙ	පරදෙවභාවොඨානෙ
හ්‍රස්ව	බ්‍යඤ්ජනයක් පර කල්හි පූර්වයේ ඇති දීර්ඝ ස්වරය හ්‍රස්ව වේ.	පා + එව ප් + ආ + ග් + එව - යවමදනතරලාවාගමා පගෙව	රස්සං
ප්‍රකෘති	වෙනසකට පත් නොකොට තිබෙන පද දෙක එක පදයක් සේ ලිවීම	පා + එව - පාඑව	සරෙ කඩවි

බ්‍යඤ්ජන සන්ධි			
	විස්තර	උදාහරණ	බාලාවතාර සූත්‍ර
ලෝපාගම	බ්‍යඤ්ජනයක් පර කල්හි පූර්වයේ ඇති ස්වරය ඇතැම් විට ලොප් වී එතනට 'අ' ආගම වේ. සූත්‍රයේ ඇති චකාරයේ බලයෙන් ඇතැම් විට 'ඵ', 'ඹ' ද ආගම වේ.	සො + භික්ඛු - සභික්ඛු ජානෙම + තං - ජානෙමුතං කච්චිනු + භවං - කච්චිනොභවං	ලොපං ච තත්‍රාකාරො
අසමාන ද්විත්වය	වර්ගාක්ෂරයන්ගේ 2, 4 අකුරුවලට පිළිවෙළින් 1, 3 අකුරු ආදේශය වේ (මහප්‍රාණ අකුරුවලට අල්පප්‍රාණ අකුරු වීම)	ආ + ඛාතං - අකඛාතං උ + සොසො - උගෙඝාසො සෙත + ඡත්ත - සෙතච්ඡත්ත පඨම + ඣාන - පඨමජ්ඣාන පද + ඨාන - පදට්ඨාන පුණ්ණ + ථෙර - පුණ්ණත්ථෙර ඡ + ධා - ජද්ධා මහා + භය - මහබ්භය	වග්ගෙ සොඝා'සොඝානං තතියපඨමා

ඔකාරාගම	ව්‍යඤ්ජනයක් පර කල්හි ඇතැම් විට 'ඔ' ආගම වේ.	පර + සහසසං - පරොසහසසං අතිපප + බො - අතිපපගොබො	කවචි ඔ ව්‍යඤ්ජනෙ
ඔකාරාදේශ	ව්‍යඤ්ජනයක් පර කල්හි 'අව' උපසර්ගයට 'ඔ' ආදේශ වේ.	අව + නද්ධා - ඔනද්ධා	ඔ අවසෙස

නිග්ගහීත සන්ධි			
	විස්තර	උදාහරණ	බාලාවතාර සූත්‍ර
ආදේශය	වර්ගාන්තාදේශය පූර්වපදයේ බිංදුවක් තිබී පර පදයේ වර්ගාක්ෂරයක් ඇති විට එම වර්ගයේ වර්ගාන්තාක්ෂරය බිංදුවට ආදේශ වේ. සූත්‍රයේ ඇති චකාරයේ බලයෙන් ලකාරය පර කල්හි ද බිංදුවට 'ල' කාරයක් වේ.	කිං + කතො > කිඞ්කතො සං + ජාතො > සඤ්ජාතො සං + ධීතා > සණ්ධීතා තං + ධනං > තන්ධනං තං + මිත්තං > තම්මිත්තං පුං + ලිංග > පුල්ලිඞ්ග	වගගන්තං වා වගෙ
	'ම'කාර, 'ද'කාර ආදේශය ස්වරයක් පරකල්හි පූර්වයේ ඇති බිංදුවට 'ම' හා 'ද' ආදේශ වේ.	එවං + ඉමං > එවමිමං එතං + අවොච > එතදවොච	මදාසරෙ
	'ඤ්ඤ'කාරාදේශය 'එ' හෝ 'හ' පරව සිට මුලින් නිග්ගහීතයක් ඇති විට 'ඤ්ඤ' ආදේශ වේ.	තං + එව > තඤ්ඤෙව තං + හි > තඤ්ඤහි	එහෙඤ්ඤං
	'ය' පර කල්හි ද මුලින් ඇති බිංදුවට 'ය' සමඟ 'ඤ්ඤ'කාරයක් ආදේශ වේ.	සං + යොගො > සඤ්ඤොගො	සයෙව

ආගම	**නිග්ගහීත ආගම** ස්වර හෝ ව්‍යඤ්ජන අකුරක් පර කල්හි නිග්ගහීතයක් ආගම වේ.	චකඛු + අනිච්චං > චකඛුංඅනිච්චං අව + සිරො > අවංසිරො	**නිගහීතඤ්ච**
ලෝපය	**නිග්ගහීත ලෝපය** ස්වරයක් පර කල්හි මුලින් ඇති බිංදුව ලොප් වේ. ව්‍යඤ්ජනාක්ෂරයක් පර කල්හි ද මුලින් ඇති බිංදුව ලොප් වේ.	විදූනං + අගගං > විදූනගගං බුද්ධානං + සාසනං > බුද්ධානසාසනං	**කචචි ලොපං** **ව්‍යඤ්ජනෙ ච**
	ස්වරලෝපය බිංදුවෙන් පර වූ ස්වරය විකල්පයෙන් ලොප් වේ.	බීජං + ඉව > බීජංව	**පරො වා සරො**
විසංයෝග	බිංදුවෙන් පර ස්වරය ලොප් කළ විට සංයෝග ව්‍යඤ්ජන විසංයෝග වේ.	එවං + අසස > එවංස	**ව්‍යඤ්ජනො ච විසඤ්ඤාගො**

වොමිස්සක සන්ධි

වොමිස්සක සන්ධි යනු ඉහත දැක්වූ ස්වර, ව්‍යඤ්ජන, නිග්ගහීත යන සන්ධි ක්‍රම තුනේ ම මිශ්‍රණයක් ලෙස සරලව හඳුන්වාදිය හැකි ය. සංස්කෘත, ප්‍රාකෘත ආදි භාෂාවන්ගෙන් පාලි භාෂාවට පැමිණි වචනවලට පාලි ස්වරූපය ලබාදීමේ අදහසින් බාලාවතාර කතුවරයා මෙම සන්ධි ක්‍රමය හඳුන්වා දී ඇත. සන්ධි පද පිළිබඳ ගැඹුරින් කෙරෙන හැදෑරීමක දී මේ ගැන පුළුල් අවබෝධයක් ලබා ගත හැකි ය. වොමිස්සක සන්ධි කාණ්ඩයේ භාවිත වන මූල සූත්‍රය මෙසේ ය.

අනුපදිටඨානං වුත්තයොගතො

★ ස්වර ව්‍යඤ්ජන නිග්ගහීත සන්ධි කාණ්ඩවල නො දැක්වූ යම් පද සිද්ධි මේ සූත්‍රයේ බලයෙන් සිද්ධ කළ යුතුය. වොමිස්සක කාණ්ඩයේ එන පද කීපයක් සූත්‍රානුසාරයෙන් මෙසේ සන්ධි කොට දැක්විය හැක.

යදි + එවං	- විසන්ධි පදය
යද් + ඉ + එවං	- පුබ්බමඩොඨිතමසඤරං සරෙන වියොජයෙ
යද් + ය් + එවං	- ඉවණ්ණා යං නවා
යජ් + එවං	- අනුපදිටඨානං වුත්තයොගතො
යජ් + ජ් + එවං	- පරදෙවභාවො ඨානෙ
යජෙජවං	- නයෙ පරං යුත්තෙ

බොධි + අඞ්ග	- විසන්ධි පදය
බොධ් + ඉ + අඞ්ග	- පුබ්බමඩොඨිතමසඤරං සරෙන වියොජයෙ
බොධ් + ය් + අඞ්ග	- ඉවණ්ණා යං නවා
බො ඤ්ඣ් + අඞ්ග	- අනුපදිටඨානං වුත්තයොගතො
බො + ජ් + ඤ්ඣ් + අඞ්ග	- වග්ගෙ සොඝඝොඝඝානං තතියපඨමා
බොජ්ඣඞ්ග	- නයෙ පරං යුත්තෙ

ස + රති	- විසන්ධි පදය
ස් + අ + රති	- පුබ්බමඩොඨිතමසඤරං සරෙන වියොජයෙ
ස් + අ + ම + රති ස් + උ + ම + රති	- අනුපදිටඨානං වුත්තයොගතො - නයෙ පරං යුත්තෙ
සුමරති	

සා + ඉත්ථී	- විසන්ධි පදය
ස් + ආ + ඉත්ථී	- පුබ්බමඩොඨිතමසඤරං සරෙන වියොජයෙ
ස් + ආ + ත්ථී	- වා පරො අසරූපා
ස් + ඔ + ත්ථී	- අනුපදිටඨානං වුත්තයොගතො
සොත්ථී	- නයෙ පරං යුත්තෙ

ඉති + එවං	- විසන්ධි පදය
ඉත් + ඉ + එවං	- පුබ්බමඩොඨිතමසඤරං සරෙන වියොජයෙ
ඉත් + ව් + එවං	- අනුපදිටඨානං වුත්තයොගතො
ඉත්‍වෙවං	- නයෙ පරං යුත්තෙ

අවධානයට

බාලාවතාරයේ ඇතැම් සූත්‍රවල **කචචි, වා, ච, නවා** යන නිපාත පද දැක්වේ. ඉන් කියවෙනුයේ එම සූත්‍ර නියමය ඇතැම් විට විකල්පයෙන් සිදු වන බව යි.

අභ්‍යාස

01. සිංහලට නගන්න.

i. ආචරියෝ සිසෙස්ස 'සන්ධි' නාම පාඨං පාඨයති.
ii. පුත්තාමත්ථි ධනමමත්ථි ඉති බාලෝ විහඤ්ඤති.
iii. මයං සබ්බෙව ධම්මං සුත්වා තං සාධුකං මනසිකරොම.
iv. දාරකා පුප්ඵානො'චිනිතුං වනං ගන්ත්වා සෙතානි'පි නීලානි'පි පුප්ඵානා'හරිංසු.
v. උගගණ්හිතුකාමා භික්ඛූ පාතො'වුට්ඨාය බාලාවතාරඤ්ච නිසණ්ඩුඤ්ච වාචෙන්ති.

02. සන්ධි කළ හැකි තැන් සන්ධි කොට පාලියට නගන්න.

i. දේවතාවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතනට එළඹියේ ය.
ii. මහණෙනි, පෙර මේ සැවැත්නුවර ම වේදේහිකා නම් ගෘහපතිනියක් වූවා ය.
iii. 'අපි ද පැවිදි වන්නෙමු'යි යන සිතුවිල්ල යසකුල පුත්‍රයාට ද ඔහුගේ යහළුවන්ට ද ඇතිවිය.
iv. අනේපිඬු සිටුතුමා ද විශාඛා මහා උපාසිකාව ද නිතර තථාගතයන් වහන්සේට උපස්ථානයට යති.
v. පෙර රජවරු සතුරන් නසා ලක්දිව එක්සේසත් කළහ.

03. පහත දැක්වෙන විසන්ධි පද සූත්‍රානුසාරයෙන් සන්ධි කරන්න.

i. ධනමෙම + අත්ථි
ii. සබ්බ + එව
iii. ඉති + ආදි
iv. දෙව + ඉති
v. බුද්ධානං + එව
vi. පරි + අන්තං
vii. චක්කං + ඉව
viii. ගච්ඡාමි + ඉති
ix. පාතු + අහොසි
x. කිඤ්චි + එව
xi. කසා + ඉව
xii. ප + උච්චති
xiii. පති + එති
xiv. මධු + උදකං
xv. අ + කමති
xvi. සං + ලෙඛ
xvii. යං + අනිච්චං
xviii. චක්ඛු + උදපාදි
xix. පඤ්ච + බන්ධා
xx. තං + ජාතං

04. ''කසමා ලිච්ඡවීති වදන්ති'' යන ඡේදයේ සන්ධි පද උද්ධෘත කොට විසන්ධිය සමග අදාළ සූත්‍රය දක්වන්න.

උද්ධෘත පදය	විසන්ධිය	අදාළ සූත්‍ර
උදා :- පාතොව	පාතො + එව	වා පරො අසරූපා

දසමො පාඨො

සබ්බං කිර පහාය ගන්තබ්බං

සෙතව්‍යවාසිනො හි චූළකාලො මජ්ඣිමකාලො මහාකාලොති තයො භාතරො කුටුම්බිකා. තෙසු ජෙට්ඨකනිට්ඨා දිසාසු විචරිත්වා සකටෙහි භණ්ඩං ආහරන්ති. මජ්ඣිමකාලො ආහතං විකකිණාති. අථෙකස්මිං සමයෙ තෙ උභොපි භාතරො පඤ්චහි සකටසතෙහි නානා භණ්ඩං ගහෙත්වා සාවත්ථිං ගන්ත්වා සාවත්ථියා ච ජෙතවනස්ස ච අන්තරෙ සකටානි මොචයිංසු. තෙසු මහාකාලො සායණ්හසමයං මාලාගන්ධාදිහත්ථෙ සාවත්ථිවාසිනො අරියසාවකෙ ධම්මසවණත්ථාය ගච්ඡන්තෙ දිස්වා "කුහිං ඉමෙ ගච්ඡන්තී"ති පුච්ඡිත්වා තමත්ථං සුත්වා 'අහමපි ගමිස්සාමී'ති චින්තෙත්වා කනිට්ඨං ආමන්තෙත්වා, "තාත සකටෙසු අප්පමත්තො හොහි. අහං ධම්මං සොතුං ගච්ඡාමී"ති වත්වා තථාගතං වන්දිත්වා පරිසපරියන්තෙ නිසීදි. සත්ථා තං දිස්වා අජ්ඣාසයවසෙන ආනුපුබ්බිකථං කථෙන්තො දුක්ඛක්ඛන්ධසුත්තාදිවසෙන අනෙකපරියායෙන කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං ච කථෙසි. තං සුත්වා මහාකාලො සබ්බං කිර පහාය ගන්තබ්බං, පරලොකං ගච්ඡන්තං නෙව භොගා න ඤාතයො අනුගච්ඡන්ති. කිමෙම ඝරාවාසෙන, පබ්බජිස්සාමීති චින්තෙසි.

(චූළකාලමහාකාලවත්ථු - ධම්මපදට්ඨකථා)

පදමාලාව

සෙතව්‍යවාසිනො	(ස)	-	සේතව්‍ය නුවර වැසි
තයො	(ස.නා)	-	තිදෙනෙක්
භාතරො	(නා)	-	සහෝදරයෝ
කුටුම්බිකා	(ත)	-	කෙළඹියෝ
තෙසු	(ස.නා)	-	ඔවුන් අතරින්
ජෙට්ඨකනිට්ඨා	(ස)	-	වැඩිමහල්ලා හා බාලයා
දිසාසු	(නා)	-	දිශාවන්හි
විචරිත්වා	(පූ.ක්‍රි)	-	හැසිර
සකටෙහි	(නා)	-	කරත්තවලින්
භණ්ඩං	(නා)	-	බඩු
ආහරන්ති	(ක්‍රි)	-	ගෙනෙති
ආහතං	(කි)	-	රැගෙන ආ දේ
විකකිණාති	(ක්‍රි)	-	විකුණයි
අථ	(නි)	-	ඉක්බිති
උභොපි	(සං)	-	දෙදෙනා ම
පඤ්චහි සකටසතෙහි	(ස)	-	ගැල් පන්සියයකින්
නානාභණ්ඩං	(ස)	-	නොයෙක් බඩු
ගහෙත්වා	(පූ.ක්‍රි)	-	ගෙන

ගන්ත්වා	(පූ.ක්‍රි)	-	ගොස්
අන්තරෙ	(නි)	-	අතර
මොචයිංසු	(ක්‍රි)	-	මුදා හළහ
සායණ්හසමයෙ	(ස)	-	සවස් කල
මාලාගන්ධාදිහත්ථෙ	(ස)	-	මල්මාලා සුවඳ ආදිය ගත් අත් ඇති
අරියසාවකෙ	(ස)	-	ආර්ය ශ්‍රාවකයන්
ධම්මසවණත්ථාය	(ස)	-	බණ ඇසීම පිණිස
දිස්වා	(පූ.ක්‍රි)	-	දැක
කුහිං	(නි)	-	කොහි
තමත්ථං	(සං)	-	ඒ කරුණ
අහම්පි	(සං)	-	මම ද
චින්තෙත්වා	(පූ.ක්‍රි)	-	සිතා
කනිට්ඨං	(ත)	-	බාලයා
ආමන්තෙත්වා	(පූ.ක්‍රි)	-	අමතා
හොහි	(ක්‍රි)	-	වන්න
පරිසපරියන්තෙ	(ස)	-	පිරිස කෙළවර
අජ්ඣාසයවසෙන	(ස)	-	අදහස්වලට අනුව
ආනුපුබ්බිකථං	(ස)	-	පිළිවෙළ කථාව
අනෙකපරියායෙන	(ස)	-	නොයෙක් ආකාරයෙන්
කාමානං	(නා)	-	කාමයන්ගේ
ආදීනවං	(නා)	-	ආදීනව
ඔකාරං	(නි)	-	ලාමක බව
සංකිලෙසං	(ස)	-	කෙලෙස් සහිත බව
පහාය	(පූ.ක්‍රි)	-	හැර
ගන්තබ්බං	(කි)	-	යා යුතු ය
ඤාතයො	(නා)	-	ඥාතීහු

අභ්‍යාස

01. 'සබ්බං කිර පහාය ගන්තබ්බං' ඡේදය සිංහලට නගන්න.

02. ඡේදය ඇසුරෙන් පාලියෙන් පිළිතුරු සපයන්න.

i. තයො භාතරා කත්ථ වසිංසු?
ii. කෙ භණ්ඩානි ආහරන්ති?
iii. කො භණ්ඩානි විකිණාති?
iv. මහාකාලො ධම්මං සොතුං කත්ථ නිසීදි?
v. ධම්මං සොතුං ගච්ඡන්තා කස්මිං සමයෙ ගච්ඡන්ති?
vi. මහාකාලො කිං නිස්සාය පබ්බජිතුං චින්තෙසි?

03. ඡේදයේ එන වාක්‍ය රටාව අනුව පහත වාක්‍යය පාලියට නගන්න.

i. අපගේ පිරිවෙණෙහි ධම්මජොති, සුමනජොති, විමලජොති යනුවෙන් යහළු සාමණේරවරු තිදෙනෙක් වෙති.
ii. ඔවුන් අතුරින් විමලජොති සාමණේර තෙම උදෑසන පිණ්ඩපාතය පිණිස යයි.
iii. ධම්මජොති, සුමනජොති සාමණේරවරු දහවල් පිණ්ඩපාතයේ යති.
iv. සවස් කාලයේ තිදෙනා ම පිරිවෙණට ගොස් පාලි භාෂාව උගනිති.
v. ගුරුවරයා ඔවුන්ගේ අදහස්වලට ගැළපෙන ලෙස පාඩම උගන්වයි.

04. ඡේදය ඇසුරෙන් සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. පෙර සැවැත්නුවර වැසියෝ සවස් කාලයෙහි කුමක් කළාහු ද?
ii. අතීතයෙහි පැවති වෙළඳාම පිළිබඳ ඡේදයේ එන තොරතුරු මොනවා ද?
iii. පරලොව යන්නෝ ගෙන නොයන දේ මොනවා ද?
iv. අනුපිළිවෙළ කථාව යනු කුමක් ද?
v. සැදෑහැ සිත් ඇතිවන හේතු දෙකක් ඡේදය ඇසුරෙන් පෙන්වා දෙන්න.

සමාස

හැඳින්වීම

'සමාස' යනු පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ ප්‍රවර්ගයකි. සමාසයෙන් සිදු වන්නේ පද සංක්ෂිප්ත කිරීම යි. **"සමාසො පද සංඛෙපො"** යන පාඨයෙන් ඒ බව තහවුරු වෙයි. සමාස නිසා භාෂාවේ සංක්ෂිප්ත බව, අර්ථ ගම්භීරත්වය, ඔජෝගුණය ඇති වේ. සමාසපද බහුලව යෙදීමෙන් භාෂා අලංකාරය, ශ්‍රැතිරම්‍යතාව හා අනුප්‍රාස රසය ද ඇති වේ. එනිසා ලේඛන කාර්යය සාර්ථකව පවත්වාගෙන යාමටත්, පාලි වාක්‍ය ප්‍රයෝගයන් නිවැරදිව තේරුම් ගැනීමටත්, සමාස ඉගෙන ගැනීම උපයුක්ත වේ.

"නාමානං සමාසො යුත්තත්ථා - සමාසොති භින්නත්ථානං පදානමෙකත්ථතා" යන බාලාවතාර සූත්‍ර වෘත්තියට අනුව, වෙන් වෙන් අර්ථ ඇති, අන්‍යොන්‍ය සම්බන්ධය සහිත පද කීපයක් තනිපදයක් වන සේ ගැළපීම සමාසය යි. සමාසපද සිද්ධියේ දී මුල් පදයන්හි විභක්තිය ලොප් වී ශබ්ද ප්‍රකෘතිය පමණක් ශේෂ වීම විශේෂ කරුණකි.

නිදැ:- රඤ්ඤා පුරිසො = රාජපුරිසො
බ්‍රාහමණී දාරිකා = බ්‍රාහමණදාරිකා

පද සංක්ෂිප්ත වන ස්වරූපය හා සමාස අර්ථවත් වන ස්වරූපය සැලකිල්ලට ගෙන සමාස ප්‍රභේද 6ක් බාලාවතාරයේ දැක්වේ.

i.	කම්මධාරය සමාසය	ii.	දිගු සමාසය
iii.	තප්පුරිස සමාසය	iv.	බහුබ්බීහි සමාසය
v.	දවන්ද සමාසය	vi.	අව්‍යයීභාව සමාසය.

සමාසපද ලිංග ලබන අයුරු

"කම්මධාරයෝ දවන්දෝ ච - තප්පුරිසෝ ච ලාහිනෝ,
තයෝ පරපදෙ ලිඞ්ගං - බහුබ්බීහි පදන්තරෙ"

ඒ අනුව

i. කම්මධාරය සමාසය :- පරපදයේ ලිංගය ලබයි.

මහන්තෝ පුරිසෝ - මහාපුරිසෝ		(පුල්ලිංග)
මහතී සද්ධා - මහාසද්ධා		(ස්ත්‍රීලිංග)
මහන්තං ඵලං - මහප්ඵලං		(නපුංසකලිංග)

ii. දිගු සමාසය

සමාහාරදිගු සමාසය :- නපුංසකලිංග ඒකවචන වේ.

තයෝ දණ්ඩා - තිදණ්ඩං
චත්තාරි සච්චානි - චතුසච්චං

අසමාහාරදිගු සමාසය :- පරපදයේ ලිංගය ලබයි.

චතස්සෝ දිසා - චතුද්දිසා		(පුල්ලිංග)
තයෝ භවා - තිභවා		(ස්ත්‍රීලිංග)
පුත්තා සතං - පුත්තසතානි		(නපුංසකලිංග)

iii. තප්පුරිස සමාසය :- පරපදයේ ලිංග ලබයි.

දෙවානං රාජා - දෙවරාජා		(පුල්ලිංග)
ධඤ්ඤානං රාසි - ධඤ්ඤරාසි		(ස්ත්‍රීලිංග)
ජිනස්ස වචනං - ජිනවචනං		(නපුංසකලිංග)

iv. **දවන්ද සමාසය**

සමාහාර දවන්දය :- නපුංසක ලිංග ඒකවචන වේ.
මුඛං ච නාසිකා ච = මුඛනාසිකං
ඵාලෝ ච පාචනෝ ච = ඵාලපාචනං

ඉතරීතරයෝග දවන්ද සමාසය :- පරපදයේ ලිංග ලබයි.
සීහා ච ව්‍යග්ඝා ච තරච්ඡා ච = සීහව්‍යග්ඝතරච්ඡා
රත්ති ච දිවා ච = රත්තින්දිවා
හිරඤ්ඤඤං ච සුවණ්ණං ච = හිරඤ්ඤසුවණ්ණානි

v. **බහුබ්බීහි සමාසය :- අන්‍ය පදයේ ලිංගය ගනියි.**

විජිතමාරා අනෙනාති	= විජිතමාරෝ (භගවා)	(පුල්ලිංග)
ආරුළ්හා වාණිජා යං	= ආරුළ්හවාණිජා (නාවා)	(ස්ත්‍රීලිංග)
බහවෝ මාතඞ්ගා අසම්ං	= බහුමාතඞ්ගං (වනං)	(නපුංසකලිංග)

vi. **අව්‍යයීභාව සමාසය :- නපුංසකලිංග ඒකවචන වේ.**

භත්තස්ස පුරෙ = පුරෙභත්තං
බලස්ස යථා = යථාබලං

සමාසයන්ගේ ප්‍රභේද බාලාවතාර සූත්‍රානුසාරයෙන් පහත විස්තර කෙරේ.

කම්මධාරය සමාසය

තුල්‍යාධිකරණ වූ හෙවත් ලිංග, විභක්ති, වචන වශයෙන් සමාන වූ විශේෂණ - විශේෂ්‍ය පද දෙකක් පූර්ව පදයන්හි විභක්ති ලොප් කොට ගැළපීම කම්මධාරය සමාසය යි. **"දවිපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො"** යන සූත්‍රයෙන් එය විස්තර වේ. කම්මධාරය සමාසයේ පද යෝජනය අනුව එහි ප්‍රභේද 9 කි.

i. **විශේෂණ පූර්වපද කම්මධාරය සමාසය**
මහන්තෝ සො වීරෝ = මහාවීරෝ
නාගා සා මාණවිකා = නාගමානවිකා
මහන්තං තං බලං = මහාබලං (මහබ්බලං)

ii. **විශේෂණ උත්තරපද කම්මධාරය සමාසය**
සාරිපුත්තෝ සො ථෙරෝ = සාරිපුත්තත්ථෙරෝ
මහොසධෝ සො පණ්ඩිතෝ = මහොසධපණ්ඩිතෝ

iii. **විශේෂණොභය (පද දෙක ම) පද කම්මධාරය සමාසය**

ඛඤ්ඤජා සෝ බුජ්ජෝ = ඛඤ්ඤජබුජ්ජෝ

ඤානං තං ඤානං = ඤානඤානං

iv. **උපමානුත්තරපද කම්මධාරය සමාසය**

සීහෝ විය මුනි = මුනිසීහෝ

නාගෝ විය බුද්ධෝ = බුද්ධනාගෝ

v. **සම්භාවනා පූර්වපද කම්මධාරය සමාසය**

ධම්මෝ ඉති සඤ්ඤා = ධම්මසඤ්ඤා

අනිච්චං ඉති සඤ්ඤා = අනිච්චසඤ්ඤා

vi. **අවධාරණ පූර්වපද කම්මධාරය සමාසය**

ගුණෝ එව ධනං = ගුණධනං

පඤ්ඤා එව රතනං = පඤ්ඤාරතනං

vii. **න නිපාත පූර්වපද කම්මධාරය සමාසය**

න බ්‍රාහ්මණෝ = අබ්‍රාහ්මණෝ

න සුරෝ = අසුරෝ

viii. **කු නිපාත පූර්වපද කම්මධාරය සමාසය**

කුච්ඡිතෝ පුරිසෝ = කුපුරිසෝ / කාපුරිසෝ

කුච්ඡිතා දිට්ඨි = කුදිට්ඨි

ix. **පාදි පූර්වපද කම්මධාරය සමාසය**

පධානං වචනං = පාවචනං

සුන්දරෝ ගන්ධෝ = සුගන්ධෝ

දිගු සමාසය

"**සඞ්ඛ්‍යා පුබ්බෝ දිගු**" යන බාලාවතාර සූත්‍රයට අනුව සංඛ්‍යාවාචී පදයක් විශේෂණයක් පූර්වපදය ලෙස සිට සිදුවන සමාසය දිගු සමාසය යි. සංඛ්‍යාවේ අර්ථයට ප්‍රමුඛත්වය හිමි වීම මෙහි ලක්ෂණය යි. සංක්ෂිප්ත වන ස්වරූපය අනුව මෙහි ප්‍රභේද 2 කි.

i. **සමාහාර දිගු සමාසය** :- සමාස පදය නිත්‍යයෙන් එකවචන හා නපුංසකලිංග වේ.

තයෝ ලෝකා = තිලෝකං

චත්තාරි සච්චානි = චතුසච්චං

චතසෝසා දිසා = චතුද්දිසං

ii. **අසමාහාර දිගු සමාසයඃ-** පරපදයේ ලිංගය ලබයි.

එකො පුගගලො = එකපුගගලො

තයො භවා = තිභවා

තපපුරිස සමාසය

"**අමාදයො පරපදෙහි**" අං ආදි (දුතියා) විභක්ත්‍යන්ත නාම පදයක් පරපදයක් හා සමාස වීම මෙහි ලක්ෂණය යි. විභක්ත්‍යර්ථයට ප්‍රමුඛතාවක් හිමි වේ. එහි පදයෝජනය අනුව ප්‍රභේද 7 කි.

දුතියා තපපුරිස සමාසය

සරණං ගතො = සරණගතො

දුකඛං පත්තො = දුකඛපපත්තො

තතියා තපපුරිස සමාසය

සීලෙන සමපනනො = සීලසමපනනො

සත්ථාරා වණණිතො = සත්ථුවණණිතො

චතුත්ථී තපපුරිස සමාසය

කඨිනස්ස දුස්සං = කඨිනදුස්සං

ආගනතුකානං භත්තං = ආගනතුකභත්තං

පඤ්චමී තපපුරිස සමාසය

රාජතො භයං = රාජභයං

පිණ්ඩපාතා පටික්කනනො = පිණ්ඩපාතපටික්කනනො

ඡට්ඨී තපපුරිස සමාසය

ජිනස්ස චරිතං = ජිනචරිතං

රුක්ඛස්ස මූලං = රුක්ඛමූලං

සත්තමී තපපුරිස සමාසය

විකාලෙ භොජනං = විකාලභොජනං

වනෙ වාසො = වනවාසො

අලොප තපපුරිස සමාසය (විභක්ති ලොප් නොවී පද සිද්ධ වේ)

අත්තනො පදං = අත්තනොපදං

අනෙත වාසිකො = අනෙතවාසිකො

දවන්ද සමාසය

"නාමානං සමුච්චයෝ දවන්දෝ" ඒකවිභක්තික නාම පදයන් සමූහයක් තනිපදයක් සේ ගළපන සමාසය යි. **"ච"** යන නිපාතයෙන් ගළපන පද සමූහයක් වීම නිපාතය ඉවත් කොට තනි පදයක් සේ ගැළපීම මෙහි ලක්ෂණය යි. සමාස පදයේ ස්වරූපය අනුව මෙහි ප්‍රභේද 2 කි.

1. **සමාහාර දවන්ද සමාසය** :- සමාස පදය හැමවිට ම නපුංසකලිංග ඒකවචනයෙන් යෙදේ.

ඩංසා ච මකසා ච = ඩංසමකසං
යුගං ච නඞගලං ච = යුගනඞගලං
ජාතරූපං ච රජතං ච = ජාතරූපරජතං

2. **ඉතරීතරයෝග දවන්ද සමාසය** :- මෙහි දී සමාසපදය අග ම පදයේ ලිංගය භජනය කරන අතර බහුවචනයෙන් යෙදේ.

සමණා ච බ්‍රාහමණා ච = සමණබ්‍රාහමණා
මාතා ච පිතා ච = මාතාපිතරෝ
පත්තෝ ච චීවරං ච = පත්තචීවරානි

බහුබ්බීහි සමාසය

"අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි" සමාස වූ පදයන්ගේ අර්ථය හැර වෙනත් අර්ථයක් ප්‍රකාශ කරන සමාසය බහුබ්බීහි සමාසය යි. සමාස පදයේ ලක්ෂණ අනුව මෙහි ප්‍රභේද 2 කි.

1. **තද්ගුණ සංවිඤ්ඤාණ බහුබ්බීහි සමාසය**:- සමාස වන පදයන්හි අදහස සමාසාර්ථයෙහි එනම් අන්‍ය පදයෙහි දක්නට ලැබීම යි.

චත්තාරෝ පාදා යෙසං තෙ = චතුප්පදා
ලම්බකණ්ණා යස්ස සෝ = ලම්බකණ්ණා (බත්තියෝ)

2. **අතද්ගුණ සංවිඤ්ඤාණ බහුබ්බීහි සමාසය**:- සමාස වූ පදයන්හි ලක්ෂණ අන්‍ය පදයෙහි දක්නට නොමැති සමාසය යි.

ආරූළ්හා වාණිජා යං සා = ආරූළ්හවාණිජා (නාවා)
විජිතා මාරා යෙන සෝ = විජිතමාරෝ (භගවා)

සමාස පදයේ අර්ථය සැලකිල්ලට ගෙන මෙය දුතියාදි අර්ථවල යෙදෙන අයුරු පහත දැක්වේ.

දුතියා විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය

ආගතා සමණා යං සො = ආගතසමණො (විහාරෝ)
පටිපන්නා අද්ධිකා යං තං = පටිපන්නද්ධිකං (මගගං)

තතියා විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය

ජිතානි ඉන්ද්‍රියානි යෙන සො = ජිතින්ද්‍රියො (භගවා)
දිට්ඨා ධම්මෙමා යෙන සො = දිට්ඨධම්මෙමා (අරියසාවකො)

චතුත්ථී විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය

උපහටො බලි යස්ස සො = උපහටබලි (යක්ඛා)
දින්නා සුඛකො යස්ස සො = දින්නසුඛකො (රාජා)

පංචමී විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය

අපෙතං විඤ්ඤාණං යස්මා සො = අපෙතවිඤ්ඤාණො (මතකායො)
නිගතො අයො යස්මා සො = නිරයො

ඡට්ඨී විභක්ත්‍යර්ථ බහුබ්බීහි

බීණා ආසවා යස්ස සො = බීණාසවො (අරහා)
දසබලානි යස්ස සො = දසබලො (භගවා)

සත්තමී විභක්ත්‍යර්ථ බහුබ්බීහි

බහවො තාපසා යස්මිං සො = බහුතාපසො (අස්සමො)
ආකිණ්ණා මනුස්සා යස්මිං තං = ආකිණ්ණමනුස්සං (නගරං)

බහුබ්බීහි සමාසය ප්‍රභේදගත වන්නේත් අර්ථවත් වන්නේත් ප්‍රකාශ වන අන්‍යාර්ථය සැලකිල්ලට ගෙන බව ප්‍රකට වේ.

අව්‍යයීභාව සමාසය

"උපසග්ගනිපාතපුබ්බකො අබ්‍යයීභාවො" උපසර්ගයක් හෝ නිපාතයක් පෙර පදය ලෙස යෙදී සිදු වන සමාසය අව්‍යයීභාව සමාසය යි. මෙමගින් නිර්මාණය වන සමාස පද නිපාත පදයක් ලෙස යෙදීම සාමාන්‍ය ලක්ෂණය යි. අකාරාන්ත අව්‍යයීභාව සමාස පද නපුංසකලිංග ඒකවචනයේ වරනැඟේ. අකාරාන්ත නොවන පද නිපාත ස්වරූපයෙන් ම සිටී.

නගරස්ස සමීපං = උපනගරං
රථස්ස පච්ඡා = අනුරථං
වාතස්ස අනු = අනුවාතං
අද්ධමාසං අනු = අනුද්ධමාසං
ජීවස්ස යාව = යාවජීවං

අකාරාන්ත නොවන පද (අනකාරාන්ත පද)

ඉත්ථීසු අධිකිච්ච = අධිත්ථී
සත්ති යථා = යථාසත්ති
කුමාරියා අධිකිච්ච = අධිකුමාරී

මිශ්‍ර සමාස පද

මිශ්‍ර සමාස යනු එක් සමාස පදයක තවත් සමාස පදයක් ඇතුළත් ඒවා ය. මේවා ගර්හ සමාස ලෙස ද හැඳින්වේ. 'රාහුලමාතාදෙවී' යනු නිදසුනකි.

රාහුලස්ස මාතා = රාහුලමාතා තප්පුරිස සමාසයකි
රාහුලමාතා සා දෙවී = රාහුලමාතාදෙවී කම්මධාරය සමාසයකි.

මේ සමාස පදය හැඳින්විය යුත්තේ **තප්පුරිස සමාස ගැබ් වූ කම්මධාරය සමාස** යන නමිනි.

පහත දැක්වෙන්නේ එවැනි සමාස පද කීපයකි.

සමාස පදය	විග්‍රහ වාක්‍ය	සමාස පදය හා නාමය
සත්ථුධම්මදෙසනං	ධම්මස්ස දෙසනා	ධම්මදෙසනා - තප්පුරිස සමාස
	සත්ථුනෝ ධම්මදෙසනා	සත්ථුධම්මදෙසනා - තප්පුරිස සමාස
එකගන්ධකුටියං	ගන්ධා සා කුටි	ගන්ධකුටි - කම්මධාරය සමාස
	එකා සා ගන්ධකුටි	එකගන්ධකුටි - දිගුසමාස
ජේතවනමගගං	ජේතස්ස වනං	ජේතවනං - තප්පුරිස සමාස
	ජේතවනස්ස මගගං	ජේතවනමගගං - තප්පුරිස්සමාස
සත්තමනුස්සකොටියෝ	මනුස්සානං කොටි	මනුස්සකොටි - තප්පුරිස සමාස
	සත්තන්නං මනුස්සකොටි	සත්තමනුස්සකොටි - දිගුසමාස

මෙසේ විවිධ සමාස අන්තර්ගත වී සැදෙන සමාස ගර්හ සමාස හෙවත් මිශ්‍ර සමාස ලෙස හැඳින්වේ.

අභ්‍යාස

01. වරහන් තුළ ඇති සමාසපද යොදමින් පහත සඳහන් වාක්‍යය පාලියට නඟන්න.

(ගෙහද්වාරානි / අප්පමත්තෝ / දක්ඛිණදෙසං / රථසතෙහි / නගරවාසී / පුරෙභත්තං / සායණ්හසමයෙ / උපොසථදිවසෙ / මාලාපදීපානි / මහාවීථියා)

i. රථය කොළඹත් කැලණියත් අතර මහපාරේ නතර විය.
ii. මව ගෙවල් දොරවල් ගැන සැලකිලිමත් වන්න යයි දියණියට කියා බණ අසන්නට ගියා ය.
iii. මන්ත්‍රීතුමා වාහන සියයකින් දකුණු ප්‍රදේශයට ගියේ ය.
iv. නගරවාසීන් අතුරෙන් ඇතැමෙක් උදෑසන දන් දී සවස්කාලයේ බණ අසති.
v. අපි පසළොස්වක පොහොය දා මල්පහන් පිදීමට පන්සලට යමු.

02. පහත සඳහන් අසමස්ත පද සමාස කර ලියන්න.

i. ජෙට්ඨා ච කනිට්ඨා ච
ii. රඤ්ඤා ධීතා
iii. රාහුලෝ කුමාරෝ
iv. මාතා ච පිතා ච
v. තිස්සෝ විජ්ජා
vi. සතං යොජනානි
vii. චන්දෝ ච සුරියෝ ච
viii. විධුරෝ පණ්ඩිතෝ
ix. වාතස්ස පටි
x. කම්මං යථා
xi. අස්සානං වාණිජා
xii. ධම්මස්ස දෙසනා

03. වරහන් තුළින් සුදුසු වචන යොදා වාක්‍යය සම්පූර්ණ කර, සිංහලට නඟන්න.

(නදීසතෙහි/ සත්ථාහං/ මහාවනෙ/ නරාදිච්චං/ භික්ඛුනීනිලයා/ දෙවනාගාසුරා)

i. නරසාරථී වෙසාලියං ..... කූටාගාරසාලායං වසති.
ii. සා ගොතමී සබ්බාහි භික්ඛුනීහි ..... ජෙතවනං අගමාසි.
iii. පඤ්චගඞ්ගායෝ ..... භූමිං අලඞ්කරොන්තී සාගරං යන්ති.
iv. අහං ආදිච්චකුලකෙතුකං ..... සිරසා පණමාමි.
v. තෙ සසඞ්ඝස්ස නරනායකස්ස ..... මහාදානං අදංසු.
vi. ..... පුප්ඵවුටඨි ගගනා අභිවස්සාපෙසුං.

04. පහත වගුව සම්පූර්ණ කරන්න.

සමාස පදය	සමාස නාමය	අසමස්ත පදය
නිදැ:- චූළකාලෝ	කම්මධාරය සමාසය	චූළෝ කාලෝ
පුරාණදුතියිකා		
රුක්ඛමූලෙ		
බුද්දපුත්තා		
දහරමාණවිකා		
බ්‍රහමචරියං		
මෙරුරාජා		
සත්ථුසාසනං		
බුද්ධමාතා		
යථාබලං		
යථාසත්ති		
දෙවමනුජා		
මෙඝදුන්දුභි		
මහාමුනි		
ආයතපණ්හි		
නරුත්තමෝ		

05. පහත දැක්වෙන ගර්භ සමාසයන්හි ඇති සමාස වර්ග වෙන් කර දක්වන්න.

i. සත්ථුසාසනකාරිකා
ii. බුද්ධසාසනවච්ඡලා
iii. ලොකගගනායකෝ
iv. ඔක්කාකකුලසම්භවෝ
v. චතුසාගරතොයානි

එකාදසමො පාඨො

ආහඤ්ඤං අමතදුන්දුභිං

තඤ්ඤ මයඤං රාජකුමාර; එතදහොසි කඤ්ඤ නු ඛො අහං පඨමං ධම්මං දෙසෙය්‍යං? කො ඉමං ධම්මං ඛිප්පමෙව ආජානිස්සතීති? තඤ්ඤ මයඤං; රාජකුමාර; එතදහොසි. බහුකාරා ඛො මෙ පඤ්චවග්ගියා භික්ඛූ යෙ මං පධානපහිතත්තං උපට්ඨහිංසු. යන්නූනාහං පඤ්චවග්ගියානං භික්ඛූනං පඨමං ධම්මං දෙසෙය්‍යන්ති. තඤ්ඤ මයඤං; රාජකුමාර, එතදහොසි; කහං නු ඛො එතරහි පඤ්චවග්ගියා භික්ඛූ විහරන්තීති. අද්දසං ඛ්වාහං; රාජකුමාර, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන පඤ්චවග්ගියෙ භික්ඛූ බාරාණසියං විහරන්තෙ ඉසිපතනෙ මිගදායෙ. අථ ඛ්වාහං, රාජකුමාර, උරුවෙලායං යථාභිරන්තං විහරිත්වා යෙන බාරාණසී තෙන චාරිකං පක්කමිං. අද්දසා ඛො මං; රාජකුමාර, උපකො ආජීවකො අන්තරා ච ගයං අන්තරා ච බොධිං අද්ධානමග්ගප්පටිපන්නං. දිස්වාන මං එතදවොච. විප්පසන්නානි ඛො තෙ; ආවුසො, ඉන්ද්‍රියානි, පරිසුද්ධා ඡවිවණ්ණා පරියොදාතා. කංසි ත්වං, ආවුසො, උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්ථා? කඤ්ඤ වා ත්වං ධම්මං රොචෙසීති? එවං වුත්තෙ; අහං; රාජකුමාර, උපකං ආජීවකං ගාථාහි අජ්ඣභාසිං.

සබ්බාභිභූ සබ්බවිදූහමස්මි, සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තෙ
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තෙ, සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං.

න මෙ ආචරියො අත්ථි, සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලොකස්මිං, නත්ථි මෙ පටිපුග්ගලො.

අහඤ්හි අරහා ලොකෙ, අහං සත්ථා අනුත්තරො
එකොම්හි සම්මාසම්බුද්ධො, සීතිභූතොස්මි නිබ්බුතො.

ධම්මචක්කං පවත්තෙතුං, ගච්ඡාමි කාසිනං පුරං
අන්ධභූතස්මිං ලොකස්මිං, ආහඤ්ඡං අමතදුන්දුභින්ති.

(බොධිරාජකුමාරසුත්ත - මජ්ඣිමනිකාය)

පදමාලාව

කඤ්ඤ	(ස.නා)	-	කවරෙකුට
දෙසෙය්‍යං	(ක්‍රි)	-	දෙසන්නෙම් ද
ඛිප්පං	(නි)	-	වහා
ආජානිස්සති	(ක්‍රි)	-	දැනගන්නේ ය
බහුකාරා	(ස)	-	බොහෝ උපකාර වූවාහු
පධානපහිතත්තං	(ස)	-	ප්‍රධන් වීර්යය පිණිස මෙහෙය වූ සිත් ඇති
උපට්ඨහිංසු	(ක්‍රි)	-	උවටැන් කළහ
කහං	(නි)	-	කොහි

එතරහි	(නි)	-	දැන්
අදදසං	(ක්‍රි)	-	දුටිමි
දිබ්බන චක්ඛුනා	(නා)	-	දිවැසින්
විසුද්ධන	(ස)	-	පිරිසිදු
අතික්කන්තමානුසකෙන	(ස)	-	මිනිස්බව ඉක්ම සිටි
අථබ්බාහං	(සං)	-	ඉක්බිති මම
යථාභිරන්තං	(නි)	-	කැමති තාක්
අන්තරා	(නි)	-	අතර දී
අද්ධානමග්ගං	(ස)	-	දීර්ඝ වූ මාර්ගය
දිස්වාන	(පූ.ක්‍රි)	-	දැක
විප්පසන්නානි	(කි)	-	බෙහෙවින් ප්‍රසන්නය
ඡවිවණ්ණා	(ස)	-	සමෙහි වර්ණය
කං	(නා)	-	කවරෙකු
සබ්බවිදූහමස්මි	(සං)	-	මම සියල්ල දන්නෙක් වෙමි
සබ්බාභිභූ	(ස)	-	සියලු ධර්ම මැඩගෙන (සිටිමි)
අනූපලිත්තෝ	(ස)	-	කෙලෙස් හා නොගැටුණේ (වෙමි)
සබ්බඤ්ඤුජහෝ	(ස)	-	සියල්ල අත් හළේ
තණ්හක්ඛයෙ	(ස)	-	තෘෂ්ණාව නැති කිරීමෙහි
අභිඤ්ඤාය	(පූ.ක්‍රි)	-	වෙසෙසින් දැන
උද්දිසෙය්‍ය	(ක්‍රි)	-	උදෙසම් ද
අමතදුන්දුභිං	(ස)	-	අමාබෙර
ආහඤ්ඡං	(ක්‍රි)	-	වයන්නෙමි

අභ්‍යාස

01. 'ආහඤ්ඡං අමතදුන්දුභිං' පාඨය සිංහලට නගන්න.

02. පාලි භාෂාවෙන් පිළිතුරු සපයන්න.

i. බුදුධා කෙසානං පඨමං ධම්මං දෙසෙසි?
ii. කහං නු ඛො පඤ්චවග්ගියා භික්ඛූ විහරිංසු?
iii. උපකො ආජීවකො කිං අහාසි?
iv. කස්ස පටිපුග්ගලො නත්ථි?
v. බුදුධා ධම්මචක්කං පවත්තෙතුං කිං නාම පුරං ගච්ඡි?

03. පාලියට නගන්න.

i. කවරෙක් මේ දහම වහා ම දැනගන්නේ ද?
ii. පස්වග මහණහු දැන් කොහි වෙසෙත් ද?
iii. පළමුව පස්වගමහණුන්ට ධර්මය දෙසන්නේ නම් මැනවි.
iv. ඔබ කවරකුගේ ධර්මය රුචි කෙරෙහි ද?
v. දම්සක් පැවැත්වීමට කාසි පුරයට යමි.

04. පිළිතුරු ලියන්න.

i. බුදුන් වහන්සේ පළමුව පස්වග මහණුන්ට දහම් දෙසන්නට සිතුවේ කුමක් නිසා ද?
ii. පළමු දහම් දේශනාවට යන අතරමඟ දී හමු වූ ආජීවකයා කවු ද?
iii. බුද්ධත්වය ලබා ගැනීමට හේතු වන කරුණු 03ක් ලියන්න.
iv. බුදුන් වහන්සේ පළමුව දේශනා කළ සූත්‍රය කුමක් ද?
v. මිනිසත් බව ඉක්ම සිටි දිවැස යනු කුමක් ද?

තද්ධිත නාම

හැඳින්වීම

නාමයන්ගේ අගට විශේෂ අර්ථ පැවසෙන තද්ධිත ප්‍රත්‍යය එක්කර සාදා ගන්නා ලද නාම තද්ධිත නාම නම් වේ. තද්ධිත පද සාධනයෙන් පහසුවෙන් උච්චාරණය කිරීමේ හැකියාව, ක්‍රමානුකූල බව, සංෂිප්ත බව, ව්‍යක්ත බව හා අලංකාරවත් බව ඇති වේ.

තද්ධිත පද සාධනය

- නාම පදයට පසුව තද්ධිත ප්‍රත්‍යය යෙදීම.
- නාම පදයේ විභක්ති ප්‍රත්‍යය ලොප් කිරීම. (**තෙසං විභත්තියො ලොපා ච**)
- සංයුක්ත නොවූ පදයන්හි ආදි ස්වරය වෘද්ධි කිරීම. (**වුද්ධාදිසරස්‍ස වා සංයොගන්තස්‍ස සඤ්ඤ ච**)
- සුදුසු පරිදි සන්ධි කාර්යය කොට පද සිද්ධ කිරීම.

වෘද්ධි කිරීම

''**අයුවණ්ණානං චායො වුද්ධි**''

අ, ඉ, උ වර්ණ වෘද්ධි වේ. ඒ පහත සඳහන් පරිදි ය.

අ	>	ආ	>	සමණ	+	ඤ්ඤර	>	සාමඤ්ඤර
ඉ ඊ	>	ඒ	>	විනතා	+	ඤ්ඤය්‍ය	>	වෙනතෙය්‍ය
				වීණා	+	ණික	>	වෙණික
උ ඌ	>	ඔ	>	උළුම්ප	+	ණික	>	ඔලුම්පික

වෘද්ධිය කළ පසු එම 'ණ' කාරය ලොප් කිරීම. (**තෙසං ඤ්ඤ ලොපං**) වේ.

උදා :-	වසිටඨසස	+ ණ -	තද්ධිත ප්‍රත්‍යය යෙදීම	- වාණපපවෙව
	වසිටඨ	+ ණ -	විභක්ති ලෝපය	- තෙසං විභත්තියො ලොපා ච
	වාසිටඨ	+ ණ -	ආදි ස්වර වෘද්ධිය	- අයුවණණානං චායො වුද්ධි
	වාසිටඨ	+ අ -	ණකාර ලෝපය	- තෙසං ණො ලොපං
	වාසිටඨ	+ අ -	සන්ධි කාර්යය	- සරා සරෙ ලොපං
	වාසිටඨ	-	පද සාධනය	- නයෙ පරං යුත්තෙ

තද්ධිත ප්‍රභේද

තද්ධිත ප්‍රධාන ප්‍රභේද 03 කි.

1. සාමඤඤ තද්ධිත නාම
2. භාව තද්ධිත නාම
3. අව්‍ය තද්ධිත නාම

සාමඤඤ තද්ධිත නාම

අපචව ආදි සාමාන්‍ය අර්ථ පැවසෙන තද්ධිත නාම සාමඤඤ තද්ධිත නාම ගණයට අයත් වේ. සාමඤඤ තද්ධිත නාම කොටස් 04 කට බෙදේ. මෙම බෙදීම් සිදු කර ඇත්තේ ප්‍රත්‍යයවල දක්නට ලැබෙන අර්ථ සැලකිල්ලට ගෙන ය.

1. අපචචත්ථ තද්ධිත නාම
2. අනෙකත්ථ තද්ධිත නාම
3. අත්‍යත්ථ තද්ධිත නාම
4. සංඛ්‍යා තද්ධිත නාම

අර්ථ අනුව තද්ධිත 06 කි.

1. අපචචත්ථ තද්ධිත නාම
2. අනෙකත්ථ තද්ධිත නාම
3. අත්‍යත්ථ තද්ධිත නාම
4. සංඛ්‍යා තද්ධිත නාම
5. භාව තද්ධිත නාම
6. අව්‍යය තද්ධිත නාම

1. අපචචත්ථ තද්ධිතය

පුත්‍රාර්ථයක් ප්‍රකාශ කරණ ''ණ'' ආදි ප්‍රත්‍යය එක්වී සෑදෙන තද්ධිත නාම අපචචත්ථ තද්ධිත නාම නම් වේ. අපචචත්ථ තද්ධිතයෙන් දුව, පුතා, මිනිබිරී, මුණුබුරු ආදි දරු පරම්පරාව ප්‍රකාශ වේ. ජටාී විභක්ත්‍යර්ථවත් නාමවලට පසුව අපචචත්ථ තද්ධිත ප්‍රත්‍යය යෙදේ.

අපචචත්ථ තද්ධිත ප්‍රත්‍යය

''**ණ, ණායන, ණාන, ණෙය්‍ය, ණි, ණික, ණව, ණෙර, ණ්‍ය**'' යනුවෙනි.

''**ණ**'' ප්‍රත්‍යය - ''**වාණපපචෙව**'' ඡට්ඨී විභක්ත්‍යන්ත නාමයන් කෙරෙන් පුත්‍රාර්ථයේ 'ණ' යන ප්‍රත්‍යය යෙදේ.

උදා :- වසිට්ඨස්ස අපචචං වසිට්ඨ + ණ > වාසිට්ඨ - (වසිට්ඨගේ පුතු)
වසුදෙවස්ස අපචචං වසුදෙව + ණ > වාසුදෙව - (වසුදෙවගේ පුතු)

''**ණායන, ණාන**'' **ප්‍රත්‍යය** - ''**ණායනණානා වචඡාදිතො**'' වචඡාදි ශබ්දවලින් පසු 'ණායන, ණාන' යන ප්‍රත්‍යය යෙදේ

උදා :- වචඡස්ස අපචචං > වචඡ + ණායන - වචඡායන (වත්සගේ පුතා)
කචචස්ස අපචචං > කචව + ණායන - කචවායන (කච්චගේ පුතා)
වචඡස්ස අපචචං > වචඡ + ණාන - වචඡාන (වත්සගේ පුතා)
කචචස්ස අපචචං > කචව + ණාන - කචවාන (කච්චගේ පුතා)

''**ණෙය්‍ය**'' ප්‍රත්‍යය - ''**ණෙය්‍යො කත්තිකාදීහි**'' කත්තිකාදි ශබ්දවලින් පසුව පුත්‍රාර්ථයෙහි 'ණෙය්‍ය' යන ප්‍රත්‍යය යෙදේ.

උදා :- කත්තිකාය අපචචං > කත්තික + ණෙය්‍ය - කත්තිකෙය්‍ය (කාර්තිකාගේ පුතු)
විනතාය අපචචං > විනතා + ණෙය්‍ය - වෙනතෙය්‍ය (විනතාගේ පුතු)

''**ණි, ණික**'' ප්‍රත්‍යය - ''**අතො ණි වා**'' අකාරාන්ත නාමවලින් පසුව පුත්‍රාර්ථයේ 'ණි' ප්‍රත්‍යය යෙදේ. වා නිපාතයේ බලයෙන් 'ණික' ප්‍රත්‍යය ද යෙදේ.

උදා :- දකඛස්ස අපචචං > දකඛ + ණි - දකඛි (දකඛයාගේ පුතු)
සක්‍යපුත්තස්ස අපචචං > සක්‍යපුත්ත + ණික - සක්‍යපුත්තික (සාක්‍ය පුත්තගේ පුතු)

''**ණව**'' ප්‍රත්‍යය - ''**ණවො'පගවාදීහි**'' උපගු ආදි ශබ්දවලින් පසුව පුත්‍රාර්ථයෙහි 'ණව' ප්‍රත්‍යය යෙදේ.

උදා :- මනුනො අපචචං > මනු + ණව - මානව - (මනුහුගේ පුතු)
උපගුනො අපචචං > උපගු + ණව - ඕපගව - (උපගුගේ පුතු)

''**ණෙර**'' ප්‍රත්‍යය - ''**ණෙර විධවාදිතො**'' විධවා ආදි ශබ්දවලින් පසුව පුත්‍රාර්ථයේ 'ණෙර' ප්‍රත්‍යය යෙදේ.

උදා :- විධවාය අපචචං > විධවා + ණෙර - වෙධවෙර (විධවාගේ පුතු)
සමණස්ස අපචචං > සමණ + ණෙර - සාමණෙර (ශ්‍රමණහුගේ පුතු)

''ණ්‍ය'' ප්‍රත්‍යය - ''**ණ්‍ය කුරු සිවීහි**'' කුරු ආදි ශබ්දවලින් පසුව 'ණ්‍ය' ප්‍රත්‍යය යෙදේ.

උදා :- කුරූනෝ අපචචං > කුරු + ණ්‍ය - කොරව්‍ය (කුරු පරපුරට අයත්)

ණො ණායනො ච ණානො ච
ණෙය්‍යා ණී ච ණිකො තථා
ණවො ණෙරො ච ණ්‍යා චාති
නව ගොතෙත පතිට්ඨිතා.

2. අනේකාර්ථ තද්ධිත නාම

ඇතැම් තද්ධිත ප්‍රත්‍යයවල බොහෝ අර්ථ ඇත. එහෙයින් ඒවා අනේකාර්ථ තද්ධිත ප්‍රත්‍යය නම් වේ. විවිධ අර්ථවල මෙම ප්‍රත්‍යය යෙදී තද්ධිත නාම සෑදේ.

අනේකාර්ථ තද්ධිත ප්‍රත්‍යය.

ණික, ණ, ඉම. ඉය, ඊය, එය්‍යක, ණක

''**ණික ප්‍රත්‍යය**'' - ''**යෙන වා සංසට්ඨං තරති චරති වහති ණිකො**''
''**තමධීතෙ තෙන කථා සන්නිධාන නියොග සිප්පහණ්ඩ ජීවිකත්ථෙසුච**''

යන බාලාවතාර සූත්‍රවලින් 'ණික' ප්‍රත්‍යය යෙදෙන අර්ථ කියැවේ. ඒවා පහත දැක්වේ.

යෙන වා සංසට්ඨං - යමකින් මිශ්‍ර වූයේ ය යන අර්ථයෙහි

සත	+	ණික	>	සාතික	(ගිතෙලින් මිශ්‍ර වූ දෙය)
තිල	+	ණික	>	තෙලික	(තෙලින් මිශ්‍ර වූ දෙය)

යෙන වා තරති - යමකින් එතර වූයේ ය යන අර්ථයෙහි

නාවා	+	ණික	>	නාවික	(නැවින් එතෙර වූයේ)
උළුම්ප	+	ණික	>	ඔළුම්පික	(පහුරෙන් එතෙර වූයේ)

යෙන වා චරති - යමකින් හැසිරේ ය යන අර්ථයෙහි

සකට	+	ණික	>	සාකටික	(කරත්තයෙන් හැසිරෙන)
ධම්ම	+	ණික	>	ධම්මික	(ධර්මයෙහි හැසිරෙන)

යෙන වා වහති - එයින් උසුලයි යන අර්ථයෙහි

සීස	+	ණික	>	සීසික	(හිසින් උසුලන්නා)
හත්ථ	+	ණික	>	හත්ථික	(අතින් උසුලන්නා)

තං අධීතෙ - එය හදාරයි යන අර්ථයෙහි

විනය	+	ණික	>	වෙනයික	(විනය හදාරන්නා)
අභිධම්ම	+	ණික	>	ආභිධම්මික	(අභිධර්මය හදාරන්නා)

තෙන කතං - එයින් කරන ලද්දේ ය යන අර්ථයෙහි

කාය	+	ණික	>	කායික	(කයින් කරන ලද)
මනස	+	ණික	>	මානසික	(මනසින් කරන ලද)

තසමිං නියුත්තෙතා - එහි නියුක්ත වූයේ යන අර්ථයෙහි

දවාර	+	ණික	>	දොවාරික	(දොරෙහි නියුක්ත වූ)

අසස සිප්පං - ඔහුගේ ශිල්පය යන අර්ථයෙහි

වීණා	+	ණික	>	වෙණික	(වීණා වාදනය ඔහුගේ ශිල්පය යි)

අසස භණ්ඩං - ඔහුගේ භාණ්ඩ යන අර්ථයෙහි

තණ්ඩුල	+	ණික	>	තණ්ඩුලික	(සහල් බඩු ඇත්තා)

තෙන ජීවිකත්ථෙ - එයින් ජීවත් වේ.

මගව	+	ණික	>	මාගවික	(මුවන් මරා ජීවත් වන්නා)

ප්‍රත්‍යය - ''**ණ, රාග තෙන රත්තං තසෙසදමඤ්ඤත්ථෙසු ච**'' යන සූත්‍රයෙන් 'ණ' ප්‍රත්‍යය පහත සඳහන් අර්ථවල යෙදෙන බව කියවේ.

තෙන රත්තං - එයින් පැහැගැන්වුණු යන අර්ථයෙහි

කසාව	+	ණ	>	කාසාව	(කහ පැහැ ගැන්වූ)

තසස ඉදං - මෙය මොහුගේ ය යන අර්ථයෙහි

මහිස	+	ණ	>	මාහිස	(මීමාගේ අඟ)

ඉම, ඉය ප්‍රත්‍යය-''**ජාතාදීනම්මියා ච**'' එයින් උපන්නේ ය යන අර්ථයෙහි 'ඉම, ඉය' ප්‍රත්‍යය යෙදේ.

ඉම ප්‍රත්‍යය	-	පච්ඡ	+ ඉම	>	පච්ඡිම	(පසුව වූයේ ය)
ඉය ප්‍රත්‍යය	-	මනුස්ස ජාති	+ ඉය	>	මනුස්ස ජාතියා	(මිනිස් බවේ උපන්)
		කප්ප	+ ඉය	>	කප්පිය	(මොහුට කැප ය)

ඊය ප්‍රත්‍යය ''**තදඤ්ඤඨානමීයො ච**'' එය එයට කරුණු ය යන අර්ථයෙහි 'ඊය' ප්‍රත්‍යය යෙදේ.

බන්ධ	+ ඊය	> බන්ධනීය	(බැම්මට කරුණු ය)
පසාදන	+ ඊය	> පසාදනීය	(පැහැදීමට කරුණු)

එය්‍ය, ණක ප්‍රත්‍යය -''**ඉත්ථිලිංගතො එය්‍යකො ණකො ච**'' ස්ත්‍රිලිංග ශබ්දයන්ගෙන් පසුව එහි උපන් යන අර්ථයෙහි 'එය්‍යක' හා 'ණක' ප්‍රත්‍යය යෙදේ.

චම්පා	+ එය්‍යක	> චම්පෙය්‍යක	(චම්පාවෙහි උපන්)
කුසිනාරා	+ ණක	> කොසිනාරක	(කුසිනාරාවේ උපන්)

★ මෙසේ ප්‍රත්‍යය එක්වී නොයෙක් අර්ථ නිපදවෙන පද අනේකත්‍ථ තද්ධිතයට අයත් වේ.

අභ්‍යාස

01. තද්ධිත පද භාවිත කරමින් පාලියට නගන්න.

i. ඒ මානවකයා වහා ධර්මය අවබෝධ කර ගනී.
ii. මේ දොරටුපාලකයා මා රජු බව දැනත් මහඬින් සිනාසෙයි.
iii. තෙරුන් වහන්සේ මානසික සුව විඳින සේක.
iv. ගැල් පදවන්නා කරත්තයෙන් ගොස් බඩු විකුණයි.
v. කුසිනාරාවෙහි උපන් මිනිස්සු පින්වත් වූහ.

02. පහත වගුව සම්පූර්ණ කරන්න.

නාමය	අර්ථය	තද්ධිත පදය
උදා: කත්තික	කාර්තිකාවගේ පුතු	කත්තිකෙය්‍ය
සමණ	ශ්‍රමණහුගේ පුතු	
ධම්ම	ධර්මයෙහි හැසිරෙන්නා	
මනුස්සජාති	මිනිස් බවේ උපන්	
මහිස	මීමාගේ අඟ	
කසාව	කහ පැහැ ගැන්වූ	
මනු	මනුහුගේ පුත්	
තිල	තෙලෙන් මිශ්‍ර වූ දෙය	
තණ්ඩුල	සහල් බඩු ඇත්තා	
උළුම්ප	පහුරෙන් එතර වූයේ	
උපගු	උපගුගේ පුතු	

03. පහත සඳහන් තද්ධිත පද සෑදුණු ආකාරය පියවරෙන් පියවර දක්වන්න.

i. වාසිටඨ ii. වච්ඡායන iii. සාමණේර iv. ඔපගව v. ආභිධම්මික

04. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

තද්ධිත පදය	ප්‍රකෘති ප්‍රත්‍යය වෙන් කිරීම	අර්ථය
උදා: වාසුදෙව	වසුදෙව + ණ	වසුදේවගේ පුතු
සාකටික		
මානසික		
වෙණික		
ඔළුම්පික		
වෙනතෙය්‍ය		
කොසිනාරක		
ආභිධම්මික		
මොග්ගල්ලායන		
නාවික		
පච්ඡිම		

05. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

තද්ධිත පදය	සිදුව ඇති වෘද්ධිය
උදා : සාකටික	අ > ආ වෘද්ධි වීම
කොසිනාරක	
මානව	
වෙනතෙය්‍ය	
ඔලුම්පික	
වෙණික	

දොළොස්වෙනි පාඩම

තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා

එකං සමයං භගවා මලෙලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසංඝෙන සද්ධිං යෙන ථූනං නාම මල්ලානං බ්‍රාහ්මණගාමො තදවසරි. අස්සොසුං ඛො, ථූනෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා 'සමණො බලු හො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මලෙලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසංඝෙන සද්ධිං ථූනං අනුප්පත්තො'ති. උදපානං තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරෙසුං 'මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසූ'ති. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙන රුක්ඛමූලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. 'ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, එතමහා උදපානා පානීයං ආහරා'ති. එවං වුත්තෙ, ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. ඉදානි සො, භන්තෙ, උදපානො ථූනෙය්‍යකෙහි බ්‍රාහ්මණගහපතිකෙහි තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරිතො 'මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසූ'ති. දුතියම්පි ඛො..... අපංසූ'ති. තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, එතමහා උදපානා පානීයං ආහරා'ති. එවං, භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා පත්තං ගහෙත්වා යෙන සො උදපානො තෙනුපසඞ්කමි. අථ ඛො සො උදපානො ආයස්මන්තෙන ආනන්දෙ උපසඞ්කමන්තෙන සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දෙන්තො මඤ්ඤෙ අට්ඨාසි. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි. අච්ඡරියං වත! හො, අබ්භුතං වත! හො, තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා. අයං හි සො උදපානො මයි උපසඞ්කමන්තෙ සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දෙන්තො මඤ්ඤෙ අට්ඨාසීති. පත්තෙන පානීයං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි.

(උදපානසුත්ත - උදානපාලි)

පදමාලාව

චරමානො	(කි)	-	හැසිරෙන්නේ
තදවසරි	(සං)	-	එතනට පැමිණියේ ය
අස්සොසුං	(ක්‍රි)	-	ඇසූහ
ථූනෙය්‍යකා	(ත)	-	ථූන ගම්වැසි
පබ්බජිතො	(කි)	-	පැවිදි වූ
අනුප්පත්තො	(කි)	-	පැමිණියේ
උදපානං	(නා)	-	ළිඳ
තිණස්ස	(නා)	-	තෘණවලින්
භුසස්ස	(නා)	-	පිදුරුවලින්
යාව මුඛතො	(නි)	-	(ළිං) කට දක්වා
පූරෙසුං	(ක්‍රි)	-	පිරවූහ

මුණ්ඩකා	(ත)	-	මුඩු
(මා) අපංසූ	(ක්‍රි)	-	(නො) බොත්වා
මගහා	(නා)	-	මාර්ගයෙන්
ඔකකමම	(පු.ක්‍රි)	-	ඉවත්ව
අඤ්ඤතරං	(ස.නා)	-	එක්තරා
නිසජ්ජ	(පු.ක්‍රි)	-	හිඳ
පටිසුත්වා	(පු.ක්‍රි)	-	පිළිවදන් දී
ඔවමිත්වා	(පු.ක්‍රි)	-	බැහැරකොට
අචඡසස	(නා)	-	පිරිසිදු / පැහැදිලි
අනාවිලසස	(කි)	-	නොකැළඹුණු
විපපසනනසස	(කි)	-	පැදුණු
විසසනෙනෙතා	(කි)	-	පිටතට නික්මෙන්නේ
අචඡරියං	(ත)	-	අශ්චර්යයකි
මහිදධිකතා	(ත)	-	මහත් සෘද්ධි ඇති බව
මහානුභාවතා	(ත)	-	මහත් අනුහස් ඇති බව

අභ්‍යාස

01. 'තථාගතසස මහිදධිකතා මහානුභාවතා' ඡේදය සිංහලට නගන්න.

02. පාලියෙන් පිළිතුරු ලියන්න.

i. භගවා කෙන සද්ධිං කිං නාම බ්‍රාහමණගාමෙ තදවසරි?
ii. ථූනෙය්‍යකා බ්‍රාහමණගහපතිකා උදපානං කෙහි පූරෙසුං?
iii. භගවා ආනන්දං ආමනෙතත්වා කිං අහාසි?
iv. ආනන්දො කෙන පානියං ආදාය භගවනතං උපසංකමි?
v. ආනන්දෙ උදපානං ගතෙ උදපානො කීදිසො අහවි?

02. ඡේදයේ සඳහන් වාක්‍ය රටාව අනුගමනය කොට පාලියට නගන්න.

i. එක් කලෙක මලියදේව මහරහතන් වහන්සේ බොහෝ භික්ෂූන් සමඟ වට්ටාරම් විහාරයට (මණ්ඩලාරාම) පැමිණි සේක.
ii. ජනාධිපතිතුමා සෙංකඩගල නුවරට පැමිණියේ යැයි සෙන්කඩගල නුවර වැසියෝ ඇසූහ.
iii. නුවර වැසියෝ තෙරුන් වහන්සේලාගේ පාත්‍ර කට දක්වා කෑයුතු පියයුතු දැයින් (බාදනීය/භොජනීය) පිරවූහ.
iv. ස්වාමීනි, එසේයයි ශිෂ්‍යයෝ ගුරුවරයාට පිළිතුරු දී පොත් රැගෙන බෝධිමණ්ඩපය වෙත එළඹුණහ.
v. ළිඳේ ජලය පිරිසිදුව නොකැළඹී පැදී කටතෙක් පිරී ඇත.

03. ඡේදය ඇසුරෙන් පිළිතුරු ලියන්න.

i. ථූන ජනපදය පිහිටා තිබුණේ කවර රාජධානියක ද?
ii. ආනන්ද තෙරුන් දැරූ තනතුරු මොනවා ද?
iii. බුදුරදුන්ගේ මහානුභාවය ප්‍රකට වූයේ කවර කරුණක් නිසා ද?
iv. බුද්ධ චරිතය සම්බන්ධ ඡේදයෙන් අනාවරණය වන කරුණු තුනක් ලියන්න.
v. බුදුරදුන්ගේ චාරිකාවට අකමැති වූවෝ කවරහු ද, ඔවුන් අකමැත්ත ප්‍රකාශ කළේ කෙසේ ද?

තද්ධිත නාම II

1. අත්‍යාර්ථ තද්ධිත නාම

ඇත යන අර්ථය දෙන තද්ධිත ප්‍රත්‍යය එක් වී සෑදෙන තද්ධිත නාම අත්‍යාර්ථ තද්ධිත නමින් හැඳින්වේ.

අත්‍යාර්ථ තද්ධිත ප්‍රත්‍යය.
ආලු, තර, තම, ඉස්සික, ඉය, ඉට්ඨ, වී, සී, ඉක, ඊ, වන්තු, මන්තු

ආලු ප්‍රත්‍යය - ''ආලු තබ්බහුලෙ''
බොහෝ කොට ඇත්තේ ය යන අර්ථයේ ආලු ප්‍රත්‍යය වේ.

උදා :- අභිජ්ඣා + ආලු - අභිජ්ඣාලු (දැඩි ලෝභය බොහෝ කොට ඇත්තේ)

තර, තම, ඉස්සික, ඉය, ඉට්ඨ, ප්‍රත්‍යය **'විසෙසෙ තරතමිස්සිකියිට්ඨා'**

උදා:-	පාප	+	තර	-	පාපතර (අන්‍ය පාපීන්ට වඩා පාපී වූ)
	පාප	+	තම	-	පාපතම (පාපතරයාට වඩා පාපී වූ)
	පාප	+	ඉස්සික	-	පාපිස්සික (පාපතමයාට වඩා පාපී වූ)
	පාප	+	ඉය	-	පාපිය (පාපිස්සිකයාට වඩා පාපී වූ)
	පාප	+	ඉට්ඨ	-	පාපිට්ඨ (පාපියාට වඩා පාපී වූ)

මෙහි **තර** ප්‍රත්‍යයට වඩා **තම** ප්‍රත්‍යය ද එයට වඩා **ඉස්සික** ප්‍රත්‍යය ද එයට වඩා **ඉය** ප්‍රත්‍යය ද එයට වඩා **ඉට්ඨ** ප්‍රත්‍යය ද අතිශයාර්ථ බව ප්‍රකාශ කරයි. අතිශයාර්ථය ප්‍රකාශ කිරීමට **ඉට්ඨ** ප්‍රත්‍යයට වඩා ඉහළ ප්‍රත්‍යයක් නොමැත.

වී ප්‍රත්‍යය - **තදස්සාත්ථී ති වී ච**

එය මොහුට බොහෝ කොට ඇත්තේය යන අර්ථයෙහි
උදා :- මෙධා අස්ස අත්ථීති - මෙධාවී (ධාරණ ප්‍රඥාව මොහුට ඇත්තේය.)

සී ප්‍රත්‍යය - **තපාදිතෝ සී**

තප ආදී ශබ්ද වලින් පරව එය මොහුට ඇත්තේය යන අර්ථයෙහි සී ප්‍රත්‍යය වේ.
තපං අස්ස අත්ථීති - තපස්සි (තපස මොහුට ඇත්තේය.)

ඉක, ඊ ප්‍රත්‍යය - **දණ්ඩාදිතෝ ඉක ඊ**

දණ්ඩාදි ශබ්දවලින් පරව එය මොහුට ඇත්තේය යන අර්ථයෙහි ඉක, ඊ ප්‍රත්‍යය වේ.

උදා:- දණ්ඩ + ඉක - දණ්ඩික
දණ්ඩ + ඊ - දණ්ඩී

වන්තු ප්‍රත්‍යය - **ගුණාදිතෝ වන්තු**

ගුණ ආදි අකාරාන්ත ශබ්ද කෙරෙන් පරව එය මොහුට ඇත්තේ ය යන අර්ථයෙහි **වන්තු** ප්‍රත්‍යය යෙදේ.

උදා :- ගුණෝ අස්ස අත්ථීති - ගුණවන්තු

මන්තු ප්‍රත්‍යය - **සත්‍යාදිහි මන්තු**

ඉවර්ණාන්ත හා උවර්ණාන්ත ශබ්ද කෙරෙන පරව එය මොහුට ඇත්තේ ය යන අර්ථයෙහි **මන්තු** ප්‍රත්‍යය යෙදේ.

උදා :- සති + මන්තු - සතිමන්තු

2. සංඛ්‍යා තද්ධිත නාම

සංඛ්‍යා නාමවලට පසුව සංඛ්‍යා පූර්ණාර්ථ තද්ධිත ප්‍රත්‍ය එක් වී සංඛ්‍යා තද්ධිත නාම සැදේ.

සංඛ්‍යා තද්ධිත ප්‍රත්‍යය

තිය, ථ, ඨ, ම.

''**තිය**'' ප්‍රත්‍යය - ''**දුවිතීහි තියො**''

ද්වි, ති ශබ්ද කෙරෙන් පරව තිය ප්‍රත්‍ය යෙදේ.

දුවි + තිය - දුතිය
ති + තිය - තතිය

ථ, ඨ ප්‍රත්‍යය - ''**චතුචෙඡහි ථ ඨා**''

චතු, ඡ කෙරෙන් පරව ථ, ඨ ප්‍රත්‍යය වේ.

උදා : චතු + ථ
චතු + ත් + ථ
චතුත්‍ථ

ඡ + ඨ
ඡ + ට් + ඨ
ඡට්ඨ

''**තෙසමඩඩුපපදෙනඩඩුඩඨදිවඩඨදියඩඨඩඨතියා**''

අඩඩ යන උපපදය සහිත චතුත්‍ථ, දුතිය, තතිය යන මේවාට පිළිවෙළින් අඩඩුඩඩ දිවඩඨඅඩඨතිය යන ආදේශ වේ.

අඩෙඩන චතුත්‍ථො > අඩඩුඩඩ (තුනහමාර)
අඩෙඩන දුතියො > දිවඩඨ (එකහමාර)
අඩෙඩන තතියො > අඩඨතියො (දෙකහමාර)

ම ප්‍රත්‍යය - **සංඛ්‍යාපුරණෙ මො**

පඤ්ඤාදි ශබ්ද කෙරෙන් පරව ම ප්‍රත්‍යය වේ.

උදා :- පඤ්ඤ + ම - පඤ්ඤම
සත්ත + ම - සත්තම
අට්ඨ + ම - අට්ඨම
දස + ම - දසම

3. භාව තද්ධිත නාම

ඔහුගේ ස්වභාවය යන අර්ථයෙහි භාවාර්ථවත් **ණ්‍ය** ආදි ප්‍රත්‍යය යෙදී සැදෙනුයේ භාව තද්ධිත නම් වේ.

භාව තද්ධිත ප්‍රත්‍යය

ණ්‍ය, ත්ත, තා ත්තන, - ''**ණ්‍යත්තතා භාවෙතු**''

ණ්‍ය ප්‍රත්‍යය

කුසල	+	ණ්‍ය	-	කොසල්ල	(හසුරු බව)
සමාන	+	ණ්‍ය	-	සාමඤ්ඤ	(සමාන බව)
අරොග	+	ණ්‍ය	-	ආරොග්‍ය	(නිරෝගි බව)

ත්ත ප්‍රත්‍යය

නීල	+	ත්ත	-	නීලත්ත	(නිල්බව)
සෙට්ඨ	+	ත්ත	-	සෙට්ඨත්ත	(ශ්‍රේෂ්ඨබව)

තා ප්‍රත්‍යය

මුදු	+	තා	-	මුදුතා	(මෘදුබව)
කතඤ්ඤු	+	තා	-	කතඤ්ඤුතා	(කෙළෙහිගුණ දන්නා බව)

ත්තන ප්‍රත්‍යය

පුථුජ්ජන	+	ත්තන	-	පුථුජ්ජනත්තන	(පුහුදුන් බව)

4. අව්‍ය තද්ධිත නාම

වාර විභාග ආදි අර්ථ ප්‍රකාශ කරන තද්ධිත ප්‍රත්‍යය එක්ව අව්‍ය තද්ධිත නාම සැදේ. මෙහිදී තද්ධිත නාමය අව්‍යයක් බවට පත්වේ.

අව්‍ය තද්ධිත ප්‍රත්‍යය

කඛත්තුං, ධා, ථා, ත්ත

කඛත්තුං ප්‍රත්‍යය

එක	+	කඛත්තුං	-	එකකඛත්තුං	(එක්වරක්
ද්වි	+	කඛත්තුං	-	ද්විකඛත්තුං	(දෙවරක්

ධා ප්‍රත්‍යය

එක	+	ධා	- එකධා	(එක් අයුරකින්)
කති	+	ධා	- කතිධා	(කී අයුරකින්)

ඨා ප්‍රත්‍යය

සබ්බ + ඨා - සබ්බඨා (සෑම අයුරකින්)
අඤ්ඤ + ඨා - අඤ්ඤඨා (අන් අයුරකින්)

තන ප්‍රත්‍යය

අජ්ජ + තන - අජ්ජතන (අද පටන්)

අභ්‍යාස

01. පාලියට නගන්න.

i. සඤ්ජය පිරිවැජියා පිරිවැජියන් දෙසිය පණහක් (අඩසතෙය්‍ය සතෙහි) සමග රජගහ නුවර වසයි.
ii. ගුණවන්ත කුමාරවරු සිල්වත් උපාසකවරුන්ට උවටැන් කරති.
iii. දිළිඳු බව වැඩි වූ කල්හි සොරකම විපුල බවට ගියේ ය.
iv. මම පළමුවත් දෙවනුවත් තෙවනුවත් බුදුන් සරණ යමි.
v. චුල්ලපන්ථක තෙර රහත්බව ලැබ තමා දහස්වරක් මවා අඹ වනයේ හුන්නේ ය.

02. සිංහලයට නගන්න.

i. ගුණවන්තා මනුස්සා පාණාතිපාතමහා විරමන්ති.
ii. අපරභාගෙ සො ආරඤ්ඤකමහාභයත්ථෙරො' ති පාකටො අහොසි.
iii. මෙධාවිනො සිස්සා ගරුනො ගාරවං කත්වා නානාසත්ථෙසු පාටවං ලභන්ති.
iv. සච්චවාදී තපස්සිනො වාචාලා න භවන්ති.
v. සත්තධා මෙ ඵලෙ මුද්ධා ජීවන්තා න සුඛං ලභෙ.

03. පහත වගුව සම්පූර්ණ කරන්න.

තද්ධිත පදය	ප්‍රත්‍යය වෙන්කිරීම	තද්ධිතය ප්‍රභේදය	තද්ධිත පදයේ අදහස
උද්‍රා : -ධම්මික	ධම්ම + ණික	අනේකාර්ථ	ධර්මයෙහි හැසිරෙන්නා
ථුනෙය්‍යකා			
ගහපතිකා			
ගොතමො			
සමණකා			
මුණ්ඩකා			
තතියං			
දුතියං			

අවඡරියං			
මහිද්ධිකතා			
මහානුභාවතා			

04. පහත වගුව සම්පූර්ණ කරන්න.

නාමය	අර්ථය	තද්ධිත පදය
උද්‍රා : අරොග	නිරෝගිකම	ආරොග්‍ය
මෙධා	නුවණ ඇති	.....
රාජ	රජ පරපුරට අයත්	.....
මගධ	මගධයෙහි උපන්	.....
සමුද්ද	මුහුදට අයත්	.....
පඤ්ඤව	පස්වැනි	.....
සබ්බ	හැම අයුරකින්	.....
පුථුජ්ජන	පුහුදුන් බව	.....
කති	කීවරක්	.....
තප	තපස් ඇති	.....
මග	මුව වැද්දා	.....

තෙරසමො පාඨො

තෙ නමස්සාමි මාතලී

භූතපුබ්බං භික්ඛවෙ සක්කො දෙවානමින්දො මාතලිං සඞ්ගාහකං ආමන්තෙසි. යොජෙහි සමම, මාතලි, සහස්සයුත්තං ආජඤ්ඤරථං. උය්‍යානභූමිං ගච්ඡාම සුභූමිං දස්සනායාති. එවං භද්දන්තවාති ඛො භික්ඛවෙ මාතලි සඞ්ගාහකො සක්කස්ස දෙවානමින්දස්ස පටිස්සුත්වා සහස්සයුත්තං ආජඤ්ඤරථං යොජෙත්වා සක්කස්ස දෙවානමින්දස්ස පටිවෙදෙසි. යුත්තො ඛො තෙ, මාරිස, සහස්සයුත්තො ආජඤ්ඤරථො යස්සදානි කාලං මඤ්ඤසීති. අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො වෙජයන්තපාසාදා ඔරොහන්තො පඤ්ජලිකො පුථුද්දිසා නමස්සති. අථ ඛො භික්ඛවෙ මාතලි සඞ්ගාහකො සක්කං දෙවානමින්දං ගාථාය අජ්ඣභාසි.

තං නමස්සන්ති තෙවිජ්ජා - සබ්බෙ භුම්මා ච බත්තියා,
චත්තාරො ච මහාරාජා - තිදසා ච යසස්සිනො,
අථ කො නාම සො යක්ඛා - යං ත්වං සක්ක නමස්සසීති.

අහඤ්ච සීලසම්පන්නෙ - චිරරත්තසමාහිතෙ,
සම්මා පබ්බජිතෙ වන්දෙ - බ්‍රහ්මචරියපරායනෙ.

යෙ ගහට්ඨා පුඤ්ඤකරා - සීලවන්තො උපාසකා,
ධම්මෙන දාරං පොසෙන්ති - තෙ නමස්සාමි මාතලී ති.

(සක්කනමස්සන සුත්ත සංයුත්තනිකාය)

පද මාලාව

භූතපුබ්බං	(නි)	-	පෙර වූවකි
සක්කො	(නා)	-	ශක්‍රයා
දෙවානමින්දො	(සං)	-	දෙවියන්ගේ අධිපති
මාතලිං	(නා)	-	මාතලි දෙව්පුත්
සඞ්ගාහකං	(නා)	-	රියදුරු
යොජෙහි	(ක්‍රි)	-	යොදවව
සමම	(නි)	-	මිත්‍රය
සහස්සයුත්තං	(ස)	-	දහසක් යොදන ලද
ආජඤ්ඤරථං	(ස)	-	ආජානීය අශ්වරථය
උය්‍යානභූමිං	(ස)	-	උයන් බිම
සුභූමිං	(ස)	-	රමණීය භූමිය
දස්සනායාති	(සං)	-	දකිනු පිණිස

භදන්තවාති	(සං)	-	ඔබට යහපතක් වේවා යැයි
පටිසුත්වා	(පූ.ක්‍රි)	-	පිළිතුරු දී
පටිවෙදෙසි	(ක්‍රි)	-	දැන්වීය
මාරිස	(නා)	-	නිදුකාණෙනි
යසසදානි	(සං)	-	යමකට දැන්
කාලං	(නා)	-	කාලය
මඤ්ඤසී	(ක්‍රි)	-	හඟිහි
වෙජයන්තපාසාදා	(ස)	-	විජයොත් පහයෙන්
ඔරොහන්තා	(කි)	-	බසින්නේ
පඤ්ජලිකෝ	(නා)	-	බඳින ලද ඇඟිලි ඇත්තේ
පුථුද්දිසා	(සං)	-	සියලු දිශා
නමස්සති	(ක්‍රි)	-	වඳියි
අජ්ඣභාසි	(ක්‍රි)	-	පැවසීය
තෙවිජ්ජා	(ත)	-	ත්‍රිවිද්‍යා ඇත්තේ
සබ්බෙ	(ස.නා)	-	සියල්ලෝ
භූමමා	(නා)	-	බිම වසන
චත්තාරෝ	(නා)	-	සතර
තිදසා	(ස)	-	තව්තිසා වැසියෝ, දෙවියෝ
යසස්සිනෝ	(ත)	-	කීර්තිමත් වූ
චිරරත්ත	(නි)	-	බොහෝ කල්
සමාහිතෙ	(සං)	-	එකඟ කළ සිත් ඇති
බ්‍රහ්මචරියපරායනෙ	(ස)	-	බඹසර එක ම මඟ ගත්
ගහට්ඨා	(ත)	-	ගිහියෝ
පුඤ්ඤකරා	(කි)	-	පින්කරන
දාරං	(නා)	-	අඹුදරු
පොසෙන්ති	(ක්‍රි)	-	පෝෂණය කරති

අභ්‍යාස

1. 'තෙ නමස්සාමි මාතලී' ඡේදය සිංහලට නගන්න.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. සක්කො දෙවානමින්දො මාතලිං සංගාහකං කිං කථෙසි?
ii. මාතලි පන සක්කස්ස දෙවානමින්දස්ස කො අහවි?
iii. සක්කො දෙවානමින්දො කුතො ඔරොහි?
iv. ගහට්ඨානං කෙ ගුණා භවන්ති?
v. සක්කො කෙසං වන්දති?

3. ඡේදය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සක් දෙව්රජ මාතලි දිව්‍යපුත්‍රයාට පැවසුවේ කුමක් ද?
ii. මාතලි දිව්‍යපුත්‍රයා සක් දෙවිඳුන්ගේ කුමන කාර්යයක් ඉටු කරයි ද?
iii. මෙම ඡේදයේ සඳහන් සක් දෙව්රජුගේ සම්පත් මොනවා ද?
iv. සතරවරම් දෙව්රජවරුන්ගේ නම් ලියන්න
v. සක් දෙව්රජුගේ වන්දනා ගරු බුහුමනට පාත්‍රවන්නේ කුමන කටයුතු කරන පිරිස් ද?

කිතක පද

හැඳින්වීම

ධාතුවකට ප්‍රත්‍යයක් එක්කොට සාදාගනු ලබන නාම කිතක නම් වේ.

ධාතුව	+ ප්‍රත්‍යය	=	**කිතක නාමය**
වඳ	+ මාන	=	වඳමාන
පාල	+ අක	=	පාලක

කිතක නාමය නාමපදයක් මෙන් විභක්තිවල වරනැගේ. ලිංග භජනය කෙරේ. සාම්ප්‍රදායික ව්‍යාකරණයෙහි කිතක පද විවිධ ස්වරූපයෙන් වර්ග කොට ඇත. පාලි භාෂාව තේරුම් ගැනීමට අත්‍යන්තයෙන් උපකාර වන කිතක පද කීපයක් මෙහි දී හඳුන්වා දෙමු.

වර්තමාන කිතක

"**වත්තමානෙ මානන්තා**" යන බාලාවතාර සූත්‍රයට අනුව වත්තමාන කාලයෙහි "**මාන**" හා "**අන්ත**" යන ප්‍රත්‍යය යෙදී වර්තමාන කිතක පද සෑදේ.

ධාතුව	ප්‍රත්‍යය	කිතක නාමය
වඳ	මාන	වඳමාන
වඳ	අන්ත	වඳන්ත
ලභ	මාන	ලභමාන
ලභ	අන්ත	ලභන්ත

වර්තමාන කෘදන්ත පද මිශ්‍රක්‍රියා වශයෙන් ද විශේෂණ වශයෙන් ද නාම පද වශයෙන් ද යෙදේ.

- දාරිකා **රොදන්තී** මාතරං උපසංකමි. (දැරිය හඬමින් මව වෙත ගියාය) (මිශ්‍රක්‍රියා)
- ථෙරෝ ධම්මං **සුණන්තෝ** රුක්ඛමූලෙ අට්ඨාසි. (තෙරුන් වහන්සේ ධර්මය අසමින් ගස මුල සිටි සේක)

වර්තමාන කෘදන්ත පද විශේෂණ පද ලෙස යෙදෙන විට විශේෂ්‍ය පදය ලිංගයෙන් විභක්තියෙන් සමාන වේ.

වන්දන්තෝ සාමණේරෝ
වන්දන්තෙහි සාමණේරෙහි
නිසීදන්තී වනිතා
නිසීදන්තීනං නාරීනං
පතන්තානි ඵලානි
පතන්තෙසු ඵලෙසු
ආදි වශයෙනි.

උදාහරණ:-

වනං ගච්ඡන්තෝ පුරිසෝ විරවන්තං දීපිං පස්සති.
(වනයට යන්නා වූ පුරුෂයා ගොරවන කොටියෙකු දකියි)
ධම්මසාලායං නිසීදන්තියෝ වනිතායෝ දෙසෙන්තං ධම්මං සුණිංසු.
(ධර්මශාලාවෙහි හුන්නා වූ කාන්තාවෝ දේශනා කරන්නා වූ ධර්මය ඇසූහ)

වර්තමාන කෘදන්ත පද වාක්‍ය දෙකක් එක් වාක්‍යයක් බවට පත්කිරීමට ද උපයෝගි කර ගැනේ.

සීහෝ සයති - මිගෝ සීහං පස්සති
මිගෝ සයන්තං සීහං පස්සති.

ඵලානි පතන්ති - වනිතා ඵලානි ඔචිනාති
වනිතා පතන්තානි ඵලානි ඔචිනාති.

භික්ඛු පිණ්ඩාය චරති - උපාසකා භික්ඛුනෝ දානං දෙන්ති
පිණ්ඩාය චරන්තඤ්ඤ භික්ඛුනෝ උපාසකා දානං දෙන්ති.

අව්‍යය කිතක පද

අව්‍යය කිතක පද ලෙස සැලකෙනුයේ වරනොනැගෙන කෘදන්ත පදයි. එනම්, පූර්ව ක්‍රියා හා තුමන්ත ක්‍රියාවන් ය. පූර්වක්‍රියා යනු කර්තෘගේ අවසාන ක්‍රියාවට මුලින් සිදුවෙන ක්‍රියාවන් ය. බාලාවතාරයේ "**පුබ්බකාලෙකකත්තුකානං තූනත්වානත්වා වා**" යන සූත්‍රයෙන් **තූන, ත්වාන, ත්වා** යන ප්‍රත්‍යය යෙදෙන බව දැක්වේ.

වන්ද + තුන = වන්දිතුන
වන්ද + ක්වාන = වන්දිත්වාන
වන්ද + ක්වා = වන්දිත්වා
වශයෙන් පද සිද්ධ වේ.

"**සබ්බෙහි තුනාදීනං යො**" යන සූත්‍රයෙන් තුනාදි ප්‍රත්‍යයවලට "ය" යන්න ආදේශ වේ.

බොහෝ විට උපසර්ග පූර්ව ධාතුවලට මෙම ආදේශය වේ.

අභි + වන්ද + ය > අභිවන්දිය
අපි + දහ + ය > පිදහිය
උප + නී + ය > උපනීය

ඇතැම් ධාතුන්ගෙන් පරව තුනාදි ප්‍රත්‍යයවලට ''**රච්ච, මම, යහ, බහ, දධ**'' යන ආදේශ වේ.

පටි + ඉ + රච්ච - පටිච්ච
වී + මුච් + රච්ච - විමුච්ච
ආ + ගමු + මම - ආගම්ම
අව + කමු + මම - ඔක්කම්ම
ප + ගහ + යහ - පග්ගය්හ
සං + මුහ + යහ - සම්මුය්හ
ප + මද + ජ්ජ - පමජ්ජ
උ + පද + ජ්ජ - උපජ්ජ
ආ + රභ + බහ - ආරබ්භ
උප + ලභ +බහ - උපලබ්භ

එකම උක්තය සහිත වාක්‍ය රාශියක් පූර්වක්‍රියා මගින් තනි වාක්‍යයක් කළ හැකි ය.

කුලපුත්තෝ ධම්මං **සුණි**. සෝ කාමෙසු ආදීනවං **පස්සි**. සෝ **පබ්බජි**. සෝ **උපසම්පජ්ජි**.
කුලපුත්තෝ ධම්මං **සුත්වා** කමෙසු ආදීනවං **දිස්වා පබ්බජිත්වා** උපසම්පජ්ජි.

තුමන්ත ක්‍රියා

ඉච්ඡත්‍ථෙසු සමානකත්තුකෙසු තවෙ, තුං වා යන සූත්‍රයට අනුව සමාන කර්තෘක කිරීමට කැමති යන අර්ථයෙහි **තවෙ/ තුං** ප්‍රත්‍යය යෙදේ.

වන්ද + තුං - වන්දිතුං - වඳින්නට
වන්ද + තවෙ - වන්දිතවෙ - වඳින්නට
කර + තුං - කාතුං - කරන්නට
කර + තවෙ - කාතවෙ - කරන්නට

මෙය ද වාක්‍යය දෙකක් එක් කිරීමේ ප්‍රයෝජනයෙන් යුතු ය.

සාමණෙරො පරිවෙණං **ගචඡති** - සාමණෙරො තතො පාලිභාසං **උගගණ්හාති.**
සාමණෙරො පාලිභාසං **උගගණ්හිතුං** පරිවෙණං ගචඡති.

කුමාරො විහාරං **ගචඡති** - කුමාරො බුද්ධං **වන්දති.**
කුමාරො බුද්ධං **වන්දිතුං** විහාරං **ගචඡති.**

ත්‍රෛකාලික කෘදන්ත

කාල තුනේ ම යෙදෙන කෘදන්ත පදයි. මේවා කොටස් දෙකකි.

i. **භාවකාරක, කර්මකාරක දෙකෙහි යෙදෙන කෘදන්ත (කිච්ච කෘදන්ත)**
ii. **කර්තෘකාරකයෙහි යෙදෙන කෘදන්ත (කිත් කෘදන්ත)** වශයෙනි.

භාවකාරක, කර්මකාරක අර්ථයන්හි යෙදෙන කෘදන්ත ප්‍රත්‍යය කීපයකි. **තබ්බ, අනීය ණ්‍ය, ණීය, රිච්ච** වශයෙනි. ඒවායින් සිද්ධ වන පද මෙසේ ය.

කර + තබ්බ - කත්තබ්බ	(කළ යුතුයි)
ගමු + තබ්බ - ගන්තබ්බ	(යා යුතුයි)
වන්ද+ තබ්බ - වන්දිතබ්බ	(වැඳිය යුතුයි)
කර + අනීය - කරණීය	(කළ යුතුයි)
වන්ද+ අනීය - වන්දනීය	(වැඳිය යුතුයි)
මර + අනීය - මරණීය	(මැරිය යුතුයි)
වද + ණ්‍ය - වජ්ජ	(කිව යුතුයි)
ගමු + ණ්‍ය - ගම්‍ය	(යා යුතුයි)
කර + ණීය - කාරිය	(කළ යුතුයි)
මර + ණීය - මාරිය	(මැරිය යුතුයි)
කර + රිච්ච - කිච්ච	(කළ යුතුයි)
භර + රිච්ච - භච්ච	(පෝෂණය කළ යුතුයි)

මේවා භාවකාරක, කර්මකාරක දෙකෙහි යෙදෙන නිසා කර්තෘ පදය තතියාවෙන් යෙදේ.

අමෙහි පුඤ්ඤං කත්තබ්බං.
කසකෙහි ඛෙත්තං කසිතබ්බං.
තුමෙහි කත්තබ්බං කුසලං චරිතබ්බං බ්‍රහ්මචරියං

ආදි වශයෙනි.

කර්තෘකාරක කෘදන්ත

මෙහි යෙදෙන ප්‍රත්‍යය රාශියකි. ක්‍රියාමූලයකින් (ධාතුවෙන්) නිපදවෙන බොහෝ නාම මෙම ගණයෙහි ලා ඇතුළත් කෙරේ. එහි යෙදෙන ප්‍රත්‍යය කීපයක් හා කිතකපද කීපයක් පහත දැක්වේ.

ණ ප්‍රත්‍යය

කර + ණ - කාර / කර යනාදි පද යෙදෙන්නේ වෙනත් කර්ම පදයක් සමගය.

කුමභ + කර + ණ - කුමභකාර
රථ + කර + ණ - රථකාර
ධම්ම + ධර + ණ - ධම්මධර
දින + කර + ණ - දිනකර

"සබ්බතො ණ්වුච්චාවී වා" යන සූත්‍රයෙන් කර්තෘකාරකයේ දී "අ, ණ්වු, තු, ආවී" යන ප්‍රත්‍යය යෙදේ. මෙම ප්‍රත්‍යයන්ට "අන, අක" යන ආදේශ ද වේ.

අක ප්‍රත්‍යය

දා + අක	**- දායක**		(දෙන්නා)
නී + අක	**- නායක**		(නායකයා)
සු + අක	**- සාවක**		(අසන්නා)
පාල + අක	**- පාලක**		(පාලනය කරන්නා)

අන ප්‍රත්‍යය

ගහ + අන	**- ගහන**	(ගැනීම)
පාල + අන	**- පාලන**	(පාලනය)
යාච + අන	**- යාචන**	(සිඟීම)
දා + අන	**- දාන**	(දීම)

තු ප්‍රත්‍යය

කර + තු - කත්තු	(කරන්නා)
භර + තු - භත්තු	(පෝෂණය කරන්නා)
වද + තු - වත්තු	(කියන්නා)
දා + තු - දාතු	(දෙන්නා)

ආවී ප්‍රත්‍යය

භය + දිස + ආවි - භයදස්සාවී

ණී ප්‍රත්‍යය

පාප + කර + ණී - පාපකාරී
ධම්ම + වද + ණී - ධම්මවාදී

"සාසාදීහි රතූ" යන සූත්‍රයෙන් "සාසු" ආදි ධාතූන්ගෙන් පරව "රතූ" ප්‍රත්‍යය යෙදේ.

සාස + රතූ - සත්‍ථු (අනුශාසකයා)

"පාදිතො රිතු" - "පා" ආදි ධාතුවලින් පසුව "රිතු" ප්‍රත්‍යය යෙදේ.

පා + රිතු - පිතු (රකින්නා)
ධර + රිතු - ධීතු (ධරන්නා)

"මානාදීහි රාතු" "මාන" ආදි ධාතුවලින් පසුව "රාතු" ප්‍රත්‍යය යෙදේ.

මා + රාතු - මාතු
භාස + රාතු - භාතු

මේ ආදි ප්‍රත්‍යය රාශියකින් කර්තෘ කාරක කෘදන්ත පද සෑදේ. මෙම කෘදන්ත පද බොහෝ විට සාමාන්‍ය නාමපද ලෙස භාවිත වේ. මෙවැනි ක්‍රියා මූලිකව සැදුණු නාම පද පිළිබඳ අවධානය යොමු කරන්න.

අතීත කෘදන්ත පද

" **අතීතෙ ත තවන්තු තාවී** " යන සූත්‍රයට අනුව අතීතකාලයෙහි යෙදෙන කෘදන්ත ප්‍රත්‍යය තුනකි. "**ත, තාවී, තවන්තු**" යනුවෙනි.

භූජ + ත - භුත්ත (අනුභව කළ)
භූජ + තාවි - භුත්තාවී (අනුභව කළ)
භූජ + තවන්තු - භුත්තවන්තු (අනුභව කළ)

පාලි භාෂාවේ බහුලව භාවිත වී ඇත්තේ "**ත**" ප්‍රත්‍යයාන්ත කෘදන්ත පදයි. "**ත**" ප්‍රත්‍යයට විවිධ වෙනස්කම් මෙහිදී සිදුවී ඇති බැව් පහත නිදසුන්වලින් ප්‍රකට වේ.

■ ඇතැම් කෘදන්ත පද සෑදීමේ දී ධාත්වන්තය ලොප් වී "**ත**" ප්‍රත්‍යය ද්විත්ව වේ.

භුජ + ත - භුත්ත		(අනුභව කළ)
යුජ + ත - යුත්ත		(යොදන ලද)
මුච + ත - මුත්ත		(මිදුණු)
සුප + ත - සුත්ත		(නිදාගන්නා ලද)
පද + ත - පත්ත		(පැමිණි)

■ "ධ, භ, හ, " අන්ත ධාතූන් කෙරෙන් "**ත**" ප්‍රත්‍යය වූ විට ප්‍රත්‍යය සමග ධාත්වන්තය ද්විත්ව වේ.

කුධ + ත - කුද්ධ		(කිපුණු)
ආ + රභ + ත - ආරද්ධ		(පටන්ගන්නා ලද)
සං + නහ + ත - සන්නද්ධ		(සන්නද්ධ වූ)
ලුභ + ත - ලුද්ධ		(ඇලුණු)
දුහ + ත - දුද්ධ		(දොවන ලද)
යුධ + ත - යුද්ධ		(යුද්ධ කරන ලද)
බධ + ත - බද්ධ		(බැඳුණු)

■ "**ම**" කාරාන්ත ධාතූන් කෙරෙන් "**ත**" ප්‍රත්‍යය වූ කල ධාත්වන්තය සමග "**ත**" ප්‍රත්‍යයට "**න්න**" ආදේශ වේ.

සම + ත - සන්ත		(සමනය වූ)
දම + ත - දන්ත		(දැමුණු)
නි + කමු + ත - නික්ඛන්ත		(නික්මුණු)
ප + කමු + ත - පක්කන්ත		(යනලද)

■ "**කර**" ආදි ධාතුවලින් පසුව ධාත්වන්තය ලොප් වී "**ත**" ප්‍රත්‍යයට "**ඉණ්ණ**" ආදේශ වේ.

තර + ත	- **තිණ්ණ**	(එතර වූ)
පුර + ත	- **පුණ්ණ**	(පිරුණු)
ජර + ත	- **ජිණ්ණ**	(දිරුණ)
ආ + කිර + ත	- **ආකිණ්ණ**	(ගැවසීගත්)

■ සමහර විට "**ත**" ප්‍රත්‍යයට "**ඉන්න**" ආදේශ වේ.

භිද + ත - භින්න		(බිඳුණු)
නි + සද + ත - නිසින්න		(හුන්)

■ සමහර විට "**ත**" ප්‍රත්‍යයට "**ඊන**" ආදේශ වේ.

ප + හා+ ත - පහීන (ප්‍රහීණ කළ)
නි + ලී + ත - නිලීන (සැඟවුණ)

■ ඒකස්වර ධාතූන්ගෙන් "**ත**" ප්‍රත්‍යය වෙනසකට පත් නොවී යෙදේ.

භූ + ත - භූත (වූ)
ඤා + ත - ඤාත (දැනගත්)

■ ඇතැම් තැනෙක ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර ඉකාරයක් ආගම වේ.

පච + ත - පචිත (පිසින ලද)
මණ්ඩ + ත - මණ්ඩිත (සරසන ලද)
කථ + ත - කථිත (කියන ලද)
ලිඛ + ත - ලිඛිත (ලියන ලද)

■ ඇතැම් ධාතූන් කෙරෙන් "ඉට්ඨ" හෝ "ට්ඨ" ආදේශ වේ.

දිස + ත - දිට්ඨ (දක්වන ලද)
නස + ත - නට්ඨ (නැසුණු)
ඵුස + ත - ඵුට්ඨ (ස්පර්ශ කළ)
පුචඡ + ත - පුට්ඨ (විමසන ලද)

■ ආදේශයන්හි විවිධ ස්වරූප පෙන්වන අතීත කෘදන්ත පද

භනජ + ත - භගග (බිඳුණු)
වස + ත - වුත්ථ (වසන ලද)
හර + ත - හට (ගෙනයන ලද)
සු + කර + ත - සුකට (මනාව කරන ලද)

■ සමහර විට ප්‍රත්‍යයට හා ධාත්වන්තයට "**ළහ**" ආදේශ වේ.

ආ + රුහ + ත - ආරුළහ (නගින ලද)
ගාහ + ත - ගාළහ (දැඩි කරන ලද)
බහ + ත - බාළහ (දැඩි කරන ලද)
මුහ + ත - මූළහ (මුළා වූ)

අභ්‍යාස

1. වර්තමාන කෘදන්ත පද යොදාගෙන තනි වාක්‍යය සේ නිර්මාණය කරන්න.
   නිදසුන :-
   - කුමාරෝ සයති - මාතා කුමාරං පබොධෙති.
     මාතා සයනතං කුමාරං පබොධෙති.

i.	කුමාරා කීළන්ති	- දායකෝ කුමාරානං පානීයං දෙති.
ii.	මිගා ධාවන්ති	- සීහෝ මිගෙ අනුබන්ධති.
iii.	සාමණෙරෝ විහාරං ගච්ඡති	- උපාසකා සාමණෙරං අනුගච්ඡන්ති.
iv.	කුමාරිකා ගංගාය සීදති	- කුමාරෝ කුමාරිං උත්තාරෙති.
v.	යාචකෝ ධනං යාචති	- සෙට්ඨී යාචකස්ස ධනං දෙති.

2. පහත සඳහන් වාක්‍යයන් පූර්වක්‍රියා පද යොදා තනි වාක්‍යයක් සේ ලියන්න.

i. සාවත්ථිවාසී කුලපුත්තෝ ජෙතවනං අගමාසි.
ii. සෝ භගවතෝ සන්තිකෙ ධම්මං සුණි.
iii. සෝ කාමෙසු ආදීනවං පස්සි.
iv. සෝ පබ්බජි.
v. සෝ උපසම්පජ්ජි.
vi. සෝ සත්ථු සන්තිකෙ කම්මට්ඨානං අගහෙසි.
vii. සෝ විපස්සනං වඩ්ඩෙසි.
viii. සෝ අරහත්තං පාපුණි.

3. පහත සඳහන් ඡේදයෙන් කිතක පද 30ක් උපුටා දක්වන්න.

අථස්ස එතදහොසි. සත්ථාරා චත්තාරෝ පුග්ගලා කථිතා, තෙසු මයා පදපරමෙන භවිතබ්බං, නත්ථි මඤ්ඤෙ මයහං ඉමස්මිං අත්තභාවෙ මග්ගෙ වා ඵලං වා, කිං කරිස්සාමි අරඤ්ඤවාසෙන, සත්ථු සන්තිකං ගන්ත්වා රූපසොභග්ගප්පත්තං බුද්ධසරීරං ඔලොකෙන්තෙ මධුරං ධම්මදෙසනං සුණන්තෙ විහරිස්සාමීති පුන ජෙතවනමෙව පච්චාගමාසි. අථ නං සන්දිට්ඨසම්භත්තා ආහංසු, ආවුසො, ත්වං සත්ථු සන්තිකෙ කම්මට්ඨානං ගහෙත්වා සමණධම්මං කරිස්සාමීති ගතො, ඉදානි පන ආගන්ත්වා සඞ්ඝණිකාය අභිරමමානො චරසි, කිං නු ඛො තෙ පබ්බජිතකිච්චං මත්ථකං පත්තං, අප්පටිසන්ධිකො ජාතොසීති? ආවුසො, අහං මග්ගං වා ඵලං වා අලභිත්වා අභබ්බපුග්ගලෙන මයා භවිතබ්බන්ති විරියං ඔස්සජ්ජිත්වා ආගතොම්හීති. අකාරණං තෙ, ආවුසො, කතං දළ්හවිරියස්ස සත්ථු සාසනෙ පබ්බජිත්වා විරියං ඔස්සජ්ජන්තෙන, අයුත්තං තෙ කතං, එහි තථාගතස්ස දස්සෙසමාති තං ආදාය සත්ථු සන්තිකං අගමංසු.

4. ඔබ උපුටාගත් කිතක පද පහත වගුවේ වර්ග කරන්න.

වත්තමාන	අවාය	ත්‍රෛකාලික	අතීත

5. පහත දී ඇති ධාතූන්ගේ කිතක පද සෑදෙන අයුරු ලියන්න.

ධාතුව	වර්තමාන කිතක	පූර්ව ක්‍රියා	තුමන්ත ක්‍රියා	කිච්ච කිතක භාවකාරක	අතීත
කර	කරොන්ත	කරිත්වා	කරිතුං/ කාතුං	කත්තබ්බං	කතං
ගච්ඡ					
පච					
දිස					
කථ					
ලිඛ					
පුච්ඡ					

6. සිංහලට නගන්න.

i. මයා දීයමාන ආහාරං සො යාචකො න පටිගණ්හාති.
ii. කස්සකෙන දණ්ඩෙන පහරියමානං තං බලිවද්දං අහං පස්සිං.
iii. සෙනාපතිනා හත්ථෙ ධාරියමානං අසිං දිස්වා චොරා භායිත්වා පලායිංසු.
iv. චොරෙ එකස්මිං ගුමෙබ නිලීයිත්වා ධෙනුං අපහරිතුං උපායං චින්තෙසි.
v. සාමණෙරෙ යට්ඨියා කොටිං ගහෙත්වා ථෙරස්ස පුරතො ගච්ඡි.

7. පාලියට නගන්න.

i. ඔබ විසින් සිය අතින් කපනු ලබන ගස ගෙය මත වැටුණේ ය.
ii. දැහැමි රජහු විසින් රකිනු ලබන රටෙහි ජනයෝ සුවසේ වාසය කරත්.
iii. ඔහු බාල වියෙහි මනාව ශිල්ප ඉගෙන ගෙන පසුව දියුණුවට පැමිණියේ ය.
iv. වඳුරා ලොකු බල්ලකු දැක බියවී ගසෙන් බිමට වැටුණේ ය.
v. සුමේධ තවුසා අහසින් යන්නේ දීපංකර බුදුන් දැක උන්වහන්සේට වැන්දේ ය.

8. කෙටි පිළිතුරු සපයන්න.

i. 'කිතක' යනු මොනවා ද?
ii. තේ‍රකාලික කිතක යනු මොනවා ද?
iii. අව්‍යය කිතක යනු මොනවා ද? උදාහරණ 05ක් ලියන්න.
iv. පුටඨ, ආරඳධ, යුත්ත, ආරුළහ, දිටඨ, යන පදවල ධාතු ප්‍රත්‍යය වෙන්කර ලියන්න.
v. "තෙ නමස්සාමි මාතලි" යන ඡේදයේ එන කිතක පද 5ක් උපුටා ලියන්න.

චුද්දසමෝ පාඨෝ

අග්‍රගණ්‍ය පාලි පඬිවරු සිවුදෙනෙක්

අර්ථකථාචාර්ය භදන්ත බුද්ධඝෝෂ මාහිමිපාණෝ

ශාස්තෘන් වහන්සේගේ ශ්‍රී මුඛ දේශනාව සුඛනම්‍ය හා සුබෝධ කරනු වස් අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කොට ත්‍රිපිටක සාහිත්‍යය උදෙසා පාලි අට්ඨකථාවන් සම්පාදනය කළ යතිවරුන් අතුරෙන් ප්‍රමුඛ වනුයේ මහා අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ මාහිමිපාණෝ ය. පාලි අටුවා වැඩි ප්‍රමාණයක් සම්පාදනය කොට ඇත්තේ උන්වහන්සේ විසිනි. නිර්මල බුදුදහම හා ශාසනය දීර්ඝ කාලයක් අවිච්ඡින්නව පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය පාලි අටුවා ලිවීම පිණිස ම උන්වහන්සේ මොලොව පහළ වූ බව ඇතැමුන්ගේ විශ්වාසය යි. ධර්මය පිළිබඳ පරිපූර්ණ දැනුමක් හා අවබෝධයක් ලබා ගැනීමට බුද්ධඝෝෂ මාහිමියන්ගේ අටුවාවන් මහත් සේ උපකාර වී ඇති අතර, ඒවා නොතිබෙන්නට ලේඛනාරූඪ තථාගත දේශනාවේ ගැටලු හා සැක තැන් තවමත් ලිහා ගැනීම දුෂ්කර වනු ඇත.

පාලි අටුවා සාහිත්‍යය තුළ බුද්ධඝෝෂ මාහිමිපාණන්ගේ අමරණීයත්වයත්, ජනප්‍රියතාවත් හේතුවෙන් උන්වහන්සේගේ ජීවන තොරතුරු ද විවිධ ජනප්‍රවාදයන්ගෙන් ව්‍යාකුල වී ඇත. බුද්ධඝෝෂ මාහිමියන් පිළිබඳ ජීවන තොරතුරු ලක්දිව ලියවුණු **මහාවංසයේත්** සියමයේ ලියවුණු **බුද්ධඝොසුප්පත්ති** නම් ග්‍රන්ථයේත් දැක්වේ. මීට අමතරව පාලි මෙන් ම ලක්දිව හා බුරුමයේ ලියවුණු විවිධ මූලාශ්‍රයවල ද තොරතුරු සඳහන් වේ. බොහෝ මූලාශ්‍රයයන් පිළිගන්නා පරිදි බුදුගොස් මාහිමි ජන්මලාභය ලැබ ඇත්තේ දඹදිව මහබෝ මැඩ සමීපයෙහි හෝ ඊට ආසන්න ප්‍රදේශයක බ්‍රාහ්මණ පවුලක ය. මහාවංශයේ දැක්වෙන පරිදි මෙම බ්‍රාහ්මණ කුමරු සියලු විද්‍යා, ශිල්ප කලාවන්හි සහ ත්‍රිවේදයෙහි පාරප්‍රාප්තව සියලු වාදයන්හි විශාරදව වාදකරනු කැමැතිව දඹදිව නොයෙක් දිශාවන්හි ඇවිද දිනක් එක් විහාරයකට අවුත් නැවතී රාත්‍රිකාලයේ **පාතඤ්ජලීමතය** කටපාඩමින් කීවේය. එම විහාරවැසි **රේවත** නම් බහුශ්‍රැත, විචක්ෂණශීලී හා දූරදර්ශී එක් තෙර නමක් ඔහුගේ තීක්ෂ්ණ බුද්ධිය වටහාගෙන මතු මොහුගෙන් ශාසනයට සිදුවන මහත් ප්‍රයෝජන දැන ඔහු දමනය කිරීමේ අටියෙන් පාඩම් කියවන ඔහුගෙන් 'මේ කොටළු හඬින් කෑගසන්නේ කවරෙක් දැයි' ඇසීය. ඉක්බිති එම බ්‍රාහ්මණ තරුණයා 'කොටළු හඬේ අර්ථය දන්නේ දැ'යි විචාළ කල්හි රේවත තෙරණුවෝ ඊට පිළිතුරු දී වාදයන්හි විශාරද වූ හෙතෙම නිරුත්තර කළහ. ඉන්පසු බ්‍රාහ්මණ තෙමේ 'ඔබගේ වාදය විස්තර කළ මැනවැ'යි කී විට තෙරණුවෝ අභිධර්ම පාඨයක් දෙසූහ. එය 'කාගේ ධර්මයක් දැ'යි ඇසූ විට 'මෙය බුද්ධමන්ත්‍රයැ'යි ද කීය. 'එය තමාට ඉගැන්වුව මැනව'යි කී විට 'පැවිදිව ඉගෙන ගනුව'යි කීහ. පසුව පැවිදි වී ත්‍රිපිටකය ම ඉගෙන ගත් අතර, බුදුරදුන්ගේ කට හඬට සමාන හඬක් ඇති බැවින් උන්වහන්සේ 'බුද්ධඝෝෂ' යන නමින් ප්‍රකට වූහ. ඇතැම් මූලාශ්‍රයක දඹදිව 'ඝෝෂ' නම් ගමේ උපත ලද හෙයින් එම නම ලැබූ බව සඳහන් වේ.

උන්වහන්සේ දඹදිව දී **ඤාණෝදය** නම් ප්‍රකරණ ග්‍රන්ථය ලියා අනතුරුව ධම්මසංගණීප්‍රකරණයට **අත්ථසාලිනී** නම් අටුවාව ලියූහ. පසුව පිරිත් අටුවාව හෝ වෙනත් සංක්ෂිප්ත අටුවාවක් ලිවීම ආරම්භ කළහ. එය දුටු ස්වකීය ආචාර්ය රේවත තෙරුන් මෙසේ පවසා ඇත. 'මෙහි ඇත්තේ පරම්පරාගත පෙළ පමණකි. මෙහි අටුවා මෙන් ම නානාවිධ ආචාර්යවාද ද නැත. මිහිඳු මහතෙරුන් විසින් සංගීතිවලට නැඟූ බුද්ධවචනය ද ශාරිපුත්‍රාදි මහතෙරුන් දෙසූ කථාමාර්ගය ද බලා සිංහල බසින් කළ අටුවා ලක්දිව ඇත. එහි ගොස් ඒවා ඉගෙන පාළියට නඟන්න. මේ පිළිබඳව සතුටු වී උන්වහන්සේ ලක්දිවට පැමිණ සීහළට්ඨකථා පාළියට නැඟීම ආරම්භ කළහ. එහෙත් සියලු මූලාශ්‍රයයන් පිළිගන්නා පරිදි අට්ඨකථා රචනයේ ප්‍රාරම්භකයා වනුයේ බුද්ධඝෝෂ මාහිමි නොව ඉන්දියාවෙන් පැමිණි **බුද්ධදත්ත** මාහිමියන් ය. බුද්ධදත්ත මාහිමි ලක්දිවට පැමිණ අට්ඨකථා රචනය ආරම්භ කළ ද වයස්ගත වීම හා වෙනත් සම්බාධක නිසා තත් කාර්යයෙහි අසාර්ථකව පෙරළා දඹදිවට වඩින අතරතුර මුහුදු මැද දී බුද්ධඝෝෂ මාහිමියන් මුණ ගැසී තොරතුරු සාකච්ඡා කොට ඇත. ඒ ගැන අතිශයින් සතුටුව එහි ලා ඇති විය හැකි බාධාවන් පිළිබඳව ද දැනුවත් කොට පන්හිඳක්, අරළු ගෙඩියක්, ගලකුත් දී ඇසේ හෝ පිටුපස රුදාවක් ඇති වුවහොත් එම අරළු ගලගා ආලේප කළ විට එම අපහසුතා මඟ හැරෙන බව දන්වා බුද්ධදත්ත මාහිමි ඉන්දියාව බලා පිටත්ව ගොස් ඇත.

මහාවංශයේ සඳහන් පරිදි බුද්ධඝෝෂ හිමි ලක්දිවට වැඩම කොට ඇත්තේ ක්‍රි. ව. 412 - 434 අතර කාලයේ **මහානාම රජු** දවස ය. මෙහි වැඩමවීමෙන් අනතුරුව මහාවිහාරයෙන් සීහළට්ඨකථා ඉල්ලා සිටිය ද මහාවිහාරීය භික්ෂූන් වහන්සේලා එකවර ම ඒවා ලබා නොදුන්හ. බුද්ධඝෝෂ මාහිමියන්ගේ සාමර්ථ්‍යය සහ ථේරවාද සම්ප්‍රදායට අනුගත භික්ෂුවක දැයි පරීක්ෂා කිරීමේ අටියෙන් මහාවිහාරීය භික්ෂූහු සංයුත්ත නිකායේ දේවතා සංයුත්තයේ එන **'අන්නා ජටා බහි ජටා'** යන ගාථාවත් **'සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ'** යන ගාථාවත් දක්වා එයට විවරණයක් සපයන ලෙස උපදෙස් දුන්හ. ඒ අනුව බුදුගොස් මාහිමි එම ගාථා දෙක අර්ථ විවරණය කරමින් අටුවා සහිත ත්‍රිපිටකය ම අළලා **'විසුද්ධිමග්ග'** නම් පොත ලීවේය. අනතුරුව බෝමැඩ සමීපයෙහි සංඝයා රැස්කරවා කියවන්නට සැරසුණු විට දෙවියෝ මුන්වහන්සේගේ නිපුණත්වය ප්‍රකට කරවීමේ අදහසින් එම පොත අතුරුදහන් කළහ. ඉන්පසු නැවතත් ලියා කියවන්නට සැරසුණු විට එය ද අන්තර්ධාන විය. තෙවන වරටත් ලියා කියවන්නට සැරසුණු විට දෙවියෝ කලින් සැඟවූ පොත් දෙකත් එතැන තැබූහ. භික්ෂූන් වහන්සේලා පිටපත් තුන ම එක්කොට කියවන්නාහු ඒ පිටපත් තුනෙහි ම වචන වශයෙන් හෝ අක්ෂර වශයෙන් හෝ කිසිඳු වෙනසක් නොදැක සන්තෝෂයට පත්ව අටුවා සහිත පිටක පොත් උන්වහන්සේට භාර කළහ. ඒ අනුව බුද්ධඝෝෂ මාහිමියෝ මුලින් ම සම්පූර්ණ විනය පිටකයට **'සමන්තපාසාදිකා'** නම් විනයට්ඨකථාව රචනා කළහ. දීඝනිකාය ආදි අනෙක් ත්‍රිපිටක ග්‍රන්ථ සඳහා අටුවා සම්පාදනය කරන ලද්දේ ඉන් අනතුරුව ය. උන්වහන්සේ විසින් රචිත අට්ඨකථා ග්‍රන්ථ නාමාවලිය මෙසේ ය.

බුද්ධඝෝෂ මාහිමියන් විසින් රචිත අටුවා ග්‍රන්ථ

පිටකය	පෙළ ග්‍රන්ථ	අටුවා ග්‍රන්ථය	විස්තර
විනය	පාරාජිකපාළි පාචිත්තියපාළි චුල්ලවග්ගපාළි මහාවග්ගපාළි පරිවාරපාළි	සමන්තපාසාදිකා	මහාවිහාරවාසී **බුද්ධසිරි** නම් තෙරුන්ගේ ආරාධනයෙන් ලියන ලද්දකි. මෙහි නිදාන කථාවේ බුද්ධශාසනයේ සංක්ෂිප්ත ඉතිහාසය, ධර්මසංගායනා පැවත්වූ ආකාරය, ලක්දිවට බුදුදහම රැගෙන ඒම, අනුරාධපුර මහාවිහාරය ආරම්භ වීම ආදී විස්තර ඇතුළත් වේ.
	පාතිමොක්ඛ	කඞ්ඛාවිතරණී	**සොණ** නමැති තෙර කෙනෙකුගේ ආරාධනයෙන් ලියා ඇත. භික්ෂූන් වහන්සේලා සඳහා පනවා ඇති විනය ශික්ෂාපද විග්‍රහ වේ.
සුත්ත	දීඝනිකාය	සුමංගලවිලාසිනී	සුමංගල පිරිවෙන් වැසි **දාඨානාග** නම් තෙරුන්ගේ ආරාධනයෙන් ලියා ඇත. මේ සඳහා '**සුමංගලවිලාසිනී**' නම යොදා ඇත්තේ ද ඒ නිසා ය.
	මජ්ඣිමනිකාය	පපඤ්චසූදනී	**බුද්ධමිත්ත** නම් තෙරුන්ගේ ආරාධනයෙන් මෙය ලියා ඇති අතර, පරවාදමථනය සඳහා මෙම අටුවාව ප්‍රයෝජනවත් වේ.
	සංයුත්තනිකාය	සාරත්ථප්පකාසිනී	බණවර 78 කින් යුත් මේ අටුවාව රචනා කොට ඇත්තේ **ජොතිපාල** හිමියන්ගේ ආරාධනයෙනි
	අංගුත්තරනිකාය	මනොරථපූරණී	බණවර 84 කින් සමන්විත මෙම අටුවාව **ජොතිපාල** හිමියන්ගේ සහ **ජීවක** උපාසකගේ ආරාධනය අනුව ලියා ඇත. බුද්ධඝෝෂ මාහිමියන්ගේ අවසාන අටුවාව මෙය වේ. මෙය ලිවීමෙන් පසු උන්වහන්සේගේ මනදොළ පූරණය වූ හෙයින් මෙම අටුවාවට මනෝරථපූරණී (මනදොළ සපුරන්නී) යන නාමය යොදා ඇත.

සුත්ත	**බුද්දක නිකාය** බුද්දකපාඨ සුත්තනිපාත	පරමත්ථජෝතිකා	මෙය ප්‍රමාණයෙන් ඉතා කුඩා අටුවාවකි. ඇතැම් කෙනෙක් මෙය බුද්ධඝෝෂ මාහිමියන්ගේ කෘතියක් නොවන බව ද කියත්.
	ධම්මපද	ධම්මපදට්ඨකථා	ධම්මපදයේ එන ගාථා 423 ට නිදානකථා 299 ක් වශයෙන් මෙම අටුවාව ලියා ඇත.
	ජාතක	ජාතකට්ඨකථා	**බුද්ධමිත්ත** හා **බුද්ධදේව** තෙරවරුන්ගේ ආරාධනයෙන් ලියා ඇති මෙම අටුවාව පන්සිය පනස් ජාතකකථා හා එහි ගථා ඇතුළත් කරමින් ලියන ලද විශාල ම අටුවාව වේ.
අභිධම්ම	ධම්මසංගණී	අත්ථසාලිනී	බණවර 39 කින් සමන්විත වන මෙහි අභිධර්මයේ නිදානකථාව විස්තර වේ.
	විභංග	සම්මොහවිනොදනී	බණවර 41 කින් සමන්විත වේ. මහාවංශයේ නොදැක්වෙන ලක්දිව ඓතිහාසික කථා පුවත් රාශියක් මෙහි දැක්වේ.
	ධාතුකථා පුග්ගලපඤ්ඤත්ති කථාවත්ථු යමක පට්ඨාන	පඤ්චප්පකරණට්ඨකථා	අභිධර්ම පිටකයේ ග්‍රන්ථ 5 ක් සඳහා ලියා ඇති හෙයින් මෙය මේ නමින් හඳුන්වා ඇත. මෙහි මොග්ගලීපුත්තතිස්ස හිමියන් කථාවත්ථුප්පකරණය දේශනා කිරීම, ධර්මාශෝක රජු බුදුසසුනේ උන්නතිය වෙනුවෙන් සිදුකළ දෑ ආදිය මෙහි විස්තර වේ.
සමස්ත ත්‍රිපිටකයට පොදුවේ		විසුද්ධිමග්ග	සප්ත විශුද්ධිය මගින් නිර්වාණය ප්‍රතිවේධ කරන ආකාරය විස්තර කෙරේ. මෙය භාවනායෝගීන්ට අතිශය වැදගත් කෘතියකි

අනෙක් කර්තෘවරුන් විසින් රචිත අටුවා ග්‍රන්ථ			
සුත්ත	**බුද්දක නිකාය** උදාන ඉතිවුත්තක විමානවත්ථු පෙතවත්ථු ථෙරගාථා ථෙරීගාථා චරියාපිටක	පරමත්ථදීපනී	ධම්මපාල මාහිමි
	නිද්දෙසපාළි	සද්ධම්මපජ්ජොතිකා	උපසේන මාහිමි
	අපදානපාළි	විසුද්ධජනවිලාසිනී	මහානාම මාහිමි
	පටිසම්භිදාමග්ග	සද්ධම්මප්පකාසිනී	කර්තෘ අඥාතයි
	බුද්ධවංසපාළි	මධුරත්ථප්පකාසිනී	බුද්ධදත්ත මාහිමි

බුද්ධඝෝෂ මාහිමියන්ට පාළි අටුවා ග්‍රන්ථ සම්පාදනයේ දී එකල මහාවිහාරය සන්තකයේ තිබූ ප්‍රධාන හෙළටුවා (සීහළට්ඨකථා) 03 ක් උපස්තම්භක වී ඇත. ඒවා නම්

1. **මහාට්ඨකථා** 2. **මහාපච්චරියට්ඨකථා** 3. **කුරුන්දට්ඨකථා**

මීට අමතරව '**සංඛෙපට්ඨකථා**', '**අන්ධකට්ඨකථා**', '**පොරාණට්ඨකථා**', '**පුබ්බට්ඨකථා**', '**සුත්තනන්තට්ඨකථා**', '**ආගමට්ඨකථා**' ආදි අටුවාවන් රාශියක් උපයෝගී වී ඇති බව අට්ඨකථාවන් පිළිබඳ පර්යේෂණ කළ උගත්හු පෙන්වා දෙති. මින් **මහාට්ඨකථාව** සමස්ත ත්‍රිපිටකයට ම පොදුවේ තිබූ ප්‍රධාන අටුවාව ලෙස හැඳින්වෙන අතර **මහාපච්චරිය** අටුවාව හා **කුරුන්දි** අටුවාව ප්‍රධාන වශයෙන් විනය සම්බන්ධව පැවැති අටුවාවන් ලෙස සැලකේ. බොහෝ අටුවාවන්හි බුදුගොස් මාහිමි සඳහන් කොට ඇති පරිදි උන්වහන්සේගේ අභිප්‍රාය වූයේ **මහාකාශ්‍යප** ආදි මහරහතන් වහන්සේලා වෙතින් සංගායනාවට පාත්‍රව පසුව **මහා මහින්ද** මහරහතන් වහන්සේ විසින් ලක්දිවට ගෙනවුත් හෙළදිව් වැසියන්ගේ ප්‍රයෝජනය පිණිස සීහළ භාෂාවෙන් තබන ලද අටුවාවන් දේශාන්තරවාසීන්ගේ ප්‍රයෝජනය පිණිස පාලියට නැඟීම යි.

බුද්ධඝෝෂ මාහිමියෝ පාලි අටුවාවන් රචනා කිරීමේ දී සෑමවිට ම මහාවිහාරීය මතයට අනුගතව කටයුතු කළහ. ථෙරවාදී සම්ප්‍රදාය විනය සම්බන්ධයෙන් දැක්වූයේ දැඩි උනන්දුවකි. පළමු ධර්මසංගීතියේ දී බුද්දානුබුද්දක ශික්ෂාපද පිළිබඳ අර්බුදය පැන නැඟි අවස්ථාවේ අවසානයේ බුදුරදුන් පනවා වදාළ සියලු ශික්ෂාපද ආරක්ෂා කිරීමට තීරණය කිරීමත් අලුත් විනය ශික්ෂාවන් නොපැනවීමට තීරණය කිරීමත් එක් සාධකයකි.

එසේ ම දෙවන ධර්ම සංගායනාවේ දී **'දස අකැප වස්තුව'** එකහෙළා ම ප්‍රතික්ෂේප කොට කුඩා වරදක් වුව ශාසනය තුළ සිදු නොවීමට ඉඩ තැබීම ද ථෙරවාදී සම්ප්‍රදාය විය. මේ පිළිබඳව සංවේදී වූ බුද්ධඝෝෂ මාහිමියෝ පාළි අට්ඨකථාවන් රචනා කිරීමේ දී පළමුවෙන් ම **'සමන්තපාසාදිකා'** නම් විනයට්ඨකථාව රචනා කොට මහාවිහාරීය භික්ෂූන්ගේ සිත් දිනාගැනීමට සමත් වූහ. මේ නිසා ම මහාවිහාරීය භික්ෂූන් වෙතින් ද බුද්ධඝෝෂ මාහිමියන්ට අනගි සහායක් ලැබුණි. සීහළට්ඨකථා සේ ම ඇතැම් විට ඇතැම් ධර්ම කරුණු පැහැදිලි කිරීමේ දී බහුශ්‍රැත ධර්මධර භික්ෂූන්ගේ තෙරවරුන්ගේ අදහස් ද, මහාවිහාරයේ සුවිසල් පොත්ගුල පරිහරණය කිරීමේ අවස්ථාව ද ලැබුණි.

බුද්ධඝෝෂ මාහිමිපාණන් වහන්සේට අංගුත්තර නිකාය අටුවාව ලිවීමෙන් පසු උන්වහන්සේගේ අටුවා ලිවීමේ මනදොළ පූරණය වී ඇත. ඒ නිසා තත් අටුවාව **'මනෝරථපූරණී'** යන නමින් නම් කොට ඇත. ඒ අනුව එය උන්වහන්සේ විසින් ලියන ලද අවසාන අටුවාව වේ. එය රචනා කිරීමෙන් පසු උන්වහන්සේ නැවතත් ඉන්දියාවට වැඩම කරන ලදැයි ලාංකීය මූලාශ්‍රයන් පිළිගන්නා අතර බුරුම රටේ පිළිගැනීම වනුයේ උන්වහන්සේ එරටට වැඩම කොට තවදුරටත් ග්‍රන්ථකරණයේ යෙදී සිට පිරිනිවන් පෑ බවයි. කෙසේ වෙතත් බුදුගොස් මාහිමි ශ්‍රී ලාංකීය ජන විඥානය තුළ කෙතරම් දුරට කිඳාබැසගත්තේ ද යත් ලක්දිවට බුදුසසුන හඳුන්වාදුන් මිහිඳු මහරහතන් වහන්සේ හැරුණු විට උන්වහන්සේ **'අනුබුදු'** යන ගෞරව නාමයෙන් පිදීමෙන් ම තහවුරු වේ.

අභ්‍යාස

01. වරහන් තුළින් සුදුසු වචන තෝරාගෙන හිස්තැන් පුරවන්න.
(අත්ථසාලිනී / මහානාම / ධම්මපාල / සංයුත්ත නිකාය /සමන්තපාසාදිකා /දාඨානාග/ මහාවංසය / මනෝරථපූරණී / රේවත / බුද්ධඝොසුප්පත්ති)

i. බුද්ධඝෝෂ මාහිමිපාණන්ගේ ගුරුවරයා වූයේ ..... හිමියන් ය.
ii. උන්වහන්සේ ඉන්දියාවේ දී රචනා කරන ලද ග්‍රන්ථයක් වනුයේ ..... ය.
iii. .....හා .....උන්වහන්සේගේ ජීවන තොරතුරු ඇතුළත් වේ.
iv. බුදුගොස් හිමි ලක්දිවට වැඩම කරවන ලද්දේ ..... රජු දවස ය.
v. බුද්ධඝෝෂ හිමියන්ගේ මනදොළ පූරණය වූයේ..... ලිවීමෙන් පසුව ය.
vi. විනය පිටකයට ලියන ලද අටුවාව වනුයේ.....යි.
vii. දීඝනිකාය අටුවාව ලිවීම සඳහා ආරාධනා කරන ලද්දේ.....හිමියන් ය.
viii. 'පරමත්ථදීපනී' නම් අටුවාව රචනා කරන ලද්දේ.....හිමියන් විසිනි.
ix. බණවර 84 කින් සමන්විත වනුයේ.....අටුවාවයි.
x. 'විසුද්ධිමග්ග' ග්‍රන්ථය රචනා වීමට වස්තු බීජ වූ ගාථා ඇත්තේ..... ය.

02. පාලි අට්ඨකථා පිළිබඳ ව අවධානය යොමුකරමින් 'බුද්ධඝෝෂ මාහිමියන් වෙතින් පාලි සාහිත්‍යයට සිදුවූ සේවාව' පිළිබඳ ව වාක්‍ය රචනයක් ලියන්න.

දිඹුලාගල කාශ්‍යප මාහිමි

දිඹුලාගල කාශ්‍යප මාහිමිපාණන් වහන්සේගේ චරිතය ලක් ශාසන ඉතිහාසය තුළ ශ්‍රේෂ්ඨත්වයට පත්වනුයේ උන්වහන්සේ වැඩ සිටි කාලයට සාපේක්ෂකව ය. උන්වහන්සේ වැඩ සිටි පොළොන්නරු අවධියේ රටෙහි පැවති අභ්‍යන්තරික දේශපාලන අවුල් වියවුල් ස්වභාවයත්, දකුණු ඉන්දියාවෙන් සිදු වූ චෝළ පාණ්ඩ්‍ය ආක්‍රමණත්, ශාසනික වශයෙන් ඇති වී තිබූ පරිහානියත් සලකා බලන විට උන්වහන්සේ වැනි යුග පුරුෂයෙකු බිහි නොවූයේ නම් ශාසනයට සිදුවන්නට තිබූ අනර්ථය විශාල වන්නට තිබුණි.

දෙවනපෑතිස් රජු දවස අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගෙන් මෙරටට ලැබුණු බුදුදහම අනුරාධපුර මහාවිහාරය කේන්ද්‍ර කරගනිමින් අතිශය දීප්තිමත් විය. එහෙත් එම යුගයේ අවසාන භාගය වත් ම දකුණු ඉන්දීය චෝළ ආක්‍රමණ හේතුවෙන් ලක්දිව බුදුසසුන පිරිහීමට පත් වූ අතර අධ්‍යාපන මූලායතනයන්ගේ කාර්යය ද යම් පසුබෑමකට ලක් විය. පොළොන්නරු යුගය උදාවන විට විනය කර්මයකට අවශ්‍ය උපසම්පදා භික්ෂූන් පස්නමක් වත් සොයා ගැනීමට දුෂ්කරව ශාසනික අර්බුද හටගෙන තිබිණි. පොළොන්නරු අවධියේ මුලින් ම රජකමට පත් වූ **පළමුවන මහාවිජයබාහු** රජතුමා චෝළයන් සමග දරුණු සටනකින් පසුව ඔවුන් පරාජය කොට ලක්දිව ඒකච්ඡත්‍ර කොට බුදුසසුනේ දියුණුවට කටයුතු කරවීය. ඒ අනුව එතුමා **බුරුමයේ අනුරුද්ධ රජු** සමග කතිකා කොට උපසම්පදා භික්ෂූන් මෙරටට වැඩම කරවා නැවතත් මෙරට උපසම්පදාව පිහිටුවීය. එපමණක් නොව මහාවිහාර, අභයගිරි, ජේතවන යන තුන් නිකාය සමගි කරවා ජරාවාසව තිබුණු වෙහෙර විහාර අලුත්වැඩියා කරවා ත්‍රිපිටක සංශෝධනයක් ද කළේය. එම රජතුමාගේ ඇවෑමෙන් පසු නැවතත් රාජ්‍යත්වය පිළිබඳ ගැටුම් ඇති වූ අතර විජයබාහු රජතුමා විසින් ඔසවා තැබූ රටේ සහ ශාසනයේ ස්ථාවරත්වය නැවතත් පිරිහීමට පත්විය. රජුන් තැනීමට හා නෙරපීමට භික්ෂූන්ගේ දායකත්වය එකල ලැබුණු නිසා එම කාලවකාවානුවේ ඇතැම් රජවරු විහාරවල බලසේනාවන් නවත්වා තැබූ හෙයින් වෙහෙර විහාර වල් බිහි වී ගිය අතර භික්ෂූන් පන්සල් හැර ගියහ. මේ නිසා විජයබාහු මහරජතුමාගෙන් පසු යුගය බුදුසමයට අඳුරු කාලපරිච්ඡේදයක් උදාවිය.

මෙබඳු වකවානුවක රෝහණයෙන් **'කිත්ති'** (පරාක්‍රමබාහු) නම් දියසෙන් කුමාරයෙක් බිහිවිය. තීක්ෂ්ණ බුද්ධියකින් හෙබි මොහු සිහසුන ලැබීමෙන් පසු ක්‍රි. ව. 1154 දී මුළු ලක්දිව ම රජු ලෙස අභිෂේක ලැබූ අතර පරාක්‍රම සමුද්‍රය, පරාක්‍රම තඩාග ආදිය ඉදි කොට ලක්දිව ස්වයංපෝෂිත රාජ්‍යක් බිහි කළේය. මහාවංශය ඇතුළු බොහෝ ඓතිහාසික මූලාශ්‍රයන්ට අනුව මොහු ශ්‍රී ලංකාවේ විසූ ශ්‍රේෂ්ඨතම නරපතියන්ගෙන් කෙනෙකි. මහාවිජයබාහු රජු ඇති කළ ශාසනික පුනරුදයේ උපරිම ඵල අවස්ථාව බිහිවනුයේ **මහාපරාක්‍රමබාහු රජු** දවස ය.

මහාපරාක්‍රමබාහු රජතුමා බුද්ධශාසනයට සිදු කළ සේවය සුවිසාල ය. භේදභින්නව තිබූ තුන්නිකාය සමඟි කරවීම දුශ්ශීලයන් සසුනින් බැහැර කොට සසුන පිරිසිදු කිරීම ආදි කාර්යයෙහි ලා මහා පරාක්‍රමබාහු රජතුමා විසින් රාජානුග්‍රහය සපයමින් සිදු කරන ලද ශාසන ප්‍රබෝධයෙහි ලා යුග කාරක කාර්යභාරය සිදු කරන ලද්දේ **දිඹුලාගල මහා කාශ්‍යප**

මාහිමිපාණන් වහන්සේ ය. උන්වහන්සේ වැඩ සිටියේ නැගෙනහිර තමන්කඩුව පළාතේ පිහිටා තිබූ **දිඹුලාගල ආරණ්‍යායතනයේ** ය. මෙම සේනාසනයේ ශ්‍රේෂ්ඨත්ව ම යතිවරයා කාශ්‍යප මාහිමිපාණන් වන අතර දිඹුලාගල ප්‍රසිද්ධියට පත්වන්නේ ද උන්වහන්සේ සම්ප්‍රාප්තියත් සමග ය. තෙළෙස් ධුතංගධර වූ උන්වහන්සේ සියලු ම භික්ෂූන් අතර ප්‍රමුඛ වූ අතර බොහෝ තැන්වල **මහාථේර, සංඝපරිණායක** යන නම්වලින් ද හඳුන්වා ඇත. එකල වැඩ සිටි මහාසංඝයා විසින් මහරහතන් වහන්සේ නමකට මෙන් මුන්වහන්සේට ගෞරව කරන ලදහ. **පොළොන්නරු සෙල් ලිපියේ** මුන්වහන්සේගේ සුපේශල ශික්ෂාකාමීත්වය වර්ණනා කොට ඇත්තේ මෙසේ ය.

'අඛණ්ඩ අච්ඡිනාදි ගුණාංග සංගත කොට රකිණ වර්ධිත පෝෂිත ශීලස්කන්ධාදි ලෞකික ගුණරත්නාලංකාරයෙන් සමලංකෘත වූ උදුම්බරගිරි නිවාසී මහාකාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ මහාවිහාරවාසී භික්ෂු සංඝයා ....'

'දඹදිව **ධර්මාශෝක රජතුමා** මොග්ගලීපුත්තතිස්ස හිමියන් සහාය කොට ගෙන සසුන පිරිසිදු කළා සේ' මහාපරාක්‍රමබාහු රජතුමා කාශ්‍යප හිමියන්ගේ සහායෙන් සසුන පිරිසිදු කළ බව මහාවංශ කතුවරයා පවසයි.

'මොගලීපුත්තතිස්සඤ්ච - ධම්මසොකො නරිස්සරො.
මහාථෙරං ධුරං කත්වා - මහාකිච්චපවහයං,

විසාරදං තෙපිටකං - විනයඤ්ඤූ විසෙසතො,
ථෙරවංසෙකපඤ්ඤාතං - සාමගිං චිරදක්ඛිතං' යනුවෙනි.

ත්‍රිපිටක විසාරද, විනය දත්, ථේරීයවංශය බබුළුවන, ශාසනයේ චිර පැවැත්ම හා සමඟිය කැමැතිවන්නා වූ යන උපපද රාශියක් භාවිත කරමින් මහාවංශ කතුවරයා මහාකාශ්‍යප මාහිමි හඳුන්වා දීමට පෙළඹී ඇත්තේ උන්වහන්සේ තුළ විරාජමාන වූ සැබෑ ගුණකදම්බය නිසා ය. **ශාරීපුත්‍ර සංඝරාජයන්** විසින් සමන්තපාසාදිකාවට ලියූ **සාරත්ථදීපනී විනයටීකාවේ** ආරම්භයේ දී ද මහා කාශ්‍යප මාහිමියන් පිළිබඳ ව සඳහන් වේ.

නිස්සාය සීහළින්දෙන - යං පරක්කමබාහුනා,
කත්වා නිකායසාමග්ගිං - සාසනං සුවිසොධිතං.

කස්සපං තං මහාථෙරං - සංඝස්ස පරිනායකං,
දීපසම්මං තම්බපණ්ණිම්හි - සාසනොදයකාරිනං.

පටිපත්ති පරාධීනං - සදා'රඤ්ඤනිවාසිනං,
පාකටං ගගනෙ චන්ද - මණ්ඩලං විය සාසනෙ.

සංඝස්ස පිතරං වන්දෙ - විනයෙ සුවිසාරදං,
යං නිස්සාය වසන්තොහං - වුද්ධිපත්තොස්මි සාසනෙ.

එහි දී උන්වහන්සේ සඳහන් කොට ඇත්තේ සිය දිවි දෙවැනි කොට ප්‍රතිපත්ති පිරූ, හැම කල්හිම ආරණ්‍යවාසය ප්‍රිය කළ, විනයෙහි උසස් විශාරදයෙකු වූ මහාකාශ්‍යප හිමි සම්බුද්ධ ශාසනය නමැති අහසෙහි පූර්ණ චන්ද්‍රයා මෙන් දීප්තිමත්ව බැබළුණු බව යි.

මහාකාශ්‍යප මාහිමි සීල සම්පත්තියෙන් අගතැන්පත් වූවා සේ ම ඤාණ සම්පත්තියෙන් ද අග්‍ර වූ බව උන්වහන්සේ අතින් ලියවුණු ග්‍රන්ථ දෙස බැලීමෙන් මැනවින් පැහැදිලි වේ. ත්‍රිපිටක පාලියේ ඇති දුරවබෝධ පද සුබෝධ කරනු පිණිස අනුරාධපුර අවධියේ දී **පාලි අටුවාවන්** රචනා වූ අතර, එම අටුවාවන්හි තවදුරටත් විස්තර කළ යුතු තැන් විස්තර කරමින් හා ව්‍යාකරණ විභාග, නිදානකථා ආදිය දක්වමින් පාලි ටීකා ග්‍රන්ථ රචනා විය. පාලි ටීකා ග්‍රන්ථ ලියවුණු කාලපරිච්ඡේදය පොළොන්නරු අවධිය යි. අනුරාධපුර මහාවිහාරය පාලි අට්ඨකථා සම්පාදනය කරමින් සම්බුදු සසුනේ හා පාලි භාෂාධ්‍යයනයේ චිර පැවැත්ම අභිවෘද්ධිය සිදු කළා සේ ම **පාලි ටීකා** සම්පාදනය කරමින් දිඹුලාගල කාශ්‍යප මාහිමි ඇතුළු තත් ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව විසින් මහාවිහාර සම්ප්‍රදාය සුස්ථිර කළහ. **අභිධම්මත්ථසංගහයට** ලියූ **අභිධම්මත්ථපුරාණටීකාව** කාශ්‍යප මාහිමිගේ කෘතියක් වන අතර ඉන් උන්වහන්සේ තුළ පැවැති අභිධර්ම විශාරදත්වය ප්‍රකට වේ. එසේ ම පාලි, සංස්කෘත, සිංහල යන භාෂාත්‍රයෙහි විශාරදයෙකු වූ උන්වහන්සේ **චාන්ද්‍රව්‍යාකරණය** සරල කොට **බාලාවබෝධන** නම් ව්‍යාකරණ ග්‍රන්ථය රචනා කළහ. එය කච්චායන ව්‍යාකරණය සරල කොට ධර්මකීර්ති මාහිමියන් විසින් ලියා ඇති බාලාවතාරය වැනි ග්‍රන්ථයකි. මහා කාශ්‍යප මාහිමියන් වෙත පැවැති සංස්කෘත භාෂාව පිළිබඳ විශාරදත්වය මින් මැනවින් විශද වේ. අභිධර්මයට ම ලියන ලද **මොහවිච්ඡේදනී** නම් ටීකාව ද හා **අනාගතවංස** යන පාලි ග්‍රන්ථය ද කාශ්‍යප මාහිමියන්ගේ කෘති බව විචාරකයන්ගේ අදහසයි.

පොළොන්නරු යුගයේ දී **විද්‍යාචක්‍රවර්ති, ගුරුළුගෝමි** වැනි පඬිවරුන් ශ්‍රේෂ්ඨ සිංහල ග්‍රන්ථ රචනා කරද්දී දිඹුලාගල කාශ්‍යප හිමි ඇතුළු ශිෂ්‍ය පරම්පරාව විසින් පාලි සාහිත්‍යයේ පුනරුදය ඇති කරන ලදී. ශාසනයටත් පාලි සාහිත්‍යයටත් අභිවෘද්ධිය සැලසූ මහාකාශ්‍යප මාහිමි තමන් වහන්සේට නොදෙවෙනි වූ ශිෂ්‍ය පරම්පරාවක් බිහිකිරීම විශිෂ්ට කාර්යයක් සේම අතිදූරදර්ශී ක්‍රියාවක් ද වේ. මේ හේතුවෙන් උන්වහන්සේ වෙතින් ප්‍රභාවිත ධර්ම ශාස්ත්‍රාලෝකය කෝට්ටේ යුගය දක්වා විහිදී ගියේ ය.

අභ්‍යාස

01. නිවැරැදි පිළිතුර යටින් ඉරි අදින්න.

i. දිඹුලාගල කාශ්‍යප මාහිමියන් වැඩ සිටියේ (දිඹුලාගල/මහාවිහාරය/අභයගිරිය) ආරණ්‍යයේ ය.
ii. උන්වහන්සේගේ යුග කාර්යභාරය සමාන වනුයේ (බුද්ධඝෝෂ මා හිමි/ මහානාම මා හිමි/වැලිවිට සරණංකර නා හිමි) ට ය.
iii. පොළොන්නරු යුගයේ දී පාලි සාහිත්‍යයට එක් වූ සාහිත්‍යාංගයවනුයේ (ප්‍රකරණ /ටීකා/අටුවා) සාහිත්‍යය යි.
iv. මහාකාශ්‍යප මා හිමියන් හැඳින්වූ අභිධානයක් වනුයේ (සාගරමති/සංඝ පරිණායක /සංඝරාජ) යන්නයි.
v. බුද්ධඝෝෂ මා හිමියන් හැරණුවිට වැඩිම පාලි ග්‍රන්ථ සංඛ්‍යාවක් ලියන ලද්දේ (ශාරිපුත්‍ර/ධම්මපාල/සංඝරක්ඛිත) මාහිමිපාණෝ ය.

පිළිතුරු සපයන්න.

02. දිඹුලාගල කාශ්‍යප මාහිමියන්ට පෙර පොළොන්නරු රාජධානියේ ස්වභාවය කෙටියෙන් පැහැදිලි කරන්න.
03. මහාපරාක්‍රමබාහු රජතුමා සිදු කළ ශාසනික සේවාවන් 02ක් ලියන්න.
04. දිඹුලාගල කාශ්‍යප මා හිමියන් විසින් රචිත ග්‍රන්ථ 03ක නම් ලියන්න.
05. උන්වහන්සේ පිළිබඳ තොරතුරු සඳහන් වන මූලාශ්‍රය ග්‍රන්ථ 02ක නම් ලියන්න.
06. දිඹුලාගල කාශ්‍යප මාහිමි ඇති කළ ශිෂ්‍යයන් උන්වහන්සේලා නම්කොට උන්වහන්සේ ලියූ ග්‍රන්ථ දෙක බැගින් ලියන්න.

පොල්වත්තේ ශ්‍රී බුද්ධදත්ත නාහිමිපාණෝ
(1887 - 1962)



පොල්වත්තේ ශ්‍රී බුද්ධදත්ත මහානාහිමිපාණන් වහන්සේ භාෂාන්තරයන්හි හා සමයාන්තරයන්හි විශාරද දැනුමක් තිබූ ශ්‍රේෂ්ඨ ලේඛකයෙක් හා ධර්ම ශාස්ත්‍රීය පර්යේෂණයෙක් ද වෙති. පාලි භාෂාවේ හා සාහිත්‍යයේ අභිවර්ධනයට පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියන් වෙතින් සිදු වූ සේවය කෙතරම් ද යත් අපවත් වී දශක 05 ක් ඉක්ම ගිය ද පාලි භාෂාධ්‍යයනය තුළ උන්වහන්සේ තවමත් ජීවමාන වෙති.

දකුණුලක, ගාලු කෝරළයේ, අම්බලන්ගොඩ පොල්වත්ත ග්‍රාමයේ දී උන්වහන්සේගේ ජන්මලාභය සිදු වූයේ 1887 ජූලි 23 වැනි දා ය. දෙමාපියෝ වූවෝ **ඕබඩගේ ලුවිස් ද සිල්වා** පියාණන් හා **තුය්යාගම්හේවා සාඤ්චිහාමි** මැණියන් ය. වැඩිමහල් සහෝදරයින් සිව්දෙනෙක් හා එක් සහෝදරියකගෙන් සමන්විත එම පවුලේ බාලයා වූ එතුමන් ඉපදී වසර 07 කින් මැණියන් කාලයාත්‍රා කොට ඇත. එකල විද්‍යාලංකාර පාඨශාලාවට යාබදව පිහිටි අම්බලන්ගොඩ බෞද්ධ ඉංග්‍රීසි පාඨශාලාවෙන් (මෙකල අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලය) අකුරුකරණය ආරම්භ කොට එහි වසර කීපයක් ඉගෙනීම් කටයුතු සිදු කොට ඇත.

මහණකම පිළිබඳ කුඩා කල පටන් ඇලුම් කළ මෙතෙම **1899. 11. 02** දින දොළොස් වැනි වියේ දී **'පොල්වත්තේ බුද්ධදත්ත'** නාමයෙන් ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් විය. උන්වහන්සේගේ පැවිදි ගුරුවරු වූවෝ අම්බලන්ගොඩ පොල්වත්ත අග්ගාරාමාධිපති ව වැඩ විසූ **ශ්‍රී ධර්මාධාර ස්වාමීන්ද්‍රයන්** වහන්සේ සහ **දොඩම්දූවේ පියරතනනිස්ස** මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. පැවිදි වීමෙන් පසු වසර 03 ක් යන තුරු ස්වකීය ආචාර්යන් වහන්සේගේ ඇසුරෙන් සිංහල, පාලි, සංස්කෘත යන ප්‍රාචීන භාෂාවන් ඉගෙන ගත්හ. ස්වයංලිඛිත අපදානයේ දී බුද්ධදත්ත නාහිමියන් ම සඳහන් කරන පරිදි එම කාලවකවානුවේ උදේ, හවස, රෑ ලෙස විශේෂයක් නැතිව පාලි, සංස්කෘත පෙළ පොත් වාචෝද්ගත කිරීම, අර්ථකීම යුහුසුලුව සිදු කොට ඇත.

වසර 03 ක ගුරු ඇසුරෙන් ලැබූ ශික්ෂණයෙන් අනතුරුව 1902 වසර අවසානයේ දී උන්වහන්සේ සිය ගුරුදේවයන් සමග බුරුමයට වැඩම කළ අතර, ඒ වන විට උන්වහන්සේ පසළොස් වන වියේ පසු වූහ. බුරුමයට යන විට **පාලි වරනැගිල්ල, බාලාවතාරය, ධාතුමඤ්ජුසාව, පාලි නිඝණ්ඩුව, ධම්මපදය, සතිපට්ඨාන සූත්‍රය, වුත්තොදය, අභිධම්මත්ථසංගහය, අභිධම්මමාතිකා** යන පොත් සම්පූර්ණයෙන් කඩපාඩමින් කීමේ හැකියාවක් උන්වහන්සේ සතු විය. ඊට අමතරව ධම්මපදට්ඨකථා, රසවාහිනී, බාලාවතාර හා වුත්තොදය යන පොත්වල අර්ථ කියා තේරුම් ගැනීමට තරම් ශක්තියක් තිබිව සිට ඇත. එසේ ම අත්තනගලුවංසය, මහාබොධිවංසය හා ජාතක අටුවා කොටස් දෙකක අර්ථ කියවා තිබී ඇත. පාලි භාෂාව ඉගෙනීමෙහි උන්වහන්සේ දැක්වූ අනවරත උනන්දුව හා සමත්කම මේ තුළින් ඉතා මැනවින් වටහා ගත හැකි අතර, මෙය වර්තමානයේ

පිරිවෙන්හි පාලි ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාවලිය සිදුකරන ගුරුසිසු දෙපාර්ශවයට ම මහඟු ආදර්ශයකි.

1903 ජනවාරි මාසයේ දින 03 ක නැව් ගමනකින් පසු බුරුමයේ **මෝල්වේන්** නුවරට ගොස් එහි **සංල්වින්** ගඟබඩ **කඩෝ** ප්‍රදේශයේ **කොණ්හත්** ගමේ පිහිටා ඇති **සුවණ්ණමණිවිජ්ජොතරතනසීමාරාම** නම් විහාරස්ථානයේ නැවතී පාලි බසත්, බුරුම බසත්, අභිධර්මයත් ඉගෙනීම ආරම්භ කළහ. එහි වැඩ සිටි මහා පඬිවරයෙකු වූ **සාගරඤාණ** හා **විසුද්ධාචාර** මාහිමිවරුන් වෙතින් බුරුම බස ඉතා කෙටි කලකින් ඉගෙන ගෙන ඇත. එහි ලා පොල්වත්තේ බුද්ධදත්ත මාහිමි ප්‍රකට කළ සාමර්ථ්‍යය කෙසේ ද යත් අවුරුද්දක් ගත වීමට පෙර බුරුම භාෂාවෙන් අභිධර්ම පොත්වලට අර්ථ අස්වාගත හැකි තරමේ දැනුමකින් පොහොසත් වී ඇත. එකල බුරුමයේ භික්ෂූන් වහන්සේලා ඉගෙනගත් ශාස්ත්‍රශාලා තුළ කටපාඩම් දීමේ තරඟ විභාග පැවතී ඇත. ධනවත් ශ්‍රද්ධාවන්ත උපාසක උපාසිකාවන් මුල් වී විශාල ලෙස ධනව්‍යයෙන් උත්සවාකාරයෙන් මෙම තරඟ පැවතී ඇති අතර, ඉන් ජයග්‍රහණ ලබන අයට ඉගෙන ගැනීමට අවැසි පොත පත ගැනීමට මුදල් ද පිරිනමා ඇත. එවැනි තරඟවලින් පොල්වත්තේ බුද්ධදත්ත මාහිමියන් ද බොහෝ වටිනා මුදල් ත්‍යාග දිනාගැනීමට සමත් වී ඇත.

1904 දී නැවත ලංකාවට පැමිණ ස්වකීය ගුරුදේව ධර්මාධාර නාහිමියන්ගේ ඉල්ලීම පරිදි සංස්කෘත භාෂාව ඉගෙනීම ආරම්භ කළ අතර එහි දී **මුග්ධබෝධ ව්‍යාකරණය, අමරකෝෂය** හා **පාණිනීසූත්‍ර පාඨය** ද කෙටි කලකින් ම ඉගෙනගැනීමට සමත් වූහ. මෙම කාලවකවානුවේ දී **ලක්මිණි පහන** කතුවරයාගේ උපදෙස් අනුව ඌනතාවලින් ග්‍රහණව තිබූ **අභිධර්මමාතෘකා සන්නය** සඳහා බුරුම සන්නය ද ආධාර කොට ගෙන සවිස්තර සන්නයක් සමගින් **අභිධර්ම මාතෘකා ස්වරූපය** නම් ග්‍රන්ථය ලියන ලදී. එය බුද්ධදත්ත මාහිමියන්ගේ මුල් ම කෘතිය වන අතර ඒ වන විට උන්වහන්සේගේ වයස අවු 18 ක් විය. එසේ ම 19 වන වියේ දී අතිගරු දොඩන්දූවේ පියරතනතිස්ස නාහිමියන් ගැන පාලි පද්‍යයෙන් ගාථා අෂ්ටකයක් ලියා ඇති අතර, පාලිභාෂාව හැසිරවීමෙහි ලා උන්වහන්සේ පෑ නෛපුණ්‍ය මෙමගින් මැනවින් ප්‍රකට වේ. 1907 ජනවාරියේ නැවත දෙවන වරටත් බුරුමයට වැඩම කොට 1907 ජනවාරි 23 දින බුරුමජාතික **සාගරඤාණ** මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් උපසම්පත්තිය ලබාගත් අතර, තත් වර්ෂයේ දී ම බුරුම බසින් සන්නයක් ද සමගින් **පාළි නිඝණ්ඩුව** මුද්‍රණද්වාරයෙන් එළිදැක්වීමට ද උන්වහන්සේ සමත් වූහ. බුරුම වැසි පාලි දුහුනන්ගේ ප්‍රයෝජනය සඳහා **පාලිභාසප්පවෙසනී** (First Step in Pali Conversation) නමින් බුරුම බසින් පාළි පාඨග්‍රන්ථයක් ද ලියා ඇති අතර එය බුරුම අධ්‍යාපන මණ්ඩලය මඟින් ද ඉතා ඉහළින් පිළිගෙන ඇත. බුරුම සම්ප්‍රදාය තුළ අවිද්‍යමාන **රසවාහිනිය, මහපිරිත් පොත හා විමුක්ති සංග්‍රහය** බුරුම අකුරින් ලියා එරට වැසි භික්ෂූන්ගේ ප්‍රයෝජනයට ඉදිරිපත් කළ අතර, පාලි - බුරුම - ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ම **ත්‍රිභාෂාරත්නාකරය** මෙන් ග්‍රන්ථයක් ද ලියා ඇත. එය වර්තමානයේ ද බුරුමයේ ඉතා ජනප්‍රිය ග්‍රන්ථයකි. එකල බුරුමයේ ගුරු ශිෂ්‍ය දෙපක්ෂය ම කළුවරේ ඉඳගෙන පොතක් නොමැතිව අභිධර්මය උගන්වන ක්‍රමයක් තිබී ඇති අතර එය **රාත්‍රීවාරය** නමින් හඳුන්වා ඇත. පොල්වත්තේ නාහිමි මේ සඳහා ගුරු සිසු දෙඅංශයෙන් ම ඉදිරිපත් වී ඇත.

1909 වසරේ පාලි භාෂාව, බුරුම භාෂාව හා අභිධර්මය යන විෂයන්ගෙන් සමන්විත විභාගයකට ඉදිරිපත් වී බුරුම භික්ෂූන් 600 ක ගෙන් ප්‍රථම ස්ථානය ලබාගත්හ. අනතුරුව ලංකාවට වැඩම කළ අතර, ඉන්පසු ලක්දිව බොහෝ කාලයක් වැඩ වසමින් මෙරට පාලි භාෂාවේත් සම්බුද්ධ ශාසනයේත් අභිවෘද්ධියට ග්‍රන්ථ රචනා කරමින්, ශාස්ත්‍රීය වාද විවාද ඇති කරමින්, ධර්මදේශනා සිදුකරමින් හා සම්මේලන ආදියට සහභාගි වෙමින් ඉමහත් සේවයක් සිදු කළහ. **රීස් ඩේවිඩ්ස්** මහතා සමග සමීපාශ්‍රයක් පවත්වා ගනිමින් එංගලන්තයේ පාලි පොත් සමාගමට (P.T.S.) විවිධ පොත් පරිවර්තනය කර දෙමින් හා ඉංග්‍රීසි අකුරින් පිටපත් කර දෙමින් අපරදිගට පාලි භාෂාඥානය විවරණය කරදීමට නිස්සරණාධ්‍යාශයෙන් යුතුව අමිල මෙහෙයක් සිදු කළහ. උන්වහන්සේගේ තරුණ වියේ දී සිදුකළ ශාස්ත්‍රීය සේවා අතුරින් කිහිපයක් මෙසේ ය.

- බුරුම වැසියන්ගේ ප්‍රයෝජනයට රචනා කරන ලද **පාලිභාසප්පවෙසිනී** පොත සිංහලට නගා පළ කිරීම.

- අම්බලන්ගොඩ වෛශාඛනිධාන සමිතියේ ඉල්ලීම පරිදි කුඩා ධර්ම පුස්තක රාශියක් ලියවීම. (**පමාවීම යුතු ද?, බුද්ධගුණදීපනිය, ධර්මාවවාදමඤ්ජරී, කර්මවීර්යදීපනී, විශුද්ධිදීපනී, දශසංඥාවිභාගය, සත්ත්වතත්වදර්ශනය** යනාදි පොත්)

- ක්‍රිස්තුභක්තිකයන් බුද්ධාගමට විරුද්ධව ලියූ **දෘෂ්ටිවිභාගය** නමැති පොතට පිළිතුරු ලෙස **සත්‍යදර්ශනය** නමැති පොත ලිවීම.
- බණ අසන විට ඉඳින ආකාරය පිළිබඳව වාදයක් ඇති වූ අතර එහි දී බුරුමජාතික **ලේතී** නම් මහාතෙරුන්ගේ විනිශ්චය ද ඇතුළත් කරමින් **ගාරවාගාරවවිනිච්ඡය** කෘතිය ලිවීම.

- 'සිරිමා' යන පදය සමග 'හෙ' යන නිපාතය යෙදීම නිසා ලක්මිණි පහන කර්තෘතුමා උසස් උදවිය සඳහා 'හෙ' යන නීචාර්ථ ආමන්ත්‍රණය යෙදීම අයෝග්‍ය යැයි වාදයක් ඇති කළ අතර, එයට පිළිතුරු ලෙස **හෙ සිරිමාවාදය** යන නමින් කෘතියක් ලියා ඇත.

- **නාමරූපපරිච්ඡේද, සම්මොහවිනොදනී, සද්ධම්මපජ්ජොතිකා** හා **නිද්දෙස** අටුවාව ශුද්ධ කොට ඉංග්‍රීසි අකුරෙන් ලියවා එංගලන්තයේ පාලි පොත් සමාගමට (P.T.S.) යැවීම.

- **ලක්මිණ** පුවත්පතේ **ධර්මවාදී, සත්‍යවාදී** නමින් ලිපි පෙළක් ද **දිනමිණ** පුවත්පතේ **අර්ථවාදී** නමින් ලිපි පෙළක් ද ලිවීම.

ප්‍රාචීන භාෂාවන් පිළිබඳ හසල දැනුමක් ලබා සිටි පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියන්ට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම ඉතා අල්ප වූ හෙයින් ඉංග්‍රීසි ඉගෙන ගැනීමට කැමැත්තක් ඇති විය. ඒ අනුව එකල **කොළඹ ආනන්ද විද්‍යාලයේ** විදුහල්පතිව සිටි **පී. ද එස්. කුලරත්න** මහතා මූලික වී භික්ෂූන් වහන්සේලාට ඉංග්‍රීසි ඉගැන්වීමේ පාසලක් කොළඹ ආනන්ද විද්‍යාලයේ ම පවත්වාගෙන යන ලදී. 1919 වසරේ දී එයට ඇතුළත්ව ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම ආරම්භ කොට එය ද කෙටි කලකින් ඉගෙනීමට උන්වහන්සේ සමත් වූහ. එහි ඉගෙනගන්නා කාලයේ දී ආනන්ද විද්‍යාලයේ සිසුන්ට පාලි ඉගැන්වීමට

ද අවස්ථාවක් ලැබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ පිරිවෙන් හා විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයන්හි බහුල ලෙස ව්‍යවහාර කෙරෙන පාලි ඉගෙනීමට ඇති මාහැඟි පාඨ ග්‍රන්ථයක් වූ **'පාලිභාෂාවතරණය'** 1923 දී රචනා විය. ඉන්පසු 1925 දී **පාලිභාෂාවතරණය** II පොත ද, 1927 දී **පාලිභාෂාවතරණය** III පොත ද, 1926 දී **පාළිපාඨාවලී** පොත ද ලියා ඇත. ලක්දිවින් බුරුමයට උපසම්පදාව රැගෙන යාම පිළිබඳව විස්තරය සඳහන් වන **කල්‍යාණශීලාලිපිය** 1924 දී සිංහල අනුවාදයක් සමග මුද්‍රණය කළහ. ඉංග්‍රීසි භාෂාව හැසිරවීම පිළිබඳ ලබාගත් නිපුණත්වයෙන් පසු මුල් ම යුරෝපීය ගමන ලෙස 1926 දී ස්විස්ටර්ලන්තයට වැඩම කළ අතර අපරදිග රටවල ධර්මප්‍රචාරය කිරීම සඳහා **ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා** ඇතුළු විවිධ අයගෙන් ආරාධනාවන් ලද ද එයට වැඩි කැමැත්තක් නොදැක්වී ය. එහෙත් **රීස් ඩේව්ඩ්ස්** මැතිතුමා, මැතිනිය, **අයි. බී. හෝනර්** මැතිනිය, **විල්හෙල්ම් ගයිගර්, ඊ. ජේ. තෝමස්** වැනි බටහිර උගතුන් සමීපව ඇසුරු කරමින් තම ඥානගවේෂණය ලෝකයාට ද විවෘත කර දුන්හ.

1952 වසරේ සිට ලංකා විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙක් ලෙස ද කටයුතු කළහ. උන්වහන්සේ පෙළ අටුවා ටීකාදිය හදාරමින් වටිනා ග්‍රන්ථ සම්පාදනය කළා සේ ම ශාසනික හා ජාතික වශයෙන් උද්ගත වූ විවිධ අර්බුදවල දී ඒවාට ද ඉදිරිපත් වූහ. ජාතික සංඝ සම්මේලනය ඇතුළු එකල පැවති බොහෝ ජාතික හා ආගමික වැදගත්කමක් ඇති සමිති සම්මේලනවල දී මුලසුන දරමින් ඒවාට නායකත්වය ලබාදුන්හ. ලංකාව පුරා විවිධ පළාත්වලට වැඩම කරවමින් දහස් ගණනක් ධර්මදේශනා පවත්වා ඇත. 2500 බුද්ධජයන්තිය නිමිති කරගෙන ලෝකවාසී බහුශ්‍රැත භික්ෂූන් වහන්සේලාගේ සහභාගිත්වයෙන් බුරුමයේ පැවැත්වූ **ඡට්ඨසංගායනාව** සඳහා පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි වැඩම කළ අතර, එම සංගායනාවේ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළහ. ලංකාව නියෝජනය කරමින් එම ධර්මසංගායනාවේ ප්‍රධාන කර්තෘමණ්ඩලයේ ක්‍රියා කළ අතර, විනය පිටකය භාරව සිටියේ ද උන්වහන්සේ ය. 1954 වර්ෂයේ දී උන්වහන්සේට බුරුම රජයෙන් ශ්‍රී ලාංකීය භික්ෂුවකට පිරිනැමෙන ඉහළ ම ගෞරව සම්මානය වන **'අග්ගමහාපණ්ඩිත'** උපාධිය පිරිනැමුණු අතර, එම උතුම් සම්මානයෙන් පුද ලද පළමු ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේ වනුයේ පොල්වත්තේ නාහිමියෝ ය. උන්වහන්සේ විසින් රචිත සිය ගණනක් ග්‍රන්ථ අතුරින් **කල්‍යාණවංශනිකාය** I, II, III, **කල්‍යාණශාසනවංශය, පාළිවාක්‍යවිවේචනය,** The New Pali Cource I, II The New Pali Cource, **හියුංසියං භ්‍රමණවෘත්තාන්තය, පාලිවාක්‍යරචනාව** හා **පරිවර්තන පරිචය, පඨමපාඨාවලී, ථෙරවාදී බෞද්ධාචාර්යයෝ, භාරතීය බෞද්ධාචාර්යයෝ, සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ, පාළි සිංහල අකාරාදිය, පාලි සාහිත්‍යය** හා **ත්‍රිපිටකසූචිය,** ආදි ග්‍රන්ථ කිහිපයකි. 1962 වසරේ උන්වහන්සේ අපවත් වන විට අමරපුර ශ්‍රී කල්‍යාණවංස මහානිකායේ මහානායක පදවිය හෙබවූහ. පාලි භාෂාවේ හා සාහිත්‍යයේ උන්නතිය වෙනුවෙන් උන්වහන්සේ සිදුකළ උදාර සේවය වෙනුවෙන් මෙකල පමණක් නොව මත්තෙහි ද උන්වහන්සේ සම්භාවනට පාත්‍ර වනු ඇත.

අභ්‍යාස

01. කෙටි පිළිතුරු ලියන්න.

i. බුද්ධදත්ත නාහිමියන්ගේ පැවිදි ආචාර්ය උපාධ්‍යායයෝ කවරහු ද?
ii. උන්වහන්සේ බුරුමයට යෑමට පෙර සම්පූර්ණයෙන් කටපාඩම් කොට තිබූ පොත් මොනවා ද?
iii. බුරුමයේ දී උන්වහන්සේ වැඩසිටි විහාරයේ නම කුමක් ද? එය පිහිටා තිබුණේ කොහි ද?
iv. බුද්ධදත්ත නාහිමි ලියූ මුල්ම කෘතිය කුමක් ද?
v. එවිට උන්වහන්සේගේ වයස කීය ද?
vi. උන්වහන්සේ බුරුමයේ දී ලියූ පාලි පොත් දෙකක නම් ලියන්න.
vii. කළුවරේ සිට අභිධර්මය උගන්වන ක්‍රමවේදය හඳුන්වන්නේ කිනම් නමකින් ද?
viii. බණ අසනවිට ඉඳින ආකාරය පිළිබඳ ව විස්තර කොට ලියූ පොත කුමක් ද?
ix. 'හෙ සිරිමාවාදය' නැමැති පොත ලිවීමට හේතුව කුමක් ද?
x. පාලි භාෂාව නඟා සිටුවීමට උන්වහන්සේ ලියූ ග්‍රන්ථ 5ක නම් පාඩමෙන් තෝරා ලියන්න.

02. පොල්වත්තේ ශ්‍රී බුද්ධදත්ත නාහිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පිළිබඳ ව වාක්‍ය රචනයක් ලියන්න.

මහාචාර්ය තෝමස් විලියම්ස් රීස් ඩේවිඩ්ස් මැතිතුමා

1843 මැයි 12 වැනිදා එංගලන්තයේ **කොල්චෙස්ටර්හි** දී උපත ලබා ලංකාවට පැමිණ **1864** වර්ෂයේ දී ඉංග්‍රීසි ආණ්ඩුවේ සිවිල් සේවයට බැඳුණු යුරෝපීය ජාතිකයෙක් පසුව නීතිඥයෙකු ලෙස කටයුතු කළේය. මෙකල ගාල්ලේ එක්තරා විහාරයක දේපලක් සම්බන්ධ නඩුවක සාක්ෂි විමසීමට ඔහුට සිදුවිය. එහි දී එම නඩුවේ සාක්ෂියක් ලෙස එක්තරා පාලි ලියවිල්ලක් අධිකරණය හමුවේ ඉදිරිපත් විය. එම පාලි ලියවිල්ල කියවා අර්ථ දැක්වීමට තරම් සමතෙකු එම අධිකරණ ශාලාවේ නො සිටියේ ය. ඒ අවස්ථාවේ මෙම අපූරු බස කුමක් දැයි සොයා බලා එම ලියවිල්ල තමන් ම කියවා අරුත් දැනගැනීමේ අදහසින් පාලි බස ඉගෙනීමට පටන් ගත්තේ ය. එම ඉගෙනීම කෙතරම් දුර ගියා දැයි කියතොත් අවසානයේ පාලි භාෂාවේ උරුමකරුවන්ටත් පාලි ඉගැන්වීමට තරම් හේ සමතෙක් විය. යුරෝපය පාලි සාහිත්‍යාදයේ පෙරගමන්කරු වූ ඔහු අන් කවරෙකු නොව **තෝමස් විලියම්ස් රීස් ඩේවිඩ්ස්** මැතිතුමා ය.

රීස් ඩේවිඩ්ස් සිවිල් සේවයේ යෙදෙමින් පාලි අධ්‍යයනය ආරම්භ කළේය. එහිදී එකල ලක්දිවට පමණක් නොව ථේරවාද බෞද්ධ ලෝකයට ම නායක වූ කොළඹ මාලිගාකන්ද **විද්‍යෝදය** පරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, අතිපූජ්‍ය **හික්කඩුවේ ශ්‍රී සුමංගලාභිධාන** නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ **යාත්‍රාමුල්ලේ ධර්මාරාම** හිමි ආදි අතිසම්භාවනීය උගතුන්ගෙන් වර්ෂ 08කින් පාලි භාෂාව ඉගෙනීමට ඔහුට හැකි විය. යාත්‍රාමුල්ලේ මාහිමි ඔහුට පාලි ඉගැන්වීම සඳහා දිනපතා සැහෙන දුරක් පයින් ම වැඩම කොට ඇත.

පාලි භාෂාව පිළිබඳ අසීමිත ළැදියාවක් ඔහු තුළ ඇති වූ අතර, ඒ නිසා ම පාලි බස ගැඹුරින් හැදෑරීමෙන් පසු බුදුදහම කෙරෙහි ඔහුගේ සිත තදින් ඇදී ගියේ ය. පසුව ඔහු සිවිල් සේවයෙන් ඉවත්ව එංගලන්තයට ගියේ ය. එංගලන්තයට ඔහු යන විටත් පාලි බස හා බුදුදහම පිළිබඳ යුරෝපීය උගත්තු දැන සිටියහ. **ඉයුජින් බර්නොෆ්** හා **මහාචාර්ය ලැසන්** 1826 දී පාලි භාෂාව ගැන ලිපියක් ලියා තිබුණු අතර, 1837 දී **ටර්නර්** පඬිවරයා මහාවංශය ගැන සංයුක්ත සංස්කරණයක් හා පරිවර්තනයක් පළකොට තිබුණි. එසේම ලංකාවේ සිට ගිය **ආර්. සී. චිල්ඩර්ස්** පාළි අකාරාදියේ වැඩ කටයුතු ආරම්භ කොට තිබුණි. ඩෙන්මාර්ක් ජාතික **වී. ෆොස් බෝල්** විසින් පාළියෙන් හා ලතින් භාෂාවෙන් ධම්මපදය ප්‍රසිද්ධ කොට තිබුණි. මේ අයුරින් එවක ප්‍රකටව සිටි ආසියානු භාෂා හා දර්ශන පිළිබඳ ශාස්ත්‍රඥයන්ගේ ඇසුර යුරෝපයේ දී රීස් ඩේවිඩ්ස්ට ලැබුණි. පසුකාලීනව එතුමා විසින් සිදු කළ පාළිභාෂාවේත් බුදුදහමේත් උන්නතියට එය මහත් පිටුබලයක් විය.

රීස් ඩේවිඩ්ස්ගේ මුල් ම පොත වූයේ 1877 දී ලියන ලද **'ලංකාවේ පැරණි කාසි හා මැනීම් ක්‍රම'** යන්නයි. එසේම 1878 දී **'බුද්ධධර්ම සංග්‍රහය'** නමින් කුඩා පොතක් ලියා පළ

කරන ලද අතර එය ක්‍රිස්තියානි නොවන ආගම් ගැන ක්‍රිස්තියානි ලබ්ධිකයන්ගේ දැනුම වැඩි දියුණු කර ගැනීම සඳහා ලියන ලද්දකි. එම කුඩා ග්‍රන්ථය ශාස්තෘන් වහන්සේගේ ජීවිතයත්, ධර්මයත් පිළිබඳව එතෙක් සොයාගත හැකිව තිබූ සියලු පාලි කරුණු පදනම් කොට ගෙන සංඝ සමාජය හා ත්‍රිපිටකය ගැන ද කෙටි සටහනක් ඇතුළත් කොට ලියන ලද්දකි. ධර්මය පිළිබඳව ඔහු තුළ පැවැති අසාමාන්‍ය වූත් පැහැදිලි වූත් දැනීම මේ කුඩා ග්‍රන්ථයෙන් පිළිබිඹු වේ. 1880 දී **'බෞද්ධ ජාතක කථා'** යන නමින් ඔහු පළ කළ ග්‍රන්ථය ජාතක නිදාන කථාව පිළිබඳ ඉතා වැදගත් ප්‍රස්තාවනාවකින් හා පරිවර්තනයකින් ද යුක්ත වේ. මේ ග්‍රන්ථය බටහිර උගතුන් විසින් හඳුන්වා ඇත්තේ **මහාචාර්ය ඊ.බී. කොබල්ගේ** සංස්කාරකත්වය ඇතිව කලාප හයකින් **'ජාතක කථා'** යන නමින් **පෝස් බොල්** විසින් ලියන ලද සම්පූර්ණ ජාතක පරිවර්තනයට ලියූ ප්‍රස්තාවනාවක් ලෙසින් ය. මේ කාලවකවානුවේ **'පෙරදිග ශුද්ධ ග්‍රන්ථ'** යන නමින් **මහාචාර්ය මැක්ස් මුලර්ගේ** නායකත්වයෙන් ග්‍රන්ථමාලාවක් සම්පාදනය කිරීම ආරම්භ කොට තිබුණි. ඒ සඳහා **රීස් ඩේවිඩ්ස්** ද **'බෞද්ධ සූත්‍ර'** නමින් කෘතියක් පළ කළේය. ඉන්පසු 1881 - 1885 අතර කාලයේ දී **හර්මන් ඔල්ඩන් බර්ග්ගේ** සහාය ද ඇතිව **'විනය ග්‍රන්ථ'** නමින් කලාප තුනක් ම පෙරදිග ශුද්ධ ග්‍රන්ථ මාලාවේ පළ කළ අතර, එහි ලා **පාතිමොක්ඛය, මහාවග්ග පාළි** හා **චුල්ලවග්ග පාළි** යන ග්‍රන්ථ ඉංග්‍රීසි බසට නැගුවේ ය. මීට අමතරව 1884 දී **දාඨාවංසය** සංස්කරණය කිරීමත්, **මිලින්දපඤ්හය** වෙළුම් දෙකකින් යුතුව පරිවර්තනය කිරීමත්, **අභිධම්මත්ථසංගහය** සංස්කරණය කිරීමත්, පාලි භාෂාව පිළිබඳ මහාචාර්යවරියක් වූ සිය බිරිඳ රීස් ඩේවිඩ්ස් මැතිනිය සමඟ එක්ව **දීඝනිකාය** පළමු වෙළුම ප්‍රකාශයට පත්කිරීමත් **රීස් ඩේවිඩ්ස්** මැතිතුමාගේ ශාස්ත්‍රීය සේවයට ඇතුළත් වේ.

අද දක්වා ම පාලි සාහිත්‍යයේ අභිවෘද්ධියට ඉමහත් සේවයක් සලසන **පාලි ග්‍රන්ථ සමිතිය** (Pali Text Society) ආරම්භ කිරීමේ වැදගත්කම 1881 දී ඇමෙරිකාව පවත්වන ලද **හිබර්ට්** දේශනයක දී අවධාරණය කරන ලද අතර එහි දී ඔහු වැඩිදුරටත් කියා සිටියේ ඒ වන විට මුද්‍රණද්වාරයෙන් පිට නොවී, යුරෝපයේ විශ්වවිද්‍යාලවලත් වෙනත් මහජන පුස්තකාලය ප්‍රයෝජනයට ගැනීමක් නැතිව විවිධ අත්පිටපත් වශයෙන් විසිර පවත්නා පැරණි බෞද්ධ සාහිත්‍යය සියලු දෙනාට හැදෑරීමට ඒවා රෝමන් අකුරෙන් මුද්‍රණය කළයුතු බවයි. රීස් ඩේවිඩ්ස්ගේ මෙම වැඩ පිළිවෙල ප්‍රංශය, ඕලන්දය, ජර්මනිය, එක්සත් ජනපදය යන රටවල සම්භාවනීය උගතුන් විසින් සාදරයෙන් පිළිගන්නා ලද අතර මුලින් ම සමිතිය සඳහා පත් කරගන්නා ලද කමිටුවේ සාමාජිකයන් ලෙස වී. **පෝස් බෝල්, හර්මන් ඔල්ඩන් බර්ග්, රිචඩ් මොරිස්, එමිලි සෙනාර්ට්** යන උගත්හු ඇතුළත් වූහ. මෙම පාලි ග්‍රන්ථ සමාගම සඳහා බටහිරින් මෙන්ම ශ්‍රී ලංකාවෙන් ද සුවිශේෂී සහයෝගයක් ලැබුණි. එකල ශ්‍රී ලංකාවේ වැඩ සිටි **හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, වස්කඩුවේ ශ්‍රී සුභූති නාහිමි, දොඩන්දූවේ ශ්‍රී පියරතනතිස්ස නාහිමි** වැනි ප්‍රබුද්ධ භික්ෂූන් වහන්සේලා මේ කටයුත්තට තම වටිනා අදහස් හා යෝජනා ලබාදුන්හ. එසේම ලාංකීය භික්ෂූන් වහන්සේලා සහ **අනගාරික ධර්මපාලතුමා** වැනි ගිහි ප්‍රභූවරු මූල්‍යාධාර ද ලබාදුන් අතර එකල පාලි ග්‍රන්ථ සමිතියේ සාමාජික මණ්ඩලයේ නිත්‍ය සාමාජික තනතුරක් ශ්‍රී ලංකාවට ද හිමිව තිබුණි. රීස් ඩේවිඩ්ස් මැතිතුමා විසින් සමාරබ්ධ මෙම පාලි ග්‍රන්ථ සමිතිය ඉටු කරන ලද මෙහෙය සුළුපටු නොවේ. ඉන් සිදු වූ සේවාවන් අතර,

■ සියලු පාලි නිකාය ග්‍රන්ථ, අටුවා හා ප්‍රකරණ ග්‍රන්ථ සමගින් සංස්කරණ කිරීම.

■ වෙළුම් 58 කින් යුත් ත්‍රිපිටකයේ සම්පූර්ණ ඉංග්‍රීසි පරිවර්තනයක් කිරීම.

■ ආචාර්ය **විලියම් ස්ටීඩ්ගේ** සම්පූර්ණ සහායෙන් දිගු කලක් තිස්සේ කරන ලද උත්සාහයකින් පසුව 1921 දී පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂයේ පළමු කොටස එළිදැක්වීම.

■ පාලි ත්‍රිපිටක කෝෂය එළිදැක්වීම. (Pali Tipitaka Concordance)

■ පාලි පුද්ගල නාම ශබ්දකෝෂය එළිදැක්වීම. (Dictionary of Pali Proper names)

රීස් ඩේවිඩ්ස් මහතා වසර 41 ක් පාලි ග්‍රන්ථ සමිතියේ කටයුතු වෙනුවෙන් සිය ජීවිතය කැප කළේය. තම කාර්යය සඵල කර ගැනීම සඳහා සෙසු අය පොළඹවා ගැනීමේ සුවිශේෂී දක්ෂතාවකින් යුතු එතුමා සංගමය සඳහා මුදල් එකතු කිරීමත්, මුදල් පාලනයත්, මුද්‍රණ කටයුතු සඳහා මුද්‍රණ ආයතන සමග ගණුදෙනු කිරීමත් එතුමා විසින් සිදුකරන ලදී. වර්ෂ 1882 දී එතුමා ලන්ඩන් විශ්වවිද්‍යාලය කොලීජියෙහි පාලි මහාචාර්යවරයා වූ අතර එය ගරු පදවියක් විය. ඊට නොබෝ කලකට පසු 1885 - 1904 කාලයේ හෙතෙම **රාජකීය ආසියාතික සමිතියේ** පුස්තකාලයාධිපති තනතුරට ද ලේකම් තනතුරට ද පත්විය. එම කාලවකවානුවේ දී එම සමිතියේ වැඩ කටයුතුවලට හා එහි පැවැත් වූ විවාදයන්ට අලුත් මුහුණුවරක් ලබාදුන්නේ ය. ඔහුගේ ප්‍රධානත්වය යටතේ එම සමිතියෙන් සිදු කළ පරිවර්තන මාලාව හා නිබන්ධන මුද්‍රණය කොට ප්‍රසිද්ධ කළේය. මේ සමයෙහි ම **බ්‍රිටිෂ් ඇකඩමි** හා **පෙරදිග හා අප්‍රිකානු අධ්‍යයන ආයතනයේ** (School of Oriental and African Studies) ආරම්භක සාමාජිකයෙකු වූ අතර, 1904 දී **මැන්චෙස්ටර්හි වික්ටෝරියා විශ්වවිද්‍යාලයේ** සමයාන්තර අධ්‍යයන විෂය සඳහා මහාචාර්යවරයා ලෙස පත් කරනු ලැබීය. ඔහුගේ මෙම තනතුරුවලින් බටහිර ලෝකය තුළ පාලි භාෂාව හා ථෙරවාද බෞද්ධ දර්ශනය ජනප්‍රිය විය.

ඉගෙනීමෙන් හා පාණ්ඩිත්‍යයෙන් පරිපූර්ණව සිටිය ද කිසිකලෙක හෙතෙම පණ්ඩිත මානයෙන් හිස උදුම්වා නො ගත්තේ ය. සිය දැනුම ශිෂ්‍යයන් සමග බෙදාගනිමින් ඔවුන්ගේ උත්සාහයන්ට වටිනාකමක් දීමට නිරතුරු කටයුතු ද කළේය. රීස් ඩේවිඩ්ස්ට සිය ජීවිත කාලය මුළුල්ලේ ම එක් උදාර අදහසක් විය. එනම් **'අප ඉක්මවා යෑමට අනුන්ට හැකියාව ලබාදීම සඳහා ඔවුන්ට අප විසින් දිය හැකි සියලු ධෛර්යය දිය යුතු'**යැයි ඔහු පිළිගෙන තිබුණි. ඔහු ලංකාවේ සිට නැවතත් එංගලන්තයට යන විට **මහාවංසය** පිළිබඳ කරුණු එක්රැස් කොට ගෙන ගියේ ග්‍රන්ථයක් පළ කිරීමේ අදහසිනි. ඒ වන විටත් ආචාර්ය එච්. ඕල්ඩන්බර්ග් ලන්ඩන් නුවර ඉදිමින් මහාවංස පරිවර්තන කාර්යය සිදු කරමින් සිටියේ ය. ඒ බව දැනගත් රීස් ඩේවිඩ්ස් ශ්‍රීමතාණෝ තමන් ළඟ පැවැති සියලු තොරතුරු ඔහු වෙත ලබා දුන්නේ ය. මෙය ඔහුගේ පුදුම පරිත්‍යාග ගුණයට එක් උදාහරණයකි.

1910 දී ඔහු අලුතින් ගොඩනැඟූ **ඉන්දියානු සමිතියේ** සභාපති විය. ඒ සමිතිය මගින් ද විවිධ දේශන මෙන්ම විවිධ පර්යේෂණ ලිපි ලියා විද්වත් ලෝකයට ප්‍රදානය කළ අතර, ඇතැම් විට කිසිදු උදව්වක් නැතිව තනියම ශාස්ත්‍රීය කටයුතු කරගෙන ගියේ ය. කැරොලින් ඔගස්ටා පොලී සමග විවාහ වීමෙන් පසු දරුවන් තිදෙනෙකුගේ පියා වූ රීස් ඩේවිඩ්ස් මැතිනිය ද පාලි හා බෞද්ධ අධ්‍යයනය පිළිබඳ විශාරද දැනුමක් ලබා සිටි තැනැත්තියකි. ඔහුගේ ශාස්ත්‍රීය කටයුතුවලට ඇගෙන් ද උදව් ලැබුණි. ඔහුගේ කීර්තිය නිසා විශාල සංඛ්‍යාවක් උගත්තු ඔහු හා සම්බන්ධකම් පවත්වන්නට වූහ. මේ නිසා බුදුදහම විවරණය කිරීමේ අවස්ථා ද වැඩි දියුණු විය. ජීවිතයේ අවසාන මොහොත දක්වා ම මනා සිහියෙන් යුතුව කටයුතු කළ හෙතෙම සිය ජීවන ගමනේ 79 වන විය පසුකරත් ම **1922 දෙසැම්බර්** 27 වැනි දා පරලෝ සැපත් විය.

අභ්‍යාස

i. රීස් ඩේවිඩ්ස් ශ්‍රීමතාණෝ උපත ලද්දේ කොහි ද?
ii. ඔහු පාලි බස ඉගෙනීමට හේතු වූ සිද්ධිය කුමක් ද?
iii. ලක්දිව දී ඔහුට පාලි බස ඉගැන්වූ ගුරුවරුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.
iv. ඔහු විසින් ලියන ලද 'බුද්ධ ධර්ම සංග්‍රහය' ග්‍රන්ථයේ ඇති වැදගත්කම කුමක් ද?
v. 'පෙරදිග ශුද්ධ ග්‍රන්ථ මාලාව'ට ඔහු ලියූ මුල්ම කෘතිය කුමක් ද?
vi. රීස් ඩේවිඩ්ස් විසින් පරිවර්තනය කළ කෘති 03ක් හා සංස්කරණය කළ කෘති 03ක් ලියන්න.
vii. 'පාලි ග්‍රන්ථ සමිතිය'(P.T.S) ආරම්භ කිරීමේ වැදගත්කම මුල්වරට අනාවරණය කරන ලද්දේ කොහිදී ද?
viii. ඔහු මහාචාර්ය ධූර දැරුවේ කිනම් විශ්වවිද්‍යාලයන්හි ද?
ix. සිය ජීවිත කාලය තුළ ඔහු දැරූ උදාර අදහස පාඩමෙන් උපුටා ලියන්න.
x. 'මහාවංශය' පිළිබඳ ඔහු එකතු කළ තොරතුරු ලබාදුන්නේ කාටද?
xi. ඔහු පුස්තකාලයාධිපති හා ලේකම් තනතුර දැරුයේ කිනම් සමිතියේ ද?
xii. P.T.S පාලි පොත් සමාගම මඟින් සිදු කළ ප්‍රධාන ශාස්ත්‍රීය සේවාවන් 03ක් ලියා දක්වන්න.

පණ්ණාරසමෝ පාඨෝ

උදානපාළි

බුදුරජාණන් වහන්සේ විසින් පන්සාළිස් වසක් මුළුල්ලෙහි දේශනා කළ බුද්ධවචනය, මුල් ම අවධියේ දී 'ධම්ම' යන වචනයෙන් හඳුන්වනු ලැබී ය. **"ධම්මචක්කං පවත්තෙතුං ගච්ඡාමි කාසිනං පුරං''**, **"දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං."** යනාදි දේශනාවලින් ඒ බව ප්‍රකට වේ. පසුව විනය ශික්ෂා පැනවීමත් සමග බුද්ධවචනය **ධම්මවිනය"** යන වචනයෙන් හඳුන්වා ඇත. **"ධම්මෝ ච විනයෝ ච දෙසිතෝ පඤ්ඤත්තෝ සෝ වෝ මමච්චයෙන සත්ථා''**, **"ඉදානි මයං ධම්මං ච විනයං ච සඞ්ගායෙය්‍යාම"** යනාදි දේශනාවලින් එය සනාථ වේ. බුද්ධපරිනිර්වාණයෙන් පසු ශාසනභාරධාරී මහතෙරවරු ධර්මය සංගායනා කොට **සූත්‍ර, විනය, අභිධර්ම** යනුවෙන් පිටකත්‍රයකට බෙදූහ. මේ පිටකත්‍රය දේශනාව අනුව විශේෂ නම් තුනකින් හඳුන්වනු ලබයි.

සූත්‍ර පිටකය	-	**වොහාර දෙසනා**
විනය පිටකය	-	**ආණා දෙසනා**
අභිධර්ම පිටකය	-	**පරමත්ථ දෙසනා**

වශයෙනි.

මෙම දේශනාව මහරහත් උතුමන් විසින් මහත් පරිශ්‍රමයෙන් පරපුරින් පරපුරට වනපොත් කොට ගෙන ගෙන එන ලදී. බුද්ධ පරිනිර්වාණයෙන් වසර 440 ක් ගිය තැන **වළගම්බා රාජ්‍ය** සමයේ **මාතලේ අළුවිහාරයේ** දී බුද්ධවචනය පුස්තකාරූඪ කරන ලද්දේ මතු ඇතිවන උපද්‍රවයන් වළකාලනු සඳහා ය. එසේ සංග්‍රහ කළ ඒ ඒ පිටකයන්ට අයත් ග්‍රන්ථ සංග්‍රහය පහත සඳහන් පරිදි වේ.



බුද්දක නිකාය හා උදාන පාළි

"ඨපෙත්වා චතුරොපෙතෙ - **නිකායෙ දීඝමාදිකෙ,**
තදඤ්ඤං බුද්ධවචනං - නිකායො බුද්දකො මතො"

යන විග්‍රහයට අනුව **දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, අඞ්ගුත්තරනිකාය** යන ප්‍රධාන නිකාය ග්‍රන්ථ හතරෙහි ඇතුළත් නොවූ ධර්ම කොට්ඨාස බුද්දකනිකාය නම් වෙයි.

ග්‍රන්ථ පහළොවකින් පරිමිත බුද්දකනිකායේ තෙවන ග්‍රන්ථය උදානපාළිය යි. අටුවාවෙහි උදාන යන්න විග්‍රහ වන්නේ **"කෙනත්ථෙන උදානං? උදානත්ථෙන උදානං. කිමිදං උදානං නාම? පීතිවෙගසමුට්ඨාපිතො උදාහාරො"** යනුවෙනි. ඒ අනුව උදානාර්ථයෙන් උදාන නම් වෙයි. උදාන නම් ප්‍රීතිවේගයෙන් නඟාලූ වචනය යි.

බුද්ධඝෝෂ තෙරුන් "**සොමනස්සඤාණමයිකඤ්ච ගාථාපටිසංයුත්තා දෙවඅසීති සුත්තන්තා උදානන්ති වෙදිතබ්බං.**" යනුවෙන් කීහ. ඒ අනුව සොම්නස හා එක්වූ ඥානය සම්බන්ධ වූ ගාථාවන්ගෙන් යුක්ත 82 ක් වූ සූත්‍ර උදානය යි දතයුතු ය. තවද සොම්නස හා ඤාණය තුළින් ප්‍රභව වූ ගාථා සහිත සූත්‍ර උදාන නම් වෙයි. උදානපාළියට අර්ථකථාවක් සම්පාදනය කළ **භදන්තාචරිය ධම්මපාල** හිමියෝ උදාන යන්නෙහි අර්ථ විස්තරය මෙසේ දක්වති. " මුවින් ඉතිරී ගිය වචනය උදාන නම් වන්නේ ය. ඉතිර යෑමෙහි හේතුව ප්‍රීතිසෝමනස්සය යි. ධර්මසංවේගාදිය ද හේතු වෙයි. ප්‍රීතිසෝමනස්සය නිසා වේවයි ධර්ම සංවේගය නිසා වේවයි මුවින් ඉතිර ගිය ගිළිහෙන යම් තෙපුලක් ඇද්ද එය උදාන වශයෙන් සැලකිය යුතු ය. තෙල් ආදිය භාජනයකට දැමූ විට නියමිත ප්‍රමාණය ඉක්මවා යනවිට උතුරා යයි. මෙසේ ප්‍රීතිවේගය මගින් මතු කරවන චින්තනයේ පැතිරීම ඇතුල් හදවතට දරාගත නොහැකි වූ විට වචන මාර්ගයෙන් පිටවේ. එහිදී අසන්නෙකු ගැන අවධානයක් යොමු නො වේ. මෙබඳු ප්‍රකාශන උදාන නම් වෙයි." තවද උදාන **බුද්ධභාෂිත, ශ්‍රාවකභාෂිත, ප්‍රත්‍යේකබුද්ධභාෂිත** යැයි තෙවදෑරුම් වේ. පවෙවකබුදධ උදාන බගගවිසාණ සූත්‍රයේ එයි. ශ්‍රාවක භාෂිත උදාන ථෙර-ථෙරීගාථාවන්හි එයි. උදානපාළියෙහි සඳහන් වන්නේ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ උදානයෝ ය.

උදානපාළිය වර්ග 8 කින් හා සූත්‍ර 82 කින් යුක්ත ය. උදානයේ 82 ක් ඇති බව කියන නමුදු උදානපාළියෙහි ඇත්තේ අසූවක් පමණි. ඒ ඒ වර්ග හඳුන්වා ඇත්තේ ප්‍රථම සූත්‍රයේ නාමයෙන් හෝ වැදගත්කමින් උසස් ම සූත්‍ර සංග්‍රහ වන සූත්‍ර නාමයෙනි. ඒ වර්ග අට මෙසේ ය.

බොධිවග
මුචලින්දවග
නන්දවග
මෙඝියවග
සොණවග
ජචචන්ධවග
චූලවග
පාටලීගාමියවග

මූලික පිරිවෙන් 5 ශ්‍රේණියට නියමිත කර ඇත්තේ බෝධිවර්ගයේ 8 වන **සංගාමජී සූත්‍රය**, මුචලින්දවර්ගයේ 6 වන **ගබ්භිනී සූත්‍රය** හා නන්දවග්ගයේ 3 වන **නන්ද සූත්‍රය** යි.

උදානපාළියේ අන්තර්ගතය

උදානපාළිය ධර්මකරුණුවලට වඩා සිද්ධිවලට ප්‍රමුඛතාව දෙන කෘතියකි. ඒ ඒ උදාන ගාථාවන්ට පාදක වූ ධර්ම කරුණු ඊට සම්බන්ධ කථා වස්තුව ආශ්‍රයෙන් මෙහි පැහැදිලි කෙරේ.

පළමුවන බෝධිවර්ගයේ පඨමාභිසම්බෝධි සමයෙහි කරුණු කිහිපයක් විස්තර වේ. බුදුන් වහන්සේ පටිච්චසමුප්පාදය මෙනෙහි කිරීම ආදි පුවත් මෙහි ඇතුළත් ය. අවසාන සූත්‍රයේ දාරුචීරිය කථාපුවත විස්තර වේ. බ්‍රාහ්මණධර්ම පිළිබඳ ව උදානයන්ගෙන් විස්තර වෙයි.

දෙවන මුචලින්දවර්ගයේ බුද්ධත්වයෙන් පසු අකාලමේඝයක් පැමිණි අවස්ථාවක මුචලින්ද නාරජු බුදුරදුන්ට ආරක්ෂාව සැලසූ අයුරු විස්තර වේ. කොසොල් රජු හා මගධ රජු අතර වූ සාකච්ඡාව **රාජ සූත්‍රයේ** ද බුදුසසුන පිහිටුවීමෙන් පසු අන්‍ය තීර්ථකයන් ලාභසත්කාරවලින් පිරිහීම පිළිබඳ ව **සක්කාර සූත්‍රයේ** ද එක්තරා පිරිවැජියෙක් ගර්භිනී වූ බිරිය සඳහා ගිතෙල් ලබා ගැනීමට ගොස් සිදු වූ සිද්ධියක් **ගබ්භිනී සූත්‍රයේ** ද මහණකමෙහි සුවය රජසැපවල ද නැති බව **භද්දිය සූත්‍රයේ** ද දැක්වේ.

තෙවන නන්දවර්ගයේ ඇතුළත් **නන්ද සූත්‍රය** බුදුරදුන්ගේ සහෝදර වූ නන්ද තෙරුන් මුල දී මහණකමෙහි නොඇලී සිටි අයුරුත්, පසුව බුදුරජ විසින් එය දුරුකළ සැටිත් විස්තර වේ. **යසොජ සූත්‍රයේ** යසෝජ තෙරුන් ප්‍රමුඛ 500ක් රහතුන් ගැන කියවේ. මෙහි කියවෙන උදානයන්ගෙන් භික්ෂුවකගේ ගුණාංග විස්තර වේ.

සිවුවන **මේඝියවර්ගයේ** බුද්ධෝපස්ථායක මේඝිය තෙරුන් භාවනාවකට ගොස් නැවත පැමිණීමේ සිද්ධියක් විස්තර වේ. **ජුණ්හ සූත්‍රයේ** සැරියුත් තෙරුන්ට ටොක්කක් ඇණ යක්ෂයෙකු පණපිටින් අපායගාමී වීම විස්තර වේ. **නාග සූත්‍රයෙහි** බුදුරදුන් පාරිලෙය්‍ය වනයට වැඩමවීමේ සිද්ධිය දැක්වේ. මෙම වර්ගයේ උදානගාථාවල සිත ගැන විස්තර වන ධර්ම කරුණු ඇතුළත් ය.

පස්වන **සෝණවර්ගයේ** මුගලන් තෙරුන් දුශ්ශීල භික්ෂුවක් උපෝසථාගාරයෙන් නෙරපා දැමූ පුවතක් **උපොසථ සූත්‍රයෙහි** අඩංගු ය. හයවන සූත්‍රයේ සෝණකුටිකණ්ණ තෙරුන්ගේ කථාව ඇතුළත් වෙයි. මෙහි එන උදානගාථාවලින් ආර්ය ශ්‍රාවකයන්ගේ චිත්ත-චෛතසික ධර්මයන් පිළිබඳව තොරතුරු විස්තර වේ.

ජච්චන්ධවර්ගයේ පළමු සූත්‍රයෙන් බුදුරදුන් චාපාල චෛත්‍යස්ථානයේ දී ආයුසංස්කාර අත්හැරීමේ පුවත විස්තර කෙරේ. 4 වන සූත්‍රය ජාත්‍යන්ධයන් අලියෙකුගේ රූව කියූ සැටි දැක්වෙන උපමා කථාවකින් යුක්ත ය. එහි එන "**ජච්චන්ධ**" යන වචනය මෙම වර්ගය නම් කිරීමට ද මුල් විය. අන්‍යලබ්ධික තීර්ථකයන්ගේ දර්ශනයන් බොහෝ උදාන ගාථාවලින් විවරණය වේ.

හත්වන **චූලවර්ගය** කුඩා සූත්‍ර 10 කින් (දහයකින්) යුක්ත ය. එහි 9 වන සූත්‍රය **උදපාන** සූත්‍රය යි. බුදුරදුන් මල්ලරට ථූප නම් බමුණුගමට පැමිණි විට උන්වහන්සේට පැන් නොලැබෙන සේ තණකොළ දමා ළිං වැසූ සැටි දක්වේ. 10 වන සූත්‍රයේ උදේන රජුගේ මෙහෙසිය වූ සාමාවතියගේ මරණය ගැන සඳහන් ය. උදාන ගාථාවලින් පාපකර්ම, ක්ලේශධර්ම පිළිබඳ විස්තර වේ.

අටවන **පාටලීගාමියවර්ගය** බුදුරදුන් අන්තිම දානය පිළිගැනීම, නාගසමාල තෙර බුදුන්ගේ පාත්‍රය බිමදමා අන්‍යතීර්ථකයන් වෙත යාම ආදී පුවත් විස්තර වන්නකි. මෙහි නිර්වාණය පිළිබඳ විස්තර ඇතුළත් උදාන ගාථාවන්ගෙන් යුක්ත ය. මෙසේ උදානපාළිය බුද්ධශාසනයේ ඓතිහාසික සිද්ධි සමූහයක් විස්තර වන රසවත් ආඛ්‍යානමය සූත්‍ර ඇතුළත් ග්‍රන්ථයක් ලෙස හඳුනාගත හැකි ය.

මෙසේ උදාපාළියෙහි සූත්‍ර 80 කි, වර්ග 8 කි, ගාථා 95 කි. බණවර අටහමාරකි.

සංගාමජී සූත්‍රය

දිනක් භාග්‍යවතුන් වහන්සේ දැකගනු පිණිස දෙව්රම් වෙහෙරට පැමිණි සංගාමජී තෙරණුවෝ දිවාකාලය ගසක් මුල ගත කළහ. උන්වහන්සේගේ ගිහිකල බිරිඳ දරුවා ද රැගෙන එහි පැමිණ, "ශ්‍රමණය, කුඩා පුතෙකු ඇත්තියක් වෙමි, මා පෝෂණය කරන්න" යැයි පැවසුවා ය. තුන්වන වතාව තෙක් එසේ කීවද, නිහඬව සිටි තෙරුන් දැක "ඔබේ පුතු බාරගන්න" යැයි පවසා මදක් ඉවතට ගොස් සැඟවී බලා සිටියා ය. සංගාමජී තෙරණුවෝ ඔහු දෙස බැලීමක් හෝ කථාබහක් නො කළහ. එය දුටු කාන්තාව "මොහුට පුතුගෙන් පලක් නැතැ"යි ආපසු පැමිණ දරුවා රැගෙන ගියා ය. භාග්‍යවතුන් වහන්සේ මෙය දැක **"ආයතිං නාභිනන්දතී..."** යනාදි උදානය වදාළ සේක.

ගබ්භිනී සූත්‍රය

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි එක්තරා පරිබ්‍රාජකයකුගේ තරුණ බිරිඳක් ගැබ්ගෙන දරු ප්‍රසූතියට ආසන්නව සිටියා ය. ඕ දරු ප්‍රසූතිය පහසු වනු පිණිස ගිතෙල් සොයාගෙන එන ලෙස පරිව්‍රාජකයාට තෙවරක් ම පෙරැත්ත කළා ය. එකල පසේනදි කොසොල් රජුගේ කෝෂ්ඨාගාරයෙන් ගිතෙල්, තලතෙල් රිසිතාක් පානය කොට යෑමට මහණ බමුණන්ට ඉඩ දී තිබිණ. එහෙත් ගෙනයාම තහනම් විය. පරිව්‍රාජකයා එම කෝෂ්ඨාගාරයට ගොස් හැකි තාක් තෙල් බී අවුත් වමාරා දීමට තැත් කළේ ය. හෙතෙම වැමෑරීමට හෝ විරේක කිරීමට නො හැකිව දැඩි වේදනාවෙන් ඔබමොබ පෙරළෙන්නට විය. සැවැත්නුවර පිඬුසිඟා වඩින අතරතුර දී බුදුරදුන්ට එය දැකගන්නට ලැබිණ. එය නිමිති කරගෙන කෙලෙස්වලින් මිදුණු පුද්ගලයාට එබඳු පීඩා නැති බව පැවසෙන **"සුඛිනෝ වත යෙ අකිඤ්චනා..."** යනාදි උදාන ගාථා වදාළ සේක.

නන්ද සූත්‍රය

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි නන්ද තෙරණුවෝ බොහෝ භික්ෂූන්ට තමා සිවුරු හැර යන බව ප්‍රකාශ කළහ. එක්තරා භික්ෂුවක් මේ පුවත බුදුරදුන්ට සැල කළේ ය. බුදුරදුහු නන්ද තෙරුන් කැඳවා අකමැත්තෙන් බඹසර හැසිරෙන්නේ දැයි විමසූහ. නන්ද තෙර වහා එන්නැයි ජනපද කල්‍යාණිය තමාට කියූ වදන් සිහි වන බව බුදුරදුන්ට කීය. ඉක්බිති බුදුහු නන්ද තෙරුන්ගේ අතින් අල්ලාගෙන දෙව්ලොවට ගොස් රන්වන් පැහැති අප්සරාවන් 500ක් පෙන්වූහ. නන්ද තෙර බුදුන් වහන්සේගෙන් අප්සරාවන් ලබා ගැනීමේ පොරොන්දුව මත බඹසර විසීමට එකඟ විය. ඉකිබිතිව බඹසර වැස රහත් වූහ. මේ සිද්ධිය අරමුණු කොට **"යස්ස නිත්තිණ්ණා පඤ්ඤා ච..."** යනාදි උදානය පසුව උන්වහන්සේ වදාළ සේක.

අභ්‍යාස

01. කෙටි පිළිතුරු සපයන්න.

i. උදානපාළියේ සූත්‍ර ගණන කීය ද?
ii. උදානපාළියේ වර්ග සංඛ්‍යාව කීය ද?
iii. උදානපාලියේ බණවර ගණන කීය ද?
iv. උදානපාළිය බුද්දකනිකායේ කීවෙනි ග්‍රන්ථය ද?
v. බුද්දකනිකායට අයත් ග්‍රන්ථ සංඛ්‍යාව කීය ද?

02. සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

i. ඉදානි ..... ධම්මං ච ..... ච සඞ්ගායෙය්‍යාම.
ii. දෙසෙථ ..... ධම්මං ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං.
iii. ධම්මචක්කං .....ගච්ඡාමි කාසිනං පුරං.
iv. තදඤ්ඤං ..... නිකායෝ ..... මතෝ.
v. කිමිදං ..... නාම. පීතිවෙගසමුට්ඨාපිතෝ .....

03. දී ඇති වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

කථාවත්‍ථුප්පකරණය / වට්ටගාමිණී අභය / පාටලීගාමිය / බ්‍රාහ්මණධර්ම / වොහාර දෙසනා / ජුණ්හ උපොසථ / චාපාලචෙතිය / 95 කි. / ආණාදෙසනා.

i. උදානපාළියේ ඇති උදානගාථා ගණන .....
ii. ..... උදානපාළියේ අවසාන වර්ගය යි.
iii. බෝධිවර්ගයේ උදානගාථාවලින් කියවෙන්නේ ..... ගැන යි.
iv. මුගලන් තෙර දුසිල් භික්ෂුවක උපෝසථාගාරයෙන් නෙරපූ පුවත සඳහන් වන්නේ ..... සූත්‍රයේ ය.
v. යක්ෂයකු සැරියුත් තෙරුන්ගේ හිසට පහර දුන් පුවත සඳහන් වන්නේ ..... සූත්‍රයේ ය.
vi. ත්‍රිපිටකය පුස්තකාරූඪ කළේ ..... රජ සමයෙහි ය.
vii. මොග්ගලීපුත්තතිස්ස තෙරුන් රචනා කළ ත්‍රිපිටකයට ඇතුළත් ග්‍රන්ථය .....
viii. සූත්‍රපිටකය හඳුන්වනු ලබන්නේ ..... නමිනි.
ix. ..... විනය පිටකය හඳුන්වයි.
x. බුදුරදුන් ආයුසංස්කාර ඇත්හැරියේ ..... ස්ථානයේ දී ය.

04. පිළිතුරු සපයන්න.

i. බුද්දකනිකාය හඳුන්වා ඇති ගාථාව ලියන්න.
ii. උදානපාළියේ වර්ග පිළිවෙළින් ලියන්න.
iii. විනයපිටකයට අයත් ග්‍රන්ථ පහ නම් කරන්න.
iv. උදානපාළියේ ඇතුළත් බුද්ධචරිතයට සම්බන්ධ සිද්ධි 5ක් ලියන්න.

සොළසමො පාඨො

සඞ්ගාමජීසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා සඞ්ගාමජී සාවත්ථිං අනුප්පත්තො හොති භගවන්තං දස්සනාය. අස්සොසි ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා 'අය්‍යා කිර සඞ්ගාමජී සාවත්ථිං අනුප්පත්තො'ති. සා දාරකං ආදාය ජෙතවනං අගමාසි. තෙන ඛො පන සමයෙන ආයස්මා සඞ්ගාමජී අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නො හොති. අථ ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා යෙනායස්මා සඞ්ගාමජී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සඞ්ගාමජිං එතදවොච: 'බුද්ධපුත්තා'මහි සමණ; පොස ම'න්ති. එවං වුත්තෙ ආයස්මා සඞ්ගාමජී තුණ්හී අහොසි. දුතියම්පි ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා ආයස්මන්තං සඞ්ගාමජිං එතදවොච: 'බුද්ධපුත්තා'මහි සමණ පොස ම'න්ති. දුතියම්පි ඛො ආයස්මා සඞ්ගාමජී තුණ්හී අහොසි. තතියම්පි ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා ආයස්මන්තං සඞ්ගාමජිං එතදවොච: 'බුද්ධපුත්තා'මහි සමණ; පොස ම'න්ති. තතියම්පි ඛො ආයස්මා සඞ්ගාමජී තුණ්හී අහොසි. අථ ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා තං දාරකං ආයස්මතො සඞ්ගාමජිස්ස පුරතො නික්ඛිපිත්වා පක්කාමි 'එස තෙ සමණ, පුත්තො පොස න'න්ති. අථ ඛො ආයස්මා සඞ්ගාමජී තං දාරකං නෙව ඔලොකෙසි, නපි ආලපි. අථ ඛො ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකා අවිදූරං ගන්ත්වා අපලොකෙන්තී අද්දස ආයස්මන්තං සඞ්ගාමජිං තං දාරකං නෙව ඔලොකෙන්තං නපි ආලපන්තං. දිස්වාන'ස්සා එතදහොසි: 'න චායං සමණො පුත්තෙනපි අත්ථිකො'ති. තතො පටිනිවත්තිත්වා දාරකං ආදාය පක්කාමි. අද්දසා ඛො භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන ආයස්මතො සඞ්ගාමජිස්ස පුරාණදුතියිකාය එවරූපං විප්පකාරං. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

ආයන්තිං නාභිනන්දති - පක්කමන්තිං න සොචති;
සඞ්ගා සඞ්ගාමජිං මුත්තං - තමහං බ්‍රූමි බ්‍රාහ්මණ'න්ති.

සංගාමජී සූත්‍රය

මෙ, මා විසින්; **එවං**, මෙසේ; **සුතං**, අසන ලදී. **එකං සමයං**, එක් සමයෙක්හි; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **සාවත්ථියං**, සැවැත්නුවර; **ජෙතවනෙ**, දෙව්රම් වෙහෙර; **අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**, අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි; **විහරති**; වාසය කරන සේක, **තෙන ඛො පන සමයෙන**, එසමයෙහි; **ආයස්මා සංගාමජී**, ආයුෂ්මත් සංගාමජී තෙර; **භගවන්තං දස්සනාය**, භාග්‍යවතුන් වහන්සේ දැකීමට; **සාවත්ථිං**, සැවැත්නුවරට; **අනුප්පත්තො හොති**, පැමිණියේ වෙයි; **ආයස්මතො**, ආයුෂ්මත්; **සඞ්ගාමජිස්ස**, සංගාමජී තෙරුන්ගේ; **පුරාණදුතියිකා**, පෙර බිරිඳ; **අය්‍යා කිර සඞ්ගාමජී**, සංගාමජී ආර්යයන් වහන්සේ; **සාවත්ථිං**, සැවැත්නුවරට; **අනුප්පත්තො ඉති**, පැමිණියේ යැයි; **අස්සොසි**, ඇසුවා ය; **සා**, ඇය; **දාරකං ආදාය**, දරුවා රැගෙන; **ජෙතවනං**, දෙව්රම් වෙහෙරට; **අගමාසි**, ගියා ය;

තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; **ආයස්මා සංගාමජී**, ආයුෂ්මත් සංගාමජී තෙර; **අඤ්ඤතරස්මිං**, එක්තරා; **රුක්ඛමූලෙ**, ගසක් මුල; **දිවාවිහාරං**, දිවා විහරණයෙන්; **නිසින්නො හොති**, හුන්නේ වෙයි; **අථ ඛො**, ඉක්බිති; **සඞ්ගාමජිස්ස**, සංගාමජී තෙරුන්ගේ; **පුරාණදුතියිකා**, පෙර බිරිඳ; **යෙනායස්මා සංගාමජී**, සංගාමජී තෙර යම් තැනක ද; **තෙන උපසංකමි**, එතැනට එළඹියා ය; **උපසඞ්කමිත්වා**, එළඹ; **ආයස්මන්තං සඞ්ගාමජිං**, ආයුෂ්මත් සංගාමජී තෙරුන්ට; **එතදවොච**, මෙය කීවා ය; **"සමණ**, ශ්‍රමණය; **බුද්දපුත්තා අම්හි**, කුඩා පුතෙකු ඇත්තියක් වෙමි; **මං**, මා; **පොස**, පෝෂණය කරන්න;" **ඉති**, යනුවෙනි; **එවං වුත්තෙ**, මෙසේ කී කල්හි; **ආයස්මා සංගාමජී**, ආයුෂ්මත් සංගාමජී තෙර; **තුණ්හී අහොසි**, නිහඬවිය; **දුතියං අපි**, දෙවනුව ද; **ඛො**, වනාහි; **ආයස්මතො සඞ්ගාමජිස්ස**, ආයුෂ්මත් සංගාමජී තෙරුන්ගේ; **පුරාණදුතියිකා**, පෙර බිරිඳ; **ආයස්මන්තං සඞ්ගාමජිං**, ආයුෂ්මත් සංගාමජී තෙරුන්ට; **එතං අවොච**, මෙය කීවා ය; "**සමණ**, ශ්‍රමණය; **බුද්දපුත්තා අම්හි**, කුඩා පුතෙකු ඇත්තියක් වෙමි; **මං**, මා; **පොස**, පෝෂණය කරන්න;" **ඉති**, යනුවෙනි; **දුතියම්පි ඛො**, දෙවනුව ද වනාහි; **ආයස්මා සඞ්ගාමජී**, ආයුෂ්මත් සංගාමජී තෙර; **තුණ්හී අහොසි**, නිශ්ශබ්ද විය. **තතියං අපි ඛො**, තෙවනුව ද වනාහි; **ආයස්මතො සඞ්ගාමජිස්ස**, ආයුෂ්මත් සංගාමජී තෙරුන්ගේ; **පුරාණදුතියිකා**, පෙර බිරිඳ; **ආයස්මන්තං සඞ්ගාමජිං**, ආයුෂ්මත් සංගාමජී තෙරුන්ට; **එතදවොච**, මෙය කීවා ය; "**සමණ**; ශ්‍රමණය; **බුද්දපුත්තා අම්හි**, කුඩා පුතෙක් ඇත්තියක් වෙමි; **මං**, මා; **පොස**, පෝෂණය කරන්න;" **ඉති**, යනුවෙනි; **තතියං අපි ඛො**, තෙවනුව ද වනාහි; **ආයස්මා සඞ්ගාමජී**, ආයුෂ්මත් සංගාමජී තෙර; **තුණ්හී අහොසි**, නිශ්ශබ්ද විය. **අථ ඛො**, ඉක්බිති; **ආයස්මතො සඞ්ගාමජිස්ස**, ආයුෂ්මත් සංගාමජී තෙරුන්ගේ; **පුරාණදුතියිකා**, පෙර බිරිඳ; **තං දාරකං**, ඒ දරුවා; **ආයස්මතො**, ආයුෂ්මත්; **සඞ්ගාමජිස්ස**, සංගාමජී තෙරුන්ගේ; **පුරතො**, ඉදිරියෙහි; **නික්ඛිපිත්වා**, තබා; "**සමණ**, ශ්‍රමණය; **තෙ**, ඔබගේ; **එසො පුත්තො**, මේ පුතාය; **නං**, ඔහුව; **පොස ඉති**, පෝෂණය කරන්නැ'යි; **පක්කාමි**, ගියා ය. **අථ ඛො**, ඉක්බිති; **ආයස්මා**, ආයුෂ්මත්; **සඞ්ගාමජී**, සංගාමජී තෙර; **තං දාරකං**, ඒ දරුවා දෙස; **නෙව ඔලොකෙසි**, නොම බැලී ය; **නපි ආලපි**, කථා ද නො කළේ ය; **අථ ඛො**, ඉක්බිති; **ආයස්මතො**, ආයුෂ්මත්; **සඞ්ගාමජිස්ස**, සංගාමජී තෙරුන්ගේ; **පුරාණදුතියිකා**, පෙර බිරිඳ; **අවිදූරං**, නොදුරට; **ගන්ත්වා**, ගොස්; **අපලොකෙන්තී**, ආපසු බලන්නී; **තං දාරකං**, ඒ දරුවා; **නෙව ඔලොකෙන්තං**, නොබලන; **නපි ආලපන්තං**, කථා නොකරන; **ආයස්මන්තං**, ආයුෂ්මත්; **සංගාමජිං**, සංගාමජී තෙර; **අද්දස**, දුටුවා ය; **දිස්වාන**, දැක; **අස්සා**, ඇයට; **එතදහොසි**, මෙම අදහස ඇති විය; "**අයං සමණො**, මේ ශ්‍රමණ තෙම; **පුත්තෙන අපි**, පුත්‍රයාගෙනුදු; **න අත්ථිකො**, ප්‍රයෝජන ඇත්තෙක් නොවේ;" **ඉති**, යනුවෙනි.

තතො, ඉක්බිති; **පටිනිවත්තිත්වා**, නැවතී; **දාරකං**, දරුවා; **ආදාය**, රැගෙන; **පක්කාමි**, ගියා ය; **භගවා ඛො**, භාග්‍යවතුන් වහන්සේ වනාහි; **විසුද්ධෙන**, පිරිසිදු වූ; **අතික්කන්තමානුසකෙන**, මිනිස් ඇස ඉක්මවූ; **දිබ්බෙන චක්ඛුනා**, දිවැසින්; **ආයස්මතො**, ආයුෂ්මත්; **සඞ්ගාමජිස්ස**, සංගාමජී තෙරුන්ගේ; **පුරාණදුතියිකාය**, පෙර බිරිඳගේ; **එවරූපං**, මෙබඳු; **විප්පකාරං**, විප්‍රකාරය; **අද්දස**, දුටුසේක.

අථ ඛො, ඉක්බිති; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **එතං අත්ථං**, මේ කරුණ; **විදිත්වා**, දැන; **තායං වෙලායං**, එම වේලාවෙහි; **ඉමං උදානං**, මේ උදානය; **උදානෙසි**, උදන් නැඟූ සේක.

"**ආයතන්හිං**, එන්නිය දැක; **න අභිනන්දති**, සතුටු නො වෙයි; **පක්කමන්තිං**, බැහැර යන්නිය දැක; **න සොචති**, ශෝක නො කරයි; **සඞ්ඝා**, ඇලීම්වලින්; **මුත්තං**, මිදුණු; **තං සංගාමජිං**, ඒ සංගාමජී භික්ෂුව; **බ්‍රාහ්මණං ඉති**, බ්‍රාහ්මණයෙකැයි; **අහං**, මම; **බ්‍රූමි**, කියමි."

අභ්‍යාස

01. පහත සඳහන් සංවාදය සිංහලට නඟන්න.

අඤ්ඤතරා වනිතාඃ- 'අරෙ භගිනි' න ත්වං ජානාසි. හීයො සායණ්හසමයෙ ආයසමා සංගාමජී සාවත්ථිං අනුප්පත්තො'ති

පුරාණදුතියිකාඃ- 'කිං ත්වං සච්චං වදසි. උදාහු මුසා?'

අඤ්ඤතරා වනිතාඃ- 'අහං කිමත්ථාය මුසා භණාමි ත්වමෙව ජෙතවනං ගන්ත්වා සච්චං ජානෙය්‍යාසි'

පුරාණදුතියිකාඃ- 'භවතු සීඝමෙව ජෙතවනං ගමිස්සාමි' (ගන්ත්වා)

අඤ්ඤතරො ථෙරොඃ- 'උපාසිකෙ කත්ථ නු ඛො ත්වං ගච්ඡසි දිවා දිවස්ස'

පුරාණදුතියිකාඃ- 'හන්ත එතරහි ආයසමා සංගාමජී කත්ථ විහරති?'

අඤ්ඤතරො ථෙරොඃ- 'පස්සසි ත්වං උපාසිකෙ; තව දක්ඛිණදිසායං චංකමනභූමි, තත්ථ ආයසමා සංගාමජී චංකමති'

පුරාණදුතියිකාඃ- 'හන්ත සංගාමජී බුද්ධපුත්තාමහි පොස මං'

ආයසමා සංගාමජීඃ- 'තුණ්හී අහොසි'

පුරාණදුතියිකාඃ- 'එස තෙ සමණ පුත්තො පොස නං'

ආයසමා සංගාමජීඃ- 'තුණ්හී අහොසි'

පුරාණදුතියිකාඃ- 'න චායං සමණො පුත්තෙනපි අත්ථිකො හොති අහමෙව දාරකං ආදාය ගමිස්සාමි'

02. පහත සඳහන් යෙදුම් භාවිත කර පාලි වාක්‍යය පහක් ලියන්න.

i. තෙන ඛො පන සමයෙන
ii. තායං වෙලායං
iii. අවිදූරං ගන්ත්වා
iv. එතමත්ථං විදිත්වා
v. අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ

03. කාන්තාවන් හා දරුවන් දැකීමෙන් පෘථග්ජන පුද්ගලයන් තුළ ඇතිවෙන සෞන්දර්යාත්මක හැඟීම් මොනවා දැයි විස්තර කරන්න.

04. රහතන් වහන්සේ කාන්තාවන් හා දරුවන් වැනි සාමිස වස්තු පිළිබඳ දක්වන ආකල්පය කුමක් දැයි පැහැදිලි කරන්න.

ගබ්හිනීසුත්තං

එවං මේ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පරිබ්බාජකස්ස දහරා මාණවිකා පජාපතී හොති ගබ්හිනී උපවිජඤ්ඤා. අථ ඛො සා පරිබ්බාජිකා තං පරිබ්බාජකං එතදවොච: "ගච්ඡ ත්වං බ්‍රාහ්මණ, තෙලං ආහර; යං මෙ විජාතාය භවිස්සතී"ති. එවං වුත්තෙ සො පරිබ්බාජකො තං පරිබ්බාජිකං එතදවොච: "කුතො පනා'හං හොති තෙලං ආහරාමී"ති. දුතියම්පි ඛො සා පරිබ්බාජිකා තං පරිබ්බාජකං එතදවොච: "ගච්ඡ ත්වං බ්‍රාහ්මණ, තෙලං ආහර යං මෙ විජාතාය භවිස්සතී"ති. දුතියම්පි ඛො සො පරිබ්බාජකො තං පරිබ්බාජිකං එතදවොච: "කුතො පනා'හං හොති තෙලං ආහරාමී"ති. තතියම්පි ඛො සා පරිබ්බාජිකා තං පරිබ්බාජකං එතදවොච: "ගච්ඡ ත්වං බ්‍රාහ්මණ, තෙලං ආහර; යං මෙ විජාතාය භවිස්සතී"ති.

තෙන ඛො පන සමයෙන රඤ්ඤා පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දියති, නො නීහරිතුං. අථ ඛො තස්ස පරිබ්බාජකස්ස එතදහොසි: "රඤ්ඤා ඛො පන පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරෙ සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා සප්පිස්ස වා තෙලස්ස වා යාවදත්ථං පාතුං දියති, නො නීහරිතුං. යනූනා'හං රඤ්ඤා පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා ඝරං ආගන්ත්වා උග්ගිරිත්වාන දදෙය්‍යං; යං ඉමිස්සා විජාතාය භවිස්සතී"ති. අථ ඛො සො පරිබ්බාජකො රඤ්ඤා පසෙනදිස්ස කොසලස්ස කොට්ඨාගාරං ගන්ත්වා තෙලස්ස යාවදත්ථං පිවිත්වා ඝරං ආගන්ත්වා නෙව සක්කොති උද්ධං කාතුං, න පන අධො. සො දුක්ඛාහි තිබ්බාහි බරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨො ආවට්ටති, පරිවට්ටති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො භගවා තං පරිබ්බාජකං දුක්ඛාහි තිබ්බාහි බරාහි කටුකාහි වෙදනාහි ඵුට්ඨං ආවට්ටමානං පරිවට්ටමානං. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

සුඛිනො වත යෙ අකිඤ්චනා
වෙදගුනො හි ජනා අකිඤ්චනා,
සකිඤ්චනං පස්ස විහඤ්ඤමානං
ජනො ජනස්මිං පටිබද්ධචිත්තොති.

ගබ්හිනී සූත්‍රය

මෙ, මා විසින්; **එවං**, මෙසේ; **සුතං**, අසන ලදී; **එකං සමයං**, එක් සමයෙක්හි; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **සාවත්ථියං**, සැවැත්නුවර; **අනාථපිණ්ඩිකස්ස**, අනේපිඬු සිටුතුමාගේ; **ජේතවනෙ**, දෙව්රම්වෙහෙර; **ආරාමෙ**, ආරාමයෙහි; **විහරති**, වාසය කරන සේක.

තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; **අඤ්ඤතරස්ස**, එක්තරා; **පරිබ්බාජකස්ස**, පිරිවැජියෙකුගේ; **දහරා මාණවිකා**, තරුණ මෙනවියක්; **පජාපතී**, භාර්යාව වූවා; **ගබ්හිනී**, ගැබ්ගත්තී; **උපවිජඤ්ඤා**, ප්‍රසූතකාලය ළං වූවා; **හොති**, වෙයි.

අථ ඛො, ඉක්බිති; **සා පරිබ්බාජිකා**, ඒ පරිබ්‍රාජිකාව; **තං පරිබ්බාජකං**, ඒ පරිබ්‍රාජකයාට; **එතදවොච**, මෙය කීවා ය;"**බ්‍රාහමණ**, බ්‍රාහ්මණය; **ත්වං**, ඔබ; **ගච්ඡ**, යන්න; **යං**, යම් තෙලක්; **මෙ**, මාගේ; **විජාතාය**, වැදුමට; **භවිස්සති**, පහසු වන්නේ නම්; **තෙලං**, එබඳු තෙලෙක්; **ආහර**, ගෙනෙන්න;"**ඉති**, යනුවෙනි. **එවං වුත්තෙ**, මෙසේ කී කල්හි; **සො පරිබ්බාජකො**, ඒ පරිබ්‍රාජකයා; **තං පරිබ්බාජිකං**, ඒ පරිබ්‍රාජිකාවට; **එතදවොච**, මෙය කීවේ ය; "**හොති**, පින්වතිය; **අහං**, මම; **කුතො පන**, කොතනින් වනාහි; **තෙලං ආහරාමි**, තෙල් ගෙනෙම් ද?;"**ඉති**, යනුවෙනි; **දුතියං අපි**, දෙවනුව ද; **සා පරිබ්බාජිකා**, ඒ පරිබ්‍රාජිකාව; **තං පරිබ්බාජකං**, ඒ පිරිවැජියාට; **එතදවොච**, මෙය කීවා ය; "**බ්‍රාහමණ ත්වං**, බ්‍රාහ්මණය ඔබ; **ගච්ඡ**, යන්න; **යං**, යම් තෙලක්; **මෙ විජාතාය**, මාගේ වැදීම සඳහා; **භවිස්සති**, වන්නේ නම්; **තෙලං**, (එබඳු) තෙලක් **ආහර**, (ඒ තෙල) ගෙනෙන්න;"**ඉති**, යනුවෙනි "**හොති**, පින්වතිය; **කුතො පන**, කොතැනින් වනාහි; **අහං**, මම; **ආහරාමි**, ගෙන එම් ද?"; **ඉති**, යනුවෙනි; **තතියං අපි**, තෙවනුව ද; **සා පරිබ්බාජිකා**, ඒ පරිබ්‍රාජිකාව; **තං පරිබ්බාජකං**, ඒ පිරිවැජියාට; **එතදවොච**, මෙය කීවා ය; "**බ්‍රාහමණ ත්වං**, බ්‍රාහ්මණය ඔබ; **ගච්ඡ**, යන්න; යං, යම් තෙලක්; **මෙ විජාතාය**, මාගේ වැදීම සඳහා; **භවිස්සති**, වන්නේ නම්; **තෙලං**, (එබඳු) තෙලක් **ආහර**, ගෙනෙන්න"; **ඉති**, යනුවෙනි.

තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; **පසෙනදිස්ස කොසලස්ස රඤ්ඤො**, පසේනදි කොසොල් රජුගේ; **කොට්ඨාගාරෙ**, ගබඩාවෙහි; **සමණස්ස වා**, ශ්‍රමණයෙකුට හෝ; **බ්‍රාහමණස්ස වා**, බමුණෙකුට හෝ; **සප්පිස්ස වා**, ගිතෙල් හෝ; **තෙලස්ස වා**, තලතෙල් හෝ; **යාවදත්ථං**, ඇතිතාක්; **පාතුං**, බොන්නට; **දියාති**, දෙනු ලැබේ; **නො නීහරිතුං**, ගෙන යන්නට නො දෙයි. **අථ ඛො**, ඉක්බිති; **තස්ස පරිබ්බාජකස්ස**, ඒ පිරිවැජියාට; **එතදහොසි**, මෙබඳු අදහසක් විය; "**පසෙනදිස්ස කොසලස්ස රඤ්ඤො**, පසේනදි කොසොල් රජුගේ; **කොට්ඨාගාරෙ**, ගබඩාවෙහි; **සමණස්ස වා**, ශ්‍රමණයෙකුට හෝ; **බ්‍රාහමණස්ස වා**, බමුණෙකුට හෝ; **සප්පිස්ස වා**, ගිතෙල් හෝ; **තෙලස්ස වා**, තලතෙල් හෝ; **යාවදත්ථං**, ඇතිතාක්; **පාතුං**, බොන්නට; **දියාති**, දෙනු ලබයි; **නො නීහරිතුං**, ගෙන යන්නට නො දෙයි; **අහං**, මම; **පසෙනදිස්ස කොසලස්ස රඤ්ඤො**, පසේනදි කොසොල් රජුගේ; **කොට්ඨාගාරං**, ගබඩාවට; **ගන්ත්වා**, ගොස්; **යං**, යම් **ඉමිස්සා**, මැයට; **විජාතාය**, වැදීම සඳහා; **භවිස්සති ඉති**, වන්නේ නම් **තෙලස්ස**, ඒ තලතෙල්; **යාවදත්ථං**, ඇතිතාක්; **පිවිත්වා**, බී; **සරං**, ගෙදරට; **ආගන්ත්වා**, අවුත්; **උගගිරිත්වාන**, වමාරා; **දදෙය්‍යං**, දෙන්නේ නම්; **යන්නූන ඉති**, ඉතා යෙහෙකි යනුවෙනි. **අථ ඛො**, ඉක්බිති; **සො පරිබ්බාජකො**, ඒ පිරිවැජියා; **පසෙනදිස්ස කොසලස්ස රඤ්ඤො**, පසේනදි කොසොල් රජුගේ; **කොට්ඨාගාරං**, ගබඩාවට; **ගන්ත්වා**, ගොස්; **තෙලස්ස**, තෙල්; **යාවදත්ථං**, ඇතිතාක්; **පිවිත්වා**, බී, **සරං**, ගෙදරට; **ආගන්ත්වා**, අවුත්; **උදධං කාතුං**, වමාරන්නට; **න සක්කොති එව**, නො හැකි වන්නේ ම ය; **අථො පන**, විරේක කිරීමට ද; **න**, නොහැකි වන්නේ ම ය; **සො**, හෙතෙම; **දුක්ඛාහි**, දුක් වූ; **තිබ්බාහි**, තියුණු වූ; **ඛරාහි**, රළු වූ; **කටුකාහි**, කටුක වූ; **වෙදනාහි**, වේදනාවන්ගෙන්; **ඵුට්ඨො**, ස්පර්ශ කරන ලද්දේ; **ආවට්ටති**, ඔබිනොබ පෙරළෙයි; **පරිවට්ටති**, හාත්පස පෙරළෙයි.

අථ ඛො, ඉක්බිති; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **පුබ්බණ්හසමයං**, පෙරවරුවෙහි; **නිවාසෙත්වා**, හැඳපෙරව; **පත්තචීවරං**, පාත්‍ර සිවුරු; **ආදාය**, රැගෙන; **සාවත්ථිං**, සැවැත්නුවරට; **පිණ්ඩාය**, පිඬු පිණිස; **පාවිසි**, පිවිසි සේක; **භගවා ඛො**, භාග්‍යවතුන් වහන්සේ වනාහි; **දුක්ඛාහි**,

දුක් වූ; **තිබ්බාහි**, තියුණු වූ; **බරාහි**, රළු වූ; **කටුකාහි**, කටුක වූ; **වෙදනාහි**, වේදනාවන්ගෙන්; **ඵුට්ඨං**, ස්පර්ශ කරන ලද; **තං පරිබ්බාජකං**, ඒ පිරිවැජියා; **අද්දසා**, දුටුසේක. **අථ ඛො**, ඉක්බිති; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **එතමත්ථං**, මේ කරුණ; **විදිත්වා**, දැන; **තායං වෙලයං**, එ වේලාවෙහි; **ඉමං උදානං**, මේ උදානය; **උදානෙසි**, උදන් ඇනූ සේක.

යෙ, යම් කෙනෙක්; **අකිඤ්චනා**, රාගාදි පළිබෝධ නැත්තාහු ද; (ඔවුහු) **වත**, ඒකාන්තයෙන්; **සුඛිනො**, සුවපත් වූවෝ වෙති; **වෙදගූනො හි ජනා**, චතුරාර්ය සත්‍යය අවබෝධ කළ රහත්හු; **අකිඤ්චනා**, රාගාදි කෙලෙස් රහිත වූවෝ ය; **ජනෙ**, ජනතෙම; **ජනසම්මිං**, ජනයා කෙරෙහි; **පටිබද්ධචිත්තෙනා**, බැඳීගිය සිතැත්තේ වේ. **සකිඤ්චනං**, කෙලෙස් සහිත වූවන්; **විහඤ්ඤමානං**, වෙහෙසෙන අයුරු; **පස්ස**, බලව.

අභ්‍යාස

01. පහත සඳහන් වාක්‍ය පාලියට නඟන්න.

i. එසමයෙහි එක්තරා රජ කෙනෙකුගේ තරුණ බිරිඳක් ගැබ් ගත්තී වැදීමට ආසන්න වූවා ය.
ii. සුමනා 'ඔබ යන්න පහන පත්තු කිරීම සඳහා තෙල් ගෙනෙන්න.'
iii. මම තෙල් ගෙනෙන්නේ කොහෙන් ද?
iv. එක්තරා තරුණයෙක් රෝගී වී දරුණු කටුක වේදනාවෙන් යුතුව වැළපෙයි.
v. බල්ලා තණකොළ ගොමුවෙහි ඒ මේ අත පෙරළෙයි.

02. පහත පදයන්ට අර්ථ විවරණ සපයන්න.

i. පරිබ්බාජකො
ii. රාජා පසෙනදි කොසලො
iii. වෙදගූනො
iv. සමණස්ස වා බ්‍රාහමණස්ස වා

03. බුද්ධකාලීන භාරතීය සමාජය පිළිබඳ ගබ්භිනී සූත්‍රය ඇසුරෙන් විස්තර කරන්න.

04. ගබ්භිනී සූත්‍රයෙන් ප්‍රකට වන තත්කාලීන සිරිත් විරිත් කවරේදැයි හඳුන්වා දෙන්න.

නන්දසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො සමඛහුලානං භික්ඛූනං එවමාරොචෙති; "අනභිරතො අහං ආවුසො බ්‍රහමචරියං චරාමි. න සක්කොමි බ්‍රහමචරියං සන්ධාරෙතුං, සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී"ති. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: "ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තො සමඛහුලානං භික්ඛූනං එවමාරොචෙති. 'අනභිරතො අහං ආවුසො බ්‍රහමචරියං චරාමි න සක්කොමි බ්‍රහමචරියං සන්ධාරෙතුං. සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී"ති. අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි; 'එහි ත්වං භික්ඛු, මම වචනෙන නන්දං භික්ඛුං ආමන්තෙහි 'සත්ථා තං ආවුසො නන්ද, ආමන්තෙතී"ති. "එවං භන්තෙ'ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා නන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං නන්දං එතදවොච: "සත්ථා තං ආවුසො නන්ද, ආමන්තෙතී"ති.

'එවමාවුසො'ති ඛො ආයස්මා නන්දො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං නන්දං භගවා එතදවොච; සච්චං කිර ත්වං නන්ද, සමඛහුලානං භික්ඛූනං එවමාරොචෙසි 'අනභිරතො අහං ආවුසො බ්‍රහමචරියං චරාමි. න සක්කොමි බ්‍රහමචරියං සන්ධාරෙතුං. සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී'ති. 'එවං භන්තෙ'ති. "කිස්ස පන ත්වං නන්ද, අනභිරතො බ්‍රහමචරියං චරසි? න සක්කොසි බ්‍රහමචරියං සන්ධාරෙතුං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සසී?'ති. "සාකියානී මං භන්තෙ ජනපදකල්‍යාණී සරා නික්ඛමන්තස්ස උපඩ්ඪුලලිඛිතෙහි කෙසෙහි අපලොකෙත්වා මං එතදවොච: 'තුවටං ඛො අය්‍යපුත්ත; ආගච්ඡෙය්‍යාසී'ති. සො ඛො අහං භන්තෙ තමනුස්සරමානො අනභිරතො බ්‍රහමචරියං චරාමි. න සක්කොමි බ්‍රහමචරියං සන්ධාරෙතුං. සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිස්සාමී"ති.

අථ ඛො භගවා ආයස්මන්තං නන්දං බාහාය ගහෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව ජෙතවනෙ අන්තරහිතො දෙවෙසු තාවතිංසෙසු පාතුරහොසි. තෙන ඛො පන සමයෙන පඤ්චමත්තානි අච්ඡරාසතානි සක්කස්ස දෙවානමින්දස්ස උපට්ඨානං ආගතානි හොන්ති කකුටපාදානි. අථ ඛො භගවා ආයස්මන්තං නන්දං ආමන්තෙසි: 'පස්සසි නො ත්වං නන්ද; ඉමානි පඤ්ච අච්ඡරාසතානි කකුටපාදානී?'ති. 'එවං භන්තෙ'ති. 'තං කිං මඤ්ඤසි නන්ද, කතමා නු ඛො අභිරූපතරා ච දස්සනීයතරා ච පාසාදිකතරා ච, සාකියානී වා ජනපදකල්‍යාණී, ඉමානි වා පඤ්ච අච්ඡරාසතානි කකුටපාදානී?'ති. 'සෙය්‍යථාපි භන්තෙ පලුට්ඨමක්කටී කණ්ණනාසච්ඡින්නා. එවමෙව ඛො භන්තෙ සාකියානී ජනපදකල්‍යාණී ඉමෙසං පඤ්චන්නං අච්ඡරාසතානං උපනිධාය සඞ්ඛම්පි න උපෙති, කලම්පි න උපෙති, කලභාගම්පි න උපෙති, උපනිධිම්පි න උපෙති. අථ ඛො ඉමානි පඤ්ච අච්ඡරාසතානි අභිරූපතරානි චෙව දස්සනීයතරානි ච පාසාදිකතරානි චා"ති. 'අභිරම නන්ද, අභිරම නන්ද, අහං තෙ පාටිභොගො පඤ්චන්නං අච්ඡරාසතානං පටිලාභාය කකුටපාදාන"න්ති. 'සචෙ

මෙ භන්තෙ භගවා පාටිභොගෙ පඤ්චන්නං අවිජ්ජාසන්තානං පටිලාභාය කකුටපාදානං, අභිරමිස්සාම'හං භන්තෙ භගවති බ්‍රහ්මචරියෙ"ති. අථ ඛො භගවා ආයස්මන්තං නන්දං බාහාය ගහෙත්වා සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව දෙවෙසු තාවතිංසෙසු අන්තරහිතො ජෙතවනෙ පාතුරහොසි. අස්සොසුං ඛො භික්ඛූ 'ආයස්මා කිර නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තෙතා අවිජ්ජානං හෙතු බ්‍රහ්මචරියං චරති, භගවා කිරස්ස පාටිභොගෙ පඤ්චන්නං අවිජ්ජාසන්තානං පටිලාභාය කකුටපාදාන'න්ති. අථ ඛො ආයස්මතො නන්දස්ස සහායකා භික්ඛූ ආයස්මන්තං නන්දං හතකවාදෙන ච උපක්කිතකවාදෙන ච සමුදාචරන්ති. 'හතකො කිරායස්මා නන්දො, උපක්කිතකො කිරා'යස්මා නන්දො, අවිජ්ජානං හෙතු බ්‍රහ්මචරියං චරති. භගවා කිරස්ස පාටිභොගෙ පඤ්චන්නං අවිජ්ජාසන්තානං පටිලාභාය කකුටපාදාන'න්ති. අථ ඛො ආයස්මා නන්දො සහායකානං භික්ඛූනං හතකවාදෙන ච උපක්කිතකවාදෙන ච අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්ස මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. 'ඛීණා ජාති; වුසිතං බ්‍රහ්මචරියං; කතං කරණීයං; නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච ඛො පනා'යස්මා නන්දො අරහතං අහොසි.

අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං එතදවොච: 'ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තෙතා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති. භගවතෝ'පි ඛො ඤාණං උදපාදි: 'නන්දො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති.

අථ ඛො ආයස්මා නන්දො තස්සා රත්තියා අච්චයෙන යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා නන්දො භගවන්තං එතදවොච: "යං මෙ භන්තෙ භගවා පාටිභොගෙ; පඤ්චන්නං අවිජ්ජාසන්තානං පටිලාභාය කකුටපාදානං. මුඤ්චාමහං භන්තෙ භගවන්තං එතස්මා පටිස්සවා"ති. මයාපි ඛො තෙ නන්ද චෙතසා චෙතො පරිච්ච විදිතො: "නන්දො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී"ති. දෙවතාපි මෙ එතමත්ථං ආරොචෙසි:'ආයස්මා භන්තෙ නන්දො භගවතො භාතා මාතුච්ඡාපුත්තෙතා ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති. යදෙව ඛො තෙ නන්ද අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තං, අථා'හං මුත්තෙතා එතස්මා පටිස්සවා'ති. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"යස්ස නිත්තිණ්ණා පඞ්කා ච මද්දිතො කාමකණ්ටකො,
මොහක්ඛයං අනුප්පත්තො සුබද්ධෙඛස්සු න වෙධති ස භික්ඛූ"ති.

නන්ද සූත්‍රය

එවං, මෙසේ; **මෙ**, මා විසින්; **සුතං**, අසන ලදී. **එකං සමයං**, එක් සමයෙක්හි; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **සාවත්ථියං**, සැවැත්නුවර; **ජේතවනෙ**, ජේතවන නම් වූ; **අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**, අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි; **විහරති**, වාසය කරන සේක. **තෙන ඛො පන සමයෙන**, එසමයෙහි වනාහි; **භගවතො භාතා**, භාග්‍යවතුන් වහන්සේගේ සොයුරු වූ; **මාතුඡාපුත්තෙතා**, සුළුමවගේ පුත්‍ර; **ආයස්මා නන්දෙ**, ආයුෂ්මත් නන්ද තෙර; **සම්බහුලානං භික්ඛූනං**, බොහෝ භික්ෂූන්ට; **එවං**, මෙසේ; **ආරොචෙති**, දන්වයි. "**ආවුසො**, ඇවැත්නි; **අහං**, මම; **අනභිරතො**; සස්නට ඇලුම් රහිත වූයේ; **බ්‍රහ්මචරියං**, බඹසර; **චරාමි**, හැසිරෙමි; **බ්‍රහ්මචරියං**, බඹසර; **සන්ධාරෙතුං**, උසුලන්නට; **න සක්කොමි**, නො හැක්කෙමි; **සික්ඛං**, ශික්ෂාව; **පච්චක්ඛාය**, හැරපියා; **හීනායාවත්තිස්සාමි**, ගිහි බවට යන්නෙමි;"**ඉති**, යනුවෙනි. **අථ ඛො**, ඉක්බිති; **අඤ්ඤතරො භික්ඛු**, එක්තරා භික්ෂුවක්; **යෙන භගවා**, භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද; **තෙන උපසඞ්කමි**, එතැනට එළඹියේ ය. **උපසඞ්කමිත්වා**, එළඹ; **භගවන්තං**, භාග්‍යවතුන් වහන්සේට; **අභිවාදෙත්වා**, වැඳ; **එකමන්තං**, එකත්පසක; **නිසීදි**, හුන්නේ ය; **එකමන්තං**, එකත්පසක; **නිසින්නො**, හුන්නාවූ; **සො භික්ඛු**, ඒ භික්ෂුව; **භගවන්තං**, භාග්‍යවතුන් වහන්සේට; **එතදවොච**, මෙය කීය; "**හන්තෙ**, ස්වාමීනි; **භගවතො**, භාග්‍යවතුන් වහන්සේගේ; **භාතා**, සහෝදරයා වූ; **මාතුඡාපුත්තෙතා**, සුළුමවගේ පුත්‍ර; **ආයස්මා නන්දෙ**, ආයුෂ්මත් නන්ද; **සම්බහුලානං භික්ඛූනං**, බොහෝ භික්ෂූන්ට; **එවං**, මෙසේ; **ආරොචෙති**, දන්වයි. "**ආවුසො**, ඇවැත්නි; **අහං**, මම; **අනභිරතො**, සසුනෙහි නො ඇලුනේ; **බ්‍රහ්මචරියං**, බඹසර; **චරාමි**, හැසිරෙමි; **බ්‍රහ්මචරියං**, බඹසර; **සන්ධාරෙතුං**, උසුලන්නට; **න සක්කොමි**, නො හැකි වෙමි; **සික්ඛං**, ශික්ෂාව; **පච්චක්ඛාය**, හැරපියා (ප්‍රතික්ෂේප කොට); **හීනායාවත්තිස්සාමි**, ගිහිබවට පෙරළෙන්නෙමි;"**ඉති**, යනුවෙනි. **අථ ඛො**, ඉක්බිති; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **අඤ්ඤතරං භික්ඛුං**, එක්තරා භික්ෂුවක්; **ආමන්තෙසි**, ඇමතූ සේක; "**භික්ඛු**, භික්ෂුව; **එහි**, එන්න. **ත්වං**, ඔබ; **මම වචනෙන**, මගේ වචනයෙන්; **නන්දං භික්ඛුං**, නන්ද භික්ෂුව; **ආමන්තෙහි**, අමතන්න;" "**ආවුසො නන්ද**, ඇවැත් නන්ද; **සත්ථා**, ශාස්තෘන් වහන්සේ; **තං**, ඔබ; **ආමන්තෙති**, අමතන සේක;"**ඉති**, යනුවෙනි; **සො භික්ඛු**, ඒ භික්ෂුව; "**එවං භන්තෙ ඉති**, එසේ ය" ස්වාමීනි යි; **භගවතො**, භාග්‍යවතුන් වහන්සේට; **පටිස්සුත්වා**, පිළිවදන් දී; **ආයස්මා නන්දෙ**, ආයුෂ්මත් නන්ද; **යෙන**, යම් තැනක ද; **තෙන උපසඞ්කමි**, එතනට එළඹියේ ය; **උපසඞ්කමිත්වා**, එළඹ; **ආයස්මන්තං නන්දං**, ආයුෂ්මත් නන්දට; **එතදවොච**, මෙය කීය;"**ආවුසො නන්ද**, ඇවැත් නන්දයෙනි; **සත්ථා**, ශාස්තෘන් වහන්සේ; **තං**, ඔබ; **ආමන්තෙති**, අමතන සේක;"**ඉති**, යනුවෙනි.

"**ආවුසො**, ඇවැත්නි; **එවං ඉති**, එසේ ය"යි; **ආයස්මා නන්දෙ**, ආයුෂ්මත් නන්ද; **තස්ස භික්ඛුනො**, ඒ භික්ෂුවට; **පටිස්සුත්වා**, පිළිතුරු දී; **යෙන භගවා**, භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද; **තෙන උපසඞ්කමි**, එතනට එළඹියේ ය; **උපසඞ්කමිත්වා**, එළඹ; **භගවන්තං**, භාග්‍යවතුන් වහන්සේට; **අභිවාදෙත්වා**, වැඳ; **එකමන්තං**, එකත්පසක; **නිසීදි**, හුන්නේ ය. **එකමන්තං**, එකත්පසක; **නිසින්නං**, හුන්නා වූ; **ආයස්මන්තං නන්දං**, ආයුෂ්මත් නන්දට; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **එතදවොච**, මෙය කීසේක; "**නන්ද**, නන්දයෙනි; **ත්වං**, ඔබ; **සම්බහුලානං භික්ඛූනං**, බොහෝ භික්ෂූන්ට; "**ආවුසො**, ඇවැත්නි; **අහං**, මම; **අනභිරතො**, සසුනෙහි නො ඇලුනේ; **බ්‍රහ්මචරියං**, බඹසර; **චරාමි**, හැසිරෙමි; **බ්‍රහ්මචරියං**, බඹසර

සන්ධාරෙතුං, උසුලන්නට; **න සක්කොමි**, නො හැක්කේ වෙමි; **සික්ඛං**, ශික්ෂාව; **පච්චක්ඛාය**, ප්‍රතික්ෂේප කොට; **හීනායාවත්තිස්සාමි ඉති**, ගිහි බවට පෙරළෙන්නෙමි'යි" එවං, මෙසේ; **ආරොචෙසි ඉති**, දන්වහි යන්න; **සච්චං කිර**, සත්‍යයක් ද?" "**හන්තෙ**, ස්වාමීනි; එවං, එසේ ය;" **ඉති**, යනු යි; "**නන්දෙ**, නන්දය, **තවං**, ඔබ; **කිස්ස පන**, කවර හෙයින්; **අනභිරතො**, සසුනේ නො ඇලුනේ; **බ්‍රහ්මචරියං**, බඹසර; **චරසි**, හැසිරෙහි ද; **බ්‍රහ්මචරියං**, බඹසර; **සන්ධාරෙතුං**, උසුලන්නට; **න සක්කොසි**, නො හැකි වෙහි ද; **සික්ඛං**, ශික්ෂාව; **පච්චක්ඛාය**, හැරදමා; **හීනායාවත්තිස්සසි**, ගිහිබවට පෙරළෙන්නෙහි ද?;" **ඉති**, යනුවෙනි; "**හන්තෙ**, ස්වාමීනි; **සාකියානී ජනපදකල්‍යාණී**, ශාක්‍යවංශික ජනපදකල්‍යාණිය; **භරා නික්ඛමන්තස්ස මං**, ගෙයින් නික්මෙන්නා වූ මට; **උපඩ්ඪුලිඛිතෙහි**, අඩක් පීරන ලද; **කෙසෙහි**, හිසකෙස් ඇතිව; මං, මාදෙස **අපලොකෙත්වා**, බලා; **එතදවොච**, මෙය කීවා ය; "**අය්‍යපුත්ත**, ස්වාමිපුත්‍රය; **තුවටං ඛො**, ඉක්මනින්ම; **ආගච්ඡය්‍යාසි**, එනු මැනවි;" **ඉති**, යනුවෙනි; "**හන්තෙ**, ස්වාමීනි; **සො ඛො අහං**, ඒ මම; **තං අනුස්සරමානො**, එය සිහි කරමින්; **අනභිරතො**, සසුනෙහි නො ඇලුනේ; **බ්‍රහ්මචරියං**, බඹසර; **චරාමි**, හැසිරෙමි; **බ්‍රහ්මචරියං**, බඹසර; **සන්ධාරෙතුං**, උසුලන්නට; **න සක්කොමි**, නො හැක්කෙමි; **සික්ඛං පච්චක්ඛාය**, ශික්ෂාව ප්‍රතික්ෂේප කොට; **හීනායාවත්තිස්සාමි**, ගිහි බවට පෙරළෙන්නෙමි;" **ඉති**, යනු යි.

අථ ඛො භගවා, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ; **ආයස්මන්තං නන්දං**, ආයුෂ්මත් නන්ද; **බාහාය ගහෙත්වා**, අතින් අල්ලාගෙන; **සෙය්‍යථාපි නාම**, යම්සේ නම්; **බලවා පුරිසො**, බලවත් පුරුෂයෙක්; **සම්මිඤ්ජිතං වා**, හකුළන ලද හෝ; **බාහං**, බාහුව; **පසාරෙය්‍ය**, දිගු කරන්නේ ද; **පසාරිතං වා**, දිගුකළා වූ හෝ; **බාහං**, බාහුව; **සම්මිඤ්ජෙය්‍ය**, හකුළුවන්නේ ද; **එවමෙව**, එසේම; **ජෙතවනෙ**, දෙව්රම් වෙහෙරෙහි; **අන්තරහිතො**, අතුරුදහන් වූයේ; **දෙවෙසු තාවතිංසෙසු**, තව්තිසා දෙව්ලොව; **පාතුරහොසි**, පහළ වූ සේක. **තෙන ඛො පන සමයෙන**, එසමයෙහි වනාහි; **කකුටපාදානි**, පරෙවි පා බඳු පා ඇති; **පඤ්චමත්තානි අච්ඡරාසතානි**, පන්සියයක් පමණ අප්සරාවන්; **සක්කස්ස දෙවානමින්දස්ස**, ශක්‍ර දේවේන්ද්‍රයන්ගේ; **උපට්ඨානං**, උපස්ථානයට; **ආගතානි හොන්ති**, ආවාහු වෙති; **අථ ඛො**, ඉක්බිති; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **ආයස්මන්තං නන්දං**, ආයුෂ්මත් නන්ද තෙරුන්; **ආමන්තෙසි**, ඇමතූ සේක; "**නන්දෙ**, නන්දය, **තවං**, ඔබ; **කකුටපාදානි**, පරෙවි පා බඳු පා ඇති; **පඤ්ච අච්ඡරාසතානි**, පන්සියයක් අප්සරාවන්; **පස්සසි නො**, දකින්නෙහි නොවේ ද?"; **ඉති**, යනුවෙනි; "**හන්තෙ**, ස්වාමීනි; එවං, එසේ ය;"**ඉති**, යනුවෙනි. "**නන්දෙ**, නන්දය; **තං කිං මඤ්ඤසි**, ඒ ගැන කුමක් සිතහි ද? **සාකියානි**, ශාක්‍යපුත්‍රී වූ; **ජනපදකල්‍යාණී වා**, ජනපදකල්‍යාණිය හෝ; **කකුටපාදානි**, පරෙවි පා බඳු පා ඇති; **ඉමානි**, මේ; **පඤ්ච අච්ඡරාසතානි**, අප්සරාවන් පන්සියය හෝ; **කතමා නු**, (මොවුන් අතරින්) කවරහු නම්; **අභිරූපතරා ච**, විශිෂ්ට රූපසම්පන්න වූවෝ ද; **දස්සනීයතරා ච**, වඩා දැකුම් කටයුත්තෝ ද; **පාසාදිකතරා ච**, පැහැදීම් එළවන්නෝ ද?;"**ඉති**, යනුවෙනි.

"**හන්තෙ**, ස්වාමීනි; **කණ්ණනාසවඤ්ඤනා**, කන් නාසා සිඳුණු; **පලුට්ඨකමක්කටී**, පිළිස්සුණු වැදිරිය; **සෙය්‍යථාපි**, යම්සේ වන්නී ද; **හන්තෙ**, ස්වාමීනි; **සාකියානී ජනපදකල්‍යාණී**, ශාක්‍යපුත්‍රී ජනපදකල්‍යාණිය ද; **එවමෙව**, එසේ ම ය; **ඉමෙසං**, මේ; **පඤ්චන්නං අච්ඡරාසතානං**, පන්සියයක් අප්සරාවන්ගේ; **උපනිධාය**, සමීපයෙහි ලා සැළකීමේදී; **සඞ්ඛං අපි**; **න උපෙති**, ගණනකටවත් නො එයි; **කලං අපි**, (සොළොස් වන

කලාවෙන්) එක් කලාවකට ද; **න උපෙති**, නො එයි; **කලභාගං අපි**, කලාවෙන් භාගයකට ද; **න උපෙති**, නො එයි; **උපනිධිං අපි**, සමීපයේ තැබීමට ද; **න උපෙති**, නො එයි; **අථ ඛො**, තව ද; **ඉමානි පඤ්ච අච්ඡරාසතානි**, මේ පන්සියයක් අප්සරාවෝ; **අභිරූපතරානි**, වඩා විශිෂ්ට රූ ඇත්තෝ ද; **දස්සනීයතරානි**, වඩා දැකුම්කලු වූවෝ ද; **පාසාදිකතරානි**, වඩා පැහැදීම් එළවන්නෝ ද වෙති;"**ඉති**, යනුවෙනි. "**නන්ද**, නන්දය; **අභිරම**, සසුනෙහි ඇලුම් කරව; **නන්ද**, නන්දය; **අභිරම**, සසුනෙහි ඇලුම් කරව; **අහං**, මම; **තෙ**, ඔබට; **කකුටපාදානං**, පරෙවි පා බඳු පා ඇති; **පඤ්චන්නං අච්ඡරාසතානං**, පන්සියයක් දෙවඟනන්; **පටිලාභාය**, ලබාදීම සඳහා; **පාටිභොගො**, ඇපවෙමි;" **ඉති**, යනුවෙනි. "**භන්තෙ**, ස්වාමීනි; **සචෙ**, ඉදින්; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **මෙ**, මට; **කකුටපාදානං**, පරෙවි පා බඳු පා ඇති; **පඤ්චන්නං අච්ඡරාසතානං**, පන්සියයක් අප්සරාවන්; **පටිලාභාය**, ලබාදීමට; **පාටිභොගො**, ඇපවන්නෝ නම්; **භන්තෙ**, ස්වාමීනි; **අහං**, මම; **භගවති**, භාග්‍යවතුන් වහන්සේ වෙත; **බ්‍රහ්මචරියෙ**, බඹසර රැක්මෙහි; **අභිරමිස්සාමි**, ඇලෙන්නෙමි;"**ඉති**, යනුවෙනි.

අථ ඛො, ඉක්බිති; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **ආයස්මන්තං නන්දං**, ආයුෂ්මත් නන්ද; **බාහාය ගහෙත්වා**, අතින් අල්ලා ගෙන; **සෙය්‍යථාපි නාම**, යම්සේ වනාහි; **බලවා පුරිසො**, බලවත් පුරුෂයෙක්; **සම්මිඤ්ජිතං වා**, හැකිළ වූ හෝ; **බාහං**, බාහුව; **පසාරෙය්‍ය**, දිගු කරන්නේ නම්; **පසාරිතං වා**, දිගු කළා වූ හෝ; **බාහං**, බාහුව; **සම්මිඤ්ජෙය්‍ය**, හකුළුවන්නේ නම්; **එවමෙව**, එපරිද්දෙන්; **දෙවෙසු තාවතිංසෙසු**, තව්තිසා දෙව්ලොවෙහි; **අන්තරහිතො**, අතුරුදහන්ව; **ජෙතවනෙ**, දෙව්රම් වෙහෙර; **පාතුරහොසි**, පහළ වූ සේක. **භික්ඛූ ඛො**, භික්ෂූන් වහන්සේලා වනාහි; "**භගවතො**, භාග්‍යවතුන් වහන්සේගේ; **භාතා**, සොයුරු වූ; **මාතුච්ඡාපුත්තො**, සුළුමවගේ පුත්‍ර වූ; **ආයස්මා නන්දො**, ආයුෂ්මත් නන්ද තෙරුන්; **අච්ඡරානං හෙතු**, අප්සරාවන් නිසා; **බ්‍රහ්මචරියං**, බඹසර; **චරති**, හැසිරේ; **භගවා කිර**, භාග්‍යවතුන් වහන්සේ වනාහි; **අස්ස**, ඔහුට; **කකුටපාදානං**, පරෙවි පා බඳු පා ඇති; **පඤ්චන්නං අච්ඡරාසතානං**, පන්සියයක් අප්සරාවන්; **පටිලාභාය**, ලබාදීමට; **පාටිභොගො ඉති**, ඇප වී යයි; **අස්සොසුං**, ඇසූහ." **අථ ඛො**, ඉක්බිති; **ආයස්මතො**, ආයුෂ්මත්; **නන්දස්ස**, නන්දගේ; **සහායකා භික්ඛූ**, යහළු භික්ෂූහු; **ආයස්මන්තං නන්දං**, ආයුෂ්මත් නන්ද තෙරුන්ට; **හතකවාදෙන ච**, බැල මෙහෙකරු යන වදනින් ද; **උපකකිතවාදෙන ච**, මිලදී ගැනීම් වාදයෙන් ද; **සමුදාචරන්ති**, ව්‍යවහාර කරති; "**ආයස්මා නන්දො**, ආයුෂ්මත් නන්ද; **හතකො**, බැලමෙහෙකරුවෙකි; **ආයස්මා නන්දො**, ආයුෂ්මත් නන්ද; **උපකකිතකො**, මිලදී ගනු ලැබූවෙකි; **අච්ඡරානං හෙතු**, අප්සරාවන් නිසා; **බ්‍රහ්මචරියං**, බඹසර; **චරති**, හැසිරෙයි; **භගවා කිර**, භාග්‍යවතුන් වහන්සේ වනාහි; **අස්ස**, ඔහුට; **කකුටපාදානං**, පරෙවි පා බඳු පා ඇති; **පඤ්චන්නං අච්ඡරාසතානං**, පන්සියයක් අප්සරාවන්; **පටිලාභාය**, ලබා දීමට; **පාටිභොගො**, ඇප වූවෝ ය;"**ඉති**, යනු යි.

අථ ඛො, ඉක්බිති; **ආයස්මා නන්දො**, ආයුෂ්මත් නන්ද තෙම; **සහායකානං භික්ඛූනං**, යහළු භික්ෂූන්ගේ; **හතකවාදෙන ච**, බැලමෙහෙකරු වාදයෙන් ද; **උපකකිතවාදෙන ච**, මිලදී ගැනීම් වාදයෙන් ද; **අට්ටීයමානො**, පෙළනු ලබන්නේ; **හරායමානො**, ලජ්ජාවට පත් කරනු ලබන්නේ; **ජිගුච්ඡමානො**, පිළිකුල් කරනු ලබන්නේ; **එකො වූපකට්ඨො**, හුදෙකලාව විවේකයෙන් යුතු වූයේ; **අප්පමත්තො**, අප්‍රමාදී වූයේ; **ආතාපී**, කෙලෙස් තවන වීර්යය ඇත්තේ; **පහිතත්තො**, නිවනට යොමු කළ සිත් ඇතිව; **විහරන්තො**, වසන්නේ; **යස්සත්ථාය**, යමක් සඳහා; **කුලපුත්තා**, කුලදරුවෝ; **සම්මදෙව**, මොනවට; **අගාරස්මා**, ගිහිගෙන්

නික්ම; **අනගාරියං**, අනගාරික වූවෝ; **පබ්බජන්ති**, පැවිදි වෙත් ද; **බ්‍රහ්මචරියපරියොසානං**, බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති **තං අනුත්තරං**, ඒ අනුත්තර වූ රහත්බව; **දිට්ඨේව ධම්මෙ**, මෙලොවදී ම; **සයං**, තෙමේ ම; **අභිඤ්ඤා සච්ඡිකත්වා**, නුවණින් දැන සාක්ෂාත් කොට; **උපසම්පජ්ජ**, නුවණින් ලැබ; **විහාසි**, වාසය කළේ ය; **ජාති**, පුනර්භවය; **ඛීණා**, ක්ෂීණ වීය; **බ්‍රහ්මචරියං**, බඹසර; **වුසිතං**, වැස නිමවන ලදී; **කරණීයං**, කළයුත්ත; **කතං** කරන ලදී; **ඉත්ථත්තාය**, රහත්බව පිණිස; **න අපරං**, වෙන කළ යුත්තක් නැත; **ඉති**, යනුවෙන්; **අබ්භඤ්ඤාසි**, දැනගත්තේ ය; **ආයස්මා නන්දො**, ආයුෂ්මත් නන්ද තෙම; **අඤ්ඤතරො ච ඛො පන අරහතං**, රහතුන් අතුරෙහි වනාහි එක්තරා කෙනෙක්; **අහොසි**, වීය.

අථ ඛො, ඉක්බිති; **අඤ්ඤතරා දෙවතා**, එක්තරා දෙවි කෙනෙක්; **අභික්කන්තාය රත්තියා**, සිත්ගන්නාසුලු රාත්‍රියක; **අභික්කන්තවණ්ණා**, සිත්ගන්නා වර්ණයෙන් යුතුව; **කෙවලකප්පං**, සම්පූර්ණ; **ජෙතවනං**, ජේතවනය; **ඔභාසෙත්වා**, බබුළුවා; **යෙන භගවා**, භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද; **තෙනුපසඞ්කමි**, එතැනට එළඹියේ ය; **උපසඞ්කමිත්වා**; එළඹ; **භගවන්තං**, භාග්‍යවතුන් වහන්සේට; **අභිවාදෙත්වා**, වැඳ; **එකමන්තං**, එකත්පස්ව; **අට්ඨාසි**, සිටියේ ය; **එකමන්තං**, එකත්පසක; **ඨිතා**, සිටියා වූ; **සා දෙවතා ඛො**, ඒ දෙවිතෙම වනාහි; **භගවන්තං**, භාග්‍යවතුන් වහන්සේට; **එතදවොච**, මෙය කීය. "**භන්තෙ**, ස්වාමීනි; **භගවතො භාතා**, භාග්‍යවතුන් වහන්සේගේ සොයුරු වූ; **මාතුච්ඡාපුත්තෙත්තා**, සුළුමවගේ පුත්‍ර වූ; **ආයස්මා නන්දො**, ආයුෂ්මත් නන්ද තෙම; **ආසවානං ඛයා**, ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන්; **අනාසවං**, කෙලෙස් රහිත; **චෙතොවිමුත්තිං**, චෙතෝ විමුක්තියට (සිත් කෙලෙස්වලින් නිදහස්වීමට); **පඤ්ඤාවිමුත්තිං**, ප්‍රඥා විමුක්තියට (ප්‍රඥාව නිසා කෙලෙසුන්ගෙන් මිදීමට) **සම පජ්ජ**, පැමිණ; **දිට්ඨේව ධම්මෙ**, මෙලොවදී ම; **සයං**, තෙමේ ම; **අභිඤ්ඤා**, නුවණින් දැන; **සච්ඡිකත්වා**, සාක්ෂාත් කොට; **විහරති ඉති**, වාසය කරයි" යනුවෙනි. **නන්දෙ**, නන්දෙ තෙමේ; **ආසවානං ඛයා**, ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන්; **අනාසවං**, කෙලෙස් රහිත; **චෙතොවිමුත්තිං**, චෙතෝ විමුක්තියට (සිත් කෙලෙස්වලින් නිදහස්වීමට); **පඤ්ඤාවිමුත්තිං**, ප්‍රඥා විමුක්තියට (ප්‍රඥාව නිසා කෙලෙසුන්ගෙන් මිදීමට) **සම්පජ්ජ**, පැමිණ; **දිට්ඨේව ධම්මෙ**, මෙලොවදී ම; **සයං**, තෙමේ ම; **අභිඤ්ඤා**, නුවණින් දැන; **සච්ඡිකත්වා**, සාක්ෂාත් කොට; **විහරති ඉති**, වාසය කරයි" **භගවතොපි ඛො**, භාග්‍යවතුන් වහන්සේට ද වනාහි; **ඤාණං** නුවණ; **උදපාදි** පහළ විය.

අථ ඛො, ඉක්බිති; **ආයස්මා නන්දො**, ආයුෂ්මත් නන්ද තෙම; **තස්සා රත්තියා අච්චයෙන**, ඒ රාත්‍රිය ඇවැමෙන්; **යෙන භගවා**, භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද; **තෙනුපසඞ්කමි**, එතනට එළඹියේ ය; **උපසඞ්කමිත්වා**, එළඹ; **භගවන්තං අභිවාදෙත්වා**, භාග්‍යවතුන් වහන්සේට වැඳ; **එකමන්තං**, එකත්පසෙක; **නිසීදි**, හුන්නේ ය; **එකමන්තං**, එකත්පසෙක; **නිසින්නො**, හුන්නා වූ; **ආයස්මා නන්දො**, ආයුෂ්මත් නන්ද තෙම; **භගවන්තං**, භාග්‍යවතුන් වහන්සේට; **එතදවොච**, මෙය කීය; "**භන්තෙ**, ස්වාමීනි; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **මෙ**, මට; **කකුටපාදානං**, පරෙවි පා බඳු පා ඇති; **පඤ්චන්නං අච්ඡරාසතානං**; අප්සරාවන් පන්සියයක්; **පටිලාභාය**, ලබා දීමට; **පාටිභොගො**, ඇප වූවෙහිය. **භන්තෙ**, ස්වාමීනි; **අහං**, මම; **භගවන්තං**, භාග්‍යවතුන් වහන්සේ; **එතස්මා පටිඤ්ඤවා**, එම පොරොන්දුවෙන්; **මුඤ්චාමි ඉති**, මුදවමි" යනුවෙනි; "**නන්ද**, නන්දය; **මයා අපි ඛො**, මා විසිනුදු වනාහි; **චෙතසා**, සිතින්; **තෙ**; ඔබගේ; **චෙතො**; සිතිවිල්ල; **පරිච්ච විදිතො**; දැනගන්නා ලදී; **නන්දො**; නන්ද තෙම; **ආසවානං ඛයා**, ආශ්‍රව ක්ෂය කොට; **අනාසවං**, කෙලෙස් රහිත වූයේ; **චෙතොවිමුත්තිං**,

චේතෝ විමුක්තියට; **පඤ්ඤාවිමුත්තිං**; ප්‍රඥාවිමුක්තියට **දිට්ඨෙව ධම්මෙ**; මෙලොවදී ම; **සයං**, තෙමේම; **අභිඤ්ඤා**, අභිඥාවන්; **සච්ඡිකත්වා**, සාක්ෂාත් කොට; **උපසම්පජ්ජ**, පැමිණ; **විහරති ඉති**, වාසය කරයි යනුවෙනි. "**භන්තෙ**, ස්වාමීනි; **භගවතො භාතා**, භාග්‍යවතුන් වහන්සේගේ සොයුරු වූ; **මාතුච්ඡාපුත්තෙනා**, සුළුමවගේ පුත්‍ර වූ; **ආයස්මා නන්දො**, ආයුෂ්මත් නන්ද තෙම; **ආසවානං ඛයා**, ආශ්‍රවක්ෂය කොට; **අනාසවං**, කෙලෙස් රහිත වූයේ; **චෙතොවිමුත්තිං**, චෙතොවිමුක්තියට; **පඤ්ඤාවිමුත්තිං**, ප්‍රඥාවිමුක්තියට; **දිට්ඨෙව ධම්මෙ**, මෙලොවදී ම; **සයං**, තෙමේම; **අභිඤ්ඤා**, අභිඥාවන් **සච්ඡිකත්වා**, සාක්ෂාත් කොට; **උපසම්පජ්ජ**, පැමිණ; **විහරති ඉති**, වාසය කෙරේ යයි **දෙවතා අපි**, දෙවියෙකුදු; **මෙ**, මට; **ආරොචෙසි**, දන්වීය. "**නන්ද**, නන්දය; **යදෙව**, යම් කලෙක; **තෙ චිත්තං**, ඔබගේ සිත; **අනුපාදාය**, කෙලෙස් රහිතව; **ආසවෙහි**, ආශ්‍රවයන්ගෙන්; **විමුත්තං**, මිදුනේ ද; **අථ**, එකල්හි **අහං**, මම; **එතස්මා පටිස්සවා**, මෙම පොරොන්දුවෙන්; **මුත්තෙනා**, මිදුනේ වෙමි'යි (භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.)

අථ ඛො, ඉක්බිති; **භගවා**, භාග්‍යවතුන් වහන්සේ; **එතං අත්ථං**, මේ කරුණ; **විදිත්වා**, දැන; **තායං වෙලායං**, එම වේලාවෙහි; **ඉමං උදානං**, මේ උදානය; **උදානෙසි**, උදන් ඇතූ සේක.

යස්ස, යමෙකු විසින් **පඛකො**, කෙලෙස් මඬවගුර; **නිත්තිණ්ණො**, තරණය කරන ලද්දේ ද; **කාමකණ්ටකො**, ක්ලේශකාම නැමැති කටු; **මද්දිතො**, මඩනා ලදද ද; **මොහක්ඛයං**, (යමෙක්) මොහක්ෂයට; **අනුප්පත්තෙනා**, පැමිණියේ ද; **සො භික්ඛු**, ඒ භික්ෂුව; **සුඛදුක්ඛසු**, සැපදුක් දෙකෙහි; **න වෙධති**, නො සැලේ.

අභ්‍යාස

01. පහත අර්ථය දෙන සූත්‍ර පාඨය උද්ධෘත කර ලියන්න.

i. ඇවැත්නි; මම සසුනට ඇල්මක් නැතිව බඹසර හැසිරෙමි.
ii. ආර්ය පුත්‍රය වහාම එන්න.
iii. නන්දයෙනි; ඔබ මේ අප්සරාවන් පන්සියය දක්නෙහි ද?
iv. ආයුෂ්මත් නන්ද තෙම බැල මෙහෙකරුවෙකි.
v. ස්වාමීනි; මම භාග්‍යවතුන් වහන්සේ එම පොරොන්දුවෙන් මුදවමි.

02. සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න. අර්ථය ද ලියන්න.

(භික්ඛූනං, භික්ඛ, භික්ඛු, බ්‍රහ්මචරියං, ත්වං, පවඛඛාය, පාටිහොගො, අවජරාසතානං)

i. න සක්කොමි ..... සන්ධාරෙතුං.
ii. එහි ත්වං ..... මම වචනෙන නන්දං ..... ආමන්තෙහි.
iii. සච්චං කිර ..... නන්ද සම්බහුලානං ..... එවමාරොචෙසි.
iv. සික්ඛං ..... හිනායාවත්තිස්සාමි.
v. අහං තෙ ..... පඤ්ඤනනං ..... පටිලාභාය.

03. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කස්ස පන භික්ඛුනො අනභිරතො පාතුරහොසි?
ii. කො නන්දං බාහාය ගහෙත්වා දෙවලොකං අගමාසි?
iii. නන්දො තාවතිංසෙසු කානි අපස්සි?
iv. නන්දො කස්ස භාතා අහොසි?
v. නන්දස්ස සහායකා භික්ඛූ නන්දං කථං සමුදාචරිංසු?

04. පහත සඳහන් අර්ථය දෙන පාලි වාක්‍යාංශය සූත්‍රයෙන් තෝරා ලියන්න.

i. පුළුටු වැඳිරිය
ii. අඩක් පීරූ කෙස් ඇතිව
iii. පරවි පා බඳු පා ඇති
iv. ගිහිබවට යන්නෙමි
v. ළඟින් තැබීමට නොසුදුසු ය
vi. පොරොන්දුව
vii. විකුණාගනු ලැබූවෙකි
viii. ඇපවීම

05. විවරණ සපයන්න.

i. බ්‍රහ්මචරියං
ii. අභිඤ්ඤා සච්ඡිකත්වා
iii. බීණා ජාති
iv. දෙවෙසු තාවතිංසෙසු
v. සාවත්ථියං

06. සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. පළමු අවස්ථාවේ දී නන්ද තෙරුන්ගේ ජනපද කල්‍යාණිය පිළිබඳ ආකල්පය විස්තර කරන්න.
ii. නන්ද තෙරුන් දෙවඟනන් දුටු පසු ජනපද කල්‍යාණිය පිළිබඳ දක්වන ලද ආකල්පය විස්තර කරන්න.
iii. නන්ද සූත්‍රයේ ඇතුළත් චරිත ගණන නම් කරන්න.
iv. දෙවඟනන් පතා මහණදම් කරන නන්ද තෙර ඔබ යැයි උපකල්පනය කොට ඔබට දොස් නගන යහළුවන්ගේ කියමන් ලියා දක්වන්න.
v. නන්ද තෙරුන්ගේ කථාව තේමා කොට රචිත නිර්මාණ එකතු කරන්න. (පොත් / ගීත / චිත්‍ර)

07. නන්ද සූත්‍රය ආශ්‍රයෙන් පාලි සංවාදයක් ලියන්න.

සත්තරසමො පාඨො

අපදානපාළි

බුද්දකනිකායට අයත් ග්‍රන්ථ මාලාවේ තෙළෙස් වන ග්‍රන්ථය අපාදානපාළියයි. පූර්වයේ කරන ලද කුශලානුභාවයෙන් ජනිත වූ උදාර චරිතයක් පූර්වේනිවාසානුස්මෘතියෙන් හෙවත් පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණින් දැක අතීත වෘත්තාන්ත වශයෙන් ගෙනහැර දැක්වීම අපදාන ශබ්දයේ අර්ථය යි. අපදාන ශබ්දය කරණ, ග්‍රහණ, අපගමන, පටිපාටි, ආක්‍රෝෂණ යනාදි අර්ථ කීපයක වැටෙයි. මෙහි අපදාන ශබ්දය වැටෙනුයේ කරණාර්ථයේ ය. ඒ අනුව බුදුවරුන්ගේ අපදානයෝ බුද්ධාපදානයෝ ය. බුද්ධකාරක නම් පාරමිතා ධර්ම ඒ අනුව සම්බුදු, පසේබුදු, මහරහත් යන ආර්යයන් වහන්සේලාගේ මුලින්වූ පාරමිතා පිරීමේ සිද්ධියට වූ කාරණය අපදානය නම් වේ.

නවාංගසත්ථුසාසනයෙහි ගාථාංගයෙහි ලා අපදාන ඇතුළත් කෙරේ. නවාංග සත්ථුසාසනය යනු බුද්ධවචනය වර්ගීකරණය කළ ඉපැරැණි ක්‍රමයකි. අර්ථකථාචාර්යයන් වහන්සේලාගේ විග්‍රහයට අනුව නවාංගසත්ථුසාසනය මෙසේ ය. **සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල** යනුවෙනි.

අපදාන ප්‍රධාන වශයෙන් කොටස් 04 කි.

1. **බුද්ධාපදාන**
2. **පච්චෙක බුද්ධාපදාන**
3. **ථෙරාපදාන**
4. **ථෙරී අපදාන** වශයෙනි.

අපදානපාළියෙහි වර්ග 65 ක් පමණ වේ. අපදාන 592 ක් ඇත. ගාථා 7619 ක් ඇත. බුද්ධාපදාන 1 ක් පච්චෙක බුද්ධාපදාන 1 ක් ථෙරාපදාන 550 ක් හා ථෙරී අපදාන 40 ක් මෙහි ඇතුළත් ය. සම්පූර්ණ අපදානපාළිය පද්‍යයෙන් රචනා වී ඇත.

අපදානපාළිය ථෙර ථෙරීන්ගේ අතීත චරිත කථා දක්වනු පිණිස රචනා වී ඇත. ථෙර ථෙරීගාථාවන්හි ප්‍රධානත්වය ලැබී ඇත්තේ ථෙර ථෙරීන්ගේ වර්තමාන චරිත සම්බන්ධ සිද්ධීන් පැහැදිලි කිරීමට ය. ගිහි ජීවිත යේ දුක්බර සිද්ධි, ඒවායෙන් අතමිදී පැවිද්ද ලැබීම, පැවිද්දේ ඇති නිරාමිස ප්‍රීතිය එහි විස්තර වේ. අපදානපාළියෙහි විස්තර වන්නේ වර්තමාන චරිතයේ ප්‍රභවයට හේතු වූ අතීත භවයන්හි කළ කුශලාකුශල ක්‍රියාවන් ය. වර්තමාන චරිත සිද්ධි ද විස්තර වේ. සර්වාස්තිවාදී නිකායෙහි **අවදානශතක, දිව්‍යාවදාන** වැනි ග්‍රන්ථවල ද බුද්ධ කාලීන හා පශ්චාත්කාලීන තෙරවරුන්ගේ චරිත අන්තර්ගත වෙයි.

ථෙරී අපදාන හා ගෝතමී ථෙරී අපදානය

ථෙරී අපදානය වර්ග 4 කින් හා අපදාන 40 කින් සමන්විත ය. එහි වර්ග 4 මෙසේ ය.

1. **සුමෙධා වර්ගය**
2. **එකුපොසථික වර්ගය**
3. **කුණ්ඩලකෙසී වර්ගය**
4. **ඛත්තියා වර්ගය** වශයෙනි.

ඉන් මහා ප්‍රජාපතී ගෝතමී අපදානය ඇතුළත් වන්නේ එකුපෝසථික වර්ගයට ය. එම වර්ගයට අපදාන 10 ක් අයත් වේ.

1. **එකුපොසථිකාපදානය**
2. **සලලපුපඵිකාපදානය**
3. **මොදකදායිකාපදානය**
4. **එකාසනදායිකාපදානය**
5. **පඤ්චදීපදායිකාපදානය**
6. **සලමාලිකාපදානය**
7. **මහාප්‍රජාපතීගොතමී අපදානය**
8. **ඛෙමා අපදානය**
9. **උපපලවණ්ණාපදානය**
10. **පටාචාරාපදානය** වශයෙනි.

මින් 7 වන මහාපජාපතී අපදානයට ගාථා 190 ක් අයත්වේ. එහි අන්තර්ගතය සංක්ෂිප්ත වශයෙන් මෙසේ ය.

- බුදුරදුන් විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩ වසන විට ප්‍රජාපතී ගෝතමී තෙරණිය ඇතුළු 500 ක් තෙරණීන්ට පරිනිර්වාණය සඳහා සිතුවිලි පහළවීම.
- එවිට භූමිකම්පා, නොකල් වැසි ආදිය ඇතිවීම.
- රහත් නොවූ ඇයගේ, වැළපීම්, ඉල්ලීම් ආදි තොරතුරු.
- බුදුරදුන් වෙත ගොස් වැරදිවලට සමාව ඉල්ලා පරිනිර්වාණය සඳහා අවසර ගැනීම.
- නන්ද, ආනන්ද, රාහුලාදි තෙරවරුන්ට පරිනිර්වාණය දන්වා සිටීම.
- ආනන්ද තෙරුන්ගේ වැළපීම.
- මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය රහත් බව ලැබ පෙළහර පෑ අයුරු.
- පදුමුත්තර බුදුන් සමයෙහි භික්ෂුණියක් චිරරාත්‍රඥ අග්‍ර තනතුරෙහි තබනු දැක ප්‍රාර්ථනා කිරීම.
- සසර කුසල් කොට දෙව්ලොව ශක්‍රයාගේ අගමෙහෙසිය වීම.
- බුදුන් දොරකොටුව තෙක් ජනකාය සමඟ ගෝතමිය අනුව යාම.

- ගෝතමී තෙරණිය ඇතුළු 500 ක් තෙරණිවරුන්ගේ පරිනිර්වාණය.
- මහී කම්පා වීම් ආදි ආශ්චර්යයන් සිදුවීම.
- ගෝතමී තෙරණිය ඇතුළු තෙරණිවරුන්ගේ ආදාහන පූජාව

මෙම තොරතුරු ඉතා විසිතුරු ලෙසත් සංවේග ජනක ලෙසත් පාලි ගාථාවන්ගෙන් ඉදිරිපත් කෙරේ.

අභ්‍යාස

i. 'අපදාන' යන්නෙහි අර්ථය ලියන්න.
ii. අපදානපාළිය ඛුද්දක නිකායේ කී වැනි ග්‍රන්ථය ද?
iii. අපදානවර්ග කීය ද? ඒ මොනවා ද?
iv. අපදානපාළියෙහි ඇතුළත් සියලු අපදාන සංඛ්‍යාව කීය ද?
v. අපදානපාළියෙහි ඇතුළත් ගාථා ගණන කීය ද?
vi. අපදානපාළියෙහි අටුවාවෙහි නම කුමක් ද?
vii. අපදානඨකථාවේ කතුවරයා කවුද?
viii. අපදානපාළියෙහි ථෙරී අපදාන කීයක් ඇතුළත් ද?
ix. 'නවාංගසත්ථුසාසනය' නම් කරන්න.
x. මහා ප්‍රජාපතී ගෝතමී අපදානයෙහි ඇතුළත් ගාථා ගණන කීය ද?

අට්ඨාරසමෝ පාඨෝ

මහාපජාපතිගොතමී අපදානං

01. එකදා ලොකපජ්ජොතො වෙසාලියං මහාවනෙ,
කූටාගාරෙ සුසාලායං වසතෙ නරසාරථී.

02. තදා ජිනස්ස මාතුච්ඡා මහාගොතමී භික්ඛුනී,
තහිං කතෙ පුරෙ රමෙම වසී භික්ඛුනුපස්සයෙ.

03. භික්ඛුනීහි විමුත්තාහි සතෙහි සහ පඤ්චහි,
රහොගතාය තස්සෙවං චිත්තස්සා'සි විතක්කිතං.

04. "බුද්ධස්ස පරිනිබ්බාණං සාවකගගයුගස්ස වා
රාහුලා,නන්දනන්දානං නාහං ලච්ඡාමි පස්සිතුං.

05. පටිගච්චා,යුසඩ්ඩාරෙ ඔස්සජ්ජාන නිබ්බුතිං,
ගච්ඡෙය්‍යං ලොකනාථෙන අනුඤ්ඤාතා මහෙසිනා."

06. තථා පඤ්චසතානම්පි භික්ඛුනීනං විතක්කිතං,
ආසි බෙමාදිකානම්පි එතදෙව විතක්කිතං.

07. භූමිචාලො තදා ආසි නාදිතා දෙවදුන්දුභි,
උපස්සයා'ධිවත්ථායො දෙවතා සොකපීළිතා,
විලපන්තා සකරුණං තත්ථ'ස්සූනි පවත්තයුං.

08. මිත්තා භික්ඛුනියො තා හි උපගන්ත්වාන ගොතමිං,
නිපච්ච සිරසා පාදෙ ඉදං වචනමබ්‍රවුං:

09. "තත්ථ තොයලවාසිත්තා මයමය්‍යෙ රහොගතා
සාචලා චලිතා භූමි නාදිතා දෙවදුන්දුභි,
පරිදෙවා ච සූයන්ති කිමත්ථං නූන ගොතමී."

10. තදා අවොච සා සබ්බං යථා පරිවිතක්කිතං,
තායො'පි සබ්බා ආහංසු යථා පරිවිතක්කිතං.

11. "යදි තෙ රුචිතං අය්‍යෙ නිබ්බාණං පරමං සිවං,
නිබ්බායිස්සාම සබ්බාපි බුද්ධා'නුඤ්ඤාය සුබ්බතෙ.

12. මයං සහා'ව නිකඛන්තා සරාපි ච භවාපි ච
සහයෙව ගමිස්සාම නිබ්බාණපුරමුත්තමං.

13. නිබ්බානාය වජන්තීනං කිං වක්ඛාමීති සා වදං
සහ සබ්බාහි නිගඝඡී භික්ඛුනීනිලයා තදා.

14. උපඩ්ඪයෙ යා'ධිවත්ථා දෙවතා තා ඛමන්තු මෙ,
භික්ඛුනීනිලයසෙසදං පඨිමං දස්සනං මම.

15. න ජරා මච්චු වා යත්ථ අප්පියෙහි සමාගමො,
පියෙහි විප්පයොගෝ'ති තං වජිස්සං අසඞ්ඛතං.

16. අවීතරාගා තං සුත්වා වචනං සුගතොරසා,
සොකට්ටා පරිදෙවිංසු අහො නො අප්පපුඤ්ඤතා.

17. භික්ඛුනීනිලයො සුඤ්ඤා, භූතො තාහි විනා අයං,
පභාතෙ විය තාරායො න දිස්සන්ති ජිනොරසා.

18. නිබ්බානං ගොතමී යාති සතෙහි සහ පඤ්ඤහි,
නදීසතෙහිව සහ ගඞ්ගා පඤ්ඤහි සාගරං.

19. රථිකාය වජන්තිං තං දිස්වා සද්ධා උපාසිකා,
සරා නිකඛමම පාදෙසු නිපච්ච ඉදමබ්‍රවුං.

20. "පසීදස්සු මහාභොගෙ අනාථායො විහාය නො,
තයා න යුත්තං නිබ්බාතුං" ඉච්චට්ටං විලපිංසු තා.

21. තාසං සොකපහාණත්ථං අවොච මධුරං ගිරං,
"රුදිතෙන අලං පුත්තා හාසකාලෝ'යමජ්ජ වො.

22. පරිඤ්ඤාතං මයා දුක්ඛං දුක්ඛහෙතු විවජ්ජිතො,
නිරොධො මෙ සච්ඡිකතො මග්ගො චාපි සුභාවිතො.

23. පරිචිණ්ණා මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

24. යස්සත්ථාය පබ්බජිතා අගාරස්මානගාරියං,
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසඤ්ඤොජනක්ඛයො.

25. බුද්ධා තස්ස ච සද්ධම්මො අනූනො යාව තිට්ඨති,
නිබ්බාතුං තාව කාලෝ මෙ මා මං සොචථ පුත්තිකා.

26. කොණ්ඩඤ්ඤානන්දනාදී තිට්ඨන්ති රාහුලෝ ජිනෝ,
සුබිතෝ සහිතෝ සඞ්ඝා හතදප්පා ච තිත්ථියා.

27. ඔක්කාකවංසස්ස යසෝ උස්සිතෝ මාරමද්දනෝ,
නනු සම්පති කාලෝ මේ නිබ්බානත්ථාය පුත්තිකා.

28. චිරප්පභුති යං මයහං පත්ථිතං අජ්ජ සිජ්ඣතෙ,
ආනන්ද හෙරිකාලෝ'යං කිං වෝ අස්සූහි පුත්තිකා.

29. සචෙ මයි දයා අත්ථි යදි වත්ථි කතඤ්ඤුතා,
සද්ධම්මට්ඨිතියා සබ්බා කරොථ විරියං දළ්හං.

30. ථීනං අදාසි පබ්බජ්ජං සම්බුද්ධා යාචිතෝ මයා,
තස්මා යථා'හං නන්දිස්සං තථා තමනුතිට්ඨථ.

31. තා එවමනුසාසිත්වා භික්ඛුනීහි පුරක්ඛතා,
උපෙච්ච බුද්ධං වන්දිත්වා ඉදං වචනමබ්‍රවි.

32. "අහං සුගත මාතා තෙ ත්වං ච වීර පිතා මම,
සද්ධම්මසුබදෝ නාථ තයා ජාතම්හි ගොතම.

33. සංවඩ්ඪිතෝ'යං සුගත රූපකායෝ මයා තව,
අනින්දියෝ ධම්මකායෝ මම සංවඩ්ඪිතෝ තයා.

34. මුහුත්ත'තණ්හාසමනං බීරං ත්වං පායිතෝ මයා,
තයා'හං සන්තමවචනත්තං ධම්මබීරං හි පායිතා.

35. වද්ධනරක්ඛනෙ මයහං අනණෝ ත්වං මහාමුනෙ,
පුත්තකාමා ථීයෝ යා තා ලභන්තු තාදිසං සුතං,

36. මන්ධාතාදිනරින්දානං යා මාතා සා භවණ්ණවෙ,
නිමුග්ගා'හං තයා පුත්ත තාරිතා භවසාගරා.

37. රක්ඛෙය්‍යා මාතා මහෙසීති සුලභං නාමමිත්ථීනං,
බුද්ධමාතාති යං නාමං එතං පරමදුල්ලභං.

38. තඤ්ච ලද්ධං මයා වීර පණිධානං මමං තයා,
අණුකං වා මහන්තං වා තං සබ්බං පූරිතං මයා.

39. පරිනිබ්බාතුමිච්ඡාමි විහායෙමං කලෙබරං,
අනුජානාහි මෙ වීර දුක්ඛන්තකර නායක.

40. චක්කඞ්කුසධජාකිණ්ණ පාදෙ කමලකොමලෙ,
පසාරෙහි පණාමං තෙ කරිස්සං පුත්තපෙමසා.

41. සුවණ්ණරාසිසංකාසං සරීරං කුරු පාකටං,
කත්වා දෙහං සුදිට්ඨං තෙ සන්තිං ගච්ඡාමි නායක''.

42. දවත්තිංසලක්ඛණූපෙතං සුප්පභාලඞ්කතං තනුං
සඤ්ඣාඝනාව බාලක්කං මාතුච්ඡං දස්සයී ජිනො.

43. ථුල්ලාරවින්දසඞ්කාසෙ තරුණාදිච්චසප්පභෙ,
චක්කඞ්කිතෙ පාදතලෙ තතො සා සිරසා පති.

44. "පණමාමි නරාදිච්චං ආදිච්චකුලකෙතුකං,
පච්ඡිමෙ මරණෙ මය්හං න තං ඉක්ඛාමහං පුනො.

45. ඉත්ථියො නාම ලොකගග සබ්බදොසකරා මතා,
යදි කො චත්ථි දොසො මෙ ඛමස්සු කරුණාකර.

46. ඉත්ථිකානඤ්ච පබ්බජ්ජං යමහං යාචිං පුනප්පුනං,
තත්ථ වෙ අත්ථි දොසො මෙ තං ඛමස්සු නරාසභ."

47. මයා භික්ඛුනියො වීර තවානුඤ්ඤාය සාසිතා,
තත්ර වෙ අත්ථි දුනීතං තං ඛමස්සු ඛමාධිප.

48. "අක්ඛනෙත නාම බන්ධබ්බං කිං භවෙ ගුණභූසනෙ,
කිමුත්තරං තෙ වක්ඛාමි නිබ්බානාය වජන්තියා.

49. සුදෙධ අන්නෙ මම භික්ඛුසඞ්ඝ - ලොකා ඉතො නිස්සරිතුං කමන්ත,
පභාතකාලෙ ව්‍යසනං ගහානං - දිස්වාන නිය්‍යාති ච චන්දලෙඛා.

50. තදෙතරා භික්ඛුනියො ජිනගගං - තාරාව චන්දානුගතා සුමෙරුං,
පදක්ඛිණං කත්ව නිපච්ච පාදෙ - ඨිතා මුඛන්තං සමුදික්ඛමානා.

51. "න තිත්තපුබ්බං තව දස්සනෙන - චක්ඛුං න සොතං තව භාසිතෙන,
චිත්තං මමං කෙවලමෙකමෙව - පප්පුය්‍ය තං ධම්මරසෙන තිත්තිං,

52. නදතො පරිසාය තෙ වාදිදප්පාපහාරිනො,
යෙ තෙ දක්ඛන්ති වදනං ධඤ්ඤා තෙ නරපුඞ්ගව.

53. දීඝඞ්ගුලී තම්බනඛෙ සුභෙ ආයතපණ්හිකෙ,
යෙ පාදෙ පණමිස්සන්ති තෙපි ධඤ්ඤා ගුණාධර,

54. මධුරානි පහට්ඨානි දොසඝඝානි හිතානි ච,
යෙ තෙ වාක්‍යානි සොඝඝනති තෙපි ධඤඤා නරුත්තම.

55. ධඤඤා'හං තෙ මහාවීර පාදපූජනතපපරා,
තිණණසංසාරකනතාරා සුවාක්‍යෙන සිරීමතො."

56. තතො සා අනුසාසෙත්වා භික්ඛුසඞඝමපි සුබබතා,
රාහුලානඤනනෙ ච වන්දිත්වා ඉදමබ්‍රවි.

57. "ආසීවිසාලයසමෙ රොගාවාසෙ කලෙබරෙ,
නිබ්බිනනා දුකඛසංඝාතෙ ජරාමරණගොචරෙ

58. නානාකලිමලාකිණණෙ පරායතෙත නිරීහකෙ,
තෙන නිබබාතුමිච්ඡාමි අනුමඤඤථ පුත්තකා."

59. නන්දො රාහුලභදෙදා ච වීතසොකා නිරාසවා,
ඨිතාචලට්ඨිතිරීරා ධමමතං අනුචිනතයුං.

60. ධීරත්ථු සඞඛතං ලොලං අසාරං කදලූපමං,
මායාමරීචිසදිසං ඉත්තරං අනවට්ඨිතං.

61. යත්ථ නාම ජිනඝසා'යං මාතුච්ඡා බුද්ධපොසිකා,
ගොතමී නිධනං යාති අනිචචං සබබසඞඛතං.

62. ආනන්දො ච තදා සෙඛො සොකට්ටා ජිනවච්ඡලො,
තත්ථඝසූනි ධරන්නෙතා සො කරුණං පරිදෙවති.

63. "හා සන්තිං ගොතමී යාති නූන බුද්ධොපි නිබ්බුතිං,
ගච්ඡති න චිරෙනෙව අග්ගිරිව නිරින්ධනො."

64. එවං විලපමානං තං ආනන්දං ආහ ගොතමී.
"සුතිසාගර ගම්භීර බුද්ධුපට්ඨානතපපර.

65. න යුත්තං සොචිතුං පුත්ත හාසකාලෙ උපට්ඨිතෙ,
තව මෙ සරණං පුත්ත නිබ්බානං සමුපාගතං.

66. තයා තාත සමජ්ඣිට්ඨා පබ්බජ්ජං අනුජානි නො,
මා පුත්ත විමනො හොහි සඵලො තෙ පරිඝසමො.

67. යං න දිට්ඨං පුරාණෙහි තිත්ථිකාචරියෙහි පි,
තං පදං සුකුමාරීහි සත්තවඝසාහි වෙදිතං.

68. බුද්ධසාසනපාලෙතා පච්ඡිමං දස්සනං තව,
තත්ථ ගච්ඡාමහං පුත්ත ගතෝ යත්ථ න දිස්සතෙ''.

69. කදාචි ධම්මං දෙසෙන්තෝ බිපි ලොකගගනායකෝ,
තදාහං ආසිංසවචං අවොචං අනුකම්පිකා.

70. "චිරං ජීව මහාවීර කප්පං තිට්ඨ මහාමුනෙ,
සබ්බලොකස්ස අත්ථාය භවස්සු අජරාමරෝ."

71. තං තථාවාදිනිං බුද්ධෝ මමං සෝ එතදබ්රවි
"න හෙවං වන්දියා බුද්ධා යථා වන්දසි ගොතමී."

72. "කථං චරහි සබ්බඤ්ඤූ වන්දිතබ්බා තථාගතා,
කථං අවන්දියා බුද්ධා තං මෙ අක්ඛාහි පුච්ඡිතෝ."

73. "ආරද්ධවිරියෙ පහිතත්තෙ නිච්චං දළ්හපරක්කමෙ,
සමග්ගෙ සාවකෙ පස්සෙ එසා බුද්ධානවන්දනා."

74. තතෝ උපස්සයං ගන්ත්වා එකිකාහං විචින්තයිං,
සමගගං පරිසං නාථෝ රොචෙති තිභවන්තගෝ.

75. හන්දාහං පරිනිබ්බිස්සං මා විපත්තිං තමද්දසං,"
එවාහං චින්තයිත්වාන දිස්වාන ඉසිසත්තමං.

76. පරිනිබ්බානකාලං මෙ ආරොචෙසිං විනායකං,
තතෝ සෝ සමනුඤ්ඤාසි "කාලං ජානාහි ගොතමී."

77. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගීව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවා.

78. සුආගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සෝ විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

79. පටිසම්භිදා චතස්සෝ ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

80. ථීනං ධම්මාභිසමයෙ යෙ බාලා විමතිං ගතා,
තෙසං දිට්ඨිපහානත්ථං ඉද්ධිං දස්සෙසි ගොතමී.

81. තදා නිපච්ච සම්බුද්ධං උප්පතිත්වාන අම්බරං,
ඉද්ධී අනෙකා දස්සෙසි බුද්ධානුඤ්ඤාය ගොතමී,

82. එකිකා බහුධා ආසි බහුකා චෙකිකා තථා,
ආවීභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොනගං.

83. අසජ්ජමානා අගමා භූමියම්පි නිමුජ්ජථ,
අභිජ්ජමානෙ උදකෙ අගඤ්ඡි මහියා යථා.

84. සකුණීව යථාකාසෙ පල්ලඞ්කෙන ගමී තදා,
වසං වත්තෙසි කායෙන යාව බ්‍රහ්මනිවෙසනං.

85. සිනෙරුං දණ්ඩං කත්වාන ඡත්තං කත්වා මහාමහිං
සමූලං පරිවත්තෙත්වා ධාරෙන්තී චඞ්කමී නහෙ.

86. ඡසූසූරොදයකාලෙව ලොකඤ්චාකාසි ධූමිකං,
යුගන්තෙ විය ලොකං සා ජාලාමාලාකුලං අකා.

87. මුචලින්දං මහාසෙලං මෙරු මන්දාර දද්දරෙ,
සාසපෙරිව සබ්බානි එකෙනගගහි මුට්ඨිනා.

88. අඞ්ගුලගෙගන ඡාදෙසි භාකරං සනිසාකරං,
චන්දසූරසහස්සානි ආවෙලම්ව ධාරයී.

89. චතුසාගරතොයානි ධාරයී එකපාණිනා,
යුගන්තජලදාකාරං මහාවස්සං පවස්සයී.

90. චක්කවත්තිං සපරිසං මාපයී සා නහත්ථලෙ,
ගරුළං දවිරදං සීහං විනදන්තං ච දස්සයී.

91. එකිකා අභිනිම්මිත්වාපපමෙය්‍යං භික්ඛුනීගණං,
පුන අන්තරධාපෙත්වා එකිකා මුනිමබ්‍රවී

92. "මාතුච්ඡා තෙ මහාවීර තවසාසනකාරිකා,
අනුපපත්තා සකං අත්ථං පාදෙ වන්දති චක්ඛුම."

93. දස්සෙත්වා විවිධා ඉද්ධී ඔරොහිත්වා නහත්ථලා,
වන්දිත්වා ලොකපජ්ජොතං එකමන්තං නිසීදි සා.

94. "සා වීසංවස්සසතිකා ජාතියාහං මහාමුනෙ,
අලමෙත්තාවතා වීර නිබ්බායිස්සාමි නායක."

95. තදා'තිවිම්හිතා සබ්බා පරිසා සා කතඤ්ජලී,
අවොච'ය්‍යෙ කථං ආසි අතුලිද්ධිපරක්කමා.

96. පදුමුත්තරෝ නාම ජිනෝ සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතෝ සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකෝ.

97. තදාහං හංසවතියං ජාතාමච්චකුලෙ අහුං,
සබ්බූපකාරසම්පන්නෙ ඉද්ධෙ ඵීතෙ මහද්ධනෙ.

98. කදාචි පිතුනා සද්ධිං දාසීගණපුරක්ඛතා,
මහතා පරිවාරෙන තං උපෙච්ච නරාසභං.

99. වාසවං විය වස්සන්තං ධම්මමෙඝං අනාසවං,
සරදාදිච්චසදිසං රංසිමාලාකුලං ජිනං.

100. දිස්වා චිත්තං පසාදෙත්වා සුත්වා චස්ස සුභාසිතං,
මාතුච්ඡං භික්ඛුනිං අග්ගෙ ඨපෙන්තං නරනායකං.

101. සුත්වා දත්වා මහාදානං සත්තාහං තස්ස තාදිනෝ,
සසඞ්ඝස්ස නරග්ගස්ස පච්චයානි බහූනි ච.

102. නිපජ්ජ පාදමූලම්හි තං ඨානං අභිපත්ථයිං,
තතෝ මහාපරිසතිං අවොච ඉසිසත්තමෝ

103. යා සසඞ්ඝං අභොජෙසි සත්තාහං ලොකනායකං,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතෝ.

104. සතසහස්සෙ ඉතෝ කප්පෙ ඔක්කාකකුලසම්භවෝ,
ගොතමෝ නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

105. තස්ස ධම්මෙසු දායාදා ඔරසා ධම්මනිම්මිතා,
ගොතමී නාම නාමෙන හෙස්සති සත්ථුසාවිකා.

106. තස්ස බුද්ධස්ස මාතුච්ඡා ජීවිතාපාදිකා අයං,
රත්තඤ්ඤූනඤ්ච අග්ගත්තං භික්ඛුනීනං ලභිස්සති.”

107. තං සුත්වාන පමුදිතා යාවජීවං තදා ජිනං,
පච්චයෙහි උපට්ඨිත්වා තතෝ කාලකතා අහං.

108. තාවතිංසෙසු දෙවෙසු සබ්බකාමසමිද්ධිසු,
නිබ්බත්තා දසහඞ්ගෙහි අඤ්ඤෙ අභිභවිං අහං.

109. රූපසද්දෙහි ගන්ධෙහි රසෙහි ඵුසනෙහි ච,
ආයුනාපි ච වණ්ණෙන සුඛෙන යසසාපි ච.

110. තථෙවාධිපතෙයෙන අධිගය්හ විරොච'හං,
අහොසිං අමරින්දස්ස මහෙසී දයිතා තහිං.

111. සංසාරෙ සංසරන්තීහං කම්මවායුසමෙරිතා,
කාසිස්ස රඤ්ඤා විසයෙ ආජායිං දාසගාමකෙ.

112. පඤ්චදාසසතා'නූනා නිවසන්ති තහිං තදා,
සබ්බෙසං තත්ථ යො ජෙට්ඨා තස්සා ජායා අහොස'හං.

113. සයම්භුනො පඤ්චසතා ගාමං පිණ්ඩාය පාවිසුං,
තෙ දිස්වාන අහං තුට්ඨා සහ සබ්බෙහි ඤාතිහි.

114. කත්වා පඤ්චසතකුටී චතුමාසෙ උපට්ඨිය,
තිචීවරානි දත්වාන පසන්නාමහ සසාමිකා.

115. තතො චුතා සපතිකා තාවතිංසගතා මයං,
පචජ්ජිමෙ ච භවෙ'දානි ජාතා දෙවදහෙ පුරෙ.

116. පිතා අඤ්ඤජනසක්කො මෙ මාතා මම සුලක්ඛණා,
තතො කපිලවත්ථුස්මිං සුද්ධොදනඝරං ගතා.

117. සෙසා සක්‍යකුලෙ ජාතා සක්‍යානං ඝරමාගමුං,
අහං විසිට්ඨා සබ්බාසං ජිනස්සා'පාදිකා අහුං.

118. මම පුත්තෙතා'හිනික්ඛම්ම බුද්ධා ආසි විනායකො,
පචජාහං පබ්බජිත්වාන සතෙහි සහ පඤ්චහි.

119. සාකියානිහි ධීරාහි සහ සන්තිසුඛං ඵුසිං,
යෙ තදා පුබ්බජාතියං අම්හාකං අහු සාමිනො.

120. සහ පුඤ්ඤස්ස කත්තාරො මහාසමයකාරකා,
ඵුසිංසු අරහත්තං තෙ සුගතෙනානුකම්පිතා.

121. තදෙතරා භික්ඛුනියො ආරුහිංසු නභත්ථලං,
සඞ්ගතා විය තාරායො විරොචිංසු මහිද්ධිකා.

122. ඉද්ධි අනෙකා දස්සෙසුං පිළන්ධවිකතී යථා,
කම්මාරො කනකස්සෙව කම්මඤ්ඤස්ස සුසික්ඛිතො.

123. දස්සෙත්වා පාටිහීරානි විචිත්තානි බහූනි ච,
තොසෙත්වා වාදිපවරං මුනිං සපරිසං තදා.

124. ඔරොහිත්වාන ගගනා වන්දිත්වා ඉසිසත්තමං,
අනුඤ්ඤාතා නරගෙන යථාඨානෙ නිසීදිංසු.

125. "අහෝ'නුකම්පිකා අමහං සබ්බාසං වීර ගොතමී,
වාසිතා තව පුඤ්ඤෙහි පත්තා නො ආසවක්ඛයං.

126. කිලෙසා ඣාපිතා අමහං භවා සබ්බෙ සමූහතා,
නාගීව බන්ධනං ඡෙත්වා විහරාම අනාසවා.

127. සුආගතං වත නො ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සෙසා විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

128. පටිසම්භිදා චතස්සෙසා ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

129. ඉද්ධීසු ච වසී හොම දිබ්බාය සොතධාතුයා,
චෙතොපරියඤාණස්ස වසී හොම මහාමුනෙ.

130. පුබ්බෙනිවාසං ජානාම දිබ්බචක්ඛු විසොධිතං,
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො

131. අත්ථෙ ච ධම්මෙ නෙරුත්තෙ පටිභානෙ ච විජ්ජති,
ඤාණං අමහං මහාවීර උප්පන්නං තව සන්තිකෙ.

132. අසමාහි පරිච්ඡෙණ්ණා'සි මෙත්තචිත්තාහි නායක,
අනුජානාහි සබ්බාසං නිබ්බානාය මහාමුනෙ."

133. නිබ්බායිස්සාම ඉච්චෙවං කිං වක්ඛාමි වදන්තියො,
යස්සදානි ච වො කාලං මඤ්ඤථා"ති ජිනො'බ්‍රවි.

134. ගොතමී ආදිකා තායො තදා භික්ඛුනියො ජිනං,
වන්දිත්වා ආසනං තම්හා වුට්ඨාය අගමංසු තා.

135. මහතා ජනකායෙන සහ ලොකගගනායකො,
අනුසංයායි සො වීරො මාතුච්ඡං යාව කොට්ඨකං.

136. තදා නිපති පාදෙසු ගොතමී ලොකබන්ධුනො,
සහෙතරාහි සබ්බාහි පච්ඡිමං පාදවන්දනං.

137. ඉදං පච්ඡිමකං මයහං ලොකනාථස්ස දස්සනං,
න පුනො අමතාකරං පස්සිස්සාමි මුඛං තව.

138. න ච මෙ වන්දනං වීර තව පාදෙ සුකොමලෙ,
සම්පුසිස්සාමි ලොකගග අජ්ජ ගච්ඡාමි නිබ්බුතිං.

139. රූපෙන කිං තවා'නෙන දිට්ඨෙ ධම්මෙ යථාතථෙ,
සබ්බං සඞ්ඛතමෙවෙතං අනස්සාසිතමිත්තරං.

140. සා තාහි සහ ගන්ත්වාන භික්ඛුනූපස්සයං සකං,
අඩ්ඪපල්ලඞ්කමාභුජ්ජ නිසීදි පරමාසනෙ.

141. තදා උපාසිකා තත්ථ බුද්ධසාසනවච්ඡලා,
තස්සා පවත්තිං සුත්වාන උපෙසුං පාදවන්දිකා.

142. කරෙහි උරං පහන්ත්වා ඡින්නමූලා යථා ලතා,
රොදන්තා කරුණං රාවං සොකට්ටා භූමිපාතිකා.

143. මා නො සරණදෙ නාථෙ විහාය ගමි නිබ්බුතිං,
නිපතිත්වාන යාචාම සබ්බායො සිරසා මයං.

144. යා පධානතමා තාසං සද්ධා පඤ්ඤා උපාසිකා,
තස්සා සීසං පමජ්ජන්තී ඉදං වචනමබ්රවිඃ

145. අලං පුත්තා විසාදෙන මාරපාසානුවත්තිනා,
අනිච්චං සඞ්ඛතං සබ්බං වියොගන්තං චලාචලං.

146. තතො සා තා විස්සජ්ජිත්වා පඨමං ඣානමුත්තමං,
දුතියං තතියං චාපි සමාපජ්ජි චතුත්ථකං.

147. ආකාසායතනඤ්චෙව විඤ්ඤාණායතනං තථා,
ආකිඤ්චඤ්ඤං නෙවසඤ්ඤං සමාපජ්ජි යථාක්කමං.

148. පටිලොමෙන ඣානානි සමාපජ්ජිත්ථ ගොතමී,
යාවතා පඨමං ඣානං තතො යාව චතුත්ථකං.

149. තතො වුට්ඨාය නිබ්බායි දීපචිච්ච නිරාසනා,
භූමිචාලො මහා ආසි නභසා විජ්ජුතා පති.

150. පනාදිතා දුන්දුභියො පරිදෙවිංසු දෙවතා,
පුප්ඵවුට්ඨි ච ගගනා අභිවස්සථ මෙදිනිං.

151. කම්පිතො මෙරුරාජාපි රඞ්ගමඤ්ඤ්ඩ යථා නටො,
සොකෙනෙවාතිදීනො ච විරවො ආසි සාගරො.

152. දෙවා නාගාසුරා බ්‍රහ්මා සංවිග්ගා'හංසු තඞ්ඛණෙ:
අනිච්චා වත සඞ්ඛාරා යථායං විලයං ගතා.

153. යා වෙ'මං පරිවාරිංසු සත්ථුසාසනකාරිකා,
තායෝ'පි අනුපාදානා දීපච්චී විය නිබ්බුතා.

154. "හා යොගා විප්පයොගන්තා හා'නිච්චං සබ්බසඞ්ඛතං,
හා ජීවිතං විනාසන්තං" ඉච්චාසි පරිදෙවනා.

155. තතො දෙවා ච බ්‍රහ්මා ච ලොකධම්මානුවත්තනං,
කාලානුරූපං කුබ්බන්ති උපෙච්චා ඉසිසත්තමං.

156. තදා ආමන්තයී සත්ථා ආනන්දං සුතිසාගරං,
ගච්ඡානන්ද නිවෙදෙහි භික්ඛූනං මාතුනිබ්බුතිං

157. තදා'නන්දෝ නිරානන්දෝ අස්සුනා පුණ්ණලොචනෝ,
ගග්ගදෙන සරෙනාහ "සමාගච්ඡන්තු භික්ඛවෝ.

158. පුබ්බදක්ඛිණපච්ඡාසු උත්තරායං වසන්ති යෙ,
සුණන්තු භාසිතං මයහං භික්ඛවෝ සුගතොරසා.

159. යා වඩ්ඪයී පයත්තෙන සරීරං පච්ඡිමං මුනෙ,
සා ගොතමී ගතා සන්තිං තාරාව සූරියොදයෙ.

160. බුද්ධමාතාති පඤ්ඤත්තිං ඨපයිත්වා ගතා'සමං,
න යත්ථ පඤ්ඩවනෙත්තො ගතං දක්ඛති නායකො.

161. යස්සත්ථී සුගතෙ සද්ධා යො ච පියො මහාමුනෙ,
බුද්ධමාතරි සක්කාරං කරොතු සුගතොරසො."

162. සුදූරට්ඨාපි තං සුත්වා සීඝමාගඤ්ඡුං භික්ඛවෝ,
කෙචි බුද්ධානුභාවෙන කෙචි ඉද්ධිසු කොවිදා.

163. කූටාගාරවරෙ රමෙම සබ්බසොණ්ණමයෙ සුභෙ,
මඤ්ඤකං සමරොපෙසුං යත්ථ සුත්තාසි ගොතමී.

164. චත්තාරො ලොකපාලා තෙ අංසෙහි සමධාරයුං,
සෙසා සක්කාදයො දෙවා කූටාගාරෙ සමගගහුං.

165. කූටාගාරානි සබ්බානි ආසුං පඤ්ඩවසතානිපි,
සරදාදිච්චවණ්ණානි විසඞ්කමමකතානි හි.

166. සබ්බාපි තා භික්ඛුනියෝ ආසුං මඤ්ඤවසු සායිතා,
දෙවානං බන්ධමාරුළ්හා නීය්‍යන්ති අනුපුබ්බසෝ.

167. සබ්බසෝ ඡාදිතං ආසි විතානෙන නභත්ථලං,
සතාරා චන්දසුරියා ලඤ්ජිතා කනකාමයා.

168. පතාකා උස්සිතා නෙකා විතතා පුප්ඵකඤ්චුකා,
ඔගතාකාසපදුමා මහියා පුප්ඵමුග්ගතං.

169. දිස්සන්ති චන්දසුරියා පජ්ජලන්ති ච තාරකා,
මජ්ඣංගතොපි චාදිච්චා න තාපෙති සසී යථා.

170. දෙවා දිබ්බෙහි ගන්ධෙහි මාලෙහි සුරභීහි ච,
වාදිතෙහි ච නච්චෙහි සඞ්ගීතීහි ච පූජයුං.

171. නාගා සුරා ච බ්‍රහ්මානෝ යථාසත්ති යථාබලං,
පූජයිංසු ච නීයන්තිං නිබ්බුතං බුද්ධමාතරං.

172. සබ්බායෝ පුරතෝ නීතා නිබ්බුතා සුගතොරසා,
ගොතමී නීයතෙ පච්ඡා සක්කතා බුද්ධපොසිතා.

173. පුරතෝ දෙවමනුජා සනාගා'සුරබ්‍රහ්මකා,
පච්ඡා සසාවකෝ බුද්ධෝ පූජත්ථං යාති මාතුයා.

174. බුද්ධස්ස පරිනිබ්බානං නෙදිසං ආසි යාදිසං,
ගොතමී පරිනිබ්බානං අතීවච්ඡරියං අහු.

175. බුද්ධෝ බුද්ධස්ස නිබ්බානෙ නොපදිස්සති භික්ඛවෝ,
බුද්ධෝ ගොතමීනිබ්බානෙ සාරිපුත්තාදිකා තථා.

176. චිතකානි කරිත්වාන සබ්බගන්ධමයානි තෙ,
ගන්ධචුණ්ණාවකිණ්ණානි ඣාපයිංසු ච තා තහිං.

177. සෙසභාගානි ඩය්හිංසු අට්ඨිසෙසානි සබ්බසෝ,
ආනන්දෝ ච තදා'වොච සංවෙගජනනං වචෝ

178. "ගොතමී නිධනං යාතා දඩ්ඪං චස්සා සරීරකං,
සඞ්ඝ'හං බුද්ධනිබ්බානං න චිරෙන භවිස්සති."

179. තතෝ ගොතමිධාතූනි තස්සා පත්තගතානි සෝ,
උපනාමෙහි නාථස්ස ආනන්දෝ බුද්ධචොදිතෝ.

180. පාණිනා තානි පගය්හ අවොච ඉසිසත්තමො
"මහතො සාරවන්තස්ස යථා රුක්ඛස්ස තිට්ඨතො.

181. යො සො මහන්තරො බන්ධො පලුජ්ජය්‍ය අනිච්චතා,
තථා භික්ඛුනීසඞ්ඝස්ස ගොතමී පරිනිබ්බුතා.

182. අහො අච්ඡරියං මය්හං නිබ්බුතායපි මාතුයා,
සරීරමත්තසෙසාය නත්ථි සොකපරිද්දවො.

183. න සොචියා පරෙසං සා තිණ්ණසංසාරසාගරා,
පරිවජ්ජිතසන්තාපා සීතිභූතා සුනිබ්බුතා.

184. පණ්ඩිතා'සි මහාපඤ්ඤා පුථුපඤ්ඤා තථෙව ච,
රත්තඤ්ඤූ භික්ඛුනීනං සා එවං ධාරෙථ භික්ඛවො.

185. ඉද්ධියා ච වසී ආසී දිබ්බාය සොතධාතුයා,
චෙතොපරියඤාණස්ස වසී ආසි ච ගොතමී.

186. පුබ්බෙනිවාසං අඤ්ඤාසී දිබ්බචක්ඛු විසොධිතං,
සබ්බාසවපරික්ඛීණා නත්ථි තස්සා පුනබ්භවො.

187. අත්ථධම්මනිරුත්තීසු පටිභානී තථෙව ච,
පරිසුද්ධං අහූ ඤාණං තස්මා සොචනියා න සා.

188. අයොඝනහතස්සෙව ජලතො ජාතවෙගසො,
අනුපුබ්බූපසන්තස්ස යථා න ඤායතෙ ගතී.

189. එවං සම්මා විමුත්තානං කාමබන්ධොඝතාරිනං,
පඤ්ඤාපෙතුං ගතී නත්ථි පත්තානං අචලං පදං.

190. අත්තදීපා තතො හොථ සතිපට්ඨානගොචරා,
භාවෙත්වා සත්තබොජ්ඣංගෙ දුක්ඛස්සන්තං කරිස්සථාති.

ඉත්ථං සුදං මහාපජාපතීගොතමී ඉමා ගාථායො අභාසිත්ථාති.

මහාපජාපතී අපදාන - පදගතාර්ථ

01. **එකදා;** එක් දිනක, **ලොකපජ්ජොතො;** ලොවට පහනක් වූ, **නරසාරථී;** වෙනෙය්‍යජන දමනයෙහි රියදුරෙකු වූ බුදුන් වහන්සේ, **වෙසාලියං;** විශාලාමහනුවර, **මහාවනෙ;** මහවනයෙහි, **කූටාගාර සුසාලායං;** මැනවින් කරන ලද කූටාගාර ශාලාවෙහි, **වසතෙ;** වාසය කරන සේක.

02. **තදා;** එකල, **ජිනසස මාතුචජා;** බුදුරදුන්ගේ සුළුමව වූ, **මහාගොතමී භික්ඛුනී;** මහාප්‍රජාපතී ගෝතමී තෙරණිය, **තහිං පුරෙ** ඒ නගරයෙහි **කතෙ;** කරන ලද, **රමෙම;** රම්‍ය වූ, **භික්ඛුනී උපස්සයෙ;** මෙහෙණවරෙහි (භික්ෂුණී ආරාමයෙහි), **වසී;** වාසය කළා ය.

03. **විමුත්තාහි;** සසරින් මිදුණා වූ, **පඤ්චහි භික්ඛුනීසතෙහි සහ;** පන්සියයක් භික්ෂුණීන් වහන්සේලා සමග, **රහොගතාය;** විවේකීව වසන, **තස්සා;** ඇයගේ, **චිත්තස්ස, සිතේ; එවං;** මෙබඳු, **විතක්කිතං;** මනෝ සංකල්පයක්, **ආසි;** පහළ විය.

04. **අහං;** මම, **බුද්ධස්ස පරිනිබ්බාණං වා;** බුදුන්ගේ පිරිනීවීම හෝ, **සාවකගහයුගස්ස වා;** දෙ අගසව්වන් වහන්සේලාගේ පිරිනිවීම හෝ, **රාහුල ආනන්ද නන්දානං;** රාහුල ආනන්ද නන්ද තෙරවරුන්ගේ පිරිනිවීම හෝ, **පස්සිතුං;** දක්නට, **න ලච්ඡාමි;** නො ලබන්නෙමි.

05. **ලොකනාථෙන;** ලොවට පිහිට වූ, **මහෙසිනා;** මහර්ෂීන් වහන්සේ විසින්, **අනුඤ්ඤාතා;** අනුදන්නා ලද්දේ, **පටිගච්ච;** කල් ඇතිව, **ආයුසංඛාරෙ ඔස්සජ්ජිත්වාන;** ආයුසංස්කාරයන් හැර දමා, **නිබ්බුතිං;** නිවනට, **ගච්ඡය්‍යං;** යන්නෙම් නම් මැනවි.

06. **පඤ්චස්සතානං අපි භික්ඛුනීනං;** පන්සියයක් භික්ෂුනීන්ට ද, **තථා;** එබඳු, **විතක්කිතං;** විතර්කයක් (සංකල්පනාවක්), **ආසි;** විය, **ඛෙමාදිකානං අපි;** ඛේම ආදි තෙරණිවරුන්ට ද, **එතං එව විතක්කිතං;** මෙම සංකල්පනාව ම, **ආසි;** වීය.

07. **තදා;** එකල, **භූමිචාලො ආසි;** මහපොළව කම්පා විය, **මෙඝදුන්දුභි;** මේඝ ගර්ජනා නමැති බෙරහඬ, **නාදිතා;** නාද විය, **උපස්සය අධිවත්ථායො;** මෙහෙණවරට අරක්ගත්, **දෙවතායො;** දේවතාවෝ, **සොකපීළිතා;** ශෝකයෙන් පෙළුණාහු, **සකරුණං,** දුක්සහිතව **විලපන්තා;** වැළපෙමින්, **තත්ථ;** එහි, **අස්සූනි පවත්තයුං;** කඳුළු සැලූහ.

08. **හි;** එසේම, **තා මිත්තා භික්ඛුනියො;** ඒ (ගෝතමී තෙරණිය හා) මිත්‍ර භික්ෂුණීහු, **ගොතමිං උපගන්ත්වාන;** ගෝතමී තෙරණිය වෙත එළඹ, **පාදෙ සිරසා නිපච්ච;** පා මත සිරසින් වැඳ වැටී, **ඉදං වචනං;** මේ වචනය, **අබ්‍රුවුං;** කීවාහු ය.

09. **අය්‍යෙ;** ආර්යාවෙනි, **තොයලවාසිත්තා මයං;** දියපොදකින් දෝවනය කරගත් අපි, **තත්ථ;** එහි, **රහොගතා;** හුදෙකලාව කල්ගෙවීමු, **සා අචලා භූමි;** ඒ නිශ්චල පොළව, **චලිතා;** සෙලවිණ, **දෙවදුන්දුභි;** මේඝ ගර්ජනා නමැති බෙරහඬ, **නාදිතා;** නාද විය, **පරිදෙවා ච;**

වැළපීම ද ඇසෙයි, **ගොතමී;** ගෝතමීන් වහන්ස, **නූන;** ඒකාන්තයෙන්, **කිමත්ථං;** මේ කුමක් නිසා ද?

10. **තදා;** එකල්හි, **සා;** ඕ තොමෝ, **යථා;** යම් පරිද්දෙන්, **පරිවිතක්කිතං;** විතර්ක කරන ලද නම්, **සබ්බං;** (ඒ) සියල්ල, **අවොච;** කීවාය, **තායො සබ්බා අපි;** ඒ සියලු භික්ෂුණීහු ද, **යථා පරිවිතක්කිතං;** යම් සේ විතර්ක කරන ලද අයුරු, **ආහංසු;** කීවාහු ය.

11. **සුබ්බතෙ අය්‍යෙ;** මනා පැවතුම් ඇති ආර්යාවෙනි, **පරමං;** ඉතා උතුම් වූ, **සිවං;** නිවන, **තෙ;** ඔබට, **යථා රුචිතං;** යම් අයුරකින් රිසි වේ නම්, (මයං) **සබ්බා අපි;** (අපි) සියල්ලෝ ද, බුද්ධානුඤ්ඤාය; බුදුරදුන්ගේ අනුදැනුමෙන්, **නිබ්බායිස්සාම;** පිරිනිවන් පාන්නෙමු.

12. **මයං,** අපි; **සහ එව ;** එක්ව ම, **සරා'පි ච;** ගිහිගෙයිනුත්, **භවා'පි ච;** භවයෙන් ද, **නික්ඛිත්තා;** නික්මුණෝ වෙමු, **සහ එව;** එක්ව ම, **උත්තමං නිබ්බාණපුරං;** උතුම් නිවන් පුරයට, **ගමිස්සාම;** යන්නෙමු.

13. **තදා;** එවිට, **සා;** ඕතොමෝ, **නිබ්බානාය වජනතීනං;** නිවනට යන්නන්ට, **කිං වක්ඛාමි ඉති;** කුමක් කියම් දැ'යි, **වදං;** කියමින්, **සබ්බාහි සහ,** සියල්ලන් සමග, **භික්ඛුනීනිලයා;** භික්ෂුණී ආරාමයෙන් (මෙහෙණවරින්), **නිගච්ඡි;** නික්මුණා ය.

14. **උපඤ්ඤයෙ;** මෙහෙණවරට, **අධිවත්ථා;** අරක්ගත්, **යා දෙවතා;** යම් දෙවිකෙනෙක් වෙත් නම්, **තා;** ඒ දෙවිවරු, **මෙ;** මට, **ඛමන්තු;** ක්ෂමා කෙරෙත්වා, **ඉදං;** මෙය, **මම;** මාගේ, **භික්ඛුනීනිලයඤ්ඤ;** මෙහෙණවරේ, **පච්ඡිමං දඤ්ඤනං;** අවසන් දැක්ම යි.

15. **යත්ථ;** යම් තැනක, **ජරා වා;** ජරාව හෝ, **මච්චු වා;** මරණය හෝ, **නත්ථි;** නැද්ද, **අප්පියෙහි සමාගමො;** අප්‍රියයන් හා එක්වීමක් හෝ, **පියෙහි;** ප්‍රියයන්ගෙන්, **විප්පයොගො;** වෙන්වීමක්, **න අත්ථි;** නැද්ද, **තං අසංකතං;** ඒ අසංකත (හේතුප්‍රත්‍යයෙන් හට නොගත්) නම් වූ නිවනට, **වජිඤ්ඤං;** යන්නෙමි.

16. **අවීතරාගා;** රහත් නොවූ, **සුගතොරසා;** බුද්ධපුත්‍රයෝ, **තං වචනං;** ඒ වචනය, **සුත්වා;** අසා, **සොකට්ටා;** ශෝකයෙන් පීඩිත වූවාහු, **අහෝ;** අනේ, **නො;** අපගේ, **අප්පපුඤ්ඤතා;** පින් මදකම යැයි, **පරිදෙවිංසු;** වැලපුණාහු ය.

17. **තාහි විනා;** ඒ භික්ෂුණීන්ගෙන් තොරව, **අයං භික්ඛුනීනිලයො;** මේ මෙහෙණවර, **සුඤ්ඤා භූතො;** හිස් විය, **පභාතෙ;** උදෑසන, **තාරායො විය;** තරු මෙන්, **ජිනොරසා;** බුද්ධ පුත්‍රීය භික්ෂුණීහු, **න දිස්සන්ති;** දක්නට නො ලැබෙත්.

18. **පඤ්චහි නදීසතෙහි;** පන්සියයක් ගංගාවන් සමග, **ගංගා;** ගංගා නම් ගඟ, **සාගරං ඉව;** සාගරයට වදින්නා සේ, **ගොතමී;** ගෝතමිය, **පඤ්චහි සතෙහි සහ,** පන්සියයක් භික්ෂුණීන් සමග, **නිබ්බානං යාති;** නිවනට යයි.

19. **රථිකාය;** වීථියෙහි, **වජන්තිං තං;** වඩනා ඇය, **දිස්වා;** දැක, **සද්ධා උපාසිකා;** සැදැහැති උපාසිකාවෝ, **සරා නික්කමම;** ගෙයින් නික්ම, **පාදෙසු නිපච්ච;** පාමුල වැටී, **ඉදං;** මේ වදන්, **අබ්‍රවුං;** කීවාහු ය.

20. **මහාභොගෙ;** මහපිනැති උත්තමාවනි, (අම්හෙ) **පසීදස්සු;** (අප කෙරෙහි) පහදිනු මැනවි, **අනාථායෙ නො;** අනාථ වූ අප, **විහාය;** හැරදමා, **තයා;** ඔබ විසින්, **නිබ්බාතුං;** පිරිනිවන් පාන්නට, **න යුත්තං ඉති;** නො සුදුසු යැයි, **තා;** (ඇලා) ඒ භික්ෂූණීහු, **අට්ටං;** මහත් සේ හඬනඟා, **විලපිංසු;** විලාප දුන්හ.

21. **තාසං;** ඇලාගේ, **සොකපහාණත්ථං;** ශෝක දුරුකිරීම සඳහා, **මධුරං ගිරං;** මිහිරි වදන්, **අවොච;** කීවාය, **පුත්තා;** දරුවෙනි, **රුදිතෙන අලං;** හැඬීමෙන් කම් නැත, **වො;** තොපට, **අජ්ජ;** අද, **අයං භාසකාලො;** මේ සිනාසීමට කාලය යි.

22. **මයා;** මා විසින්, **දුක්ඛං;** දුක, **පරිඤ්ඤාතං;** පිරිසිඳ දන්නා ලදී, **දුක්ඛහෙතු;** දුකට හේතුව, **විවජ්ජිතො;** දුරුකරන ලදී, **මෙ;** මා විසින්, **නිරොධො;** නිවන, **සච්ඡිකතො;** පසක් කරන ලදී, **මග්ගා ච අපි;** මාර්ගය ද, **සුභාවිතො;** මැනවින් වඩන ලදී.

23. **මයා;** මවිසින්, **සත්ථා;** ශාස්තෘන් වහන්සේ, **පරිච්ඡිණ්ණා;** ඇසුරු කරන ලදහ, **බුද්ධස්ස සාසනං;** බුදුන්ගේ අනුශාසනය, **කතං;** කරන ලදී, **ගරුකො භාරො;** පඤ්චස්කන්ධය නමැති මහත් බර, **ඔහිතො;** බහා තබන ලදී, **භවනෙත්ති;** භවයන් පිළිබඳ ආශාව, **සමූහතා;** මුලිනුපුටාලන ලදී.

24. **අගාරස්මා;** ගිහි ගෙයින් නික්ම, **අනගාරියං;** අනගාරික වූ බුදුසසුන්හි, **යස්ස අත්ථාය;** යම් අර්ථයක් සඳහා, **පබ්බජිතා;** පැවිදි වූයෙමි ද, **සබ්බසංයොජනක්ඛයො;** සියලු සංයෝජන නැති කළ, **සො අත්ථො;** ඒ අර්ථය, **මෙ;** මා විසින්, **අනුප්පත්තො;** ලබන ලදී.

25. **බුද්ධා ච;** බුදුරජාණන් වහන්සේ ද, **තස්ස;** උන්වහන්සේගේ, **අනූනො සද්ධම්මො;** අනූන ව සද්ධර්මය, **යාව;** යම්තාක්, **තිට්ඨති;** පවතී නම්, **තාව;** ඒ තාක්, **මෙ;** මට, **නිබ්බාතුං;** පිරිනිවෙන්නට, **කාලො;** කාලය යි, **පුත්තිකා;** දියණිවරුනි, **මං;** මා ගැන, **මා සොචථ;** ශෝක නො කරවු.

26. **කොණ්ඩඤ්ඤ ආනන්ද නන්ද ආදී;** කොණ්ඩඤ්ඤ ආනන්ද, නන්ද, ආදි තෙරවරු ද, **ජිනො රාහුලො;** සසර දිනූ රාහුල තෙර ද, **තිට්ඨන්ති;** සිටිති, **සඞ්ඝා;** සඞ්ඝ තෙමේ, **සුඛිතො;** සුඛිත ය, **සහිතො;** හිත සහිත ය, **තිත්ථියා ච;** තීර්ථකයෝ ද, **හතදප්පා;** නැසුණු දර්ප ඇත්තෝ ය.

27. **ඔක්කාකවංසස්ස;** ඔක්කාකවංසයේ, **මාරමද්දනො;** මරුන් මඩනා, **යසො;** කීර්තිය, **උස්සිතො;** උස්ව නැඟ සිටියේ ය, **පුත්තිකා;** දූරියනි, **සම්පති;** දැන්, **මෙ;** මට, **නිබ්බානත්ථාය;** නිවන් සඳහා, **කාලො නනු;** කාලය නොවේ ද?

28. **චිරප්පභුති;** බොහෝ කලක් පටන්, **මයහං;** මගේ, **යං පත්ථිතං;** යම් ප්‍රාර්ථනාවක් වී ද (එය), **අජ්ජ;** අද, **සිජ්ඣතෙ;** සිදුවේ, **අයං;** මෙය, **ආනන්දහෙරිකාලො;** සතුටු බෙර වැයීමට

කාලය යි, **පුත්තිකා;** දැරියනි, **වො;** තොපගේ, **අසඝූහි;** කඳුළුවලින්; **කිං;** කවර ප්‍රයෝජනයක් ද?

29. **සචෙ;** ඉදින්, **මයි;** මා කෙරේ, **දයා අත්ථි;** දයාවක් ඇත්නම්, **යදි;** යම් හෙයකින්, **කතඤ්ඤුතා;** කෘතඥතාවක්, **අත්ථි;** ඇත්නම්, **සබ්බා;** සියල්ලෝ, **සද්ධම්මට්ඨිතියා;** සද්ධර්මයාගේ පැවැත්ම සඳහා, **දළ්හං;** දැඩි, **විරියං;** වීර්ය, **කරොථ;** කරවු.

30. **මයා;** මා විසින්, **යාචිතො;** අයදනා ලද්දේ, **සම්බුද්ධො;** බුදුන් වහන්සේ, **ථීනං;** කාන්තාවන්ට, **පබ්බජ්ජං;** පැවිද්ද, **අදාසි;** දුන් සේක, **තසමා;** එනිසා, **යථා;** යම්සේ, **අහං;** මම, **නන්දිඝසං;** සතුටු වූයෙම් ද, **තථා;** එසේ ම, **තං අනුතිට්ඨථ;** ඒ අනුව සිටිවු.

31. **තා;** ඈ, **එවං;** මෙසේ, **අනුසාසිතබ්බා;** අනුශාසනා කොට, **භික්ඛුනීහි;** මෙහෙණන් විසින්, **පුරක්ඛතා;** පෙරටු කරන ලද්දේ, **බුද්ධං;** බුදුන් වහ්නසේ වෙත, **උපෙච්ච;** එළඹ, **වන්දිත්ථා;** වැඳ, **ඉදං වචනං;** මේ වචනය, **අබ්‍රවී;** කීවා ය.

32. **සුගත;** සුගතයන් වහන්ස, **අහං;** මම, **තෙ;** ඔබගේ, **මාතා;** මව වෙමි, **වීර;** වීරයන් වහන්ස, **ත්වං ච;** ඔබ වහන්සේ ද, **මම;** මාගේ, **පිතා;** පියා වෙහි, **නාථ;** නාථයන් වහන්ස, **සද්ධම්ම සුබ්බදො;** සදහම් සුව දෙන තැනැත්තා වෙහි, **ගොතම;** ගෞතමයන් වහන්ස, **තයා;** ඔබ නිසා, **ජාතා අම්හි;** උපන්නී වෙමි.

33. **සුගත;** සුගතයන් වහන්ස, **තව අයං රූපකායො;** ඔබගේ මේ රූපකාය, **මයා;** මා විසින්, **සංවඩ්ඪිතො;** වඩන ලදී, **තයා;** ඔබ වහන්සේ විසින්, **මම;** මාගේ, **අනින්දියො;** අනින්දනීය, **ධම්මකායො;** ධර්මකාය; **සංවඩ්ඪිතො;** වඩන ලදී.

34. **මයා;** මා විසින්, **ත්වං;** ඔබ, **මුහුත්තං;** මොහොතක්, **තණ්හාසමනං;** තෘෂ්ණාව සමනය කිරීම, සඳහා, **ඛීරං;** කිරි, **පායිතො;** පොවන ලද්දෙ වෙහ, **තයා;** ඔබ වහන්සේ විසින්, **අහං;** මම, **අචවන්තසන්තං හි;** අතිශයින් ශාන්ත වූ, **ධම්මඛීරං;** දහම් නමැති කිරි, **පායිතා;** පොවන ලද්දී වෙමි.

35. **මහාමුනෙ;** මහමුනිවරයානෙනි, **ත්වං;** ඔබ වහන්සේ, **මඤ්ඤං;** මා හට, **වඳනරක්ඛනෙ;** වැඩීමෙහි හා රැකීමෙහිලා, **අනණ්ණා;** ණයගැති නො වෙති, **පුත්තකාමා;** පුතුන් කැමැති, **යා ථීයො;** යම් ස්ත්‍රීහු වෙත් නම්, **තා;** ඔවුහු, **තාදිසං;** ඔබ බඳු, **සුතං;** පුතකු, **ලභන්තු;** ලබත්වා!

36. **මන්ධාතාදි නරින්දානං;** මන්ධාතු ආදි රජවරුන්ගේ, **යා මාතා;** යම් මවක් වූවා නම්, **සා;** ඕ තොමෝ, **භවණ්ණවෙ;** බවසයුරෙහි, **නිමුග්ගා;** ගිලුණා ය, **පුත්ත;** පුත්‍රයාණනි, **තයා;** ඔබ විසින්, **අහං;** මම, **භවසාගරා;** බවසයුරෙන්, **තාරිතා;** එතෙර කරවන ලද්දී වෙමි.

37. **රඤ්ඤා මාතා;** රාජමාතා, **මහෙසී;** රාජමහෙසී, **ඉති නාම;** යන නම, **ඉත්ථීනං;** ස්ත්‍රීන්ට, **සුලභං;** සුලභ ය, **බුද්ධමාතා ඉති;** බුද්ධමාතා යන, **යං නාමං;** යම් නමක් වේ ද, **එතං;** මෙය, **පරමදුල්ලභං;** අතිශයින් දුර්ලභ ය.

38. **වීර;** වීරයන් වහන්ස, **මමං;** මාගේ, **තං ච පණිධානං;** ඒ ප්‍රණිධිය ද, **තයා;** ඔබගෙන්, මයා; මවිසින්, **ලද්ධං;** ලබන ලදී, **අණුකං වා;** කුඩා වූ හෝ; **මහන්තං වා;** මහත් වූ හෝ, **තං සබ්බං;** ඒ සියලු දෑ, **මයා;** මා විසින්, **පූරිතං;** පුරන ලදී.

39. **ඉමං කලෙබරං;** මේ ශරීරය, **විහාය;** හැර, **පරිනිබ්බාතුං;** පිරිනිවෙන්නට, **ඉච්ඡාමි;** කැමැත්තෙමි, **වීර;** වීර වූ, **දුක්ඛන්තකරනායක;** දුක් කෙළවර කළ නායකයන් වහන්ස, **මෙ;** මට, **අනුජානාහි;** අනුදැන වදාළ මැනවි.

40. **චක්ක අඞ්කුසධජාකිණ්ණෙන;** චක්‍ර, අඞ්කුස, ධජ ලකුණුවලින් ගැවසීගත්, **කමල කොමලෙ;** පියුම් බඳු සියුමැලි වූ, **පාදෙ පසාරෙහි;** පා දිගු කරනු මැනවි, **පුත්තපෙමසා;** පුත්‍රප්‍රේමයෙන්, **තෙ;** ඔබ වහන්සේට, **පණාමං කරිස්සං;** ප්‍රණාම කරන්නෙමි.

41. **සුවණ්ණරාසි සංකාසං;** රන්කඳක් බඳු, **සරීරං;** ශරීරය, **පාකටං කුරු;** ප්‍රකට කරනු මැනවි, (පෙන්වන්න) **නායක;** නායකයන් වහන්ස, **තෙ;** ඔබ වහන්සේගේ, **දෙහං;** ශරීරය, **සුදිට්ඨං කත්වා;** හොඳින් දැකීම කොට, **සන්තිං ගච්ඡාමි;** නිවනට යමි.

42. **දවත්තිංසලක්ඛණ උපෙතං;** දෙතිස් ලකුණින් යුතු, **සුප්පභාලඞ්කතං;** මනා ප්‍රභාවයෙන් අලංකාර වූ, **සඤ්ඣාඝනා;** සැඳෑ වලායෙන් ඉවත් වූ, **බාලඅක්කං ඉව;** ළහිරු වැනි වූ, **තනුං;** ශරීරය, **ජිනො;** බුදුන් වහන්සේ, **මාතුවච්ඡං;** සුළුමවට, **දස්සයී;** පෙන්වූ සේක.

43. **තතො;** ඉක්බිති, **සා;** ඕතොමෝ, **ථුල්ලාරවින්දසංකාතෙ;** පිපුණු පියුමක් බඳු, **තරුණාදිච්චසන්නිභෙ;** ළහිරු බඳු ප්‍රභා ඇති, **චක්කඞ්කිතෙ;** චක්‍ර ලක්ෂණයෙන් යුතු, **පාදතලෙ;** සිරිපාමතුයෙහි, **සිරසා පති;** සිරසින් වැඳ වැටුණා ය.

44. **අදිච්චකුලකෙතුකං;** සූර්යවංශයට ධජයක් වැනි වූ, **නරාදිච්චං;** නරශ්‍රේෂ්ඨයන්, **මයහං;** මගේ, **පච්ඡිමෙ මරණෙ;** අන්තිම මරණයේ දී, **පණමාමි;** ප්‍රණාම කරමි, **අහං;** මම, **තං;** එය, **පුනො;** නැවත, **න ඉක්ඛාමි;** බලාපොරොත්තු නො වෙමි.

45. **ලොකගග්ග;** ලෝකාග්‍රයන් වහන්ස, **ඉත්ථියො නාම;** ස්ත්‍රීහු නම්, **සබ්බදොසකරා;** සියලු දොස්වලට ආකරයක් යැයි, **මතා;** දන්නා ලදී හෙවත් ප්‍රසිද්ධය. **කරුණාකර;** කරුණාකරයන් වහන්ස, **යදි;** ඉදින්, **මෙ;** මාගේ, **කොචි දොසො;** කිසියම් වරදක්, **අත්ථි;** ඇත්නම්, **තං ඛමසසු;** එය ක්ෂමා කරනු මැනවි.

46. **යං;** යම් කරුණක් නිසා, **අහං;** මම, **ඉත්ථීකානං;** ස්ත්‍රීන්හට, **පබ්බජ්ජං;** පැවිද්ද, **පුනප්පුනං;** නැවත නැවත, **යාචිං;** ඉල්ලුවෙම් ද, **නරාසභ;** නරශ්‍රේෂ්ඨයන් වහන්ස, **චෙ;** ඉදින්, **තත්ථ;** එහි, **මෙ දොසො අත්ථි;** මගේ වරදක් ඇත්නම්, **තං ඛමසසු;** එයම ක්ෂමා කරනු මැනවි.

47. **වීර;** වීරයන් වහන්ස, **තව අනුඤ්ඤාය;** ඔබගේ අනුදැනුමෙන්, **භික්ඛුනියො;** භික්ෂුණීහු, **මයා;** මා විසින්, **සාසිතා;** අනශාසනා කරන ලද්දාහු ය, **චෙ;** ඉදින්, **තත්ර;** එහි ලා, **දුන්නීතං අත්ථි;** වරදවා කළ අනුශාසනයක් ඇත්නම්, **ඛමාධිප;** ක්ෂමාධිපතියාණන් වහන්ස, **තං ඛමසසු;** එය ක්ෂමා කරනු මැනවි.

48. **ගුණභූසනෙ;** ගුණයෙන් අලංකාර වූ තැනැත්තිය, **අකඛනෙත;** ක්‍ෂමා කිරීමට කරුණු නැති කල්හි, **ඛන්තබ්බං;** ක්‍ෂමා කළ යුතු, **කිං නාම භවෙ;** කුමක් නම් වන්නේ ද, **නිබ්බානාය;** පිරිනිවීම සඳහා, **වජන්තියා;** යන්නාවූ, **තෙ;** ඔබට, **උත්තරං;** වැඩිදුර, **කිං වක්ඛාමි;** කුමක් කියම් ද?

49. **සුද්ධ;** පිරිසිදු වූ, **අනූනෙ;** (කළ යුතු කිසෙහි) අඩු නැති, **මම;** මාගේ, **භික්ඛුසඞ්ඝස්ස;** භික්‍ෂු සංඝයා, **ඉතො ලොකා;** මෙලොවින්, **නිස්සරිතුං කමනෙත;** නික්මයාමට යන කල්හි, **පභාතකාලෙ;** උදෑසන, **ගහානං;** ග්‍රහතාරකාවල, **ව්‍යසනං දිස්වාන;** නැතිවීම දැක, **චන්දලෙඛා;** සඳරේඛා, **නියාති ඉව;** නික්ම යන්නාක් මෙනි.

50. **සුමෙරුං;** මහාමේරු පර්වතය වටා යන, **චන්දානුගතා;** සඳ අනුව යන, **තාරා ඉව;** තරු මෙන්, **තදෙතරා භික්ඛුනියො;** ඒ අනෙක් භික්‍ෂුණීහු, **ජිනගණං;** ජිනේන්ද්‍රයන් වහන්සේ, **පදක්ඛිණං කත්වා;** ප්‍රදක්‍ෂිණා කොට, **පාදෙ නිපච්ච;** පාමුල වැඳ වැටී, **මුඛනතං සමුදික්ඛමානා;** මුවග බලමින්, **ඨිතා;** සිටියාහු ය.

51. **තව දස්සනෙන;** ඔබගේ දැකීමෙන්, **චක්ඛු;** ඇස, **න තිත්තපුබ්බං;** තෘප්ත නොවූ විරූ ය. **තව භාසිතෙන;** ඔබගේ වචනයෙන්, **සොතං;** කණ, **න;** තෘප්ත නොවූ විරූ ය, **කෙවලං;** හුදෙක්, **මමං;** මාගේ, **තං එකමෙව චිත්තං;** ඒ එක ම සිත, **ධම්මරසෙන;** දහම්රසයෙන්, **තිත්තිං;** තෘප්තියට, **පප්පුය්‍ය;** පැමිණ සිටියි.

52. **නරපුඞ්ගව;** නරශ්‍රේෂ්ඨයාණෙනි, **නදතො;** අභීත නාද පවත්වන, **වාදිදප්ප අපහාරිනො;** වාද කරන්නවුන්ගේ මානය මථනය කරන, **තෙ වදනං;** ඔබගේ ශ්‍රී මුඛය, **යෙ දක්ඛන්ති;** යමෙක් දකිත් ද, **තෙ;** ඔවුහු, **ධඤ්ඤා;** පින්වන්තයෝ ය.

53. **ගුණධර;** ගුණධාරී උතුමාණනි, **දීඝඞ්ගුලී;** දිගු ඇඟිලි ඇති, **තම්බනඛ;** තඹවන් නිය ඇති, **ආයතපණ්හිකෙ;** දිග විලුඹ ඇති, **සුභෙ;** ශුභ වූ, **පාදෙ;** (ඔබගේ) පාදයන්, **යෙ;** යමෙක්; **පණමිස්සන්ති;** වඳිත් ද, **තෙ අපි;** ඔවුහු ද, **ධඤ්ඤා;** පින්වන්තයෝ ය.

54. **නරුත්තම;** නරශ්‍රේෂ්ඨයාණනි, **තෙ;** ඔබගේ, **මධුරානි;** මිහිරි වූ; **පහට්ඨානි;** ප්‍රහර්ෂය ඇති කරන, **දොසඝාතානි;** ද්වේෂය නැති කරන, **හිතානි;** හිත වූ, **වාක්‍යානි;** වචන, **යෙ සොස්සන්ති;** යමෙක් අසත් ද, **තෙ අපි;** ඔවුහු ද, **ධඤ්ඤා;** පින්වන්තයෝ ය.

55. **මහාවීර;** මහාවීරයන් වහන්ස, **තෙ;** ඔබගේ, **පාදපූජනතප්පරා;** පිදීමෙහි නිරත වූ, **තිණ්ණසංසාරකන්තාරා;** තරණය කළ සසර කතර ඇති, **අහං;** මම, **සිරීමතො;** ශ්‍රීමතාණන්ගේ, **සුවාක්‍යෙන;** සුන්දරවාක්‍යයෙන්, **ධඤ්ඤා;** පින්වන්තියක් වීමි.

56. **තතො;** ඉක්බිති, **සුබ්බතා සා;** මනා පැවතුම් ඇති ඈ, **භික්ඛුසඞ්ඝං අපි;** භික්‍ෂු සංඝයාට ද, **අනුසාසෙත්වා;** අනුශාසනා කොට, **රාහුලානන්දනන්දෙ ච;** රාහුල, ආනන්ද, නන්ද තෙරවරුන් **වන්දිත්වා;** වැඳ, **ඉදං;** මේ වචන, **අබ්‍රවී;** පැවසුවා ය.

57. **ආසිවිස ආලයසමෙ;** සර්පයන් වසන තුඹසක් සමාන වූ, **රොගාවාසෙ;** රොගයනට වාසස්ථාන වූ, **දුක්ඛසංඝාතෙ;** දුක්කඳක් වූ, **ජරාමරණගොචරෙ;** ජරාමරණයන්ට ගොදුරු වූ, **කලෙබරෙ;** ශරීරයෙහි, **නිබ්බින්නා;** කළකිරුණෙමි.

58. **නානාකලිමලාකිණ්ණෙ;** නොයෙක් කුණු කසලින් ගැවසීගත්, **පරායත්තෙ;** අනුන් අයත් වූ (තමා සතු නොවූ), **නිරීහකෙ;** අකර්මණ්‍ය වූ ශරීරයෙහි (කලකිරුණෙමි), **තෙන;** එනිසා, **නිබ්බායිතුං;** පිරිනිවෙන්නට, **ඉච්ඡාමි;** කැමැත්තෙමි, **පුත්තකා;** දරුවනි, **අනුමඤ්ඤථ;** අනුදනිවු.

59. **වීතසොකා;** පහ වූ ශෝක ඇති, **නිරාසවා;** ආශ්‍රව රහිත, **නන්දො ච;** නන්ද තෙරණුවෝ ද, **රාහුලභද්දො ච;** රාහුල භද්‍ර තෙරුන් වහන්සේ ද, **අචලට්ඨිතිථීරා;** පර්වතයක් මෙන් ස්ථිරව, **ඨිතා;** සිටියාහු, **ධම්මතං;** දහම් ස්වභාවය, **අනුචින්තයුං;** අනුව සිතුවාහු ය.

60. **සඞ්ඛතං;** හේතුප්‍රත්‍යයෙන් හටගත්, **ලොලං;** සැලෙන, **අසාරං;** අසාර වූ, **කදලූපමං;** කෙසෙල්කඳක් බඳු, **මායාමරීචිසදිසං;** මායාවක් හා මිරිඟුවක් සමාන වූ, **ඉත්තරං;** බෙහෝ කල් නොපවත්නා, **අනවට්ඨිතං;** ස්ථිරව නොසිටි (ශරීරයට;) **ධීරත්ථු;** නින්දා වේවා.

61. **යත්ථ;** යම් කරුණෙක්හි ලා, **අයං නාම;** මෝතොමෝ වූකලී, **ජිනසස;** බුදුරදුන්ගේ, **මාතුච්ඡා;** සුළුමව ය, **බුද්ධපොසිකා;** බුදුරදුන් පෝෂණය කළ, **ගොතමී;** ගෝතමිය, **නිධනං යාති;** පිරිනි වීමට යයි, **සබ්බසඞ්ඛතං;** සියලු සංස්කාර ධර්ම, **අනිච්චං;** අනිත්‍ය ය.

62. **තදා;** එකල, **අනන්දො;** ආනන්ද තෙරණුවෝ, **සෙඛො;** සෙඛ පුද්ගලයෙකි (සෝවාන් වූවෙකි), **ජිනවච්ඡලො;** බුදුරදුන් කෙරෙහි සෙනෙහෙ ඇත්තෙකි, **සොකට්ටො;** සොවින් පෙළුණු, **සො;** හෙතෙම, **අස්සූනි ධරන්තො;** කඳුලු දරමින්, **තත්ථ;** එහිදී, **කරුණං;** අනුකම්පාවෙන්, **පරිදෙවති;** වැළපෙයි.

63. **හා;** අහෝ, **ගොතමී;** ගොතමිය, **සන්තිං;** ශාන්තියට, **යාති;** යයි, **න චිරෙන එව;** නොබෝ දිනකින් ම, **නූනං;** ඒකාන්තයෙන්, **බුද්ධා අපි;** බුදුරජාණන් වහන්සේ ද, **නිරින්ධනො;** ඉන්ධන රහිත, **අග්ගි ඉව;** ගින්න මෙන්, **නිබ්බුතිං;** නිවනට, **ගච්ඡති;** යති.

64. **එවං;** මෙසේ, **විලපමානං;** වැලපෙන, **තං ආනන්දං;** ඒ ආනන්ද තෙරුන්ට, **ගොතමී;** ගෝතමිය, **ආහ;** කීවාය, **සුතිසාගර;** ශ්‍රැතියට සාගර වූ, **ගම්භීර;** ගැඹුරු ගුණ ඇති, **බුද්ධුපට්ඨානතප්පර;** බුද්ධෝපස්ථානයෙහි තත්පර වූ,

65. **පුත්ත;** පුත්‍රය, **හාසකාලෙ;** සිනහවට කාලය, **උපට්ඨිතෙ;** එළඹි කල, **සොචිතුං;** ශෝක කරන්නට, **න යුත්තං;** සුදුසු නැත. **පුත්ත;** පුත්‍රය, **නිබ්බානං;** නිවනට, **සමුපාගතං;** එළඹී මෙ; මට, **තව;** ඔබගේ, **සරණං;** පිහිට ය.

66. **තාත;** දරුව, **තයා;** ඔබ විසින්, **සම්මජ්ජිතේථා;** මනාව ඇරයුම් කරන ලද (බුදුහු), **නො;** අපට, **පබ්බජ්ජං;** පැවිද්ද, **අනුජානි;** අනුදත්හ, **පුත්ත;** පුත්‍රයාණෙනි, **විමනො මා හොහි;** දොම්නස් නො වන්න, **තෙ;** ඔබගේ, **පරිස්සමො;** උත්සාහය, **සඵලො;** සඵල ය.

67. **පුරාණෙහි තිත්ථිකාචරියෙහි අපි;** පැරණි තීර්ථක ආචාර්යවරුන් විසිනුදු, **යං;** යම් නිවනක්, **න දිට්ඨං;** නො දක්නා ලද ද, **තං පදං;** ඒ නිර්වාණ පදය, **සත්තවස්සාහි;** සත්හැවිරිදි,

සුකුමාරීහි; සියුමැලි දැරියන් විසිනුදු, **වෙදිතං;** දැනගන්නා ලදී.

68. **බුද්ධසාසනපාලෙතා;** බුදුසසුන පාලනය කරන, **පුත්ත;** පුත්‍රයාණෙනි, **තව;** ඔබගේ, **පච්ඡිම;** අවසාන, **දස්සනං;** දැකීම යි, **යත්ථ;** යම්තැනක, **ගතො;** ගියේ, **න දිස්සතෙ;** නො දක්නා ලැබේ ද, **අහං;** මම, **තත්ථ;** එහි, **ගච්ඡාමි;** යමි.

69. **කදාචි;** කිසියම් දිනක, **ලොකගගනායකො;** ලොකාග්‍ර වූ නායකයන් වහන්සේ, **ධම්මං දෙසෙනෙතා;** ධර්මය දේශනා කරමින්, **බ්‍රහ්මි,** කිවිසි සේක් ද, **තදා;** එවිට, **අහං;** මම, **අනුකම්පිකා;** අනුකම්පා ඇත්තී, **ආසිංසවචං;** ආශීර්වාද වචනයක්, **අවොචං;** කීවෙමි.

70. **මහාවීර;** මහාවීරයන් වහන්ස, **චිරං ජීව;** බොහෝ කල් ජීවත්වන සේක්වා, **මහාමුනෙ;** මහා මුනිවරයාණෙනි, **කප්පං;** කල්පයක්, **තිට්ඨ;** වැඩ සිටින්න, **සබ්බලොකස්ස;** සියලු ලෝකයාට, **අත්ථාය;** වැඩ පිණිස, **අජරාමරො;** අජරාමර, **භවස්සු;** වන සේක්වා.

71. **තථාවාදිනිං;** එසේ කියන්නාවූ, **තං මමං;** ඒ මට, **සො බුද්ධා;** ඒ බුදුන්වහන්සේ, **එතං;** මෙය, **අබ්‍රවී;** කී සේක, **ගොතමී;** ගෝතමිය, **යථා වදෙසි;** ඔබ යම් අයුරකින් වදිහි ද, **බුද්ධා;** බුදුවරු, **එවං නහි වන්දියා;** මෙසේ නොවැන්ද යුත්තාහ.

72. **සබ්බඤ්ඤූ;** සර්වඥයන් වහන්ස, **චරහි;** එසේ නම්, **තථාගතා;** තථාගතයන් වහන්සේලා, **කථං;** කවර අයුරකින්, **වන්දිතබ්බා;** වැන්ද යුත්තාහු ද, **බුද්ධා;** බුදුවරු, **කථං;** කවර අයුරකින්, **අවන්දියා;** නො වැන්ද යුත්තාහු ද, **පුච්ඡිතො;** විමසන ලද, **මෙ;** මට, **අක්ඛාහි;** කියනු මැනවි.

73. **ආරද්ධවිරියෙ;** පටන්ගන්නා ලද වීර්ය ඇති, **පහිතත්තෙන;** නිවන් පිණිස යොමු කළ සිත් ඇති, **නිච්චං;** නිරතුරු, **දළ්හපරක්කමෙ;** දැඩි උත්සාහ ඇති, **සමගෙන,** සමගිව සිටිනා, **සාවකෙ;** ශ්‍රාවකයන්, **පස්සෙ;** දක්නේ නම්, **එසා;** මෙය, **බුද්ධාභිවන්දනා;** බුදුරදුන්ට කරන වන්දනාව වෙයි.

74. **තතො;** ඉක්බිති, **උපස්සයං;** මෙහෙණවරට, **ගන්ත්වා;** ගොස්, **එකිකා අහං;** එකලා වූ මම, **විචින්තයිං;** සිතුවෙමි, **තිභවන්තගො;** ත්‍රිවිධ භවයන්හි අන්තයට ගිය, **නාථො;** නාථයන් වහන්සේ; **සමගගං;** සමගි වූ, **පරිසං;** පිරිස, **රොචෙති;** රුචි කරති.

75. **හන්ද;** ඒකාන්තයෙන්, **අහං;** මම, **පරිනිබ්බිස්සං;** පිරිනිවන් පාන්නෙමි, **තං; එය, විපත්තිං;** විපත්තියක් ලෙස, **මා අදදසං;** නො දිටිමි, **අහං;** මම, **එවං;** මෙසේ, **චින්තයිත්වා;** සිතා, **ඉසිසත්තමං;** බුදුන් වහන්සේ, **දිස්වාන;** දැක,

76. **විනායකං;** ශ්‍රේෂ්ඨ නායකයන් වහන්සේට, **මෙ;** මාගේ, **පරිනිබ්බානකාලං;** පිරිනිවන් පානා කාලය, **ආරොචෙසිං;** සැළකළෙමි, **තතො;** ඉක්බිති, **සො;** ඒ බුදුන් වහන්සේ, **ගොතමී;** ගෝතමිය, **කාලං ජානාහි;** කල් දනුවයි, **සමනුඤ්ඤාසි;** අනුදත්හ.

77. **මයහං;** මවිසින්, **කිලෙසා;** ක්ලේශයෝ, **ඣාපිතා;** දවන ලදහ, **සබ්බෙ භවා;** සියලු භවයෝ, **සමූහතා;** මුලිනුපුටා දමන ලදහ, **බන්ධනං ඡෙත්වා;** බැඳුම් බිඳ හැසිරෙන, **නාගී ඉව;** ඇත් රැජිනියක මෙන්, **අනාසවා;** ආශ්‍රව රහිතව, **විහරාමි;** වාසය කරමි.

78. **වත;** ඒකාන්තයෙන්, **බුද්ධසෙට්ඨස්ස;** ශ්‍රේෂ්ඨ බුදුන් වහන්සේගේ, **සන්තිකෙ;** සමීපයේ, **මෙ;** මට, **සඞ්ගතං ආසි;** යහපතක් වීය, **තිස්සො විජ්ජා;** ත්‍රිවිද්‍යාවෝ, **අනුප්පත්තා;** ලබන ලදහ, **බුද්ධස්ස සාසනං;** බුදුන්ගේ අනුසාසනාව, **කතං;** කරන ලදී.

79. **චතස්සො පටිසම්භිදා ච;** සිවු පිළිසිඹියා ද, **ඉමෙ අට්ඨ විමොක්ඛා ච;** මේ අෂ්ටවිමෝක්ෂ ද, **ඡළභිඤ්ඤා;** ෂඩ් අභිඥාවන් ද, **සච්ඡිකතා;** සාක්ෂාත් කරන ලදී, **බුද්ධස්ස සාසනං;** බුදුන්ගේ අනුශාසනාව, **කතං;** කරන ලදී.

80. **ගොතමී;** ගෝතමිය, **ථීනං;** ස්ත්‍රීන්ගේ, **ධම්මාභිසමයෙ;** ධර්මාවබෝධයේ දී, **යෙ බාලා;** යම් අඥාන කෙනෙක්, **විමතිං;** වැරදි මතයකට, **ගතා;** ගියාහු ද?, **තෙසං;** ඔවුන්ගේ, **දිට්ඨිපහානත්ථං;** දෘෂ්ටිප්‍රහාණය පිණිස **ඉදානිං දස්සෙහි;** සෘද්ධි දක්වන්න.

81. **තදා;** එකල්හි, **ගොතමී;** ගෝතමී තෙරණිය, **සම්බුද්ධං;** බුදුන් වහන්සේට, **නිපච්ච;** වැඳ, **අම්බරං;** අහසට, **උප්පතිත්වාන;** පැන නැඟී, **බුද්ධානුභාවෙන;** බුදුන්ගේ අනුදැනුමෙන්, **අනෙකා ඉද්ධී;** නොයෙක් සෘද්ධීන්, **දස්සෙසි;** දැක්වූවා ය.

82. **එකිකා;** එක ම තැනැත්තිය, **බහුධා ආසි;** බොහෝ ආකාර වූවා ය, **බහුකා ච;** බොහෝ අය ද, **එකිකා ආසි;** එකියක්ව (එක් තැනැත්තියක්ව) වූවා ය, **තථා;** එසේ ම, **ආවීභාවං;** ප්‍රකට බවට ද, **තිරොභාවං;** අප්‍රකට බවට ද, **තිරොකුඩ්ඩං;** පවුර හරහා ද, **තිරොනගං;** පර්වතය හරහා ද.

83. **අසජ්ජමානා;** නොගැවෙමින්, **අගමා;** ගියා ය, **භූමියං අපි;** පොළොවෙහි ද, **නිමුජ්ජථ;** ගැලුණාය, **යථා මහියා;** පොළොවෙහි මෙන්, **අභිජ්ජමානෙ උදකෙ;** නොබිඳෙන ජලයේ, **අගඤ්ඡි;** ගියා ය.

84. **තදා;** එකල, **සකුණී ඉව;** කිරිල්ලියක මෙන්, **ආකාසෙ;** අහසෙහි, **පල්ලඞ්කෙන;** පළඟින් ගමි; ගියා ය, **යාව බ්‍රහ්මනිවෙසනං;** බඹලොව දක්වා, **කායෙන;** කයින්, **වසං වත්තසි;** වසඟයෙහි පැවැත්වූවා ය.

85. **සිනෙරුං;** මහාමේරු පර්වතය, **දණ්ඩං කත්වාන;** කුඩමිටක් කොට, **මහාමහිං;** මහපොළොව, **ඡත්තං කත්වා;** කුඩයක් කොට, **සමූලං පරිවත්තෙත්වා;** සහමුලින් ම පෙරළා, **ධාරෙන්තී;** දරමින්; **නහෙ;** අහසෙහි, **චඞ්කමි;** හැසිරුණෙමි.

86. **ඡසසුරියොදය කාලෙ ඉව;** හිරු හයක් උදාවන කාලයක මෙන්, **ලොකං ච;** ලොව ද, **ධූමිකං අකාසි;** දුම් සහිත වූවක් කළා ය, **සා;** ඕ තොමෝ, **ලොකං;** ලෝකය, **යුගනෙත්ත විය;** කල්පාන්තයේ මෙන්, **ජාලාමාලාකුලං;** ගිනිදැල්වලින් ගැවසීගත්තක්, **අකා;** කළා ය.

87. **මුචලින්දං මහාසෙලං;** මුචලින්ද මහා පර්වතය, **මෙරු මන්දාර දද්දරෙ;** මේරු මන්දාර දද්දර යන පර්වත , **සබ්බානි;** සියල්ල, **සාසපෙ ඉව;** අබඇට මෙන්, **එකෙන මුඨීනා;** එකමිටට, **අගහි;** ගත්තා ය.

88. **සනිසාකරං;** සඳ සහිතවූ, **භාකරං;** හිරු, **අඞ්ගුලගෙහන;** ඇඟිලිතුඩින්, **ඡාදෙසි;** වැසුවා ය, **චන්දසූරසහස්සානි;** දහස්ගණනක් සඳහිරු, **ආවෙලමිව;** මුදුන්මල්කඩ සෙයින්, **ධාරයී;** දැරුවා ය.

89. **චතුසාගරතොයානි;** සිවුසයුරෙහි දිය, **එකපාණිනා;** එක අල්ලෙන්, **ධාරයී;** දැරුවා ය, **යුගන්තජලදාකරං;** යුගාන්තයෙහි මහා මේඝයක් බඳු, **මහාවස්සං;** මහවැසි, **පවස්සයී;** වැස්ස වූවා ය.

90. **සා;** ඇ, **නභට්ඨලෙ;** අහස්තලයෙහි; **සපරිසං;** පිරිස් සහිත, **චක්කවත්තිං;** සක්විති රජෙකු, **මාපයී;** මැව්වා ය, **ගරුළං;** ගුරුළෙකු, **දව්රදං;** ඇතෙකු, **විනදන්තං;** නාද කරන, **සීහං;** සිංහයෙකු, **දස්සෙසි;** දක්වූවා ය.

91. **එකිකා;** එකලාව, **අප්පමෙය්‍යා;** අප්‍රමාණ, **භික්ඛුනීගණං;** භික්ෂුණී සමූහයා, **අභිනිම්මිනිත්වා;** මවා, **පුන;** නැවත, **අන්තරධායෙත්වා;** අතුරුදහන් කොට, **එකිකා;** තනිව, **මුනිං;** බුදුන් වහන්සේට, **අබ්‍රවී;** කීවා ය.

92. **මහාවීර;** මහාවීරයන් වහන්ස, **තව;** ඔබගේ, **සාසනකාරිකා;** අනුසාසනාව කරන, **තෙ;** ඔබගේ, **මාතුචඡා;** සුළුමව යි. **චක්ඛුම;** ඇස් ඇත්තාණෙනි, **සකං අත්ථං;** ස්වාර්ථයට (ලෝකෝත්තර අර්ථයට), **අනුපපත්තා;** පැමිණි තැනැත්තී, **පාදෙ;** පාදයන්, **වන්දති;** වඳියි.

93. **සා;** ඕතොමෝ, **විවිධා ඉද්ධි;** නොයෙක් ඍද්ධි, **දස්සෙත්වා;** දක්වා, **නභට්ඨලා;** අහස්තලයෙන්, **ඔරොහිත්වා;** බැස, **ලොකපජ්ජොතං;** බුදුන් වහන්සේ, **වන්දිත්වා;** වැඳ, **එකමන්තං;** එතක්පසක, **නිසීදි;** හුන්නා ය.

94. **මහාමුනෙ;** මහමුනිවරයාණෙනි, **සා අහං;** ඒ මම, **ජතියා;** උපතින්, **වීසංවස්සසතිකා;** එක් සිය විසි වස් හැවිරිදි වෙමි, **වීර;** වීරයාණෙනි, **එත්තාවතා අලං;** මෙපමණකින් සෑහෙමි, **නායක;** නායකයාණෙනි, **නිබ්බායිස්සාමි;** පිරිනිවන් පාන්නෙමි.

95. **තදා;** එකල, **අතිවිම්හිතා;** අතිශයින් විස්මයට පැමිණි, **සා සබ්බා පරිසා;** ඒ සියලු පිරිස, **කතඤ්ජලී;** කරන ලද ඇඳිලි වැඳීම් ඇත්තේ, **අවොච;** කීවා ය, **අය්‍යෙ;** ආර්යාවෙනි, **කථං;** කෙසේ, **අතුල;** අසමාන, **ඉද්ධිපරක්කමා;** ඍද්ධි පරාක්‍රම ඇත්තියක්, **ආසි;** වූවා ද?

96. **සබ්බධම්මෙසු;** සියලු ධර්මයන්හි, **චක්ඛුමා;** ඇස් ඇති, **නායකො;** නායකවූ, **පදුමුත්තරො නාම ජිනො;** පදුමුත්තර නම් බුදුන් වහන්සේ, **ඉතො;** මෙයින්, **සතසස්සමහි කප්පෙ;** කල්ප ලක්ෂයකට පෙර, **ලොකෙ;** ලොව, **උප්පජ්ජි;** උපන් සේක.

97. **තදා;** එකල, **අහං;** මම, **හංසවතියං;** හංසවතී නගරයෙහි, **සබ්බූපකාරසම්පන්නෙන;** සියලු උපකරණයන්ගෙන් යුතු, **ඉද්ධෙ;** සමෘද්ධිමත්, **ඵීතෙ;** සර්වසම්පූර්ණ, **මහද්ධනෙ;** මහත් ධනය ඇති, **අමච්චකුලෙ;** ඇමති කුලයක, **ජාතා;** උපන්නෙමි.

98. **කදාචි;** කිසිවිටෙක, **දාසීගණපුරක්ඛතා;** දාසිසමූහයා විසින් පෙරටු කරන ලද්දී, **මහතා පරිවාරෙන;** මහත් පිරිවරින්; **පිතුනා සද්ධිං;** පියා සමග, **තං;** ඒ, **නරාසභං;** බුදුරදුන් වෙත, **උපෙච්ච;** එළඹ...

99. **වාසවං විය;** ශක්‍රදේවේන්ද්‍රයා වැනි, **අනාසවං;** කෙලෙස් රහිත, **ධම්මමෙසං;** දහම් නමැති මේඝය, **වස්සන්තං;** වස්වන, **සරදාදිච්ච සදිසං;** සරත් කාලයෙහි හිරු හා සමාන වූ, **රංසිමාලාකුලං;** රැස්මාලා වලින් ගැවසී ගත්, **ජිනං;** බුදුන් වහන්සේ ...

100. **දිස්වා;** දැක, **චිත්තං;** සිත, **පසාදෙත්වා;** පහදවා, **අස්ස;** උන්වහන්සේගේ, **සුභාසිතං ච;** සුභාෂිතය ද, සුත්වා. අසා, **නරනායකං;** නරශ්‍රේෂ්ඨයන් වහන්සේ, **මාතුච්ඡං;** (සිය) සුළුමව වූ, **භික්ඛුනිං;** භික්ෂුණිය, **අග්ගෙ ඨපෙන්තං;** අග තනතුරෙහි තබනු ...

101. **සුත්වා;** අසා, **සත්තාහං;** දින හතක්, **සසඞ්ඝස්ස;** සංඝයා සහිත, **තාදිනො;** තාදී ගුණ ඇති **තස්ස නරග්ගස්ස;** ඒ නර ශ්‍රේෂ්ඨයන් වහන්සේට, **මහාදානං;** මහාදානයක් ද, **බහූනි පච්චයානි ච;** බොහෝ ප්‍රත්‍යයන් ද, **දත්වා;** දී ...

102. **පාදමූලම්හි නිපජ්ජ;** පාමුල වැටී, **තං ඨානං;** ඒ තනතුර, **අභිපත්ථයිං;** ප්‍රාර්ථනා කළෙමි, **තතො;** ඉක්බිති, **ඉසිසත්තමො;** ඍෂි ශ්‍රේෂ්ඨයන් වහන්සේ, **මහාපරිසතිං;** මහපිරිස් මැද, **අවොච;** වදාළ සේක.

103. **යා;** යම් කාන්තාවක්, **සසඞ්ඝං;** සංඝයා සහිත, **ලොකනායකං;** ලෝකනායකයන් වහන්සේ, **සත්තාහං;** සත්දිනක්, **අහෙ ජෙසි;** වැළඳ වූවා ද, **අහං;** මම, **තං;** ඇය, **කිත්තයිස්සාමි;** ප්‍රශංසා කරන්නෙමි, **භාසතො;** කියන්නා වූ, **මම;** මාගේ වචනය, **සුණාථ;** අසවු.

104. **ඉතො;** මෙයින්, **සතසහස්සෙ කප්පෙ;** කල්පලක්ෂයක් මත්තෙහිදී, **ඔක්කාකකුලසම්භවො;** ඔක්කාක කුලයේ උපන්, **ගොත්තෙන;** ගෝත්‍රයෙන්, **ගොතමො නාම;** ගෝතම නම් වූ, **සත්ථා;** ශාස්තෘන් වහන්සේ, **ලොකෙ;** ලොව, **භවිස්සති;** පහළ වන්නේ ය.

105. **තස්ස;** උන්වහන්සේගේ, **ධම්මෙසු දායාදා;** ධර්මය දායාද වූ, **ඔරසා;** ඖරස වූ, **ධම්මනිම්මිතා;** ධර්මයෙන් නිර්මිත වූ, **නාමෙන;** නමින්, **ගොතමී නාම;** ගෝතමී නම් වූ, **සත්ථුසාවිකා;** බුද්ධ ශ්‍රාවිකාවක්, **භෙස්සති;** වන්නී ය.

106. **තස්ස බුද්ධස්ස;** ඒ බුදුරදුන්ගේ, **ජීවිත ආපාදිකා;** ජීවිතය වඩාලන, **මාතුච්ඡා;** සුළුමව වූ, **අයං;** මෝ තොමෝ, **රත්තඤ්ඤූනං, භික්ඛුනීනංච;** චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර ද, **අග්ගත්තං;** අගතනතුර, **ලභිස්සති;** ලබන්නී ය.

107. **තං සුත්වාන;** ඒ අසා, **පමුදිතා;** සතුටු වූ, **අහං;** මම, **තදා;** එකල, **යාවජීවං;** දිවි ඇතිතාක්, **ජිනං;** බුදුන් වහන්සේට, **පචචයෙහි;** සිව්පසයෙන්, **උපට්ඨිත්වා;** උපස්ථාන කොට, **තතො;** එතනින්, **කාලකතා;** කලුරිය කළෙමි.

108. **සබ්බකාමසමිද්ධිසු;** සියලු කාමයෙන් සමෘද්ධ වූ, **තාවතිංසෙසු දෙවෙසු;** තවුතිසා දෙවියන් අතර, **නිබ්බත්තා;** උපන්, **අහං;** මම, **දසහි අඞ්ගහි;** දස කරුණෙකින්, **අඤ්ඤදෙවියන්;** සෙසු දෙවියන්, **අභිභවිං;** ඉක්මවා සිටියෙමි.

